53 වන කාණ්ඩය
12 වන කලාපය

බදාදා
1963 සැප්තැම්බර් 11

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 2829]

විසර්ජන කෙටුම්පත් පණත, 1963-64 [දහඅටවන වෙන් කළ දිනය] : [තී. 2854]

**154-157 සහ 144 වන ශීර්ෂ කාරක සභාව විසින් සලකා බලන ලදි.**

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තී. 3099]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 53
இல. 12

புதன்கிழமை
11 செப்ரெம்பர், 1963

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகாரபூர்வமான அறிக்கை

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 2829]

ஒதுக்கீட்டு மசோதா, 1963–64 [*ஒதுக்கப்பட்ட பதினெட்டாம் நாள்*] [ப. 2854] :
குழுவில் ஆராயப்பெற்றது
தலைப்புக்கள் 154–157 ; 144

வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப. 3099]

---

Volume 53
No. 12

Wednesday,
11th September, 1963

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [c. 2829]

APPROPRIATION BILL, 1963-64 [*Eighteenth Allotted Day*] [c. 2854] :
Considered in Committee
Heads 154-157 ; 144

WRITTEN ANSWERS TO QUESTIONS [c. 3099]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## 1963 සැප්තැම්බර් 11 වන බදාදා

පූ. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු ආර්. එස්. පැල්පොල] මූලාසනාරූඪ විය.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

*வினாக்களுக்கு வாய்மூல விடைகள்*

ORAL ANSWERS TO QUESTIONS

### රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව : යතුරු ලියන්නන් හා ලඝුලේඛකයින් පුහුණු කිරීමේ පංති

*அரசகரும மொழிப்பகுதி : தட்டெழுத்தாளர் சுருக்கெழுத்தாளர்க்குப் பயிற்சி வகுப்புக்கள்*

OFFICIAL LANGUAGE DEPARTMENT : TRAINING CLASSES FOR TYPISTS AND STENOGRAPHERS

1. **ඩබ්ලිව්. දහනායක මයා.** (ගාල්ල)

*(திரு. டப்ளியு. தகனாயக்க—காலி)*

(Mr. W. Dahanayake—Galle)

රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) යතුරු ලියන්නන් හා ලඝුලේඛකයින් සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන පුහුණු කිරීමේ පංති ඇති බව එතුමා දන්නවාද ? (ආ) මෙම පුහුණු කිරීමේ පංතිවලට ඇතුළත්වීම සඳහා අවශ්‍ය සුදුසුකම් මොනවාද ? (ඉ) මෙම පංතිවලට ඇතුළත්වීම සඳහා ප්‍රවේශ පරීක්ෂණයක් පවත්වනු ලැබේද ? (ඊ) එක් එක් වර්ෂයක් තුළ කීදෙනෙකු බැගින් පුහුණු කරවනු ලැබේද ? (උ) ඔවුන්ගේ පාඨ මාලාව අවසන්වූ පසු සහතිකයක් ප්‍රදානය කරනු ලැබේද ? (ඌ) එසේ නම්, ඒ කුමන අන්දමේ සහතිකයක්ද ? (එ) රජයේ විවිධ දෙපාර්තමේන්තුවල යතුරු ලියන්නන් හා ලඝුලේඛකයින්ගේ අඩුවක් තිබියදීත් මෙම පාඨ මාලාව සමත්වන අයට කෙළින්ම රජයේ සේවයේ රක්ෂා නොදෙන්නේ මන්ද ?

*பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா : (அ) சிங்களத் தட்டெழுத்தாளர், சுருக்கெழுத்தாளர்களுக்கான பயிற்சி வகுப்புக்கள் அரசகரும தொழிற் திணைக்களத்தால் நடாத்தப்படுகின்றனவென்பதை அவர் அறிவாரா ? (ஆ) இப்பயிற்சி வகுப்புகளுக்கு அனுமதி பெறுவதற்கான கல்வித் தகைமைகள் யாவை ? (இ) இவ்வகுப்புகளுக்கு அனுமதி பெறுவதற்குப் புகுமுகப் பரீட்சை ஒன்றுண்டா ? (ஈ) ஒவ்வொரு வருடத்திலும் பயிற்றப்படுவோர் எத்தனை ? (உ) அவர்களுடைய பயிற்சி முடிந்ததும் தராதரப் பத்திரம் ஒன்று வழங்கப்படுகின்றதா ? (ஊ) அவ்வாறாயின், எத்தகைய தராதரப் பத்திரம் வழங்கப்படுகின்றது ? (எ) பல அரசாங்க திணைக்களங்களில் போதியளவு சிங்கள தட்டெழுத்தாளர், சுருக்கெழுத்தாளர்கள் இல்லாததை முன்னிட்டு, இப்பயிற்சிகளிற் சித்தியடைபவர்களுக்கு அரசாங்க சேவையில் நேரடியாக தொழில் வசதி வழங்கப்படாததேன் ?*

asked the Parliamentary Secretary to the Minister of Defence and External Affairs : (*a*) Is he aware that there are training classes for typists and stenographers respectively, in Sinhala, conducted by the Official Language Department? (*b*) What are the qualifications for admission to these training classes? (*c*) Is there an entrance examination for admission to these classes? (*d*) How many are trained each year? (*e*) Is a certificate awarded at the end of their course? (f) If so, what is its nature? (*g*) Why is not direct employment offered in Government service to those who pass this course, in view of the shortage of typists and stenographers respectively, in Sinhala in various Government Departments?

**පී. පී. වික්‍රමසූරිය මයා. (අධිකරණ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. பீ. பீ. விக்கிரமசூரிய—நீதியமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. P. P. Wickramasuriya—Parliamentary Secretary to the Minister of Justice)

(*a*) Yes. (*b*) Old entrant stenographers, typists and clerks recruited in the English medium are eligible for admission. (*c*) No. (*d*) About 50 in stenography, and about 300 in typing are trained each year. (*e*) No. (*f*) Does not arise. (*g*) Does not arise as they are already in service.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

Are there not some persons who have gone through this course of training who are without billets?

**වික්‍රමසූරිය මයා.**
*(திரு. விக்கிரமசூரிய)*
(Mr. Wickramasuriya)

Yes. The position is this. This department only trains people in stenography—that is shorthand and typewriting. Whenever vacancies for stenographers occur in Government departments they are filled in accordance with Government regulations.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

Is the hon. Parliamentary Secretary aware of the fact that the cadre of typists and stenographers of Government is short by a very large number? If so, will he immediately recruit into service those who have been trained through this course?

**වික්‍රමසූරිය මයා.**
*(திரு. விக்கிரமசூரிய)*
(Mr. Wickramasuriya)

I am not aware of such a shortage; but I shall certainly bring the matter to the notice of the Hon. Minister. If there is a shortage the question of recruitment will be considered.

**කේ. එම්. පී. රාජරත්න මයා.** (වැලිමඩ)
*(திரு. கே. எம். பி. ராஜரத்ன—வெலிமடை)*
(Mr. K. M. P. Rajaratna—Welimada)

රජයේ දෙපාර්තමේන්තුවල, විශේෂයෙන්ම උසාවිවල, වැඩ කටයුතු සිංහලෙන් කිරීමට ලොකු බාධාවක් වී ඇත්තේ සිංහල ලඝු ලේඛකයින් හිඟ නිසායයි රජයේ ඇමතිවරුනුත්, දෙපාර්තමේන්තු ප්‍රධානීනුත් ප්‍රකාශ කර තිබෙනවා. තත්ත්වය එය නම්, වුවමනා තරම් ලඝු ලේඛකයින් පුහුණු කොට ඔවුන් සිංහලෙන් වැඩ කිරීම සඳහා අවශ්‍ය දෙපාර්තමේන්තුවලට නොයවන්නෙ ඇයි?



**වික්‍රමසූරිය මයා.**
*(திரு. விக்கிரமசூரிய)*
(Mr. Wickramasuriya)

උසාවි පිළිබඳව ඒ ප්‍රශ්නය අහනවා නම් මට කියන්න පුළුවනි, උසාවිවලට වුවමනා තරම් ලඝු ලේඛකයින් සිටින බව.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பி. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ඇයි එහෙම නම් උසාවිවල වැඩ සිංහලෙන් කරන්නෙ නැත්තෙ?

**වික්‍රමසූරිය මයා.**
*(திரு. விக்கிரமசூரிய)*
(Mr. Wickramasuriya)

උසාවිවල වැඩට වුවමනා තරම් ලඝු ලේඛකයින් සිටිනව. ලංකාවේ ඇති සියලුම ගම්සභා උසාවිවල—උතුරු නැගෙනහිර පළාතේ හැර—සිංහලෙන් වැඩ කරනව. ඒවායෙ නඩු පොත් සිංහලෙන් තබන්නෙ. මහෙස්ත්‍රාත් උසාවිවලටත් වුවමනා තරම් ලඝු ලේඛකයින් සිටිනව; නමුත් සම්පූර්ණයෙන්ම සිංහලෙන් වැඩ කිරීමට පුළුවන් නඩුකාරවරු සිටිනවායයි අපට කියන්න අමාරුයි. (බාධාකිරීමක්) නඩුකාරවරුන්ට සිංහලෙන් වැඩ කිරීමට පුහුණු කරවීමේ කටයුතු කරගෙන යනවා. ඒ සඳහා විභාග පවත්වනවා. දැනටත් මේ විභාග පවත්වනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

2 වන ප්‍රශ්නය.

**මෙරිල් ප්‍රනාන්දු මයා.** (මොරටුව)
*(திரு. மெரில் பெர்னாண்டோ—மொறட்டுவை)*
(Mr. Meryl Fernando—Moratuwa)

මා අහනව දෙවන ප්‍රශ්නය.

**එම්. තෙන්නකෝන් මයා.** (මුදල් කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)
*(திரு. எம். தென்னகோன்—நிதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. M. Tennakoon—Parliamentary Secretary to the Minister of Finance)

2 වන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා කෘෂිකර්ම, ආහාර හා සමුපකාර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා වෙනුවෙන් මම කල් ඉල්ලනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**මෙරිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. மெரில் பெர்னாண்டோ)*
(Mr. Meryl Fernando)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී තවත් කල් වුවමනා කරන්නෙ මක් නිසාදැයි මට තේරෙන්නෙ නැහැ. ගිය අවුරුද්දේ අවසාන භාගයේදී සිදුවූ දෙයක් ගැනයි ප්‍රශ්නය අහල තියෙන්නෙ. මේ අවුරුද්දේ ජනවාරි මාසයේදී නිලධාරීන් කීප දෙනෙකුගෙ වැඩ නවත්වා තිබෙනව. පෙබරවාරි මාසයෙදිත් මීට අදාළ ප්‍රශ්නයක් ඇහුව. දැන් මේ සිද්ධිය වෙලා මාස දහයක් ගත වෙලයි තියෙන්නෙ. එහෙම තිබියදිත් නව කල් වුවමනාකරන්නෙ මොන හේතුවක් නිසාදැයි මට තේරුම් ගන්න අමාරුයි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ කරුණු ගරු ඇමතිතුමාගේ සැලකිල්ලට යොමු කරන්නම්.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

**කන්තලේ සීනි යෝජනා ක්‍රමයේ නිලධාරීන් හතරදෙනෙකුගේ වැඩ තහනම් කිරීම**

*கந்தளாய் சீனியுற்பத்தித்திட்டம்: நான்கு உத்தியோகத்தரின் தற்காலிக பதவிநீக்கம்*

SUGAR PROJECT, KANTALAI : INTERDICTION OF FOUR OFFICERS

3. **මෙරිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. மெரில் பெர்னாண்டோ)*
(Mr. Meryl Fernando)

කෘෂිකර්ම, ආහාර හා සමුපකාර කටයුතු පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අවසර නොමැතිව කන්තලේ සීනි යෝජනා ක්‍රමයේ කුඹුරු අක්කර 600ක් වගා කිරීමේ චෝදනාව මත නිලධාරීන් හතර දෙනෙකුගේ වැඩ තහනම් කිරීම සම්බන්ධයෙන් 1963.1.15 වැනි දින හා 1963.1.16 වැනි දින ගුවන් විදුලි හා ප්‍රවෘත්ති පත්‍ර නිවේදන දීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරියා කවරෙක්ද? (ආ) නිවේදන සම්පූර්ණයෙන්ම සත්‍ය ඒවාද? (ඉ) නොඑසේ නම්, ඒ හා සමාන ප්‍රචාරයක් ඇතිව, එකී මාර්ගවලින්ම සම්පූර්ණ සත්‍ය රපෝර්තුවක් වහාම නිකුත් කිරීමට එතුමා සලස්සනවාද? (ඊ) අසත්‍ය නිවේදනය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරියාට විරුද්ධව කුමන ක්‍රියා මාර්ගයක් ගනු ලැබේද? (උ) වගා කිරීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ අනුමතිය දුන්නේද නැද්ද යන වගත්, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයෙකු විසින්, කන්තලේ සීනි සංයුක්ත මණ්ඩලයේ සභාපති හා සංයුක්ත මණ්ඩලයේ වෙනත් නිලධාරීන් විසින් වගාව පරීක්‍ෂා කරන ලද්දේද යන වගත් විශේෂයෙන් සඳහන් කරමින්, කන්තලේ නිලධාරීන්ගේ වැඩ තහනම් කිරීමට තුඩු දුන් හේතූන් පිළිබඳ සම්පූර්ණ රපෝර්තුවක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරනවාද?

*கமத்தொழில், உணவு, கூட்டுறவு விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) கந்தளாயிலுள்ள சீனி உற்பத்தித் திட்டத்தில் 600 ஏக்கர் காணியில் அனுமதியின்றி நெற்சாகுபடி செய்த குற்றச்சாட்டின்பேரில் கந்தளாயிலுள்ள நான்கு உத்தியோகத்தர்களைத் தற்காலிகமாய்ப் பதவியினின்றும் நிறுத்திவைத்தமை சம்பந்தமாய் 15.1.63, 16.1.63 ஆகிய தேதிகளில் வானொலிக்கும், பத்திரிகை நிலையத்திற்கும் தகவல் அளிப்பதற்குப் பொறுப்பாயிருந்த உத்தியோகத்தர் யார்? (ஆ) அவ்வறிக்கைகள் முற்றிலும் சரியானவையா? (இ) இல்லையெனில், அதே நிலையங்களின்மூலம் முற்றிலும் சரியான அறிக்கையொன்றினை அதே அளவு பகிரங்கப்படுத்தி உடனடியாய் வெளியிடுவதற்கு அவர் வகைசெய்வாரா? (ஈ) பிழையான அறிக்கையைக் கொடுப்பதற்குப் பொறுப்பாயிருந்த உத்தியோகத்தருக்கெதிராய் என்ன நடவடிக்கை எடுக்கப்படும்? (உ) கந்தளாயிலுள்ள அவ்வுத்தியோகத்தர்களைத் தற்காலிகமாய்ப் பதவியினின்றும் நிறுத்திவைக்கவேண்டி ஏற்பட்ட சூழ்நிலைகளையும், குறிப்பாக, நெற்சாகுபடி செய்வதற்குக் கமத்தொழிலதிபதியால் அனுமதியளிக்கப்பட்டதா அல்லது அனுமதியளிக்கப்படவில்லையா என்பதையும் பிரதிக் கமத்தொழிலதிபதியொருவர், கந்தளாய்ச் சீனிக் கூட்டுத்தாபனத் தலைவர், அக்கூட்டுத்தாபனத்தின் ஏனைய உத்தியோகத்தர்கள் ஆகியோரால் அச்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෙරිල් ප්‍රනාන්දු මයා.]

சாகுபடி மேற்பார்வையிடப்பட்டதா என்பது பற்றிய விபரங்களையும் உள்ளடக்கிய முழு அறிக்கையொன்றினை அவர் இச்சபைக்குச் சமர்ப்பிப்பாரா?

asked the Minister of Agriculture, Food and Co-operatives: (*a*) Who is the officer responsible for the Radio and Press releases of 15.1.63 and 16.1.63 regarding the interdiction of four officers at Kantalai for the alleged unauthorized cultivation of 600 acres of paddy at the Sugar Project, Kantalai? (*b*) Are the communiques absolutely correct? (c) If not, will he cause an absolutely correct report to be issued immediately through the same sources and with equal publicity? (*d*) What action will be taken against the officer responsible for the incorrect communique? (*e*) Will he table a full report in the House regarding the circumstances which led to the interdiction of the officers at Kantalai stating specifically whether or not the cultivation was authorized by the Director of Agriculture and whether the cultivation was supervised by a Deputy-Director of Agriculture, the Chairman, Kantalai Sugar Corporation and other officers of the corporation?

**එම්. තෙන්නකෝන් මයා. (කෘෂිකර්ම, ආහාර හා සමුපකාර කටයුතු පිළිබඳ ඇමති වෙනුවට)**

(திரு. எம். தென்னகோன்—விவசாய, உணவு கூட்டுறவு அமைச்சர் சார்பாக)

(Mr. M. Tennakoon—on behalf of Minister of Agriculture, Food and Co-operatives)

(අ) ගුවන් විදුලි හා ප්‍රවෘත්ති නිවේදන, එවකට තිබූ කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබලය පිළිබඳ අමාත්‍යාංශය විසින් නිකුත් කැරුණු ඒවා බව පෙනී යයි. මෙම නිවේදන සම්බන්ධයෙන් එක්තරා නිලධාරියකු වග කිවයුතුය යි, තිබෙන්නාවූ සටහන් අනුව මට කිව නොහැක. (ආ) ඔව්. (ඉ) පැන නොනගී. (ඊ) පැන නොනගී. (උ) වැඩ තහනම් කළ නිලධාරීන්ට විරුද්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභා රෙගුලාසි යටතේ විනයානුකූලව කටයුතු කිරීම ළඟ දී ඇරඹීමට නියමිත හෙයින් මේ ගැන සම්පූර්ණ වාර්තාවක් දැනට ඉදිරිපත් කිරීමට නොහැකි වීම ගැන කනගාටු වෙමි.

**මෙරිල් ප්‍රනාන්දු මයා.**

(திரு. மெரில் பெர்ணண்டோ)

(Mr. Meryl Fernando)

මේ ප්‍රශ්නය හා සම්බන්ධ ප්‍රවෘත්තිය 1963 ජනවාරි 16 වැනිදා "ඩේලි නිවුස්" පත්‍රයේ පළ වී තිබුණා. ඒ නිවේදනය අනුව කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ගරු ඇමතිතුමා කියල තියෙන්නෙ, කන්තලේ අක්කර 600 ක කුඹුරු වගාවක් කර තිබෙන්නෙ බලය නැතිව යම් යම් අය විසින්ය කියලයි. මා දැන් ඊට අදාල කොටස කියවනව.

Extract from the "Daily News" of the 16th January, 1963:

"The Minister of Agriculture, Land, Irrigation and Power, Mr. C. P. de Silva, who was informed of this told the 'Daily News' yesterday that he was taking 'stern action' He said this unauthorized use of Government equipment and labour has to be stopped."

1962 සැප්තැම්බර් 21 වන දා නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් යවන ලද ලියමනකින් පෙනෙනවා; මේ ගැන ඒ කාලෙ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙ නිලධාරීන් දැනගෙන හිටපු බව. ඒ ලියමනත් දැන් මම කියවන්නම්.

This is a letter from the Deputy-Director of Agriculture (Development).

"21.9.62.

Chairman, Kantalai Sugar Corporation,
Colombo 2.

PADDY CULTIVATION AT KANTALAI

Attached is a letter from A. E. (Kantalai) recommending the release of 600 acres now being prepared in tracts 13A, 15A, 16A, 17A and 19 for paddy cultivation to the men who are working this land. He says that this should be given to them as a bonus because they have all worked hard to complete so much of this land in such a short time.

I mentioned this to the Additional Secretary, Agriculture, Lands, Irrigation and Power who suggested that it be given at the usual rate of about Rs. 30 per acre."

තවත් ලියමනක් තියෙනව. ඒ ලියමන යවල තියෙන්නෙ 1962. 9. 29 වැනිදයි. ඒකත් මම කියවන්නම්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

This is a letter dated 29.9.62 from the Deputy-Director of Agriculture (Development) to the Chairman, Kantalai Sugar Corporation :

"Land in tracts Nos. 13A, 15A, 16A, 17A and 19. With reference to your letter dated 24.9.62, this Department has only recommended the applications of the members of the Recreation Club and other employees for release of land for paddy cultivation, but did not undertake to lease out the land or collect land rent."

මේකයි සිද්ධ වුණේ. කන්තලේ කම්කරුවන් විශාල පිරිසක් බොහොම මහන්සියෙන් ඉතාම ඉක්මනින් එතන වැඩ කළා. කන්තලේ කම්කරුවන් බොහොම ඉක්මනින් හොඳට වැඩ කර තිබෙනවය කියල සෝවියට් ඉංජිනේරු කෙනෙකුත් බොහොම හොඳ විශේෂ ප්‍රශංසාවක් කළා. බෝනස් එකක් වශයෙන් කම්කරුවන්ට වගාව භාර දෙන්න කියා යෝජනාවකුත් ඉදිරිපත් වුණා. ඒ යෝජනාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙ අධ්‍යක්ෂතුමාත් අනුමත කර තිබෙනවා. එවකට ස්ථිර ලේකම්ව සිටි ශ්‍රී කාන්ත මහත්මයා "ඩේලි නිවුස්" පත්‍රයේ වාර්තාකරුවෙක් තමන්ගේ කාර්යාලයට ගෙන්වා මේ ප්‍රවෘත්තිය දී තිබෙනවා. එහෙම තිබියදී ඒ සේවකයන්ට විරුද්ධව මේ විධියේ බොරු ප්‍රචාර දමාගෙන ක්‍රියා කිරීම වැරදියි. ඒ ගැන වැරදි ප්‍රවෘත්ති දුන් නිලධාරීන්ට විරුද්ධව ක්‍රියා කරන්න කියා මා ඉල්ලනවා.

**එම්. තෙන්නකෝන් මයා.**

*(திரு. எம். தென்னகோன்)*

(Mr. M. Tennakoon)

ගරු කෘෂිකර්ම ඇමතිතුමාට ඒ කරුණු ඉදිරිපත් කර සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වන ලෙස ඉල්ලන්නම්.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

දෙවැනි අතුරු ප්‍රශ්නය, ගරු කථානායකතුමනි, ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගේ පිළිතුරේ සඳහන් වුණා, එක නිලධාරියෙක් පමණක් මීට වගකිය යුත්තා වශයෙන් සන්නට බැරිය——

**ටී. බී. තෙන්නකෝන් මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. ரி. பி. தென்னகோன்—கல்வி, கலாச்சார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. T. B. Tennekoon—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

ප්‍රශ්නයක්ද ? කථාවක්ද ?

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

ප්‍රශ්නයක්. ඇහුම්කන් දෙන්න. මා කියන දේ ගරු උප ඇමතිතුමාට නොතේරීම ගැන කනගාටු වෙනවා. මුදල් කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙමින් කිව්වා, එම පුවත්පත් නිවේදනය සම්බන්ධයෙන් එක නිලධාරියකු පමණක් වගකිය යුතුය කියා කියන්න බැරි බව. එහෙම නම් ඒ සඳහා වග කිය යුතු නිලධාරීන් වැඩි දෙනෙක් සිටිනවා නම් ඒ සියලු දෙනාගේම නම් දැන් ඉදිරිපත් කරනවද ?

**එම්. තෙන්නකෝන් මයා.**

*(திரு. எம். தென்னகோன்)*

(Mr. M. Tennakoon)

ඒ නම් දැන් නැහැ.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

ඇයි. ඔය වාර්තාවල ඒ නම් සඳහන් වෙනවා ඇති. ඒ නිසා ඒ නම් සියල්ලම දෙන්න.

**එම්. තෙන්නකෝන් මයා.**

*(திரு. எம். தென்னகோன்)*

(Mr. M. Tennakoon)

ගොවිකම් අංශය ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල අංශයට සම්බන්ධ වී තිබුණ කාලයෙ දියි මේ සිද්ධිය ඇති වී තිබෙන්නෙ. ඒ අමාත්‍යාංශයට සම්බන්ධ වී සිටි ප්‍රවෘත්ති පත්‍ර නිලධාරි මහත්මයාගෙ මාර්ගයෙනුයි මෙය යන්න ඇත්තෙ. එම නිසා එයට ස්ථිර ලේකම්, අධ්‍යක්ෂ ආදි කීප දෙනෙක්ම සම්බන්ධ වී තිබෙනවා. ඒ නිසා දැන් සිටින ගොවිකම් ඇමතිතුමාට——

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ඒ පුවත් පත් නිවේදනය නිකුත් කළ අයගෙ නම් දෙන්න.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

ඒ නිලධාරීන් සියලු දෙනාගෙම නම් දීමට කල් ඕනෑ බව දන්වන්න කැමතියි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

තුන්වෙනි අතුරු ප්‍රශ්නය ගරු කථානායකතුමනි, පිට රටින් සහල් ගෙන්වීමට සිදු වී තිබෙන අවස්ථාවකදී රජයේ සේවකයන් හෝ වේවා, වෙන කවුරුත් හෝ වේවා, ආහාර නිෂ්පාදනයට උදව් දීම පිළිබඳ වැඩ කටයුතු කරනවා නම් එය වරදක්ද? එය වරදක් වශයෙන් සලකා ගෙනද ඒ අයට විරුද්ධව විනයානුකූල පරීක්ෂණ පවත්වන්නෙ? එම නිසා එම පරීක්ෂණය වහාම අවලංගු කර, ඒ ඉඩම් "බෝනස්" වශයෙන් කම්කරුවන්ට දෙන්නය කියා ඇමතිතුමාට දන්වන මෙන් මම ඉල්ලනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

4 වෙනි ප්‍රශ්නය යම් මන්ත්‍රීවරයෙක් අසනවද?

**පර්සි වික්‍රමසිංහ මයා.** (කඹුරුපිටිය)
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ—கம்புறுப் பிட்டிய)*
(Mr. Percy Wickremasinghe—Kumburupitiya)

මම අසනවා.

**ජේ. ඩී. වීරසේකර මයා.** (කොත්මලේ)
*(திரு. ஜே. டீ. வீரசேக்கர—கொத்மலே)*
(Mr. J. D. Weerasekera—Kotmale)

ඒ ප්‍රශ්නයට කල් ඉල්ලන්න වෙනවා. උත්තරය ලැබී නැහැ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

මොකක්ද මෙහි තේරුම? මේ ප්‍රශ්නයට කල් ඕනෑ නැහැ.

**මෙරිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. மெரில் பெர்னாண்டோ)*
(Mr. Meryl Fernando)

කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට කල් වුවමනාය කියන එකේ තේරුමක් නැහැ. මේ ගරු සභාවෙදි අසන——

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

ඒ ප්‍රශ්නයට උත්තරය ලැබී නැතිලු.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

## රජයේ මුද්‍රණාලයේ සේවකයන්ට නිවාඩු නිවාස

*அரசாங்க அச்சக ஊழியர்க்கு விடுமுறை மனைகள்*

HOLIDAY HOMES FOR GOVERNMENT PRESS EMPLOYEES

5. **කේ. එම්. පී. රාජරත්න මයා.** (වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා වෙනුවට)
*(திரு. கே. எம். பீ. ராஜரத்ன—டொக்டர் டப்ளியு. டீ. டி சில்வா சார்பில்)*
(Mr. K. M. P. Rajaratna—on behalf of Dr. W. D. de Silva)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) බොරැල්ලේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා 1962.6.17 වැනි දින රජයෙන් ඉල්ලා සිටියේ ගොඩනැගිලි දෙකක් හෝ තුනක් අත්කර ගෙන ඒවා රජයේ හා අනිකුත් සේවකයන් සඳහා නිවාඩු නිවාස බවට පත් කිරීමට මිස මේ කාර්‍යය සඳහා අලුත් ගොඩනැගිලි ඉදිකරණ ලෙස නොවන බව එතුමා දන්නවාද? (ආ) දැනට පවත්නා මුදල් තත්ත්වය අනුව, රජයේ මුද්‍රණාලයේ සේවකයන්ට බණ්ඩාරවෙල නිවාඩු නිවාස සඳහා ගොඩනැගිලි ඉදි කිරීම නතර කර මෙම කාර්‍යය සඳහා එම ප්‍රදේශයෙන් ගොඩනැගිලි දෙකක් හෝ තුනක් අත්කර ගන්නවාද?

*நிதியமைச்சரைக் கேட்ட வினா: (அ) இரண்டு அல்லது மூன்று கட்டடங்களைக் கொள்வனவு செய்து, அரசாங்க ஊழியர்களும் ஏனைய*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ஊழியர்களும் விடுமுறைக் காலத்தைக் கழிக்கக் கூடிய விடுமுறை மனைகளாக அவற்றை மாற்றும்படியும் இத்தேவைக் கெனப் புதிய கட்டடங்களை நிறுவவேண்டா மெனவும் 17.6.1962 இல் பொறளைப் பாராளு மன்ற உறுப்பினர் அரசாங்கத்தைக் கேட்டுக் கொண்டாரென்பதை அவர் அறிவாரா? (ஆ) தற்போதைய நிதி நிலைமையை முன்னிட்டு அரசாங்க அச்சகத்தைச் சேர்ந்த ஊழியர் களுக்கெனப் பண்டாரவளையில் விடுமுறை மனைகளுக்கான புதிய கட்டடங்களை நிர்மா ணிப்பதைக் கைவிட்டு அப்பகுதியில் இரண்டு அல்லது மூன்று கட்டடங்களை இத்தேவைக் கென அவர் கொள்வாரா?

asked the Minister of Finance: (*a*) Is he aware that the M. P. for Borella on 17.6.1962 requested the Government to acquire two or three buildings and convert them into holiday homes for Government and other employees, and not to construct new buildings for this purpose? (*b*) In view of the present financial position, will he abandon the construction of new buildings for holiday homes at Bandarawela for the employees of the Government Press and acquire two or three buildings from that area for this purpose?

**එම්. තෙන්නකෝන් මයා.**

(திரு. எம். தென்னகோன்)

(Mr. M. Tennakoon)

(අ) 1962.6.17 වෙනි දින ඉල්ලීමක් ගැන නොදනිමි. රජයේ සේවකයන් සඳහා සහ සංස්ථාවල සේවකයන් සඳහා නිවාඩු වට නවතින වාසස්ථාන සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා මහතා විසින් නගන ලද ප්‍රශ්නයක් විය. මෙම ප්‍රශ්නය ගැන සොයා බැලූ අතර, ත්‍රිකුණාමලය, යාපනය, පුත්තලම්, ගාල්ල සහ මාතර ආණ්ඩුවේ දිසාපතිවරුන්ගෙන් තොරතුරු විමසන ලදි. සුදුසු ගොඩනැගිල්ලක් නොතිබුණු බව ඒ අයගේ පිළිතුරුවලින් පෙනුණු හෙයින්, එම කරුණ අත් හැර දමන ලදි. නුවරඑළියේ, ජේනරල්ස් මන්දිරය රජයේ සේවකයන්ට නිවාඩු ගත කිරීම සඳහා භාර දීමට ගරු කථානායකතුමා එකඟ වන්නේදැයි එතුමාගෙන් ලියා විමසන ලදි. එතුමාගෙන් මෙම ලිපියට පිළිතුරක් ලැබී නැත. (ආ) යෝජනාව නම්, රජයේ මුද්‍රණාලයේ සේවකයන්ගේ ආධාර මුදලින්, නිවාඩු ගත කිරීමට නිවාසයක් බණ්ඩාරවෙල තැනීමය. රජයේ මුදල් මේ සඳහා යොදවනු නොලැබේ.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

(திரு. கே. எம். பீ. ராஜரத்ன)

(Mr. K. M. P. Rajaratna)

කථානායකතුමනි, බණ්ඩාරවෙලත් ඇතුළුව පළාත් කීපයක නම් සඳහන් කරමින් උප ඇමතිතුමා කියන්න යෙදුණා, දිසාපතිවරුන්ගෙන් විමසූ නමුත් ආණ්ඩුවට ගැනීම සඳහා සුදුසු ගොඩනැගිල්ලක් නොතිබුණ බව. නමුත් බණ්ඩාරවෙල හොඳ ගොඩනැගිල්ලක් තිබෙන බව මම පෙන්වා දෙන්න කැමතියි.

**එම්. තෙන්නකෝන් මයා.**

(திரு. எம். தென்னகோன்)

(Mr. M. Tennakoon)

බණ්ඩාරවෙල ඊට සම්බන්ධ නැහැ. එයි සඳහන්ව ඇත්තේ, ත්‍රිකුණාමලය, යාපනය, පුත්තලම, ගාල්ල සහ මාතර යන ස්ථාන පමණයි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

(திரு. கே. எம். பீ. ராஜரத்ன)

(Mr. K. M. P. Rajaratna)

එහෙම නම් මම වෙන ප්‍රශ්නයක් අහනවා. බණ්ඩාරවෙල හෝටලය නමැති ගොඩනැගිල්ලක් බණ්ඩාරවෙල තියෙනවා. එය විවේකාගාරයක් හැටියට ගැනීමට ආණ්ඩුව කැමතිද නැද්ද කියා මම අහනවා.

**එම්. තෙන්නකෝන් මයා.**

(திரு. எம். தென்னகோன்)

(Mr. M. Tennakoon)

මම විශ්වාස කරන්නෙ නැහැ අපහසුවක් ඇති වේවි කියා.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

(திரு. கே. எம். பீ. ராஜரத்ன)

(Mr. K. M. P. Rajaratna)

අපහසුවක් නොවෙයි, කැමතිද නැද්ද කියා කියන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

ඒ සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීමට පුළුවන් නම් ගැනීමේ අපහසුවක් නැහැ.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

මුදල් පිළිබඳ ප්‍රශ්නයක් නැහැ නෙ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

සේවකයින්ගේ ආධාර මුදලිනුයි, නිවාඩු ගත කිරීම සඳහා නිවාසයක් ගැනීමට බලා පොරොත්තු වන්නෙ. මෙහි සඳහන් වී ඇත්තේ, "...රජයේ මුද්‍රණාලයේ සේවක යින්ගේ ආධාර මුදලින්, නිවාඩු ගත කිරී මට නිවාසයක් බණ්ඩාරවෙල තැනීමය." කියායි එම නිසා ඒ අයගේ ආධාර මුදලි නුයි එය ගැනීමට යන්නෙ.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

පාර්ලිමේන්තු ලේකම්තුමා කිව්වා, බොරැල්ලෙ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා) 1962.6.17 වන දින එවන ලද ලිපිය ලැබුණේ නැති බව; එහෙම නැති නම් එතුමාට ඒ සම්බන්ධව දැනගන්න ලැබිල නැති බව. ඇමතිවරුන්ට පාර්ලිමේන්තු ලේකම්වරුන්ට සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට යවන ලියුම් යන්නෙ කුණු කූඩවලටද කියල මා අහනව. මේ ගැන පරීක්ෂා කර බලනවද?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

ඒ ගැන සොයා බලා පිළිතුරක් එවනව.

**කේ. එම්. පී. රාජරත්න මයා.** (වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා මයා. වෙනුවට)
*(திரு. கே. எம். பீ. ராஜரத்ன—டொக்டர் டபிள்யு. டீ. த சில்வா சார்பாக)*
(Mr. K. M. P. Rajaratna—on behalf of Dr. W. D. de Silva)

මා අහනව 6 වන ප්‍රශ්නය.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரி. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය කරුණු සපයා නැති නිසා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා කල් ඉල්ලනව.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

**පී. ආර්. රත්නායක මයා.** (මාවනැල්ල-ලක්ෂ්මන් ජයකොඩි මයා. වෙනුවට)
*(திரு. பீ. ஆர். ரத்ணயக்க—மாவனல்ல—திரு. இலக்ஷ்மன் ஜயக்கொடி சார்பாக)*
(Mr. P. R. Ratnayake—Mawanella—on behalf of Mr. Lakshman Jayakody)

මා අහනව 7 වන ප්‍රශ්නය.

**එම්. තෙන්නකෝන් මයා. (සෞඛ්‍ය හා නිවාස කටයුතු පිළිබඳ ඇමති වෙනුවට)**
*(திரு. எம். தென்னகோன்—சுகாதார வீடமைப்பு அமைச்சரின் சார்பாக)*
(Mr. M. Tennakoon—on behalf of the Minister of Health and Housing)

සෞඛ්‍ය හා නිවාස කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා කල් ඉල්ලා සිටිනව.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

## උඩතලවින්නේ, මඩිගේ පදිංචි ආර්. එස්. ජලල්දීන් මහතාගේ විශ්‍රාම වැටුප්

## உடத்தலவின்ன மடிகேயிலுள்ள 20 ஆமிலக்க இல்லத்தில் வதியும் ஆர். எஸ். ஜலால்தீனுக்கு இளைப்பாற்றுச் சம்பளம் வழங்கல்

## PAYMENT OF PENSION TO R. S. JALALDEEN, 20, MADIGE, UDATALAWINNA

8. **පී. ආර්. රත්නායක මයා.** (ඩී. ජී. එච්. සිරිසේන මයා. වෙනුවට)
*(திரு. பீ. ஆர். ரத்ணயக்க—திரு. டி. ஜீ. எச். சிறிசேன சார்பாக)*
(Mr. P. R. Ratnayake—on behalf of Mr. D. G. H. Sirisena)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) උඩතලවින්නේ, මඩිගේ අංක 20 දරණ ස්ථානයේ පදිංචි ආර්. එස්. ජලල්දීන් මාබුගොඩ හා මහනුවර ආරෝග්‍යශාලාවල කසළ ශෝධකයෙකු වශයෙන් සේවය කළ බව එතුමා දන්නවාද? (ආ) ඔහුට අංශබාග රෝගය වැළඳී වෛද්‍ය මණ්ඩලයේ නිර්දේශ අනුව 1962 අගෝස්තු මස 21

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැනි දින සිට විශ්‍රාම ගන්වනු ලැබූ බව එතුමා දන්නවාද? (ඉ) මහා භාණ්ඩාගාරය ඔහුගේ විශ්‍රාම වැටුප් ගෙවීමට කිසිම ක්‍රියා මාර්ගයක් ගෙන නැති බවත්, ඔහුට භාර්යාව හා දරුවන් සතර දෙනෙකු නඩත්තු කිරීමට ඇති බවත් එතුමා දන්නවාද? (ඊ) ප්‍රතිකාර ගැනීම සඳහාත්, පවුල නඩත්තු කිරීම සඳහාත් සැලකියයුතු මුදල් ප්‍රමාණයක් වියදම් කිරීමට සිදුවී ඇති හෙයින් ඔහුගේ විශ්‍රාම වැටුප් වහාම ගෙවන ලෙස එතුමා භාණ්ඩාගාරයට නියෝග කරනවාද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) உடத் தலவின்ன, மடிகேயிலுள்ள 20 ஆம் இலக்கத் தில் வதியும் ஆர். எஸ். ஜலால்தீன் மாடுகொட, கண்டி ஆகிய வைத்தியசாலைகளில் மலசல கூடத் தொழிலாளியாகக் கடமையாற்றினு ரென்பதை அவர் அறிவாரா? (ஆ) அவர் பாரிசவாதத்தால் பீடிக்கப்பட்டாரென்பதை யும் வைத்தியச்சபையின் சிபார்சின் பிரகா ரம் 1962, ஆகஸ்ட் 21 ஆம் தேதியிலிருந்து சேவையிலிருந்து இளைப்பாறினுரென்பதை யும் அவர் அறிவாரா? (இ) அவரது இளைப் பாற்றுச்சம்பளத்தை வழங்குவதற்குப் பொதுத் திறைசேரி நடவடிக்கையெதுவும் மேற்கொள்ளவில்லையென்பதையும் அவரது மனைவியையும் நாலு பிள்ளைகளையும் அவர் பாதுகாக்கவேண்டியுள்ள தென்பதையும் அவர் அறிவாரா? (ஈ) சிகிச்சைபெறுவதற் கும், அவரது குடும்பத்தைப் பாதுகாப்பதற் கும் அவர் பெருமளவு பணம் செலவிட வேண்டியுள்ளதை முன்னிட்டு, அவரது இளைப்பாற்றுச்சம்பளத்தை உடனடியாகக் கொடுக்கும்படி அவர் திறைசேரிக்கு உத்தர விடுவாரா?*

asked the Minister of Finance: (*a*) Is he aware that R. S. Jalaldeen of No. 20, Madige, Udatalawinna, was working as a conservancy labourer in Madugoda and Kandy hospitals? (*b*) Is he aware that he suffered from paralysis and was retired with effect from 21st August, 1962, on the recommendations of a Medical Board? (*c*) Is he aware that the General Treasury has taken no action to pay him his pension and that he has to maintain his wife and four children? (*d*) In view of the fact that he has to spend a considerable sum of money for treatment and the maintenance of his family will he direct the Treasury to pay him his pension immediately?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

(අ) ඔව්. (ආ) ඔව්. (ඇ) 1963 ජනවාරි මස තාවකාලික විශ්‍රාම වැටුපක් භාණ්ඩාගාරය විසින් ජලල්දීන් මහතාට අනුමත කොට ඇති අතර මෙතෙක් ඔහුට මෙම තාවකාලික විශ්‍රාම වැටුප ලැබේ. ඔහු දැනට ලබාගන්නා මුදලෙන්, ඔහුට හිමි අවසාන වශයෙන් ගණන් බැලූ දීමනාවෙන් වෙනස මසකට රු. 2.45 ක් පමණි. (ඈ) ජලල්දීන් මහතාගේ පරිවර්තිත පාරිතෝෂිකයේ හා අවසන් අඩු කළ විශ්‍රාම වැටුපේ ගණන් බැලීම, ඔඩිටර් ජනරාල්වරයා විසින් හරි වැරදි බලන අතර, නුදුරේදීම ඔහු ඔහුගේ වැඩිකළ විශ්‍රාම වැටුප ලබාගන්නවා ඇත. මෙම කාරණයට භාණ්ඩාගාරය විසින් ඔඩිටර් ජනරාල්වරයාගේ අවධානය යොමු කරවනු ලැබේ.

**මෙරිල් ප්‍රනාන්දු මයා.** (එඩ්මන්ඩ් සමරක්කොඩි මයා. වෙනුවට)
*(திரு. மெரில் பெர்னுண்டோ—திரு. எட்மன் சமரக்கொடி சார்பாக)*
(Mr. Meryl Fernando—on behalf of Mr. Edmund Samarakkody)

මා අහනව 9 වන ප්‍රශ්නය.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரி. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

අවශ්‍ය කරුණු සොයා ගැනීමට කල් වුව මනා නිසා මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහාත් කල් ඉල්ලා සිටිනව.

ගරු කථානායකතුමනි, අය වැය ලේඛනය පිළිබඳ විවාදය පවතින දිනවල දින පතාම පාර්ලිමේන්තුව රැස් වන බව තමුන්නාන්සෙ දන්නව ඇති. එම නිසා අනික් දවස්වලදී වාගෙ කාලය ලැබෙන්නෙ නැහැ, ගරු මන්ත්‍රීවරුන් අසන ප්‍රශ්නවලට උත්තර පිළියෙළ කර ගන්න. හුඟක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා කල් ඉල්ලන්න සිදු වෙලා තියෙන්නෙ ඒකයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**මෙරිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. மெரில் பெர்னாண்டோ)*
(Mr. Meryl Fernando)

අපට එය පිළිගන්න බැහැ. දෙපාර්ත මේන්තුවල නිලධාරීන් විසිනුයි, මේවට උත්තර සපයන්නෙ. ඒ අය මෙම සභාවට ඇවිත් කාලය ගත කරන්නෙ නැහැ.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

නිලධාරී මහත්වරුන්ට බොරු ගොතන්නටද මෙච්චර කල් ඉල්ලන්නෙ?

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

**මෙරිල් ප්‍රනාන්දු මයා.** (එඩ්මන්ඩ් සමරක්කොඩි මයා. වෙනුවට)
*(திரு. மெரில் பெர்னாண்டோ—திரு. எட்மன் சமரக்கொடி சார்பாக)*
(Mr. Meryl Fernando—on behalf of Mr. Edmund Samarakkody)

මා අහනව 10 වන ප්‍රශ්නය.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரி. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

මෙම ප්‍රශ්නයටත් පිළිතුරු සැපයීම සඳහා කල් ඉල්ලනව. කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලයෙන් අවශ්‍ය කරන කරුණු ලබා ගැනීමට චූවමනා කරනව. 21 වන දාට තරම උත්තර දෙන්න පුළුවන් වේවි.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

**මෙරිල් ප්‍රනාන්දු මයා.** (එඩ්මන්ඩ් සමරක්කොඩි මයා. වෙනුවට)
*(திரு. மெரில் பெர்னாண்டோ—திரு. எட்மன் சமரக்கொடி சார்பாக)*
(Mr. Meryl Fernando—on behalf of Mr. Edmund Samarakkody)

මා අහනව 11 වන ප්‍රශ්නය.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரி. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ඒ සඳහාත් ප්‍රාදේශීය කාර්යාලයෙන් උත්තර ලැබිල නැහැ. එම නිසා ඒ ප්‍රශ්නයටත් පිළිතුරු සැපයීම සඳහා කල් ඉල්ලනව.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

තමුන්නාන්සෙලට අස් වෙලා යන්න අපි කල් දෙනව.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

**කථානායකතුමා**
*(சபாநாயகர்)*
(Mr. Speaker)

4 වන ප්‍රශ්නයට උත්තර දෙන්න පුළුවන්කම තියෙන බව පේනව. එම ප්‍රශ්න යම්කිසි මන්ත්‍රීවරයෙක් අහනවද?

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

මෙම ප්‍රශ්නය ඉස්සෙල්ලත් අහල තියෙනව. මා අහනව එම ප්‍රශ්නය.

## ටැක්සි රථ අයිතිකරුවන්ට අමතර කොටස් : ලබා ගැනීමට තිබෙන අමාරුකම්

*கார் உதிரிப் பாகங்கள் : வாடகைக் கார் சொந்தக்காரர் படும் கஷ்டங்கள்*

MOTOR SPARE PARTS : DIFFICULTIES EXPERIENCED BY TAXI-OWNERS

4. **කේ. එම්. පී. රාජරත්න මයා.** (වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඩී. ද සිල්වා වෙනුවට)

*(திரு. கே. எம். பீ. ராஜரத்ன—டொக்டர் டப்ளியு. டீ. டி சில்வா சார்பாக)*

(Mr. K. M. P. Rajaratna—on behalf of Dr. W. D. de Silva)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ටැක්සි රියැදුරන්ට ඔවුන්ගේ ටැක්සි රථ වලට අමතර කොටස් මිලදී ගැනීමේදී දුෂ්කරතාවයන් සිදුවන බව එතුමා දන්නවාද? (ආ) එසේ නම්, ඔවුන්ට සහනයක් ලබා දීම සඳහා එතුමාගේ අමාත්‍යාංශය ගැනීමට අදහස් කරන ක්‍රියා මාර්ගය කුමක්ද?

*நிதியமைச்சரைக் கேட்ட வினா: (அ) வாடகைக் கார்ச் சொந்தக்காரர்கள் தமது கார்களுக்கு வேண்டிய உதிரிப் பாகங்களை வாங்குவதில் மிகுந்த கஷ்டங்களை அனுபவிக்க வேண்டியுள்ளதென்பதை அவர் அறிவாரா? (ஆ) ஆமெனில், அவர்களுக்கு நிவாரணமளிக்கும் வகையில் அவரது அமைச்சு என்ன நடவடிக்கையெடுக்க உத்தேசித்துள்ளது?*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

asked the Minister of Finance: (a) Is he aware that the taxi-owners experience much difficulties in purchasing spare parts for their taxis? (b) If so, what action does his Ministry propose taking to grant them relief?

**ටී. බී. තෙන්නකෝන් මයා.** (වාණිජ හා කර්මාන්ත පිළිබඳ ඇමති වෙනුවට)

*(திரு. ரி. பி. தென்னகோன்—வர்த்தக கைத்தொழில் அமைச்சரின் சார்பாக)*

(Mr. T. B. Tennekoon—on behalf of Minister of Commerce and Industries)

(අ) ඔව්, එහෙත් මෙය සියලුම මෝටර් වාහන හිමියන්ට ඇති පොදු අමාරුකමකි. (ආ) මෝටර් වාහන අමතර කොටස් ආනයනය පිණිස රුපියල් කෝටි 1.6 ක් වන කොටස මේ වර්ෂයේදී වෙළඳුන්ට වෙන් කර දී ඇත. 1963 සැප්තැම්බර වන විට මෙයින් රුපියල් ලක්ෂ 36 ක් වටිනා අමතර කොටස් දිවයිනට ආනයනය කර ඇති අතර මීළඟ මාස පහ තුළදී රු. 70 ලක්ෂයක් වටිනා ආනයනයන් ලැබෙතැයි බලාපොරොත්තු වේ. ටැක්සි හිමියන් සහ අනිකුත් මෝටර් වාහන හිමියන් විඳිනා අමාරුකම් මෙයින් සැලකිය යුතු ප්‍රමාණයකට අඩුවිය යුතුය.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු ලේකම්තුමා පිළිතුරු දුන් හැටියට නම්, මෝටර් රථවාහන අමතර කොටස්වල මිළ අඩු වන්නෙ නැහැ. එම නිසා මේවායෙ මිළ පාලන ක්‍රමයක් ඇති කිරීමට පුළුවන් තරම් ඉක්මනින් ක්‍රියා කරනවද කියා දැන ගන්ට කැමතියි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**

*(திரு. ரி. பி. தென்னகோன்)*

(Mr. T. B. Tennekoon)

ඒ ගැන ගරු ඇමතිතුමාට දන්වාවා.

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම

*சபை அமர்வு*

## SITTING OF THE HOUSE

**ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන (රජයේ වැඩ හා තැපැල් කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ எம். பீ. டி சொய்சா சிறிவர்த்தன—அரசாங்கக் கட்டுவேலை தபால் அமைச்சர்)*

(The Hon. M. P. de Zoysa Siriwardena—Minister of Public Works and Posts)

ගරු සභානායකතුමා වෙනුවෙන් මා මෙම යෝජනාව ඉදිරිපත් කරනව:

අංක 74 (2) ස්ථාවර නියෝගයේ කුමක් සඳහන් වී තිබුණද 1963 සැප්තැම්බර් මස 12 වැනි බ්‍රහස්පතින්දා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම් වේලාව පූ. භා. 10 සිට අ. භා. 12.30 දක්වා ද; අ. භා. 2 සිට අ. භා. 4 දක්වා ද; අ. භා. 4.30 සිට අ. භා. 10.30 දක්වා ද විය යුතුය. තවද (අ) අ. භා. 10ට අංක 8 ස්ථාවර නියෝගයේ (5) සහ (6) වන ඡේද ක්‍රියාත්මක විය යුතුය; (ආ) කථානායකතුමා අ. භා. 10.30ට ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම කල් තැබිය යුතුය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

ගරු කථානායකතුමනි, හෙට අයවැය ලේඛනය තුන්වැනි වර කියවා අවසන් කිරීමට අප තීරණය කර ගත් බව ඇත්තයි. නමුත් බොහෝ අමාත්‍යාංශ ගැන සාකච්ඡා කරන්ට අවස්ථාවක් නොලැබීමේ හේතුව ගැන ගරු ඇමතිවරුන් හා ගරු මන්ත්‍රීවරුන් දන්නවා ඇති. ඉතිරි සියලුම අමාත්‍යාංශ ගැන සාකච්ඡා කිරීම සඳහා තව අපට ඉතිරිව තිබෙන්නෙ පැය 24 ක කාලය කුයි. ගිය අවුරුද්දේ අයවැය ලේඛන කාරකසභා අවස්ථාව සඳහා දින 13 ක් දී තිබෙන නිසාත්, මේ වර තවම අපට අමාත්‍යාංශ වැඩි ගණනක් ගැන සාකච්ඡා කරන්ට අවස්ථාවක් නොලැබුණු නිසාත්, මේ සාකච්ඡාව හෙට නොව අනිද්දා අවසන් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. ගිය අවුරුද්දෙ දවස් 13 ක් දුන්නා නම් මේ අවුරුද්දෙත් දවස් 13 ක් දීම අපහසු වේ යයි මා හිතන්නෙ නැහැ. තව දවසක්වත් වැඩිපුර දුන්නොත් එක්තරා ප්‍රමාණයකින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

වත් අපට ඉතිරි අමාත්‍යාංශ ගැන සාකච්ඡා කරන්ට පුළුවන් වේවි. එම නිසා ඉදිරිපත් කරන ලද මෙම යෝජනාවේ දිනය හෙට නොව අනිද්දා කරන ලෙස මා ඉල්ලා සිටිනව. ඒක නීතියට එකඟයි—ස්ථාවර නියෝගවලට එකඟයි. සභානායකතුමා හිටියා නම් මගේ මේ අදහසට විරුද්ධ වේය කියා මා හිතන්නෙ නැහැ.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

මේ සාකච්ඡාව සඳහා දිය හැකි වැඩිම දින ගණන ගැන සඳහන් නීතියක් තිබෙන වා නම් ඒ නීතිය අනුව දිය හැකි ඒ වැඩිම දින ගණන දීම යුතුකමක්. සමහර වැය ශීර්ෂ ගැන සාකච්ඡා කිරීම ප්‍රමාද වුණේ මොන කරුණු නිසාදැයි තමුන්නාන්සෙල දන්නව ඇති. ගරු සෞඛ්‍ය ඇමතිතුමාට ඊයෙ මේ ගරු සභාවට නොපැමිණිය හැකි වුණු නිසා සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිබඳ වැය ශීර්ෂය සම්මත කර ගැනීම අදට කල් තබන්න සිදු වුණා. යම්කිසි ඇමතිවරයකුට යම්කිසි අපහසුකමක් තිවුණා නම් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් හැම වෙලා වෙම ඒ ඇමතිතුමා ඒ අපහසුකමින් මග හරවා ගැනීම පිණිස වුවමනා කරන හැම කටයුත්තකටම එකඟ වුණු බව ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් දන්නව ඇති. ගරු ආහාර ඇමතිතුමාට තමාගෙ රාජකාරිය නිසා තිබුණු අවහිරකම් නිසා එම ඇමති අංශය ගැන සාකච්ඡා කිරීම ප්‍රමාද කරන ලෙස කීම ගැන විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරු එකඟ වුණා. සාධාරණ ඉල්ලීම කට විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරු විරුද්ධ වන්නෙ නැහැ. ඒ වාගේම නීතිය අනුවත් වැඩිපුර තියෙන මේ දවස අප සියලු දෙනාටම දේවිය කියා අපි බලා පොරොත්තු වෙනව. තවත් කරුණක් තිබෙනව. මා තමුන්නාන්සෙලාට මතක් කරන්ට කැමතියි, මේ සාකච්ඡාවෙදි නීති අනුව අපි තදින් ක්‍රියා කළා නම් තමුන් නාන්සෙල සංශෝධනය ගැන කල් දී නො තිබුණු නිසා ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීන්ට කථා කරන්ට ඉඩ දෙන්න බැරි ය කියන්න අපට පුළුවන්කම තිබුන නමුත් අපි ඒ විධියේ තර්ක ඉදිරිපත් කළේ නැහැ. අපි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රී වරුන්ට ඕනෑ තරම්, බඩ පිරෙන්නම, කථා කරන්ට ඉඩ ප්‍රස්ථාව දුන්න. නියම විධියටම ක්‍රියා කරන්නය කියා අපි කිව්වෙ නැහැ. ඒ නිසා මේ වැඩිපුර දවසක් ඉල් ලීම සාධාරණයි. ඊට එකඟ වෙන මෙන් මම මේ ගරු ඇමති වරුන්ගෙන් ඉතා කරුණා වෙන් ඉල්ලා සිටිනව.

**මෙරිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. மெரில் பெர்னாண்டோ)*
(Mr. Meryl Fernando)

ගරු කථානායකතුමනි, වැඩිපුර දවසක් දෙන්න කියා කර තිබෙන මේ ඉල්ලීම මමත් අනුමත කරනව. ඊට හේතු දෙකක් තිබෙනව. තව සුමානයක් දුන්නත් මේ වැය ශීර්ෂ සම්පූර්ණයෙන් සාකච්ඡා කරන්ට බැහැ. නමුත් සාකච්ඡා කළ යුතු තවත් වැදගත් වැය ශීර්ෂ කීපයක් තිබෙනව. තව වැඩිපුර දවසක් දුන්නොත් මේ වැද ගත් වැය ශීර්ෂවලින් එකක් ගැනවත් සාකච්ඡා කරන්ට පුළුවන්. අනෙක් කාරණය, වැඩිපුර දවසක් දුන්නොත් ඒ කාලය ලැබෙන්නෙ විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීන්ට පමණක් නොවෙයි. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීන්ටත් ඒ කාලය ලැබෙනව. දෙපාර්ශ්වයටම ඒ කාලය බෙදා ගෙන සාකච්ඡා කරන්ට පුළුවන්. ඒ නිසා වැඩිපුර දවසක් ඉල්ලන මේ යෝජනාවට එකඟ වන මෙන් මම විශේෂයෙන්ම ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව.

**ආර්. සිංගල්ටන්-සැමන් මයා.** (පත් කරන ලද මන්ත්‍රී)
*(திரு. ஆர். சிங்கல்டன்-சமன்—நியமன அங்கத்தவர்)*
(Mr. R. Singleton-Salmon—Appointed Member)

I want to point out that the Standing Orders were framed when the House was a very much smaller one. We now find ourselves in an anomalous position.

The relevant Standing Order states that twenty days shall be allotted to the consideration of the Budget, seven of which shall be for the Second Reading and twelve for the Committee stage, making nineteen. Apparently the twentieth day is for the Third Reading. I do not know why, but there is also a

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

provision that two extra days can be allotted if a Motion to that effect is moved by a Minister.

The point I want to make is that these Standing Orders were framed when this House was a very much smaller one and when hon. Members were not quite so long-winded.

**ගරු ටී. බී. ඉලංගරත්න (මුදල් ඇමති)**
*(கௌரவ ரி. பி. இலங்கரத்ன—நிதியமைச்சர்)*
(The Hon. T. B. Ilangaratne—Minister of Finance)

විරුද්ධ පාර්ශ්වය වගේම ආණ්ඩු පක්ෂයත් නිතරම සහයෝගයෙන් වැඩ කරන්ට කැමතියි. ඒ වාගේම ඊයේ ගාල්ලෙ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) මේ වැය ශීර්ෂය ගැන කථා කරමින්, අද සවස මෙය අවසාන කරමු, කියා කිව්වා. ඒ එසේ වුණත් ආණ්ඩු පක්ෂයේ ගරු ඇමතිවරුන් මෙහි නොසිටියත්, ඕනෑම අවස්ථාවක පිළිතුරු දීමට අපි ලෑස්තිව සිටියා. ඒව එතරම් වැදගත් දේවල් නොවෙයි. නමුත් මම එකක් මතක් කරන්න කැමතියි. අපි මුදල් පණත ඉදිරිපත් කර තිබෙන නිසා අනිත් වැය ශීර්ෂ ගැන බොහොම හොඳට සාකච්ඡා කිරීමට තවත් අවස්ථාවක් ලැබෙනව. තමුන්නාන්සෙල කැමති නම් ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න පුළුවනි. [බාධා කිරීම්] ලබන සුමානේ වැඩ රාශියක් ගැන සාකච්ඡා කිරීමට ආණ්ඩුවට තිබෙනව. [බාධා කිරීම්] එහෙම නැත්නම් තමුන්නාන්සෙල කියන පිළිදි සිකුරාදත් වැඩ කරන්ට අපි ඉඩ දෙමු. ඒ වාගේම මේ දුන් දක්වන ලද සහයෝගය වගේම සහයෝගයක් ලබන සුමානෙ ආණ්ඩුවේ වැඩ කටයුතු කරන අවස්ථාවේදීත් දක්වන මෙන් මම තමුන්නාන්සෙලාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනව. තමුන්නාන්සෙලාගෙ සහයෝගය ඇතිව ඒ වැඩ කෙටියෙන් කරගත හැකි වේ යයි අපි බලාපොරොත්තු වෙනව.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

අපි හොඳට සාකච්ඡා කර සහයෝගය දෙනව.

**ගරු ඉලංගරත්න**
*(கௌரவ இலங்கரத்ன)*
(The Hon. Ilangaratne)

එම නිසා මේ යෝජනාව මා ඉල්ලා අස් කර ගන්නව. හොඳටත් කෙටියෙනුත් ලබන සුමානයේ වැඩ කරනවා ඇතැයි කියාත් බලාපොරොත්තු වෙනව.

යෝජනාව මන්ත්‍රී මණ්ඩලයේ අවසරය පරිදි, ඉල්ලා අස් කරගන්නා ලදි.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

මුදල් ඇමතිතුමාට ජය වේවා.

## විසර්ජන කෙටුම්පත් පණත, 1963-64

*ஒதுக்கீட்டு மசோதா, 1963–64*

APPROPRIATION BILL, 1963-64

කාරක සභාවෙහිදී සලකා බලන ලදි.—[ප්‍රගතිය සැප්තැම්බර් 10]

[කථානායකතුමා මූලාසනාරූඪ විය.]

**154 වන ශීර්ෂය—සෞඛ්‍ය හා නිවාස අමාත්‍යවරයා**

**1 වන සම්මතය.—කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි සහ අතිකුත් දීමනා, රු. 2,85,394.**

**1 වන උප ශීර්ෂය.—සේවක සංඛ්‍යා සහ වැටුප්, 1,82,917**

*தலைப்பு 154.—சௌக்கிய வீடமைப்பு அமைச்சு*

*வாக்குப்பணம் இல. 1.—பணியாளரின் ஆளுக்குரிய வேதனமும் பிற படிகளும், ரூபா 2,85,394*

*உப தலைப்பு 1.—ஊழியர் கோப்பும் சம்பளங்களும் ரூபா 1,82,917*

HEAD 154.—MINISTER OF HEALTH AND HOUSING

*Vote No. 1.—Personal Emoluments and other allowances of staff, Rs. 285,394*

*Sub-head 1.—Cadre and salaries, Rs. 182,917*

ඉදිරිපත් කරන ලද සංශෝධනය—[සැප්තැම්බර් 5]

"That the Vote be reduced by Rs. 10 in respect of sub-head 1, item 'Minister'" [ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා.]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

ගරු සභාපතිතුමනි, අද නිවාස ප්‍රශ්නය උග්‍ර වී තිබෙන පිළිවෙළ අනුව විසඳා නැති ඒ නිවාස ප්‍රශ්නය මේ ආණ්ඩුවට අභියෝගයක් වී තිබෙනව.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නයක් දැන ගන්නට කැමතියි. මේ වැය ශීර්ෂය අනුව අපට පිළිතුරු ලැබෙන්නේ කොයි වෙලාවේද කියා දැනගන්නට කැමතියි.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

ඇමතිතුමා ඇවිත් උත්තර දේවි. කෙටියෙන් කථා කළොත් පිළිතුරු දෙන්නට අවස්ථාව ලැබෙනව. කරුණා කර කෙටියෙන් කථා කරන්න කිව්වෙ ඒ නිසා තමයි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

කොයි වෙලාවෙද පිළිතුරු දෙන්නෙ?

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

ඇමතිතුමා ආවට පසු දැනගන්නට පුළුවනි. ඇමතිතුමාට ටිකක් සනීප මදි. ඒ නිසා පසුව ඒවි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ඇමතිතුමා එන්නට ප්‍රථමයෙන් එන වෙලාව දැනගන්නට කැමතියි.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

කීයටද එන්න කියන්න ඕනැ? එතුමාට සනීප මදි නිසා පිළිතුරු දෙන්න එන්නට කියන්න ඕනැ කීයටද?

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

තුනට එන්න කියන්න. තව පැය 3 යි තිබෙන්නෙ. මේ නිවාස ක්‍රමය සඳහා තව පැය තුනක් වැඩි නැහැනෙ.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

තව පැය 3 ක් නියම කර ගනිමු. ඊට කලින් අවසාන වුණොත් ඇමතිතුමාට ඇවිත් පිළිතුරු දෙන්න පුළුවන්. ඒ නිසා ඇමතිතුමාට 2 ට එන්න කියන්න. අපි බලාපොරොත්තු වන වැඩිම කාලය 3 වන තෙක් පමණයි.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

ඔව්, එහෙනම් 2 ට වඩම්මවාගෙන එන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

අපි වඩම්මවාගෙන එන්නම්. තමුන්නාන්සෙලා පෙරහැර ලැහැස්ති කරන්න.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

ගරු සභාපතිතුමනි, අද නිවාස ප්‍රශ්නය උග්‍ර වී තිබෙන පිළිවෙළ අනුව ඒ විසඳා නැති නිවාස ප්‍රශ්නය මෙම ආණ්ඩුවට අභියෝගයක් වී තිබෙනව. ඒ අභියෝගය ට නියම විධියෙ පිළිතුරක් පසුගිය අවුරුදු තුනේ කාලයේදි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ රජය දී නැති බව කනගාටුවෙන් ප්‍රකාශ කරන්නට කැමතියි. ඒ නිසා ඉදිරියට තිබෙන අවුරුදු දෙකේදිවත් ඒ නිවාස ප්‍රශ්නය පිළිබඳ අභියෝගයට තිසි විධියෙ පිළියමක් යොදන්නය කියා මම ආණ්ඩුවෙන් ඉල්ලනව.

දැනට තිබෙන නිවාස අංශයේ වැඩ කටයුතු අසතුටුදායක නිසා ජාතික නිවාස සංයුක්ත මණ්ඩලයක් ඇති කරන්නය කියා මා යෝජනා කරනව. එවැනි සංයුක්ත මණ්ඩලයක් පිහිටුවීම අංග සම්පූර්ණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ක්‍රියාමාර්ගයක් අනුව කළ යුතුයි. එනම්: මුලින්ම, මුළු රටේම අවශ්‍ය තැන්වලට නිවාස සැපයීම; දෙවනුව, අද තිබෙන ඉඩම් බේරා ගැනීම, නැත්නම් ඉඩම් අත්පත් කර ගැනීමේදි තිබෙන අමාරුකම් මග හරවා ඉක්මනට ඉඩම් ගන්නට පිළිවෙළක් යෙදීම; තුන්වැනිව, නිවාස සෑදීමේදි වුවමනා කරන උපකරණ, බඩු මුට්ටු ආදී පිටරටින් ගෙන්වන්නට තිබෙන ද්‍රව්‍ය —යකඩ වෙන්න පුළුවන්, සිමෙන්ති වෙන්න පුළුවන්—ඒ සංයුක්ත මණ්ඩලයෙන් ගෙන්වීම; හතර වැනිව, මේ රටේ සදන්නට පුළුවන් ද්‍රව්‍ය සහ අඩුවැඩිය— උළු, ගඩොල්, හුණු, ලී, ආදී සියලුම දේවල් —ඒ සංයුක්ත මණ්ඩලයෙන් සපයා ගැනීම; කළ යුතුයි. එමෙන්ම අවශ්‍ය කරන කම්හල් මේ සංයුක්ත මණ්ඩලය මගින්ම සුදුසු ස්ථානවල පිහිටුවන්නට ඕනෑ. ඊළඟට පස් වෙනුව, වැඩ කටයුතු කරගෙන යාම පිණිස ඒ සංයුක්ත මණ්ඩලයේම ඉංජිනේරු අංශයක් ඇති කර ගැනීම. හය වෙනුව, ඒ ඉංජිනේරු අංශයේම, ඒ යටතේ වැඩ කරන වඩුවෝ, පෙදරේරුවෝ, කම්කරුවෝ ආදීන්ගෙන් යුත් අංශයක් ඇති කරන්න ඕනෑ. මේ මේ විධියට අංග සම්පූර්ණ ක්‍රියා මාර්ගයක් ඇතිව ජාතික නිවාස සංයුක්ත මණ්ඩලයක් පිහිටුවා, ප්‍රජාතන්ත්‍රවාදි අන්දමට නිවාස ලැබෙන නිවාස ක්‍රමයක්—හවුසිං ඩිමෝක්‍රසි—සකස් කිරීමට වැඩ පිළිවෙළක් ඇති කරන්නටය කියා අප ඉල්ලා සිටිනවා. එවැනි වැඩ පිළිවෙළක් ඇති කළොත් දැන් සම්පූර්ණයෙන්ම අත්හැර දමා තිබෙන වැදගත් කරුණු ඉෂ්ට කරන්න පුළුවනි. එවැනි වැදගත් කරුණු එකක් දෙකක් ඉදිරිපත් කරන්න කැමතියි.

එකක්, අලුත් නගර පිහිටුවීම, අප නිදහස ලබාගත්තාට පසු අලුතෙන් නගර කීයක් පිහිටුවා තිබෙනවද? එක අලුත් නගරයක් නම් පිහිටුවාගෙන යනවා. ඒ අලුත් නගරය පිහිටුවීමට විශෙෂ කරුණක් තිබුණා. පැරණි සුඩ නගරය නැතිනම් පැරණි අනුරාධපුර නගරය නියම විධියේ සැලැස්මක් අනුව තිබුණේ නැති නිසා, ඒ පිරිසිදු-සුඩ නගරය කළි වී තිබුණු නිසා, ඒ නගරය පිටට ගෙන යාමට නැති නම් අලුත් නගරයක් පිහිටුවීමට සිදු වුණා. නමුත් ඒ වගේ දේවල් ගැන නොවෙයි මම කථා කරන්නෙ.

ජාතික නිවාස සංයුක්ත මණ්ඩලයක තිබෙන රාජකාරිය අලුතෙන් නගර පිහිටුවීමයි. දෙවැනි ලෝක මහා යුද්ධයෙන් පසු තිබුණු එක්තරා විධියක සංවර්ධන ප්‍රතිසංස්කරණයක් තමයි අලුත් නගර පිහිටුවීම. එවැනි අලුත් නගර පිහිටුවන්නෙ ජන ගහනය වැඩි නගරවල ඉඩකඩ ලබාගැනීමට හා වැඩි වේගන එන ජනගහනයට නියම විධියෙ සෞඛ්‍ය පහසුකම් ඇතුව හොඳ නගරවල ජීවත්වීමට ඉඩ සලසා දීම සඳහායි. තමුන්නාන්සෙට මම ඉදිරිපත් කරන්න කැමතියි, දෙවැනි මහා යුද්ධයෙන් පසු එංගලන්තයේ කොපමණ ලක්ෂණ පිළිවෙළකට අලුත් නගර 15 ක් පිහිටුවා තිබෙනවද කියා. 1947 දි ආරම්භ කරන ලද මේ වැඩ පිළිවෙළ අනුව, කොපමණ අක්කර ප්‍රමාණයක් අලුත් නගර සඳහා වෙන් වී තිබෙනවද, දැනට මේ නගරවල පදිංචි ජන ගහනය කොපමණද, ඒ අයට කොපමණ ගොඩනැඟිලි සදා දී තිබෙනවාද, තව අවුරුදු කීපයකින් සදා නිමවන ගෙවල් සංඛ්‍යාව කොපමණද, කොපමණ සංඛ්‍යාවක් පදිංචි කරවීමට බලාපොරොත්තු වෙනවද, ඒ අනුව ජනගහනය කොපමණ විය හැකිද, දැනට කොපමණ කර්මාන්තශාලා ආරම්භ කර තිබෙනවද, ඉදිරියට කොපමණ ආරම්භ කරන්න බලාපොරොත්තුව සිටිනවද, ඒ අනුව කර්මාන්තශාලා සදා නිම කරන විට කොපමණ සංඛ්‍යාවකට රක්ෂා දිය හැකිද, ඒ වැඩ කටයුතු සඳහා කොපමණ මුදලක් වැය කළ යුතුද, මේ ආදී විස්තර සියල්ලක්ම මේ පොතේ සඳහන් වී තිබෙනවා. මේ පොත කියවූ කෙනෙකුට, අලුත් නගර පිහිටුවීම සඳහා එංගලන්තය කොපමණ ලක්ෂණ වැඩ පිළිවෙළක් ගෙන තිබෙනවද කියා තේරුම් යනවා. සැලැස්මවල් ඇති කරමින් ලංකාවේ අළුත් නගර පහක්, හයක් ජාතික නිවාස සංයුක්ත මණ්ඩලය මගින් ඇති කළ යුතුයි. එවැනි සංයුක්ත මණ්ඩලයකින් කළ යුතු තවත් වැදගත් කාරණාවක් ඉදිරිපත් කරන්න තියෙනවා. එනම් ස්වභාව ධර්මය අනු ඉඩම් වෙන් කිරීමෙයි. Natural reserves. ඒ විධියට අද ඉඩම් වෙන් කරල නැහැ. සවභාව ධර්මය අනුව වෙන් කරන ඉඩම් ගැන විස්තරයක් මම මේ පොතෙන් කියවන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

"The natural reserve will consist of mountain country, marshes, woodlands, fens, tidal mud flats, moorland, grassland, dunes and shingle ridges, ranging in size from a few acres to a large acreage and offering a unique opportunity for the intensive study of the indigenous flora and fauna in their natural state."

ඒ විධියේ දේ අළුතෙන් පිහිටුවන්න ඕනෑ. කඳු, මඩ වගුරු, නොයෙකුත් විධියේ පැළෑටි, ගස් කොළන්, සතුන් ස්වභාව ධර්මය අනුව සෑදෙන ස්ථාන වෙන් කර න්ට ඕනෑ. මේ ආණ්ඩුව පිහිටුවූවාට පසු කොපමණ අළුත් අභය භූමි ඇති කළාද කියා මම අහන්න සතුටුයි. අපේ රටේ අභය භූමි දෙකක් තියෙනව. ඒ අධිරාජ්‍ය වාදීන්ගෙ කාලයෙදි පිහිටුවපු අභය භූමි දෙකයි. ඒ අභය භූමි දෙකෙන් එකක්, කොන්ත්‍රාත් කාරයන් ආණ්ඩුවේ කුට නිල ධාරීන් සමග එකතු වෙලා දෙවනත් කර දමනවාය, සුන් කර දමනවාය කියා අපට ආරංචියි. මේ ලංකාවේ තවත් අභය භූමි පිහිටුවන්න ඕනෑ. සිංහරාජ අඩවිය අභය භූමියක් කරන්න ඕනෑ. දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ අභය භූමියක් පිහිටු වන්නය කියා මම ඉල්ලනව. එවැනි අභය භූමියක් පිහිටෙව්වොත් එය යාල අභය භූමි යට දෙවෙනි නොවෙනවාය කියා මම හිත නව.

තව එක කාරණාවක් මතක් කර මගේ කථාව අවසාන කරන්න බලාපොරොත්තු වෙනව. මේ රටේ පාරවල් සෑදීමත් එවැනි සංයුක්ත මණ්ඩලයකින් භාර ගන්න ඕනෑ. අද අළුත් පාරවල් සෑදීම කාටවත් අයිති වැඩක් නොවෙයි. රජයේ වැඩ දෙපාර්ත මේන්තුවෙන් ඇහුවත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ඇහුවත් සැලැස් මක් අනුව රටේ පාරවල් හැදීම තමන්ට අයිති කාරණයක්ය කියන්නෙ නැහැ. මේ රජය නියම සංවර්ධන වැඩ පිළිවෙළක් අනුව තව හැතැප්ම හත් අට දාහක හොඳට සකස් කළ පාරවල් ඇති කළ යුතුයි. ඊයේ පෙරේසිදා රුපියල් ලක්ෂ 300 ක් වියදම් කර සෑදීමට ගත් මයියංගනයේ සිට පදිය තලාවට යන අඩි 40 ක් පළල පාරේ වැඩ අද ඇණ හිට තිබෙන බව ඉතා කනගාටු වෙන් කියන්න ඕනෑ ඒක මොඩ්ල් රෝඩ් එකක්—ආදර්ශ පාරක්. නමුත් අද ඒ පාර මොඩ්ල් රෝඩ් එකක් නොවෙයි, "මඩ් රෝඩ්" එකක් වෙලා—මඩ වගුරක් වෙලා. ළඟදීම ඒක කඩාගෙන යාවි. මේ සංයුක්ත මණ්ඩලය පාරවල් සෑදීම භාර ගන්න ඕනෑ. පී. ඩබ්ලිව්. ඩී. එකට කරන්නවත්, කැනෝ ඩියන් ඒඩ්වලින් කරන්නවත් තියන්නෙ නැතිව රටට අවශ්‍ය අළුත් පාරවල් සියල් ලක්ම ජාතික නිවාස සංයුක්ත මණ්ඩලය මගින් හදන්න ඕනෑ.

නිවාස ප්‍රශ්නය මේ ආණ්ඩුවට තියෙන අභියෝගයක්. නිවාස නැති අයට තමුන් නාන්සෙල නිවාස දෙනවද, නැද්ද කියන ප්‍රශ්නයට උත්තර දෙන්න ඕනෑ. ලංකාවට අද නිවාස ලක්ෂ 10 ක් අවශ්‍යයි. මේවා කොයි කාලයෙ දෙනවද? 1945 සිට 1961 දක්වා අවුරුදු 16 ක කාලය තුළදී එංගලන් තයෙ අළුත් නිවාස ලක්ෂ 40 ක් හැදුව. අවුරුද්දකට ගෙවල් ලක්ෂ දෙකහමාරක් හදනව. අපටත් පුළුවන් ඒ විධියට නියම සංයුක්ත මණ්ඩලයක් පිහිටුවා ඒ මගින් අවුරුද්දකට ගෙවල් ලක්ෂ 2 හමාර ගණ නේ සාදා අපේ රටේ දැනට පවතින නිවාස හිඟය අවුරුදු 4 කදී නැත්නම් 5 කදී නැති කරන්න. ඒ විධියේ අළුත් ජාතික සංවර් ධන වැඩ පිළිවෙළක් මේ අළුත් නිවාස ඇමතිතුමා විසින් ආරම්භ කරනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ කථාව අව සාන කරනව.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.** (නිවිතිගල)
*(திரு. ஸ்டான்லி மொல்லிகொட—நிவிதிகல)*
**(Mr. Stanley Molligoda—Niwitigala)**

ගරු සභාපතිතුමනි, ගාල්ලේ ගරු මන්ත්‍රී තුමා (ඩබ්ලිව්. දහනායක මයා.) ඊයේ රාත්‍රියේ පටන් ගත් දේශනයෙන් පසු නිවාස දෙපාර්තමේන්තුව සම්බන්ධ යෙන් වචන ස්වල්පයක් කථා කරන්ට මටත් ඉඩ ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනව. ගාල්ලේ ගරු මන්ත්‍රී තුමාගෙන් මා අහන්ට කැමතියි, අභය භූමි සහ නව නගර නිවාස දෙපාර්තමේන්තුවට ඇතුළත් වන්නේ කෙසේද කියා? කෙසේ වෙතත්, ගරු සභාපතිතුමනි, එතුමා තරම් දීර්ඝ කාලයක් මගේ කථාවට මා ගන්ට අදහස් කරන්නෙ නැහැ.

මන්ත්‍රී කොට්ඨාශයක් නියෝජනය කර න කෙනෙකු හැටියට නිවාස දෙපාර්තමේ න්තුව ගැන මා වචනයක් දෙකක් කිය න්ට කැමතියි. මා අදහස් කරන අන්දමට නම් මේ දෙපාර්තමේන්තුවට කිසිම සැළ ස්මක් නැති බවයි පෙනෙන්නෙ. එක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එක් තැන්වල නිවාස යෝජනා ක්‍රම අනුව ගෙවල් සාදනවා විනා කිසිම සැළැස්මක් දෙපාතීමේන්තුවට නැහැ. ඒ කියන්නෙ, අවුරුද්දකට ගෙවල් මෙතරම් ප්‍රමාණයක් සෑදිය යුතුය යන මූලික අදහසක් ඔවුන් තුළ නැහැ. 1963-64 කොපමණ ගෙවල් හදනවද, 1964-65 කොපමණ සාදන්ට බලාපොරොත්තු වෙනවද, 1965-66 කොපමණ සාදන්ට අදහස් කරනවද, යන විධියේ සැළැස්මක් තවම දෙපාර්තමේන්තුව පිළියෙළ කර නැහැ. විශේෂයෙන්ම ලංකාව වැනි නොදියුණු රටකට එවැනි සැළැස්මක් ඉතා අවශ්‍යයයි කියා මා කල්පනා කරනව.

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සෙ දන්නව, නගරවල මෙන්ම ගම්බද ප්‍රදේශවලත් අද නිවාස හිඟය ඉතා තදින් පවතින බව. මේ නිවාස හිඟය තිබෙන්නේ නගරවල පමණක් යයි සමහරුන් කියන නමුත් ඒ තර්කය පිළිගන්ට මා සූදානම් නැහැ. ගම්බද ප්‍රදේශවලත් නිවාස හිඟය තදින් පවතිනව. විශේෂයෙන් වතු කරයේ ජීවත්වන විශාල පිරිසක් සිටිනව, වතුවල කරන රැකියාවම ජීවනෝපාය කරගන්නා අය. සමහරවිට ඒ උදවියටත් මේ නිවාස ප්‍රශ්නය ඉතා උග්‍ර අන්දමට බලපානව. එම නිසා නගරවල මෙන්ම ගම්බදවත් නිවාස තැනීමේ සැළැස්මක් ඇති කළ යුතුයි. මේ විධියේ සැළැස්මක් ඇති කරන්ට ප්‍රමාද වුණා වැඩියි. දැනට අවුරුදු 15 කට 16 කට පමණ පෙරයි, මෙවැනි සැළැස්මක් පිළියෙළ කළ යුතුව තිබුණේ. ඒ වුණත් පසුගිය කාලය අපට නැවත වරක් ලබා ගන්ට පුළුවන්කමක් නැහැ. ප්‍රමාදවී වුවත් මේ අවධියේවත් යම් පරමාර්ථයක් ඇතිව, යම් සැළැස්මක් ඇතිව මේ නිවාස යෝජනා ක්‍රම ගෙන ගියොත් අපට පුළුවන් වෙනව, අපේ රටේ ගම්බද පළාත්වලත් ඒ වගේම නගරබද පළාත් වලත් දැනට පවතින නිවාස හිඟය බොහෝ දුරට මගහරවන්න.

ගරු සභාපතිතුමනි, නිවාස දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා පසුගිය කාලයේ අපට දැන්නුවා, සෑම මැතිවරණ කොට්ඨාශයකටම නිවාස යෝජනා ක්‍රමයක් දෙනවාය කියා. ඒ අතරම ඔහු අපෙන් ඉල්ලා සිටියා, ඒ සඳහා අවශ්‍ය ඉඩම් තිබෙන ස්ථාන පෙන්වා දෙන්නය, රජයේ ඉඩම්ම සොයා ගන්න පුළුවන් නම් වඩාත්ම හොඳය කියා. ඒ අවස්ථාවේදී රත්නපුරයේ දිස්ත්‍රික්ක සම්බන්ධතා කාරක සභාවේදී අපි ඒ ගැන සාකච්ඡා කළා. රත්නපුරේ ගරු මන්ත්‍රීතුමාත් ඊට සහභාගී වූ නිසා එතුමාත් මේ පිළිබඳව හොඳහැටි දන්නවා ඇති. බොහෝ මැතිවරණ කොට්ඨාශවල තිබෙන නිවාස යෝජනා ක්‍රම ඇති කිරීමට සුදුසු රජයේ ඉඩම් අපි නිවාස දෙපාර්තමේන්තුවට දැන්නුවා. අනික් ඒවායින් රජයට අත්පත් කර ගැනීමට වුවමනා ස්ථාන අපි පෙන්වා දුන්න; මගේ කොට්ඨාශයේ කහවත්ත නගරයට නුදුරින් පිහිටා තිබෙන ඇල්ලගෙවත්ත හේන් යාය මම පෙන්වා දුන්න. ගම් පුළුල් කිරීමෙ ව්‍යාපාරය සඳහා ඉඩම් වෙන් කරන අවස්ථාවෙදි රජයේ නිවාස යෝජනා ක්‍රමය සඳහා ඒ ඉඩමෙන් අක්කර පහක් වෙන් කළා; නමුත් වෙන් කළා පමණයි, ඉන් එහාට කිසි වැඩක් කෙරුණෙ නැහැ. රජයේ ඉඩම් තිබෙනවා නම් මෙම නිවාස යෝජනා ක්‍රම ඉක්මනින්ම ඇති කරන බව නිවාස දෙපාර්තමේන්තුව එදා අපට දැන්නුවා. එසේ වුවත් රජයේ ඉඩම් තිබෙන ස්ථානවලවත් තවම නිවාස යෝජනා ක්‍රම ඇති කර නැහැ. මෙය ඉතාමත් කනගාටුදායක කාරණයක්. රජයේ ඉඩම් නැත්නම් අපට කියන්න පුළුවනි, ඉඩම් අත්පත් කර ගැනීමෙ ආඥා පණත යටතේ රජයට ඉඩම් පවරා ගැනීමට යම් කාලසීමාවක් යනවය කියා. නමුත් රජයට අයිති කැලෑවක් නිවාස දෙපාර්තමේන්තුව සතුකර ඇති බව දිසාපතිවරය කිව්වට පසුවත් තවම ඒ නිවාස යෝජනා ක්‍රමය ඇති වුණේ නැහැ. මේ සම්බන්ධයෙන් නිවාස දෙපාර්තමේන්තුවෙන් විමසූ විට, කියන්නෙ මුදල් නැති බවයි. මුදල් නැතිකම නොවෙයි සභාපතිතුමනි, මීට හේතුව මා මුලිනුත් කිව්ව වගේ, සැළැස්මක් නැති බවයි. සෑම කච්චේරියකටම, සෑම මන්ත්‍රීවරයකුටම, නිවාස දෙපාර්තමේන්තුවෙන් ලියුම් ලියනව ඒ ඒ මැතිවරණ කොට්ඨාශවල නිවාස යෝජනා ක්‍රම ඇති කිරීමට කට යුතු කරනවය කියා. නමුත් එයින් කිසිම පලක් නැහැ. මම හිතන්නෙ නැහැ ලංකාවෙ එකම මැතිවරණ කොට්ඨාශයකටවත් තවමත් නිවාස යෝජනා ක්‍රමයක් ලැබී තිබෙනවය කියා. රජයෙ ඉඩම් තිබෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.]
ස්ථානවලට වුණත් නොලැබ තිබීම ඇත් තෙන්ම කනගාටුවට කරුණකටත් වඩා භයානක තත්ත්වයක්. ඇයි දෙවියනේ, දෙවියන්ගෙ නාමයෙන්—

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
දෙවියන් ගැන නැතිව වෙන විධියකින් කියන්න.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)
මම අහන්නෙ මේකයි. ඇයි මේ සැලැස් මක් ඇති කර නැත්තෙ? අවුරුද්දකට හදන්නෙ ගෙවල් මෙපමණයි කියා අපට කියනව නම් අපි පිළිගන්නව.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
ඒ දෙපාර්තමේන්තුව වසා දමන්න ඕනැ.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)
මේ අවුරුද්දෙ රුපියල් ලක්ෂ 10 ක නැත්නම් 5 ක නැත්නම් 3 ක ගෙවල් සෑදීමට අදහස් කරනවය කියනව නම්, අපි ඒක පිළිගන්නව. නමුත් එසේ නොකියා, සෑම මන්ත්‍රීවරයකුටම කියා එවනව, මේ මුදල් වර්ෂයේදී සෑම කොට්ඨාශයකටම දෙනවය කියා. නමුත් බැලුවම ආණ්ඩුවෙ ඉඩම් තිබෙන කොට්ඨාශවලවත් නිවාස යෝජනා ක්‍රම ඇති කර නැහැ. එම නිසා මේ නිවාස දෙපාර්තමේන්තුවෙන් මම ඉතාමත් ඕනෑකමින් ඉල්ලා සිටිනව, ඒවා කරන්න බැරි නම් කරුණා කර අපට ලියුම් එවන්න එපාය කියා. මැතිවරණ කොට්ඨාශවලට නිවාස යෝජනාක්‍රම දෙනවය කිව්වම අපි මහජනයාගෙන් විමසනව, මේ සඳහා යොදවීමට සුදුසු රජයේ ඉඩම් තිබෙනවද, රජයේ ඉඩම් නැත්නම් පෞද්ගලික ඉඩම් තිබෙනවද, කියා. දිසාපති කායර්‍යාලයෙනුත් මහන්සි ගන්නව ඉඩම් සොයා දෙන්න. නමුත් ඒ සියල්ලක් ගැනම මහන්සි ගෙන වැඩ කළාට පස්සෙ දෙපාර්තමේන්තුව කියනව සල්ලි නැත කියා.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
බොරුවට මුල් ගල් තබනව.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)
මුල් ගල් නම් දැන් පැළ වෙලා. නිවාස ණය ගැන ඊ ළඟට—

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
කරුණා කර කෙටි කරන්න.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.**
*(திரு. ஸ்டான்லி மொல்லிகொட)*
(Mr. Stanley Molligoda)
මෙය සභාපතිතුමනි, ඉතාමත් වැදගත් කරුණක්. නිවාස ණය දීමට වූ පොරොන්දු ක්‍රියාවෙ නොයෙදෙන්නෙ ඇයි? රුපියල් දෙදාහෙ ණයට මොකද වුණේ? සභාපතිතුමනි, ගම්බද පළාත්වල මහජනතාවට දැන්නුවා, සිට්ටු ඇදීමෙන් එක මැතිවරණ කොට්ඨාශයකින් 75 දෙනෙක් තෝර ගන්නය කියා. ඊට පසු ඔවුන්ට එවූ තවත් ලියවිල්ලක් අනුව, ඒ ඉඩම් වෙන් කර ඔවුන්ගෙ ඔප්පුවල පාරම්පරික අයිතිවාසිකම් සොයා ගත්ත. ඒ කායර්‍යයන් සඳහා ඞී.ආර්.ඕ. කන්තෝරු ගොස් රස්තියාදු වී රුපියල් සිය ගණන් ඒ ජනතාවට වියදම් වුණා. දෙපාර්තමේන්තුවෙන් නිවාස පරීක්ෂකවරුන් පවා ගොස් පරීක්ෂා කළා, නමුත් තවම සල්ලි ලැබුණෙ නැහැ. මේ මොන කරුමයක්ද කියා මම දන්නෙ නැහැ. මගේ කොට්ඨාශයට නම් තවම ලැබී නැහැ. වෙන කොට්ඨාශයක් ගැන මම දන්නෙ නැහැ.

අපේ කොට්ඨාශවලට නම් රුපියල් 2,000 හේ ණය ලැබී නැහැ. මේ ණය දීම පිළිබඳව තවත් "වංචාවක්" කළා. මුලින් කිව්වා, කිසිම ඇපයක් වුවමනා කරන්නෙ නැත කියා. නමුත් ඊට පසුව ඇපයක් වුවමනායයි කිව්වා. ඒ නිසා මිනිස්සු බොහොම අමාරුවෙන් අයබදු ගෙවන අය සොයා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙන ගොස් ඇපයට අත්සන් කරවා ගත්තා. මේවා කාට කියන්නද කියා මම දන්නෙ නැහැ.

රුපියල් 2,000 න් ඉහළ ණය දීම සඳහා බොහොම ලොකුවට ලැයිස්තු ප්‍රසිද්ධ කළා. අසවල් ගණනට ණය දෙනවායයි කිව්වා. ඒ අයට අර මුලින් කී අයට පවා වැඩි වියදමක් දරන්න සිදු වුණා. පෙරකදොරු කාර්යාලවලට ගොස් ඔප්පු පරීක්ෂා කර බලා කොළඹ පිහිටි ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට අවුත් වුවමනා ලියකියවිලි සොයා ගෙන ඒ අය බලා සිටිනවා, මේ ණය මුදලත් ලබාගැනීම සඳහා. එදා සිට තවමත් බලා සිටිනවා. ලබන මුදල් වර්ෂයේදී මේ ණය මුදල් දෙනවාලු. මම බලාපොරොත්තු වෙනවා, අඩු ගණනේ ආසනයකට 75 ගණනේ පොරොන්දු වූ ණයත්, ලැයිස්තු ප්‍රසිද්ධ කොට දෙනවායයි කී අයගේ ණයත් ලබන වර්ෂයේදී දේවිය කියා.

අද අපේ රටට නිවාස ඉතාමත්ම අවශ්‍යයි. නගරබදවත්, ගම්බදවත් නිවාස බොහෝ ගණනක් තැනිය යුතුව තිබෙනවා. ඒ නිසා මේ නිවාස ප්‍රශ්නය විසඳීමට යම් කිසි උපක්‍රමයක් යෙදිය යුතුයි. ඒ සඳහා යම් කිසි සැලැස්මක් ඇති කළ යුතුයි. එවැනි වැඩ පිළිවෙළක් ආරම්භ කරන්නේ කවදාද ? යම් කිසි සැලැස්මක් ඇතිව කට යුතු නොකළොත් මහජනයාට සිදු වන්නේ හැමදාම බලාපොරොත්තුවෙන් සිටීමට පමණයි. කවදාවත් අවශ්‍ය නිවාස තැනෙන්නේ නැහැ. ඒ නිසා මේ පිළිබඳව යම් කිසි සැලැස්මක් පිළියෙළ කොට දෙන්නට පොරොන්දු වී ඇති ණය මුලින්ම දෙන හැටියට මම ඉල්ලා සිටිනවා.

පූ.භා. 11

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ගරු නිවිතිගල මන්ත්‍රීතුමා (ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.) කීවාක් මෙන් ගම්බද පළාත්වල නිවාස තැනීම සඳහා කරදර රාශියක් තිබෙනවා. ඒ සඳහා ණය ලබාගැනීමට ඇති අපහසුව මෙන්ම ඉඩම් ප්‍රශ්නයද බොහෝ දුරට බලපානවා. ඉඩම් පිළිබඳ ප්‍රශ්නය නිවාස දෙපාර්තමේන්තුවට පමණක් අදාළ ප්‍රශ්නයක් නොවෙයි. නිවාස දෙපාර්තමේන්තුවෙන් ඉඩම් ගැනීමේදී ඉඩම් ගැනීමේ ආඥාපණත හරස් වෙනවා. පළාත් පාලන ආයතනවලටත් සිදු වී ඇත්තේ එයයි. ඉඩම් ගැනීම සඳහා ඉඩම් හා වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්තුමාට ඇති සියලුම බලතල සෞඛ්‍ය හා නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්තුමාට දිය යුතුයි. එසේ කළොත් දැනට පවතින තත්ත්වය මීට වඩා ලිහිල් කරගැනීමට පුළුවන් වෙනවා. ගිය වර්ෂයේ මාතර දිස්ත්‍රික්කයේ නිවාස තැනීම සඳහා වෙන් කරන ලද ඉඩම් ගැනීම අත්හිටුවා තිබෙනවා. ඒ ගැන දිසාපතිතුමාගෙන් ප්‍රශ්න කළාම එතුමාට දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබෙනවාය කියන නියෝගයක් අනුව ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම නවත්වන්න සිදු වුණු බවයි මට දැනුම් දුන්නෙ. මෙයින් පෙනී යන්නෙ මේ හැම ප්‍රශ්නයක්ම පාහේ බොහෝ දුරට ප්‍රමාද වන්නෙ ඉඩම් ප්‍රශ්නය උඩ බවයි. ඒ නිසා ප්‍රථමයෙන් කළ යුත්තේ ඉඩම් ගැනීමේ බලතල නිවාස අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම්තුමාට පවරා දීමයි. ගෙවල් හැදීමට උපකරණ වුවමනා කරනවා. අද තිබෙන තත්ත්වයෙ හැටියට නිවාස දෙපාර්තමේන්තුවට පමණක් නොව සාමාන්‍ය මහජනයාටත් ගෙයක් සාදා ගැනීමට පුළුවන්කමක් නැහැ. ගෙවල් තැනීමට උපකරණ වුවමනා නිසා ඒ උපකරණ සියල්ලක්ම සමුපකාර තොග වෙළෙඳ ආයතනය මගින් හෝ රජයේ වෙන දෙපාර්තමේන්තුවක් මගින් හෝ පිටරටින් ගෙන්වා මහජනයා අතර බෙදා හැරීමට වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ. ඒ ඒ පළාත්වල නිවාස යෝජනා ක්‍රම භාරව වැඩ කරන ගම්කාර්ය සභා ඇතුළු සියලුම පළාත් පාලන ආයතනවලටත් අඩු මිලට උපකරණ ලබා ගැනීමට පුළුවන් වන විධියේ වැඩ පිළිවෙළක් වහාම සකස් කරන්න ඕනෑ.

ගෙවල් තැනීමට වුවමනා කරන දේවල් අතර සිමෙන්ති, ගඩොල්, වැලි, හුණු ආදිය ප්‍රධාන තැනක් ගන්නවා. මගේ ඡන්ද කොට්ඨාශයේ විශාල පිරිසක් ගඩොල් තැනීමේ යෙදී සිටිනවා. ඒ වගේම නිල්වලා ගඟෙන් වැලි ගොඩ දමා රජයේ වැඩ කට යුතුවලට දෙන සමුපකාර සමිතියකුත් තිබෙනවා. ඉදලගම විවිධ සේවා සමුපකාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

සමිතිය සම්පූර්ණයෙන්ම වාගේ කරන්නෙ වැලි සහ ගඩොල් වෙළඳාමයි. රුපියල් 15,000 කට, 20,000 කට වැනි ගණන්වලට කොන්ත්‍රාත් අත්සන් කර රජයේ දෙපාර්තමේන්තුවලට මේවා සපයනව. ඒ සමිතියට තමන්ගේ වැඩ කටයුතු හරියාකාර කර ගෙන යාමට පාරුවක් වුවමනා කරනව. ඒ සඳහා සමුපකාර දෙපාර්තමේන්තුවෙන් ණය මුදලක් ඉල්ලුවා. මේ ජාවාරම කර ගෙන යන්න පාරුවක් ඕනෑ නිසා පාරුවක් ගැනීමට මුදලක් ණයට ඉල්ලුවම දෙපාර්තමේන්තුව එය ප්‍රතික්ෂේප කළා. ඒ හේතුකොටගෙන ගෙවල් තැනීමේ වැඩ කටයුතු අඩපණ වුණා. ඒ ප්‍රදේශයේ නිවාස යෝජනා ක්‍රම යටතේ පෞද්ගලිකවත් ගෙවල් තනන අයට ගන්න ඕනෑ කරන වැලි නැති වීමෙන් මිනිසුන්ට බොහොම කරදර සිදු වෙනව. අඩු මිළට වැලි සපයන විවිධ සේවා සමුපකාර සමිතියට ඒ කටයුත්තට වුවමනා කරන පාරුවක් ගැනීමට රුපියල් පන් දාහක ණයක් ගන්න විධියක් නැහැ. අද වනතුරු ඒ අයට පාරුවක් ගන්න පුළුවන් වෙලා නැහැ. නිවාස තැනීමේ කටයුතු භාරව සිටින සභාවර ලේකම්තුමා ඇතුළු උසස් නිලධාරීන් සියලු දෙනාගේම සැලකිල්ල මේ කාරණය කෙරෙහි යොමු වෙනවා ඇත කියා මා විශ්වාස කරනව. මේවා සඳහන් කරන විට ගරු ඇමතිතුමාත් එතුමගෙ පාර්ලිමේන්තු ලේකම්තුමාත් සිය අසුන්වල නොසිටීම කනගාටුවට කරුණක්. නිලධාරීන්වත් මේ අසළ ඉන්න නිසා උන්නැහේලාවත් මේවට ඇහුම් කන් දී ඒ ගැන ඇමතිතුමාට දන්වා අවශ්‍ය දේ කර දීමට උත්සාහ කරනවා ඇතැයි විශ්වාස කරනව.

මා නියෝජනය කරන කොට්ඨාශයෙහි යටියන කියන ගමේ නිවාස දහයක් තියෙනව. ඒ නිවාස දහය තමුන්නාන්සෙලා බලයට එන්න ඉස්සර සිටම එතන තියෙනව. එතන රට උළු කර්මාන්ත ශාලාවක් තියෙනව. එතන සේවය කරන කම්කරුවන්ට ගෙවල් වුවමනා කරනව. ඒ අයට ගෙවල් දහයක් හදන්න ඉඩමක් වෙන් කර තිබුණා. අවුරුදු ගණනාවක් තිස්සෙ එතන ගෙවල් හදන්නෙයි කිව්ව. අද වනතුරු ගෙවල් දහය හැදීමට කටයුතු සලස්සල නැහැ. ඒ නිසා උළු කර්මාන්ත ශාලාවේ සේවය කරන කම්කරුවන් අද ජීවත් වෙන්නෙ පැල්පත්වලයි. පැල්පත් ගහ ගෙන ඉන්න ඒ කම්කරුවන්ට ගෙවල් වුවමනා කරන නිසා ඒ ගැන විශේෂ සැලකිල්ල යොමු කරනවා ඇතැයි විශ්වාස කරනව.

ගම්කාර්ය සභා මගිනුත් නිවාස තැනීමට වැඩ පිළිවෙළක් සලස්සා තිබෙනවා.

**ඩී. පී. ආර්. වීරසේකර මයා.** (රත්නපුරය)
*(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர—இரத்தினபுரி)*
(Mr. D. P. R. Weerasekera—Ratnapura)

On a point of Order, there is no Minister or Parliamentary Secretary present in order to reply to these matters.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

කරුණා කර සිංහලෙන් කියන්න.

**ඩී. පී. ආර්. වීරසේකර මයා.**
*(திரு. டீ. பீ. ஆர். வீரசேக்கர)*
(Mr. D. P. R. Weerasekera)

ගරු සභාපතිතුමනි, මම කිව්වෙ අපි මේවා කථා කරන නමුත් ඒවට ඇහුම්කන් දෙන්න ඇමතිවරයෙක්වත්, පාර්ලිමේන්තු ලේකම්වරයෙක්වත් මෙතන නැති එක ගැනයි.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

කරුණාකර වාඩි වෙන්න.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்சி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ගරු සභාපතිතුමනි, ගම්කාර්ය සභා මගින් නිවාස තැනීමේදී ඒ සඳහා ටෙන්ඩර් කැඳවා කොන්ත්‍රාත් දීමට සිද්ධවෙලා තියෙනව. ඒ නිසා ගෙවල් තැනීම ප්‍රමාද වෙනව. ඒ ක්‍රමය වෙනස් කර නිවාස දෙපාර්තමේන්තුව යටතේ ගෙවල් තනන උදවියට උපදෙස් දීමට ඉන්න නිලධාරීන්ගේ උපදෙස් අනුව ගෙවල් තැනීමට පළාත් පාලන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආයතනවලටත් අවසර දෙනව නම් කම් කරුවන් යොදා ගම්කාර්ය සභා මගිනුත් මීට වඩා ඉක්මණින් සහ හොඳින් නිවාස යෝජනා ක්‍රම යටතේ වැඩ කරන්නත් දියුණු කරන්නත් පුළුවන් වේය කියා මා හිතනව. හැම වැඩක්ම ප්‍රමාද වෙනව. ගරු සභාපතිතුමනි, තමුන්නාන්සෙත් සමග වරක් අපි සෝවියට් දේශයට ගියා තමුන් නාන්සේට මතක ඇති. එහිදී අපි ඒ රටේ නිවාස තැනීම ගැනත් බලන්න ගියා. ඒ රටේ සති දෙකකට පෙර තිබුණු මුඩු බිම් සති දෙකකට පස්සෙ විශාල මන්දිරවලින් පිරුණු ස්ථාන බවට පෙරළෙන හැටි අපට එහිදී දැකගන්ට ලැබුණා. එවැනි සැලැස් මක් අනුව නවීන ක්‍රම යොදා වැඩ පිළි වෙළක් මේ රටේත් ගෙනයන්න ඕනෑ. අද අපේ රටේත් තියෙනව ප්‍රීස්ට්‍රෙස්ඩ් කොන්ක්‍රීට් pre-stressed concrete නමින් එක්තරා කොන්ක්‍රීට් වර්ගයක්. එය අයිති කුලසිංහ ඉංජිනේරු මහතාටයි. සෝවියට් දේශයේ විධියට බිත්ති ජනෙල් සහ උලුවහු යනාදිය එක අච්චුවක සාදා ගෙනැවිත් වෑල්ඩින් කර සවි කිරීමේ වැඩ පිළිවෙළක් මේ රටේත් යොදනව නම්, මේ නිවාස සෑදීමේ කටයුතු ඉක්මණින් කරන් න පුළුවනි. අප කියන්නෙ නවීන ක්‍රම යොදා ඉක්මණින් වැඩ කළයුතු බවයි.

ජර්මනියට ගිය අවස්ථාවේදී අපව ආදර යෙන් පිළිගත්ත නගරාධිපතිතුමෙක් එතුමා අවුරුදු 10 ක් තුළදී එක්තරා නගර යක් සංවර්ධනය කිරීම සඳහා වෙහෙසී වැඩ කළ ආකාරය අපට පෙන්වා දුන්න. අපට වුවමනා කරන්නෙ කුමන රටකින් හෝ උපදෙස් ලබා ගෙන උග්‍ර තත්ත්වයක තියෙන නිවාස ප්‍රශ්නය විසඳන්න ක්‍රියා කරන්නයි. තමුන්නාන්සෙ දන්නව ඇති, පුරාණ කාලෙ අපි පාලම් සවි කිරීමේදී යකඩ පොලු හරස් කර කර කටයුතු කරපු ආකා රය. අද මේ කුලසිංහ ප්‍රීස්ට්‍රෙඩ්ස් කොන් ක්‍රීට්වලින් පාලම් සෑදීම සඳහා අමුතුම ඉක් මන් ක්‍රමයක් සකස් කරල තියෙනව. ඒ ක්‍රමය උපකාරයට අරගෙන ඉක්මණින් ගෙවල් හදන්නත් පුළුවනි.

ගරු සභාපතිතුමනි, මගේ වේලාව සීමා කර තියෙන නිසා මා වැඩි දුර කතා කරන් න යන්නෙ නැහැ. තව එක කාරණයක් කියන්න තියෙනව. හිටපු නිවාස ඇමති තුමා පොල් අතු වහලවලට උළු ඇමීම වැනි වැඩවලට රුපියල් 2,000 බැගින් දුන්න බව කියනව. අප දන්නෙ නැහැ කුමන කුමන ආසනවලට එම මුදල් ලැබුණද කියල. කෙසේ වෙතත් මේ ගැන වැඩිය කතා කිරීමෙන් පලක් නැහැ. අද ඒ වෙනු වෙන් තමුන්නාන්සෙලටවත් අපටවත් මහජනයට උත්තර සපයන්න බැරි වෙලයි තියෙන්නෙ. ඒ අන්දමට ක්‍රියා නොකර කුමන ක්‍රමයකින් හරි මේ රටේ තියෙන නිවාස ප්‍රශ්නය විසඳන්න අළුත් ඇමති තුමා ක්‍රියා කරනව ඇත කියල අප විශ් වාස කරනව. මහජනයට වුවමනා කරන් නෙ ඒකයි. හැකි පමණ නවීන ක්‍රම යොදා මුදල් වැය කර මෙම නිවාස ප්‍රශ්නය විස දන්න එතුමා උත්සාහ කරනවා ඇත කියා විශ්වාස කරමින් මගෙ කතාව අවසාන කරනව.

**ඩී. එම්. ගුණසේකර මයා.** (බිබිලේ)
*(திரு. டீ. எம். குணசேக்கர—பிபிலே)*
(Mr. D. M. Gunasekera—Bibile)

නිවාස අංශය යටතේ වචන ස්වල්පයක් කතා කරන්න මා අදහස් කරනව. නගර බදව වාගෙම පිටිසරබදවත් ගෙවල් හිඟය බලපාන බව අපි දන්නව. ජනගහනය වැඩි වන ප්‍රමාණය අනුව නිවාස ප්‍රමාණයේ වැඩි වීමක් සිදුවී නැති බව අපට කියන්න පුළුවනි.

ගරු සභාපතිතුමනි, 1954 වර්ෂයේ පම ණයි, නිවාස දෙපාර්තමේන්තුව පටන් ගත්තෙ. 1960 වන විට නිවාස දෙපාර්ත මේන්තුව මගින් නිවාස 2,679 ක් පමණ ගොඩනගා තියෙනව. මේ අනුව අපට පේනව, වර්ෂයකට ගෙවල් 300 ක් පමණ ගොඩනගන්න පුළුවන් වී තියෙන බව. අවුරුද්දකට ගෙවල් 300 ක් පමණ හදන්න වුවමනා වූ විට දෙපාර්තමේන්තුව මගින් ඒ සඳහා ගෙවල් 600 ක්, 700 ක් තරම සාදන්න පුළුවන් ප්‍රමාණයට නික රුණේ වැඩියෙන් මුදල් වියදම් කර තිබෙන බව පේනව.

ගරු සභාපතිතුමනි, මගෙ කොට්ඨාශයේ අඩුපාඩුකම් ගැන කියන්නයි, මා දැන් කල් පනා කරන්නෙ. නගරබදව වාගෙම පිටිසර බදවත් ගෙවල් හිඟය උග්‍ර වී තිබෙන බව මා ආරම්භයේදී කිව්ව. බිබිලෙ කොට්ඨා ශයේ ගෙවල් 25 ක් හදන්න ඇමතිතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. එම්. ගුණසේකර මයා.]

පොරොන්දු වෙලා සැලැස්මක් ද සකස් කර තිබුණ. බිබිලේ නිවාස යෝජනා ක්‍රමය යටතේ බිබිලේ ගෙවල් 10 ක් සෑදවීමටත්, මැදගම්පත්තුවේ නන්නපුරාවේ ගෙවල් 8 ක් සෑදවීමටත්, දඹගල්ලේ ගෙවල් 7ක් සෑදවීමටත් යනාදී වශයෙන් ගෙවල් 25ක් සෑදවීමට නියම කරගෙන තිබුණා. මේ පිළිබඳව නිවාස කොමසාරිස්වරයාද ඒ පළාතට ගොස් පරීක්‍ෂා කර බැලුවා. ඉඩම් ඕනෑ තරම් තියෙනවා. අනිකුත් හැම පහසුකමක්ම තියෙනවා. නමුත් තවම නිවාස නම් සෑදුණේ නැහැ. මේ නිවාස සෑදවීම ගැන අද වන තුරුම තීරණයක් නැහැ. බිබිලේ නිවාස යෝජනා ක්‍රමය සඳහා වුවමනා කරන ලේඛන ආදිය ඉදිරිපත් කිරීම පිණිස එහි ගම්කාර්ය සභාපතිතුමා 13 වතාවක්ම තමන්ගේ සාක්කුවෙන් වියදම් කරගෙන අවුත් නිවාස කොමසාරිස්වරයා හමු වී තිබෙනවා. ඒ කාලයේ සිටියේ දැන් සිටින කොමසාරිස්තුමා නම් නොවෙයි. මේ සඳහා උනන්දුවක් තිබුණා නම්, ඉඩම් ආදිය පරීක්ෂා කර බැලුවා නම්, මහජන සහයෝගයත් තිබුණා නම්, මෙය අවශ්‍ය කටයුත්තක් බවට හැඟීමකුත් තිබුණා නම් මෙතෙක් කල් බලා නොසිට මේ ගෙවල් සෑදිය යුතුව තිබුණා නේද? නමුත් කලක් ගත වුණාට පසුව නිවාස දෙපාර්තමේන්තුව මේ නිවාස යෝජනා ක්‍රමය ගැන කීවේ, "සමහර විට මේ නිවාස කුලියට ගැනීමට උදවිය නොමැති නිසා මේ නිවාස අවශ්‍යද කියා දෙපාර්තමේන්තුවට සැකයක් තිබෙනවා," යනුවෙනුයි. නිවාස දෙපාර්තමේන්තුව කොමසාරිස්තුමා මේ විධියේ පිළිතුරක් දුන්නේ ඒ ප්‍රදේශයේ සිටින එක්තරා ප්‍රබල කඩාකප්පල්කාරී පුද්ගලයකු සමඟ කථා කිරීමෙන් පසුවයි. ඒ නිසා මා දැන් අසන ප්‍රශ්නය මේකයි. යෝජනා කර ඇති මේ ගෙවල් 25 සෑදීමට මුදල් දෙනවාද? නැද්ද? මේ ගැන ස්ථිර තීරණයක් ඕනෑ.

පූ. භා. 11.15

තවත් එක් කරුණක් මතක් කරන්ට කැමතියි. රුපියල් 2,000 හේ නිවාස ණය ගැන ගරු මන්ත්‍රීවරුන් කීප දෙනකුම කථා කළා. මාත් මේ ගැන වචන කීපයක් කියන්ට ඕනෑ. මා නියෝජනය කරන ප්‍රදේශයේත් නිවාස ණය ලැබෙන පුද්ගලයන්ගේ ලැයිස්තුවක් සකස් කරන්ට යෙදුණා. ණය බලාපොරොත්තුව සිටි ඔවුන් රුපියල් තුන් හාර සීය ඒ සඳහා අවශ්‍ය කටයුතු පිළියෙළ කර ගැනීම පිණිස වියදම් කළා. නමුත් තවම නම් රුපියල් 2,000 හේ ණය මුදල් ලැබී නැහැ. දැන් ඔවුන්ට ණය මුදලුත් නැහැ. වියදම් කළ මුදලුත් නැහැ. "තමුන්නාන්සෙලා රුපියල් 2,000 හේ නිවාස ණය දෙනවා කියා රාජාසන කථාව මඟිනුත් කිව්වා. රැස්වීම්වලදීත් කිව්වා. නමුත් තවම නම් ඒ ණය ලැබී නැහැ. උළු වහලවලුත් නැහැ." යනුවෙන් දැනුත් යම් යම් අය අපෙන් අහනවා. ගම් පළල් කිරීමේ ක්‍රමය අනුව ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් නම් මා නියෝජනය කරන කොට්ඨාශයේ පවුල් 35 ක් 40 කට ස්ථිර වහලවල් දී තිබෙනවා. නමුත් නිවාස දෙපාර්තමේන්තුවෙන් දුන් දෙයක් නැහැ. නිවාස දෙපාර්තමේන්තුව කටයුතු කරන්නේ මේ විධියට නම්, මේ දෙපාර්තමේන්තුව සඳහා රුපියල් කෝටි ගණනක් වැය කරමින් මෙය පවත්වාගෙන යෑමේ තේරුම මොකක්ද? මේ ගැන ඇමතිවරයා උනන්දු නොවෙනවාද, කොමසාරිස්වරයා උනන්දු නොවෙනවාද කියා මා දන්නේ නැහැ. නියම සැලැස්මක් නියම ක්‍රමයක් අනුව වැඩ කරන්ට බැරි නම් කරුණාකර මේ දෙපාර්තමේන්තුව වසා දමන්න. එසේ නැතිව පිළිවෙළක් අනුව මේ දෙපාර්තමේන්තුවෙන් වැඩ ගැනීමට ඇමතිවරයාට බැරි නම් ඇමතිවරයා අස් වෙන්ට ඕනෑ.

අප නියෝජනය කරන ප්‍රදේශවල දුප්පත් ජනතාව කටු මැටි ගැසූ ගෙවල්වලයි, නැත්නම් පැල්පත්වලයි, ජීවත් වෙන්නෙ. කොළඹ වගේ විශාල මන්දිර ඒ ප්‍රදේශවල නැහැ. අප එවැනි ප්‍රදේශ නියෝජනය කරන නිසා මෙවැනි අවස්ථාවකදී අප මේ කරුණු ඉදිරිපත් කළ යුතුව තිබෙනවා. ඒ දුප්පත් ජනයා වෙනුවෙන් වචනයක් දෙකක් කථා නොකළොත් අප අපේ යුතුකමක් පැහැර හැරියා වෙනවා. මා විශේෂයෙන්ම ඉල්ලා සිටින්නේ පිටිසරබද ප්‍රදේශ ගැන වැඩි උනන්දුවකින් ක්‍රියා කරන ලෙසයි. දැනට තිබෙන තත්ත්වය අනුව නම් නිවාස දෙපාර්තමේන්තුවෙන් පිටිසර බද ප්‍රදේශවලට නියම සේවයක් ඉෂ්ට වන්නේ නැහැ. බිබිලෙ ප්‍රදේශයේ රජයෙ කාර්යාල කීපයක්ම තිබෙනව. නමුත් ඒවායෙ සේවය කරන නිලධාරී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මහතුන්ට නිවාස සොයාගැනීමට පුළුවන් කමක් නැහැ. බිබිලෙ සේවය කරන සමුප කාර කොමසාරිස්තුමා නිවාසයක් නැති නිසා තානායමේ නතරවී සිටින බව මම දන්නවා. ඉන්න තැනක් නැති නිසා ඒ මහත්මයාගෙ ළමයින්ටත් භාර් යාවටත් ඒ මහත්මයා සේවය කරන ස්ථා නයට පැමිණ පදිංචි වෙන්න පුළුවන් කමක් නැහැ. ඒ නිසා ඒ මහත්මයගෙ රාජකාරි හරියට කෙරෙන්නෙ නැහැ. ඒ මහත්මය නිතරම නිවාඩු දමා ගමට යනවා. මේ අනුව නිවාස නැතිකම නිසා පිටිසරබද ප්‍රදේශවල සිටින රජයේ සේවකයින් ගෙන් නියම විධියට රාජකාරි කටයුතු කෙරෙන්නෙ නැහැ. එපමණක් නොවෙයි, රජයෙ සේවකයින්ට නිවාස නැතිකමේ ප්‍රශ්නය නිසා දෙපාර්තමේන්තු කීපයකම වැඩ අඩපණ වී තිබෙනව.

මම කනගාටු වෙනව ඇමතිතුමාවත් පාර්ලිමේන්තු ලේකම්තුමාවත් මෙහි නො සිටීම ගැන. කාට කියන්නද මං දන්නෙ නැහැ. [බාධා කිරීමක්] දෙයියන්ට තමයි කියන්න ඕනෑ. මේ හැන්සාඩ් වාර්තාවවත් බලා මේව ගැන සොයා බලා කටයුතු කරන මෙන් තමුන්නාන්සෙවත් නියම කරන්න. නිවාස දෙපාර්තමේන්තුව සඳහා රුපියල් කෝටි ගණනක් වියදම් කරනව. මේ මුදලට අපේ ප්‍රදේශවල දුප්පත් ජනතාවත් කොටස්කරුවන්. ඒ නිසා මේව ගැන කථා කිරීමට අපට අයිතියක් තිබෙනව. අවසාන වශයෙන් විශේෂයෙන් මේ කරුණු ගැන සොයා බලා පිටිසරබද ප්‍රදේශවල තිබෙන නිවාස හිඟය නැති කිරීමට කටයුතු යොදන මෙන් ඉල්ලමින් මගෙ වචන ස්වල්පය අවසාන කරනවා.

**වී. ධර්මලින්ගම් මයා.** (උඩුවිල්)
*(திரு. வீ. தர்மலிங்கம்—உடுவில்)*
(Mr. V. Dharmalingam—Uduvil)

*கௌரவ அக்கிராசனர் அவர்களே, 1962 ஆம் ஆண்டு முதற் பகுதியிலே கௌரவ வீடமைப்பு அமைச்சர் அவர்கள் இந்த கௌரவ சபையின் பிரதிநிதிகள் ஒவ்வொருவருக்கும் அவரவர்கள் தொகுதியிலே வீடமைப்புத் திட்டத்தின் கீழ்ச் சில வீடுகளைக் கட்டித் தருவதாகவும் அதற்கான காணிகளைச் சிபார்சு செய்யும்படியும் சுற்றுநிருபமொன்று அனுப்பியிருந்தார். அதன் பிரகாரம் எத்தனையோ கௌரவப் பிரதிநிதிகள் தங்கள் தொகுதிகளிலே அதற்கேற்ற தகுந்த காணிகளைச் சிபார்சு செய்திருந்தார்கள். அப்படியிருந்தும் பல தொகுதிகளிலே இந்த வீடமைப்புத் திட்டத்தின் கீழ் வீடுகள் கட்டுவதற்கு ஒருவிதமான நடவடிக்கையும் இந்த அரசாங்கம் எடுக்கவில்லை. ஆனால், சில தொகுதிகளிலே—அரசாங்கத்தை ஆதரிக்கின்ற சில பிரதிநிதிகள் தொகுதிகளிலே—இந்த வீடமைப்புத் திட்டத்தின் கீழ்ச் சில வீடுகள் கட்டிக் கொடுக்கப்பட்டிருப்பதை நாம் அறிகின்றோம்.*

*எதற்காக வடக்கு, அல்லது கிழக்கு மாகாணங்களிலே உள்ள பிரதிநிதிகள் தொகுதிகளிலே இந்தத் திட்டத்தின்கீழ் ஒரு வீடாவது கட்டிக் கொடுக்கவில்லையென்று நான் அரசாங்கத்தைக் கேட்க விரும்புகின்றேன். உடுவில் தொகுதியைப் பொறுத்த வரையிலே, உடுவில் கிராமச் சங்கத்துக்குச் சொந்தமான காணியிலே இந்தத் திட்டத்தை அமுல் செய்யலாமெனவும் எனவே அக்காணியிலே இவ்வீடுகளைக் கட்டித் தாருங்கள் என்றும் நான் சிபார்சு செய்திருந்தேன். அதற்கான நடவடிக்கைகளை எடுப்போம் என்று வீடமைப்புக் கமிஷனர் அவர்கள் எழுதியிருந்தார். ஆனால், இதுவரை ஒருவிதமான நடவடிக்கையும் எடுக்கப்படவில்லை. எனவே கூடிய விரைவிலே இதற்கான நடவடிக்கைகளை எடுத்து அவ் வீடுகளைக் கட்டித்தருமாறு நான் அரசாங்கத்தைக் கேட்டுக்கொள்கின்றேன்.*

*1961 ஆம் ஆண்டிலே தனிப்பட்ட நபர்களுக்கு வீடுகளைக் கட்டுவதற்காக இரண்டாயிரம் ரூபா கடன் கொடுக்கப்படும் என்று அமைச்சர் அவர்கள் அறிவித்தார். ஆனால், இதுவரையிலே அவ்வித கடன் ஒருவருக்காவது கொடுக்கப்பட்டதாகத் தெரியவில்லை. "இந்தக் கடன் உங்களுக்குக் கொடுக்கப்படும்" என்று அறிவிக்கப்பட்ட பல பேர்கள் பல கஷ்டங்களுக்குள்ளானார்கள். அவர்கள் தங்கள் பணத்தைச் செலவழித்து இதற்கான உறுதிகளைத் தயார் செய்து வீடமைப்புக் கமிஷனருக்கு அனுப்பினார்கள். ஆனால், இது பற்றி ஒருவிதமான நடவடிக்கையும் எடுக்கப்படாமல் இருப்பது கண்டிக்கத்தக்கது. ஆகையால், கூடிய விரைவிலே இந்தக் கடனை அரசாங்கம் கொடுக்க வேண்டுமென்று வற்புறுத்துகின்றேன்.*

*கௌரவ காலிப் பிரதிநிதி (திரு. டப்ளியு. தகனாயக்கா) அவர்கள் பேசும்போது, கொழும்பிலே உள்ள சேரிகள் நாளுக்கு நாள்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. ධර්මලිංගම් මයා.]

வளர்ந்து, அதனால் கொலையும் களவும் அதிகரிக்கின்றன என்று கூறினர். கூடிய விரைவிலே கொழும்பு ஒரு சிக்காக்கோ நகரமாக மாறிவிடுமென்றும் அவர் குறிப்பிட்டார். அவரது கூற்றிலே பெரியதோர் உண்மை இருக்கின்றது. இந்நிலைமையை நாம் கண்காணிக்காமல் விட்டால் அது ஒரு பெரிய மோசமான நிலைக்கு நம்மைக் கொண்டுவந்துவிடும் என்று கூற விரும்புகின்றேன். ஆகையால், இந்த அரசாங்கம் கூடிய விரைவிலே சேரி ஒழிப்புத் திட்டத்துக்கான நடவடிக்கைகளை எடுக்க வேண்டும்.

இதன்பொருட்டு, முதலாவதாக, ஒரு புள்ளிவிவரம் தயாரிக்க வேண்டும். அதாவது இந்நகரத்தில் வாழும் மக்கள் ஒவ்வொருவரிடமிருந்தும் அவர்கள் என்ன வேலை செய்கின்றார்கள், எவ்விதமாகத் தங்கள் நேரத்தைக் கழிக்கின்றார்கள் என்பனபோன்ற விவரங்களை அறிய வேண்டும். ஒருவித வேலையுமில்லாமல் இருப்பவர்களுக்கு ஒரு காலஎல்லை கொடுத்து நகரத்திலிருந்து வெளியேறிவிடவேண்டுமென்று பணிக்க வேண்டும். இதற்கப்புறம் இந்நகர எல்லைக்குள்ளே ஒரு கொட்டிலாவது கட்டக்கூடாது என்று உத்தரவிடவேண்டும். இவ்விதம் தீவிரமான நடவடிக்கைகளை எடுத்தால் தான் கொழும்பில் சேரி ஒழிப்பை வெற்றிகரமாக நடத்த முடியும்.

அரசாங்கம், தனது பத்தாண்டுத் திட்டத்தின் கீழ் சுமார் ஒன்பதரை லட்சம் வீடுகளைக் கட்டிக் கொடுப்பதாகக் கூறியிருக்கின்றது. ஆனால், இன்று அரசாங்க வீடமைப்பு இலாகா எடுக்கும் நடவடிக்கைகளைப் பார்த்தால், இந்த அமைச்சரின் இவ் வாழ்விலே அல்ல, இந்த அமைச்சர் பல வாழ்வு எடுத்தாலும் அந்தப் பத்தாண்டுத் திட்டத்தின் கீழ்க் குறிப்பிட்ட அளவு வீடுகளைக் கட்டி முடிக்க முடியாது. கௌரவ காலிப் பிரதிநிதி அவர்கள், இந்த அரசாங்கம் இத்தனை ஆண்டுகளாக எத்தனை வீடுகளைக் கட்டியிருக்கின்றது என்று கேட்டார். இந்த வேகத்திலே பத்தாண்டுத் திட்டத்தை ஒருபோதும் அமுல் நடத்த முடியாது. இந்தப் பத்தாண்டுத் திட்டத்தைப் பூர்த்திசெய்யவேண்டுமானால் சில நடவடிக்கைகளை அவசரமாக எடுக்கவேண்டும்.

முதலாவதாக நான் கூறுவது என்னவென்றால், கட்டிடங்களுக்கு உபயோகிக்கின்ற பொருள்களின் தீர்வையைக் குறைக்க வேண்டும், அல்லது இல்லாமற் செய்ய வேண்டும். உதாரணமாக, சிமெந்திலே பெருந் தீர்வை அறவிடுகின்றார்கள். அத் தீர்வையைக் குறைத்தால் மிகவும் நன்றாக இருக்கும். சிமெந்தைப் போலவே கட்டிட வேலைகளுக்கு உபயோகிக்கப்படும் வேறு பொருட்களுக்கும் அரசாங்கம் அருந் தீர்வைகளை அறவிடுகின்றது. இதனால் கட்டிடங்களுக்குத் தேவையான பொருட்களின் விலைவாசிகளும் அதிகரிக்கின்றன. இவ் விலைவாசி அதிகரிப்பினால் மக்கள் தங்களுக்குத் தேவையான வீடுகளைக் கட்டி முடிக்க முடியாமல் இருக்கிறார்கள். அதனால், கட்டிட வேலைக்குத் தேவையான சிமெந்து போன்ற பொருட்களின் மீதான தீர்வைகளைக் குறைக்க வேண்டிய நடவடிக்கைகளை அரசாங்கம் உடனடியாக எடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்ளுகின்றேன்.

இன்னும் ஒரு விஷயத்தை மாத்திரம் கூறி என்னுடைய பேச்சை முடித்துக் கொள்ளுகின்றேன். வீடுகள் கட்டுவதற்குக் கடன் கொடுக்கின்றீர்கள். அதனை அறவிடுவதற்காக அந்தக் கடனை இன்சூரன்ஸ் செய்ய வேண்டிய வசதிகளை அரசாங்கம் செய்து கொடுக்க வேண்டும். எத்தனையோ தனிப்பட்ட கம்பனிகள் கடன்களை இன்சூரன்ஸ் செய்வதற்கான வசதிகளை அளிக்க முன் வந்த போதிலும் அரசாங்கம் அதனை அறுத்திருக்கின்றது. அரசாங்க வீடமைப்பு இலாகா ஒரு தடவையில் அந்த இன்சூரன்ஸ் பிரமியத்தைக் கொடுத்து, அதனை கடன் கொடுக்கும் நபருக்குக் கொடுக்கும் கடன் தொகையுடன் சேர்த்தால் ஒரு போதும் அது வீணாகப் போகாது.

இந்த அரசாங்கத்துக்கு பல அயல் நாடுகள் இனமாகவும், கடனாகவும் வீடமைப்புத் திட்டத்தில் வீடுகள் கட்ட உதவி செய்ய முன்வந்தும் அரசாங்கம் அதை ஏற்கவில்லை. எதற்காக அத்தகைய உதவிகளை எங்கள் அரசாங்கம் ஏற்கவில்லை என்று அறிய விரும்புகின்றேன். எந்தெந்த நாடுகள் உதவி செய்ய முன்வந்தன, எவ்வெக் காலங்களில் முன்வந்தன, எவ்வளவு எவ்வளவுதொகை கொடுக்க முன்வந்தன, இனமாக எவ்வளவு தொகை கொடுக்க முன்வந்தன, கடனாக எவ்வளவு தொகை கொடுக்க முன்வந்தன என்பதையெல்லாம் கௌரவ அமைச்சர் அவர்கள் எங்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

களுக்கு எடுத்துச் சொல்ல வேண்டும் என்று கேட்டு எனது பேச்சை முடித்துக் கொள்கிறேன்.

පූ. භා. 11.30

**චන්ද්‍රසේන මුණවීර මයා.** (රත්තොට)
(திரு. சந்திரசேன முனவீர—ரத்தொட்டை)
(Mr. Chandrasena Munaweera—Rattota)

ගරු සභාපතිතුමනි, නිවාස දෙපාර්තමේන්තුව පිළිබඳ සාකච්ඡා කරන මේ අවස්ථාවෙදි මෙතෙක් ඒ දෙපාතීමේන්තුව ගැන සෑම ගරු මන්ත්‍රීවරයෙක්ම කළ ප්‍රකාශ ගැන මම එතුමන්ලාට ස්තුති වන්ත වෙනව. මේ දෙපාර්තමේන්තුව මොන පරමාර්ථයක් මුල් කරගෙන තිබෙන දෙපාර්තමේන්තුවක්ද කියා එහි කොමසාරිස්වරයා කල්පනා කරන වද? ගරු ඇමතිවරයා ඊට පිළිතුරක් දෙන්න ඕන. මේ දෙපාර්තමේන්තුව පසු ගිය අවුරුදු ගණන තිස්සෙම කරගෙන ගිය වැඩවලින් මේ රටේ ජනතාවට කිසිම සැනසීමකට පත් වෙන්ට පුළුවන්කමක් නැති බව මම මේ ගරු සභාවේ නිර්භයව කියනව. හැම විටම නිවාස් දෙපාර්තමේන්තුව වැඩක් කළා නම් එය කර තිබෙන්නෙ එවැනි දෙපාර්තමේන්තුවකින් ලැබිය යුතු නියම සේවය මොකක්ද කියා අවබෝධයක් නැතිවයි. රුපියල් දෙදාහෙණය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීන් බොහෝ දෙනෙක් චෝදනා කළා. නමුත් මේ දෙපාර්තමේන්තුවට තිබුණු සල්ලි වලින් වුවමනා කරන වැඩ ටිකවත් කරන්ට කිසිම සැලකිල්ලක් නොදැක්වූ බව මම කියනව. හිටපු නිවාස කොමසාරිස් ජයනෙත්ති මත්මයාට පෞද්ගලික දෝෂාරෝපනය කිරීමට මම කැමති නැහැ; නමුත් ඒ කොමසාරිස්වරයාගෙ පටන් නිවාස දෙපාර්තමේන්තුවේ අන්තිම පහළ සිටින සේවකයා දක්වා වූ නිවාස දෙපාර්තමේන්තුව නඩත්තු කරන්ට මේ ආණ්ඩුව දරන වියදම ගැන සලකා බලන විට, ඒ වියදමින් සියයට එකක් තරම්වත් සේවයක් මේ දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්න බැරි වූ බව කුඹියෙක් වුවත් පිළිගන්න කාරණයක්.

දැන් අළුත් ඇමතිතුමෙකුට ඒ දෙපාතීමේන්තුව පැවරී තිබෙනව. ඒ වගකීම සුළු වගකීමක් නොවෙයි. ආණ්ඩුවක් වෙනස් වන විට දෙපාර්තමේන්තුවලත් වෙනස් කම් කිරීමෙ සිරිතක් වෙනත් රටවල තිබෙනව; නමුත් අපේ දෙපාර්තමේන්තුවල ලැගගෙන සිටින උසස් නිලධාරීන් දෙපාතීමේන්තුවල කටයුතු ගෙන යන්නෙ තමන්ගෙ පෞද්ගලික පවුලෙ කටයුතු කරනවා වගෙයි; තමන්ගෙ පවුලෙ උදවියගෙ සැපසම්පත් ගැන පමණයි මේ නිලධාරීන් කටයුතු කරන්නෙ. සමුපකාර ක්‍රමයට නිවාස හදාගැනීමට ඉඩම් ලබා දෙන්ට නිවාස දෙපාර්තමේන්තුව බැඳී හිටියා; ඒව ලබා දෙන්ට කටයුතු කරගෙන ගියා. මේ ළඟදි නිවාස දෙපාර්තමේන්තුව තීරණයක් අරගෙන තිබෙනවා, ඒ අන්දමට ඉඩම් අත්පත් කර ගැනීම සම්පූර්ණයෙන්ම නවත්වන්නට. මේ රටේ නිවාස හිඟයක් පවතිනවා නම්, නිවාස දෙපාර්තමේන්තුවකුත් තිබනවා නම්, ඒ සඳහා ගත හැකි මුඩුබිම් කොළඹ වැනි නගරවල තිබෙනවා නම්, නිවාස දෙපාර්තමේන්තුව එවැනි තීරණයක් ගත්තෙ කාගෙ අනුමැතියක් උඩද කියා දැනගන්නට කැමතියි. බොහෝ දෙනා වියදම් කර නොයෙක් සැලැස්මවල් සදාගෙන නොයෙක් ස්ථානවල සමූහ වශයෙන් ඉඩම් ලබාගන්නට ඉල්ලා තිබෙනව, ගෙවල් හැදීම පිණිස. ඒ ගෙවල් හදන්නට බලාපොරොත්තු වන්නෙ එක්කොණයක් අරගෙන; නැත්නම් පෞද්ගලික මුදල්වලින්. එහෙනම්, මේ ඉඩම් ලබා දෙන්නට මැළි වන්නෙ ඇයි කියා මා අහනවා; එය අත්හැර දැම්මෙ ඇයි, කියා අහනවා. එය අත්හැරියා නම් නිවාස දෙපාර්තමේන්තුවට බාරවී තිබෙන්නෙ ගෙවල් හැදීම නොවෙයි. නිවාස දෙපාර්තමේන්තුවෙ කොමසාරිස්වරයා නිවාස හැදීම වැළැක්වීමට කටයුතු කරනව නම්, ඔහු තව දුරටත් නිවාස දෙපාර්තමේන්තුවෙ තැබිය යුතුද කියා මා අහනව. ඇමතිතුමා මෙයට පැහැදිලි පිළිතුරක් දෙනවා ඇත කියා මා බලාපොරොත්තු වෙනව.

මගේ කොට්ඨාශයේ එක්තරා පිරිසක් සමූහයක් වශයෙන් නිවාස සදා ගැනීමට ඉඩමක් අරගෙන දෙන්නය කියා ඉල්ලුව. මාතලේ නගරයේ සිටින එක්තරා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[චන්ද්‍රසේන මුනවීර මයා.]

පුද්ගලයෙකුට මාතලේ වටේ අක්කර දහස් ගණනක ඉඩම් හත අටකම තනි අයිතිය තිබෙනව. මේ ඉඩම් කෑබැල්ලක් ගන්නට පෞද්ගලිකව වැයම් කළොත් ධනපතියන් අතරෙ තරඟයක් තිබෙන නිසා අක්කරයකින් අටෙන් කොටසක් ගන්නට රුපියල් 4,000 ක් පමණ යනවා; තැරැව්කාරයින්ට සල්ලි දෙන්න වෙනව. ඒ නිසා ඒ අය සමූහ වශයෙන් සංගම් සදාගෙන සමුපකාර ක්‍රමයට මේ ඉඩම් අර ගෙන දෙන්නය කියා නිවාස දෙපාර්ත මේන්තුවට කිව්වා. එසේ කියා අවුරුදු ගණනාවක් තිස්සෙ ලියුම් ලිව්වා. නමුත් මේ වැඩේ කවදා කරනවද කියා හිතා ගන්න බැරි තත්ත්වයකට මෙය ප්‍රමාද වී තිබෙනව. මේ ප්‍රමාදවීම නිසා මධ්‍යම පංක්තියේ ජනතාවට, කුඩා නගර කිට්ටුව ජීවත් වන ජනතාවට, තමන්ගෙ අතේ තිබෙන මුදලින් ගෙයක් හදා ගන්නට අවස්ථාවක් ලැබෙන්නෙ නැහැ. ඒ අවස්ථාව ගන්න නම්, ගෙයක් හදාගන්න තිබෙන මුදල තැරැව්කාරයින්ට දෙන්න ඕනෑ. දැන් ධනපතියන් අතරෙ මුදල් කොල්ලකෑමක් තිබෙනව. ඉඩම් විකිණීමෙ අලුත් ක්‍රමයක් තිබෙනව. අක්කර 10 ක ඉඩමක් අරගෙන එය අක්කරයෙන් අටෙන් පංගුවෙ කෑලිවලට බෙදා, ඊළඟට තැරැව්කාරයින් දමා, ඒ කෑල්ලක් රුපියල් 5,000 ට, 7,000 ට, 10,000 ට ආදී ගණන්වලට විකුණනවා. එවැනි තත්ත්වයක් සෑම නගරයකම දැන් කරගෙන යනවා. මේවට ගොදුරු වීමට මහජනයාට ඉඩ තබනවා නම්, ඒ නිවාසවලට ඉඩම් ලබා දීම ප්‍රමාද කරනවා නම්, නිවාස කොමසාරිස් වශයෙන් මේ ඉඩම් හිමියන් සමග සම්පූර්ණ සම්බන්ධකම් ඇතිව ජීවත් වෙනවා නම්, කඩාකප්පල්කාරි ලියුම් එවනවා නම්, මේ රටට මේ විධියෙ නිවාස දෙපාර්තමේන්තුවක් අවශ්‍යද කියා මා අහනවා. මේ තත්ත්වයේ තිබෙන මේ නිවාස දෙපාර්තමේන්තුව මේ රටට අවශ්‍ය නැහැ. තමන් බාරගත් වැඩ කරන්නය කියා මේ නිවාස දෙපාර්තමේන්තුවට බල කරන්න ඕනෑ. ආණ්ඩුවෙන් ඒ ඉල්ලීම නොකළොත් ඔවුන් තම තමන්ගෙ මතයේ හැටියට වැඩ කරනව.

මගේ කොට්ඨාශයේ මැතිවරණ කොට්ඨාශ නිවාස යෝජනා ක්‍රමයක් ඇති කරන්නය කියා ඉල්ලා සිටියා. අවුරුදු ගණනක් තිස්සෙ මෙය කර ගන්න වැයම් කළා. මුදල් නැති කාලයක, දෙපාර්ත මේන්තුවේ වැඩ ඉතාම දුර්වලව ගොළුබෙලි ගමනකින් කරගෙන යන කාලයක, මේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ස්ථාන බැලීම සඳහා නොයෙකුත් ඡන්ද කොට්ඨාශවලට ගිය ගමන් බිමන් සඳහා කොපමණ මුදලක් අරගෙන තිබෙනවාද කියා පරීක්ෂණයක් කරන ලෙස මා ඉල්ලා සිටියා. මේ වනතෙක් පරීක්ෂණයක් කළේ නැත්තෙ මන්ද කියා මම අහනවා. එහෙම කළොත් ගමන් වියදම් සඳහා ගෙවල් සිය දහස් ගණනක් හදන මුදලක් අරගෙන තිබෙන බව පෙනී යනවාට සැක යක් නැහැ. මගේ ඉල්ලීමට මොකද වුණේ? අවසානයෙදී නිවාස කොමසාරිස් වරයා මට බොරු ලියමනක් එවනව. මම නිවාස කොමසාරිස් වරයාට කියනව, ලියමනේ අඩංගු කාරණා පුළුවන් නම් ඔප්පු කරන්නටය කියා. 1963 මැයි මාසයේ 27 දින දරණ ලියමනෙන්, කියා තිබෙනව, ඉඩම් අමාත්‍යාංශයෙන් නියම කළාය මේ ඉඩම අත් පත් කර ගැනීමට වහාම කට යුතු කරන්නය කියා. ඊළඟට 1963 ජූනි මාසයේ 13 වනදා, ජයනෙත්ති මහත්මයාම අත්සන් කළ ලියමනක් මට එවනවා. ඒ ලියමන තමුන්නාන්සේගෙ දැනගැනීම සඳහා කියවන්න කැමතියි.

"ඔබේ 63. 5. 27 දින දරණ ලිපියට තවදුරටත් කිවයුත්තේ යෝජනා කර ඇති ඉඩම සරුසාර තේ වගාවෙන් යුක්ත එකක් නිසා එවැනි ඉඩම් අත්පත් කර ගැනීම රජයේ සාමාන්‍ය ප්‍රතිපත්තියටද අනුකූල නොවන බැවින් මේ යෝජිත අත් පත් කර ගැනීම වටිය යුතු කීම, මට අපහසු බවය. මේ ඉඩමෙන් සැතපුම් කාලක් ඔබ්බෙහි මේ වතුයායටම අයිති මුඩු බිමක් තිබේ. මේ මුඩු බිමෙන් අක්කර දෙකක් යෝජිත අත්පත් කර ගැනීමට භාජනය කිරීමට ඔබ එකඟ ද යනු කරුණා කර මට දැන්වුව මැනවි. මෙයට, යටහත් සේවක ඩ. ජයනෙත්ති."

මම මේ ලියමනට පිළිතුරු යැව්වා. ඒ පිළිතුරත් තමුන්නාන්සෙට කියවන්න කැමතියි.

'ඔබගේ 13. 6. 63 දින දරන ලිපිය දැක මම ඔබ ගෙන ඇති තීරණය ගැන පුදුම වුණෙමි. නිවාස යෝජනා ක්‍රමය ඇති කරන්නේ ඒ ප්‍රදේශයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දියුණුව ඇති කිරීමේ අඩිතාලමක් වශයෙන් බව ඔබ පිළිගන්නේ නම් මෙතෙක් දුරට වැඩ කරගෙන යාමෙන් පසු ඉඩම වෙනස් කිරීමට අදහස් නොකරනු ඇත. ඒ අතර ඒ ඉඩම සරුසාර තේ වගාවෙන් යුක්ත එකක් යයි කීම මුසාවාදයකි. අප යෝජනා කරන අන්දමට ගතයුතු ඉඩම් අක්කර එක හමාරේ කොටසෙහි තේ ගස් කිහිපයක් ඇත්තේ අක්කර භාගයකටත් අඩු බිම් කොටසකය. ඒ තේ පඳුරු සරුසාර ඒවා නොවන බව දකින ඕනෑ කෙනෙකු පිළිගන්නවා ඇත. ඔබ අදහස් කරන මුඩුබිම නිවාස යෝජනා ක්‍රමයට කිසි සේත්ම සුදුසු නැත. ඔබගේ යෝජනාවට මම එකඟ නොවන්නෙමි. ඔබ ගන්නා පියවර වහාම දන්වන්න."

මේ ලියමන මම යැව්වා. මම කියන්නෙ, ගරු සභාපතිතුමනි, මේ විධියේ බොරු ලියුම් එවන්නෙ මොකද? මේ විධියේ බොරු ලියුම් ලියාගෙන, කඩදාසි නාස්ති කරගෙන, තැපැල් වියදම් කරගෙන වැරදි තීරණයක් අරගෙන තිබෙන්නෙ මේ නිවාස ක්‍රමය හැදීම වළක්වන්නය කියා මම කල්පනා කරනවා.

ගාල්ලේ මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) කීවා, කැබිනට් තීරණයක් ගත්තාම ඒක මන්ත්‍රීවරුන්ට දන්වන්නෙ නැති නිසා, ඒවායේ ඇත්ත නැත්ත මොකක්ද කියා දන්නෙ නැති නිසා මන්ත්‍රීවරුන් ගිහින් කොමසාරිස්වරයාත් සමග රන්ඩු කර ගන්නවාය කියා. ඇත්ත වශයෙන් ඒ විධියේ ප්‍රශ්නවලදී අප ජීවත්වෙන්නෙ අන්ධකාරයේයි.

ගරු සභාපතිතුමනි, මා කලින් සඳහන් කළ කාරණය ගැන 1963 ජූලි 11 වන දාතමින් මට ලියමනක් එවා තිබෙනව. එහි මෙසේ සඳහන් වෙනව:

"63. 7. 3 වෙනි දින ලිපිය ගැනයි. මැතිවරණ කොට්ඨාශවල නිවාස ක්‍රමයන් පිහිටුවීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම දැනට අත්හිටවා ඇති බැවින්, මගේ පැමිණීම අනවශ්‍යයයි සිතමි."

ඊතකොට මේ වැඩය ඉවරයි. අවුරුදු ගණනාවක් අපි ලියුම් ලිව්ව, ඇවිද්ද. මේ රටේ නිවාසයක් නැතිව සිටින ලක්ෂ සංඛ්‍යාත ජනතාවට නිවාසයක් ලබා දෙන්න නිවාස දෙපාර්තමේන්තුව ගන්න පියවර මේකද කියා මම අහනව.

ඊයෙ පෙරෙයිද විල්සන් දොස්තර මහත්තය ගැන කථා වුණා. එයාට ගෙයක් හදා ගන්න රුපියල් 63,000 ක ණයක් දීල තියෙනව. ඒ 63,000 ට ගෙයක් හදල රුපියල් 1,000 කට වැඩි කුලියකට දීල තියෙනව. වෙනත් ස්ථානයක කුලියට ගත් ගෙයක එයා පදිංචි වෙලා ඉන්නව. මේව ගැන නිවාස දෙපාර්තමේන්තුව පරීක්ෂා කරනවද? පරීක්ෂා කරන්නෙ නැහැ. ඒ ගොල්ලන්ට කැමති අයට කැමති විධියට සල්ලි දෙනව. ඒ සල්ලි වැරදි විධියට පාවිච්චි කරනව. දුප්පත් ගම්වැසියන්ට නිවාස දෙපාර්තමේන්තුව මගින් ගෙවල් සදා දීමට ක්‍රමයක් ඇති කළ පළමුවැනි වතාව මේකයි. ඒ පළමුවැනි වතාවේදීම වැඩය කඩා කප්පල් කරන්න ගන්න පුළුවන් සෑම පියවරක්ම අරගෙන තිබෙනව. ගරු ඇමතිවරය නැත්නම් ඒ වෙනුවෙන් ඉන්න වෙන ඇමතිවරයෙක් මේ කරුණු ගැන අපට පිළිතුරක් දෙන්න ඕනෑ. නිවාස දෙපාර්තමේන්තුව විගඩමක් වෙලා තියෙන්නෙ. මෙතන ඉන්න කොමසාරිස්වරුන්ට ඇහෙන්න චෝදනා කිරීමෙ තේරුමක් නැහැ. මේ රටට සම්පූර්ණ අගතියක් කරල තියෙන බව අපි කියනව.

ගෙවල් හදා ගැනීම සඳහා සමුපකාර ක්‍රමයට ඉඩම් ලබා ගැනීමට බලාපොරොත්තු වෙන් ඉන්න අයට ඒ ඉඩම් ලබා දීම අත්හිටවීමට අරගෙන තිබෙන තීරනය වහම ඉවත් කරන්න ඕනෑ. එසේ ඉවත් නොකළොත් සල්ලි වියදම් කර හෝ ගෙයක් හද ගන්න පුළුවන් අයට, ඒ ගේ හද ගැනීම සඳහා ඉඩමක් ලබා ගැනීමට කිසිම ක්‍රමයක් නැහැ. ධනපතියන්ට රුපියල් දස දහස් ගණන් දීල, ඒ අයට තරඟකාරී ලෙස ඉඩම් ලබා ගන්න බැහැ. රටේ සාධාරණ මිළ අනුව මධ්‍යම පන්තියේ අයට ඉඩම් ලබා දෙන්න පුළුවන් වන්න ඕනෑ. නගරබදව ඉන්න තැනක් නැතිව අනුන්ගෙ ගෙවල අගු පිල්වල ජීවත් වෙමින් ඉන්නව, රුපියල් දෙතුන් දාහ, හාර පන් දාහ වියදම් කරල සුළු ගෙවල් හදාගෙන ජීවත් වන්න පුළුවන් අය. ඒ අයට මේ ජාතික නිවාස දෙපාර්තමේන්තුවෙන් ඉඩම් ලබා දෙන්නෙ නැද්ද කියා මම අහනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

කරුණා කරල කථාව කෙටි කරන්න.

**මුණවීර මයා.**
*(திரு. முனவீர)*
(Mr. Munaweera)

හැමදාම මම නැගිට්ටොත් සභාපතිතුමා කියනව, වාඩි වෙන්න කියා. මේ කාරණා ගැන කියන්න අපට කවදාවත් වෙලා ලැබෙන්නෙ නැහැ. අපේ ආසනවල නිවාස දෙපාර්තමේන්තුවෙන් කවදාවත් කිසිම වැඩක් වෙලා නැහැ. රත්තොට නගර සභාව තුළත්, මාතලේ නගර සභාව තුළත්, ජාතික නිවාස දෙපාර්තමේන්තුවෙන් ගෙවල් සදා තිබෙනව. ඒ සදා තිබෙන ගෙවල අඩුපාඩුකම් ගැන දෙපාර්තමේන්තුව වග කියන්න ඕනෑ. ජාතික නිවාස දෙපාර්තමේන්තුවෙන් මාතලේ නගරයෙ ගෙවල් හදා දීල තියෙනව. ඒ ගෙවල ලෙඩකු මැරුණොත් ඒ මැරුණු ලෙඩා පෙට්ටියක දමා ගෙයින් එළියට ගන්න බැහැ. එවැනි සැලැස්මක් අනුවයි, ගෙවල් හදා තියෙන්නෙ. එවැනි අවස්ථාවලදී බිත්ති කඩලයි, මිනී පෙට්ටිය එළියට ගන්නෙ. මේ පිළිබඳව පසුගිය අවුරුදු හත අටක කාලය තිස්සෙ කරුණු කියනව. නිවාස අංශයෙන් ඇහුවම කියනව, පළාත් පාලන අංශයෙන් අහන්නය කියා. පළාත් පාලන අංශයෙන් ඇහුවම කියනව, නිවාස අංශයෙන් අහන්නය කියා.

රත්තොට නගර සභා ප්‍රදේශයෙ ගෙවල් හදල දීල තියෙනව. මේ ලෝකයෙ කොහේවත් අය කරන්නෙ නැති තරම් වැඩි කුලියක් ඒ ගෙවලට අය කරනව. ඒ කුලිය අඩු කරන්නය කීවට අහන්නෙ නැහැ. කම්කරුවන්ගෙ නිවාස ක්‍රමයක් වුණාම කම්කරුවන්ට ගෙවන්න පුළුවන් කුලියක් අය කරන්න ඕනෑ. ඒ ගෙවල් බොහොම පුංචි ගෙවල්. මාසයකට රුපියල් 12 කට වැඩි කුලියක් අය කරනව. එක මාසයක් කුලී ගෙවන්න බැරි වුණොත් වැඩිපුර දඩයක් නියම කරනව. ඒ දඩය නොගෙව්වොත් ඊ ළඟට ගෙවල් කුලී භාර ගන්නෙ නැහැ. මේ ගැන මම නිවාස දෙපාර්තමේන්තුවට රෙජිස්ටර් තැපෑලෙන් ලියමනක් යැව්ව, මාසයකට පෙර. අද වන තුරු උත්තරයක් ලැබුණෙ නැහැ. මේ දෙපාර්තමේන්තුව අපට උත්තර නොඑවීම විශාල ලෙඩක්. ඒ ලියුම්වලට මොනවද වෙන්නෙ? කිසිම ලියමනකට අපට උත්තරයක් එවන්නෙ නැහැ. මේව අපි බොහොම මහන්සියෙන් ලියන ලියුම්. නිවාස දෙපාර්තමේන්තුව කරන වැරදිවලට මහජනයා වන්දි ගෙවිය යුතු නැහැ. හරියට වැඩ කරන්න බැරි නම් මේක වසා දැමීම විශාල පුණ්‍ය කර්මයක්. මේ දෙපාර්තමේන්තුව සතර අපායට යන වරදක් කරන බව කියන්න කැමතියි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.** (කොට්ටාව)
*(திரு. டீ. பி. ஆர். குணவர்தன—கொட்டாவ)*
(Mr. D. B. R. Gunawardena—Kottawa)

ගරු සභාපතිතුමනි, නිවාස දෙපාර්තමේන්තුව සම්බන්ධව කරුණු කීපයක් ඉදිරිපත් කරන්න තියෙනව. ලංකාවෙ නිවාස නැතිව ලක්ෂ කීයක ජනතාවක් ඉන්නවද කියා තමුන්නාන්සෙල කල්පනා කළ යුතුයි. අද කොළඹ නගරයේ පමණක් පැල්පත් ලක්ෂයකට කිට්ටු ගණනක් තියෙනව. කොළඹ නගරයේ ගෙවල් ප්‍රශ්නය විසඳීමට තමුන්නාන්සෙල පියවරක් අරගෙන නැහැ. රටේ අනික් සුළු නගරවලත් ඒ විධියටම ගෙවල් නැතිකමේ ප්‍රශ්නය උග්‍ර වෙලා තියෙනව. රථවාහනයකට යන්ට බැරි වන පිළිවෙළට පාර අයිනෙ පැල්පත් හදල තියෙනව. ඇයි මේ ආණ්ඩුවට මේ ප්‍රශ්නය විසඳන්න බැරි? මේ ප්‍රශ්නය කොළඹ නගරයේ විසඳන්න පුළුවන්. ඕනෑ තරම් පිට්ටනි තියෙනව. ඕනෑ විධියක සැලැස්මක් ඇති කර ගෙවල් 20,000 ක් 30,000 ක් හදන්න ඉඩ තියෙනව. තමුන්නාන්සෙලට සැලැස්මක් නැහැ. හැම නගරයක්ම ඔය විධියයි. ගාල්ල ගන්න, නුවර ගන්න, අම්පාරෙ ගන්න, ඔය හැම නගරයක්ම ඔය ආකාරයි. අනික් සෑම සුළු නගරයක්මත් එහෙමයි. මේක ටිකක් දුරට මග හරවන්ට ගම්වලත් වැඩ පිළිවෙළක් ඇති කළ හැකියි. ගම්බද ප්‍රදේශවල ජනතාව, රැකියාවක් නැතිවන විට, ඉන්ට තැනක් නැතිවන විට නගරබදට දුවගෙන එනව. මේ ප්‍රශ්නය විසදන්ට ගම් පළල් කිරීමේ වැඩ පිළිවෙළ යටතේ ඉඩම් රජයට ගෙන දුප්පත් මිනිසුන්ට අක්කර කාල බැගින් දෙන්ට කියා අපි ඉල්ලා තිබෙනව. ඒ ප්‍රදේශවල වාසය නොකරන උදවියට අයිති, කිසිම ප්‍රයෝජන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යක් නොගන්න ඉඩම් අක්කර පණහ—හැට ඒ ප්‍රදේශවල තිබෙනව. ඒ ඉඩම් රජයට ගෙන බෙදා දෙන්ට කියා ඉල්ලා සිටිය. මගේ කොට්ඨාශයේ, කොට්ටාව ආසනයේ රනාල ගමේ, හෝකන්දර ගමේ, තලංගම ගමේ, මාලබේ ගමේ, වැලිවිට ගමේ, හෝමගම ගමේ, දැඩිගමුව ගමේ, අතුරුගිරිය-පෝරේ ගමේ, වල්ගම ගමේ, රුක්මලේ ගමේ ඒ විධියේ ඉඩම් රාශියක් මා පෙන්වා දී තිබෙනව. ඒ ඉඩම්වලින් අක්කර විස්ස—තිහ වෙන් කර, අක්කර කාල—කාල ඒ ගම්වල උදවියට ගෙවල් තනා ගැනීමට දෙන්ටය කියා මා ඉල්ලා සිටියා. හැම ගමකම වගේ ඔය විධියේ ප්‍රශ්න තිබෙනව.

එහෙත් මේ ආණ්ඩුව කරන්නෙ මොකක්ද ? අවුරුදු 3 ක් එක ඇමති කෙනෙක් දාගෙන ඉන්නව. ඒ ඇමති කොන්ත්‍රාත්කාරයන්ට බලය දෙනව, මේ රටේ ගෙවල් සෑදීමට වුවමනා ද්‍රව්‍ය පිටරටින් ගෙන්වන්න. මේ රටේ සිමෙන්ති ටික නිෂ්පාදනය කරන්ට කියද්දි කොන්ත්‍රාත්කාරයන්ට පිටරටින් සිමෙන්ති ගෙන්වන්ට ඇමතිවරු බලය දෙනව. එක ඇමතිවරයෙක් අවුරුදු 2 ක් හෝ 2½ ක් වැඩ කරගෙන යන විට ඒ අංශයට වෙන ඇමති කෙනෙක් දානව. ඒ මිනිහ දන්නෙ නැහැ ඒ සම්බන්ධයෙන් මෙලොව දෙයක්. මෙතැන ඇවිත් අහන ප්‍රශ්නවලට පිළිතුරු නොදී ඒ මිනිහ උඩුම්බුව වගේ උඩ බලාගෙන ඉන්නව. මේ ස්ථානයට සමහරවිට එන්නෙත් නැහැ. ආවත් ප්‍රශ්නයක් ඇසුවාම පිළිතුරු නොදී උඩුම්බුව වගේ උඩ බලාගෙන ඉන්නව. ඇමතිවරුන් මේ කරන්නෙ ප්‍රයෝගයක් නේද ? මහජනයාගෙන් කෝටි ගණන් මුදල් එකතු කර ගන්නව. නිවාස දෙපාර්තමේන්තුවක් තිබෙනව. කෝ කරන වැඩ ? තමුන්නාන්සෙලා මේ කරන්නෙ හොරකමක් බව මා කෙලින්ම කියන්ට ඕනෑ.

පසුගිය රාජාසන කථාවකදී ගෙවල් දෙනව කියා ප්‍රකාශ කළා. නමුත් දුන්නෙ නැහැ. මේ වතාවෙ 4,000ක් දෙනවාලු. මේ විධියේ ප්‍රයෝග කරන්නෙ නැතුව, මේ විධියෙ බොරු කරන්නෙ නැතුව රටට හොරකම් කරන්ට උගන්වන්නෙ නැතුව කෙලින්ම අවංකව වැඩ ටිකක් කරන්න.

සභාපතිතුමනි, පැල්පත් ප්‍රශ්නය උග්‍ර වේගන යනව. ගම් පළල් කිරීම යටතේ අක්කර කාල-කාල දුප්පත් ගොවීන්ට දෙන්ට කිව්වාම, මේ දෙපාර්තමේන්තුවෙන් ඒක දානව මිනින්දෝරුවන්ට. එතැන මිනින්දෝරු කට්ටිය නැහැ. එතැනින් ඒක යවනව ඒජන්ත උන්නැහේට පරීක්ෂා කරන්ඩ ; එතැන 6 මාසයක්, 8 මාසයක් අවුරුද්දක් ගත වෙනව. එතැනින් ලියවිල්ල එනව කන්තෝරුවට. ඒක පයිල් එකේ දමාගෙන ඉන්නව මිසක් වැඩක් කෙරෙන්නෙ නැහැ. ඇයි, මේ කටයුතු කරනව නම් මාසයෙන් කරන්ට බැරිද ? අක්කර කාලක් දුන්නම ගෙවල් හදාගන්ට ලැහැස්ති මිනිස්සු ගම්වල ඉන්නව. තමුන්නාන්සෙල හදා දෙන්න වුවමනා නැහැ. ඒක කරන්නෙ නැහැ. පිදුරු ගොඩේ ඉන්න බල්ලටත් අන්තයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
කවුද ?

පූ. භා. 11. 45

**ඞී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

මේ ආණ්ඩුවේ මැතිඇමතිවරු. පිදුරු ගොඩේ ඉන්න බල්ලන්ටත් අන්තයි. දෙනව කියනව. දෙන්ට පුළුවන්කම තිබෙනව, දෙන්නෙ නැහැ. දුෂ්ට අදහස් නිසා ගම්බද දුප්පත් ජනයාට ඒක සකස් කරන්ට ඉඩ දෙන්නෙ නැහැ. රදළයාගේ, ධනපතියාගේ ප්‍රතිපත්තිය නේද තමුන්නාන්සේලා ගෙන යන්නෙ. ලක්ෂ ගණන් ගම්බද දුප්පත් ජනයාට ඉන්න තැන් නැහැ. වර්ෂාවට තෙමෙනව ; අව්වට වේලෙනව. සමහරවිට පැල්පත්වල පවුලේ අට-දහය ඉන්නව, එක කාමරයේ. ඒව පෙනෙන්නෙ නැද්ද ? තමුන්නාන්සෙලගෙ අග්‍රාණ්ඩුකාරවරයගෙ බංගලාවෙ කාමර 50ක් 60ක් තිබෙනව. පුස්කකා තිබෙන ඒවා පිසදමමින් තබනව. තමුන්නාන්සෙලාට දුප්පත් මහජනයා ගැන කැක්කුමක් නැහැ. මොකද ? තමුන්නාන්සේලා කැක්කුමක් ඇතිව නොවෙයි, ඔය පුටුවලට ඇවිත් ඉන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපතිතුමනි, ඔරුවල ගම ගැන බලමු. ඔරුවල දැන් විශාල යකඩ කර්මාන්තශාලාවක් සාදාගෙන යනව. යම්කිසි සැළැස්මක් උඩ එතැන අවට ගම් ටික පිළියෙළ නොකරන්නේ ඇයි ?

මේ ස්ථානය අවට දැන් පවුල් හත් අට දාහක් පදිංචිව සිටිනවා. ඇයි මේ ස්ථානයට අවශ්‍ය රෝහල්, පාඨශාලා ආදිය ඉදිකිරීමට වැඩපිළිවෙළක් සකස් නොකරන්නෙ ? මේ ප්‍රශ්නවලට අද වන තුරු අපට පිළිතුරක් ලැබී නැහැ. නමුත් දැන් නම් මුදල් ඇමතිතුමා, ගෙවල් සෑදීමට වුවමනා කරන බඩු බාහිරාදියේ මිල නැග තිබෙනවාය, රෙදි පිළිවල මිල ඉහළ ගොසින් තිබෙනවාය කියා පත්තර මාර්ගයෙන් කියනවා. නමුත් මෙපමණ කල් කළුකඩකාරයන්ට ඕනෑ හැටියට වැඩ කර ගැනීමට ඉඩ දීල ඔවුන් මගින් තරවෙලා දැන් පත්තර මගින් කියනවා, මිල අඩු කරන්න වැඩපිළිවෙළක් යොදනවාය කියා. මේ ආණ්ඩුව තර වුණේ සිමෙන්ති, යකඩ, උළු ආදී ද්‍රව්‍ය වැඩි ගණන්වලට විකුණන කළුකඩකාරයින්ට ජනතාව සූරා කන්න ඉඩ දීලා නිකම් හිටපු නිසයි. දැන් පත්තරෙන් මුදල් ඇමති කියනවා, මේ වෙළඳුන්ට දඬුවම් කරනවාය කියා. කොහොමද උන්නැහෙ වෙළඳුන්ට දඬුවම් කරන්නෙ කියල මම අහනවා. නිකම් බොරුවට මහජනයා රැවටීමට පත්තරේ බොරු දමනවා. වැරදි කරන වෙළඳුන් ඇල්ලුවත් ඊට වැඩි ලොකු පගාවක් දීල ඔවුන් බේරේවි.

ගරු සභාපතිතුමනි, සී. ටී. බී. එකෙන් ඇලුමිනියම් හොරකම් කළා පෙරේදා. ඒකේ ඉන්න ලොකු නිලධාරීන් මොකද කළේ ? ඇලුමිනියම් ටොන් එකක් රුපියල් 4,500ක් වෙනවා. එදා ටොන් 14ක් පිට වුණා. ස්ටෝර්කීපර් මේ කාරණය නිලධාරීන්ට දැන්නුවාම, " ඒ ගැන තමුසෙට ප්‍රශ්නයක් නැහැ " කියා තිබෙනවා. ඒ නිසා තමයි පෙරේදා සිට මේ කට්ටිය වැඩ නැවැත්වීමක යෙදී සිටින්නෙ [බාධා කිරීම්] ඇයි මේ ඇමතිවරුන්ගෙ නෑදෑ කට්ටිය ඉන්නවනෙ ඒකෙ ලොකු නිල තල දීල. මේ තත්ත්වයට සම්පූර්ණයෙන්ම ඇමතිතුමා වග කියන්න ඕනෑ.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
කරුණා කර කථාව කෙටි කරන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
මේවා කියල ඉවර වෙලා කථාව කෙටි කරන්නම්. අපේ කථා කෙටි කරන්න නම් ඒ පැත්තෙන් කථා අඩු කරන්නය කියන්න ඕනෑ.

මට දැන් ගෙවල් ප්‍රශ්නය සම්බන්ධයෙන් කරුණු ටිකක් කියන්න තියෙනවා. මගේ පළාතේ ගෙවල් කැඩී ගිය අය බොහෝ දෙනෙක් සිටින නමුත් තවම බැරි වී තිබෙනවා ණය මුදලක් ලබා ගැනීමට. නමුත් ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ටත් ඒ ගොල්ලන්ගෙ පන්දම් කාරයින්ටත් පුළුවන් නිවාස දෙපාර්තමේන්තුවෙන් පමණක් නොවෙයි බැංකුවලිනුත් රුපියල් ලක්ෂය දෙක යනාදී වශයෙන් මුදල් ලබා ගන්න [බාධා කිරීම්].

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
කවුද ? නම් කියන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
අනන්ත ඉන්නවා. ඇයි ගිහිල්ල දෙපාර්මේන්තුවේ ලැයිස්තු ටිකක් බලන් නෑකො.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් Food and Drugs Act නමැති පණත ක්‍රියාත්මක කරන්න නවරත්න නැමති කෙනෙක් පත් කර සිටිනවා.

එස්. ඒ. නවරත්න එෆ්.ආර්.එස්.එච්., එම්.බී.අයි.පී. තවත් මොනවා මෙතෙන තියෙනවාද මම දන්නෙ නැහැ. මෙයා තමයි Chief Food and Drugs Inspector, Department of Health. මේයා කවුද ? මෙයා තමයි මේ රටේ කිරි දරුවන්ට දෙන කිරි මේ රටට ගෙන්නුවාම ඒවා හොඳද නරකද කියා පරීක්ෂා කර බලන්නෙ. අවුරුදු 5 කට කලින් මේ නැනැත්තාට තිබුණ දේපළත් දැන් තිබෙන දේපළත් ගැන ටිකක් පරීක්ෂා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කර බලන්න. කොම්පැනිකාරයන් සමග එකතු වී මේ රටට ගෙන්වන කෝටි ගණන් කිරි ආහාරවලින් මෙයා හොඳට ගහනවා. fපුඩ් ඇන්ඩ් ඩ්රග්ස් ඇක්ට් නැමති පණත යටතේ ප්‍රධාන පරීක්ෂක තැන විශයෙනුයි මේ නැනැත්තා පත් කර තිබෙන්නෙ. වෙන කාටවත් වැඩක් නැහැ. "fපුඩ් ඇන්ඩ් ඩ්රග්ස් ඇක්ට්" එක යටතේ වෙන පරීක්ෂකයෙක් නැහැ. මේ හොරු. තමුන්නාන්සෙල සියලු දෙනාමත් කළු කඩ කොටස්කාරයො වෙනව. ආණ්ඩුව කළු කඩේ කොටස්කාරයො. මොකද? ආණ්ඩුව මේවට ඉඩ දී තිබෙන නිසා. මේ ඇමති ඉඩ දී තිබෙන්නෙ හොරකම් කරන් නයි. "ක්වෝටා" එක ගෙන්නුවෙ නැත කියනව. ඇමතිවරය මහත් වෙනව.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
පෞද්ගලික දේවල් වුවමනා නැහැ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

පෞද්ගලික දේවල් නොවෙයි මම කියන්නෙ. සනීපෙට ඉඳගෙන ඇමති විත රක් මහත් වෙන එකයි. ඇයි, කරදරයක් නැහැ. ඒ නිසා මහත් වෙනව. ආදායම එන්නෙ මොනවයින්ද? මොන කරුණක් නිසාද කරදර නැත්තෙ? කළු කඩ කොටස් නිසයි. මේ ආණ්ඩුවෙ කිසි වග කීමක් නැහැ. ඉන්න ගෙවල් දොරවල් නැති උදවිය ගැනයි අපි කියන්නෙ. කන්න ආහාර පාන නැති උදවිය ගැනයි අපි කියන්නෙ; බෙහෙත් හේත් ටික ගන්න නැති උදවිය ගැනයි අපි කියන්නෙ. ඒ නිසයි අපට කැත්කුමක් ඇති වී තිබෙන්නෙ. තමුන්නාන්සෙ කියයි අපි චෝදනා කරනවය කියා. චෝදනා කරනව නොවෙයි, කථාවට වඩා ක්‍රියා කරන්න ඕනෑ බවයි මම කියන්නෙ. මෙපමණ අවුරුදු ගණනක් තිස්සෙ කථා කරන තමුත් එකම ප්‍රශ්නයක්වත් මේ ඇමති වරු විසඳා තිබෙනවාද? දැන් දවස් ගණ නක් තිස්සෙ කථා කළා. එක ඇමතිවර යෙක්වත් උත්තරයක් දුන්නද? එක් කෙනෙක්වත් මෙතැන ඉන්නවද උත්තර දෙන්න? එක්කෙනෙකුට බඩේ කැක් කුම; අනෙක් එක්කෙනාට තවත් එකක්; අනෙක් එක්කෙනා තව කොහෙද ගිහින්. ඔය විධියයි මෙතැන තත්ත්වය.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
කරුණා කර මෙම ශීර්ෂය ගැන කථා කරන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

මම තමුන්නාන්සෙට ගරු කරනව. සභා පතිතුමනි, අද තිබෙන තත්ත්වය උග්‍රයි. අපි මෙහිදි කොපමණ කරුණු ඉදිරිපත් කළත් වැඩක් කෙරෙන්නෙ නැහැ. තමුන් නාන්සෙලාගෙ කන්වලට ඇහෙන්නෙ නැත්නම් ඇස්වත් පාදාගෙන බලන්න. එක නිවාස ඇමතිවරයෙක් අවුරුද්දක් දෙකක් වැඩ කරනව. ඊට පස්සෙ තව එක්කෙනෙක්. කෘෂිකර්මයත් එහෙමමයි. සෞඛ්‍යයත් එහෙමයි. එක්කෙනෙක් එක තැනක නැහැ වග කියන්න. වග කියන්න කෙනෙක් නැහැ. අගමැතිණීත් මෙතැන නැහැ. ඔය මුවාවෙන් නොවෙද තමුන් නාන්සෙල මේ වංචාව කරන්නෙ? වග කීමක් නැතිව ඇමතිවරු එක්කහු වී වංචා කරනව.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
කරුණා කර "වංචා කරනව" කී එක අස් කර ගන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
වංචාව නොවෙන්නම්. මේක රටට කරන වංචාව.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
ගරු මන්ත්‍රීතුමා කරුණා කර ඒ චෝද නාව අස් කර ගන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
මොන චෝදනාවද ?

**සභාපතිතුමා.**
*(அக்கிராசனர்)*
(The Chairman)
වංචා කරනවාය කී චෝදනාව.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
මම කිව්වෙ රටට කරන වංචාව ගැනයි. අහවල් ඇමතිය කියා මම කිව්වෙ නැහැ. මම නම් කිව්වෙ නැහැ.

**සභාපතිතුමා.**
*(அக்கிராசனர்)*
(The Chairman)
ගරු මන්ත්‍රීතුමා කරුණා කර මම කියන එකට ඇහුම්කන් දෙන්න. මන්ත්‍රීතුමා කිව්ව, ඇමතිවරු එකතු වී වංචාවක් කරන වාය කියා. ඒ චෝදනාව අස් කර ගන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
හොඳයි ඇමතිවරුන්ට චෝදනා කළ එක මම අස් කර ගන්නව. මේ රටේ අග මැතිණියගෙ මුවාවෙන් රටට කරන අයුතු කම් ගැනයි මම කියන්නෙ. රටට මුසාවාද කියමින් කරන ප්‍රයෝගය ගැනයි මම කියන්නෙ. රටේ ජනතාව සූරා කමින් කටයුතු කරන කළු කඩ කාරයට කොටස් කාරයන් වේගන යන එක ගැනයි මම චෝදනා කරන්නෙ. එකක් දෙකක් නො වෙයි. යකඩ ටික ගන්න යන්න. ඒක නැහැ. ගම්බද ගෙයක ජනේලයක් හදා ගන්නෙ කොහොමද ? ඇමතිතුමා කියනව කළු කඩයට වික්කොත් මින් මත්තට "ක්වෝටා" එක දෙන්නෙ නැත කියා. නමුත් ලංකාවට වුවමනා බඩු ටික නැහැ. ගෙන්වන්නෙ නැති නිසා එකට පහ හය දී ගමේ සිටින ගම්බද දුප්පත් මිනිහට කළු කඩෙන් බඩු ගන්න සිද්ධ වී තිබෙ නව. අද පත්‍රයෙ මම දැක්ක "ක්වෝටා" එකෙන් දෙකෙන් පංගුවයි, තුනෙන් පංගුවයි, ගෙන්වා තිබෙන්නෙ කියා.

දවල් 12

අද ගම්වල සිටින දුප්පත් ජනතාව සූරා කෑමට කළුකඩකාරයාට ඉඩ දී තිබෙනවා, මේ ආණ්ඩුව. ඒ පැත්තෙන් වැඩ එහෙමයි. අනික් පැත්තෙන් බලන්න. ගමක අක්කර 15 ක් ගන්න වුවමනා නම් එක මාසෙන් ගන්න බැරිද ? එසේ ගෙන යම් පැටලිල්ලක් තිබෙනවා නම් උසාවියකින් එය තීරණය කරන්න පුළුවනි. නමුත් එහෙම වැඩ කරන්නෙ නැහැ. අද මේ රජය කරන ප්‍රයෝග වංචා සහගත වැඩ නිසා රටේ ජනතාව පීඩාවට පත් වී තිබෙ නවා. හොඳයි, ඒක නැතෙයි කියන්න පුළුවන්ද ?

රජය ගෙයක් හදන්න ගියොත් කාටද එය දෙන්නෙ? කොන්ත්‍රාත්කාරයාට. ඕනෑම ගොඩනැඟිල්ලක් හෝ වෙනත් වැඩක් දෙන්නෙ කොන්ත්‍රාත්කාරයාටයි. මගේ ප්‍රදේශයේ අමුණක් ගහන්න ලෑස්ති වුණා. ඒ පිළිබඳව ඒ ප්‍රදේශයේ ගොවීන්ගෙන් විමසන්නේ නැතිව පිට පළාතක විවිධ සේවා සමිතියකට දී තිබෙ නවා, නිලධාරියකුගේ කැමැත්ත ඇතිව. මෙසේ කෙරෙන වංචා පිළිබඳව අපි කියන්න ඕනැ. ආණ්ඩුව විසින් අද ගෙයක් හෝ පාසල් ගොඩනැඟිල්ලක් හෝ සාදන විට එය දෙන්නේ කොන්ත්‍රාත්කාර යාටයි. බලන්න ඒවාට සිමෙන්ති ගෙනෙන්නේ කවුද කියා. ඒත් කොන් ත්‍රාත්කාරයා. මොනවාද, ඒ සිමෙන්තිවල තිබෙන්නෙ ? බාගයක් ගල්කුඩු. අද සිමෙන්තිවලටත් පෝරවලටත් සියයට 50 ක් පමණ ගල්කුඩු මිශ්‍ර කරනවා. මේ ආණ්ඩුව ඒවා කරන එක්කෙනෙකුවත් අල්ලා තිබෙනවාද ? මම අහනවා, කොතැනද අල්ලා තිබෙන්නෙ කියා? කී දෙනෙක් අල්ලා තිබෙනවාද ? පත්‍රයේ නම් කිය නවා, මේවා අල්ලන්න වුවමනාය කියා. නමුත් මහජනයා මේවායින් බේරාගැනීම සඳහා කිසිම වැඩක් කර තිබෙනවාද ? ඔවුන්ට සහනයක් ලැබෙන අන්දමේ වැඩක් කර තිබෙනවාද ?

අද මේ ආණ්ඩුව රටඋළු සෑදීමට ඒ ඒ අයට මුදල් දෙනවා. ලක්ෂ දෙකහමාරක් දී තිබෙනවා. නමුත් උළුවල මිළ සීමා කර තිබෙනවාද ? අසවල් සරසවිට, අසවල් ගැමුණුට දුන්නාලු. උළු හදන මෝල් සඳහා ලක්ෂ ගණන් දී තිබෙනවා. ලක්ෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගණනින් ඒ දෙන්නේ මහජන මුදලුයි. ඒ මුදල් පාවිච්චි කොට සාදනු ලබන උළු මිට වඩා මිළකට නොවිකිණිය යුතුය කියා ආණ්ඩුව කියා තිබෙනවාද? ඇයි එවැනි නියෝගයක් කළේ නැත්තෙ? එසේ කරන්නේ නැතිව අරයා මෙයා අල්ලන වායයි කිව්වාට වැඩක් වෙන්නෙ නැහැ. අද හැම දෙනාටම උළු වුවමනා වෙනවා. ඒවා ගැනීමට දුප්පත් මහජනයාට ඉතා වැඩි මිලක් ගෙවන්න සිදු වී තිබෙනවා. උළු දෙනවාය, තහඩු දෙනවය, කිව්වට තවම ලැබුණෙ නැහැ. රුපියල් දාහට පහළ හංවැල්ලෙ ගෙවල් හදන්න පටන් ගත්ත. හදාගෙන යනකොට ඒ මුදලින් ඒක කරන්න බැරිව ගියා. මොකද කාරණය? වහලෙට පමණක් රුපියල් 410 ක් ඕනැ. තහඩුවල මිළ සීමා කර දුන්නද? අද තහඩු සීමා කරල තියෙනවද? පොලොන්නරුව පැත්තට නම් ඒව සැහෙන්න යන බවට රපෝර්තු අපට එහෙන් ලැබෙනව. රජයෙ සේවකයන් එහෙ කොන්ත්‍රාත්කරුවන් සමග එකතුවෙලයි වැඩ කරගෙන යන්නෙ.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

කරුණා කර කථාව කෙටි කරන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

වැඩි වෙලාවක් ගන්නෙ නැහැ. පැල්පත් සම්බන්ධව අවුරුදු ගණනක් තිස්සෙ කියා ගෙන ගියා. අද කොළඹ යූ. එන්. පී. නගරාධිපතිවරයෙක් ඉන්නෙ. නිවාස ප්‍රශ්නය විසඳුවද? නගරයේ පැල්පත් ප්‍රශ්නය විසඳුවද? මොකද කළේ? කොළඹ වැඩ කරන පන් දාහකට නිවාස හදන්න තියෙනව. තට්ටු නිවාස හදන්න ඕනැ. එහෙම නොකර මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ගෝර්ඩන් ගාඩන්ස්වල තට්ටු දහ හතක නිවාසයක් ගහන්න පුළුවන් නම්, ඒවායෙ පදිංචි වෙන්න පුළුවනි. අර ශ්‍රී ලංකා මහා බැංකුව ගහන හැටියට ගැහුවොත් සහනයක් ලැබෙනව. අද මේ පැල්පත්වල ගඳ ගහන කානු නිසා ඉන්න බැහැ. ඒ වුණාට කරන්න දෙයකුත් නැහැ. පණුවන් ඉන්න, ගඳ ගහන, පල්වෙච්ච වතුර තියෙන කානු අහලකින් යන්නවත් බැරි තරමටයි තියෙන්නෙ. අහලකින්වත් යන්න බැරි වුණාට, කානු අසල ඉන්නයි වෙලා තියෙන්නෙ.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

දැන් ඉතින් කථාව කෙටි කළොත් හොඳයි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

මැකලම් පාරෙ තියෙන පැල්පත් බොහොම කනගාටුදායක තත්ත්වයකයි තියෙන්නෙ. තදබදය බොහොම තියෙනව එතන. අඩි දහයෙ දොළහෙ කාමරයක දහ දොළොස් දෙනෙක් ඉන්නව. කොහොමද මේ උදවිය ඉන්නෙ?

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

ගරු මන්ත්‍රීතුමා කරුණා කරල කතාව කෙටි කරනව නම් හොඳයි. අද දවල් දෙකට වත් මේ ශීර්ෂය අවසන් කළොත් හොඳයි නේද? තවත් ගරු මන්ත්‍රීවරුන් කථා කරන්නත් බලාපොරොත්තුවෙන් ඉන්නව.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

බඹ දෙකේ පැල්පත් කාමරයක එකොළොස් දෙනෙක් නිදා ගන්නෙ කොහොමද කියන එකයි මම අහන්නෙ. ඇයි මේ ප්‍රශ්නය විසඳන්න බැරි? ඇයි, මේ රටේ වුවමනා ඉඩම් තියෙනව නම්, බිමත් තියෙනව නම්, වැඩ කරන්න හිත ඇති මිනිස්සු ඉන්නව නම්, සල්ලිත් හොයා ගන්න විධියක් තියෙනව නම්, ඇයි ඉතින් නිකම් බලාගෙන ඉන්නෙ? තමුන්නාන්සෙලාගෙ වැඩ කාබාසිනියා කර දමනව ඇතැම් නිලධාරීන්. ඒකයි රහස. ඒ වුණාට එක නිලධාරියාට රුපියල් 1,500 කුත් තව ත් නිලධාරියෙකුට 3,000 කුත් යනාදි වශයෙන් වැටුප් නම් ගෙවනව. ඊට අතිරේකව



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

සවාරිවලටත් මුදල් ගෙවනව. නිලධාරීන් නඩත්තු කරන්නෙ මිනිසුන්ට වුවමනා වැඩ කරව ගන්න නොවෙයිද?

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

දැන් බොහොම වෙලා ගතවෙලයි තියෙන්නෙ. ගරු මන්ත්‍රීතුමා කරුණා කර කථාව කෙටි කරන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

අධිරාජ්‍යවාදී ආණ්ඩු ක්‍රමය තිබුණු කාලෙ කරගෙන ගිය විධියටම ඔය නිලධාරීන් නඩත්තු කිරීම පමණක්ද අපටත් කරන්න තියෙන්නෙ? ජනතාව ගසාකමින්, ජනතාව වෙනුවෙන් වියදම් කරන්න තියෙන මුදල් ටික නිලධාරීන් අතරේ බෙදී යන විධියටයි, දැන් පිළිවෙළ සකස් වෙලා තියෙන්නෙ. සී. ටී. බී. එකෙත්, වෙනත් සංයුක්ත මණ්ඩලවලත් කෙරෙන්නෙ මහ ජනයාට හිතකර වැඩ පිළිවෙළක් නොවෙයි. නියම සැලැස්මක් උඩ වැඩක් කෙරෙන තැන් එකක්වත් නැහැ නේද?

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

කරුණා කරල දැන් ඉතින් කතාව කෙටි කරන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

දාහ, දෙදාහ, තුන් දාහ, ආදී වශයෙන් මාස්පතා නිලධාරීන්ට ගෙවන ඔය පඩියෙන් එක නිලධාරියෙකුගෙ පඩිය අවුරුද්දකට නැවැත්තුවොත් ගෙවල් 50 ක් හදන්න මුදල් ඉතිරි වෙයි. ගහන පගා ගැන නොවෙයි මම කියන්නෙ. ගෙවන වැටුප්, දීමනා ගැනයි.

අද පාරවල් දිහා බලන්න. අයවැය ලේඛනයෙන් වෙන් කරනු ලබන මුදලින් සියේට 25 ක් මේ පාරවලට යොදනවද?

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

ඒක මේ ශීර්ෂයට අදාළ නැහැ නේද?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

මම කියන්නෙ පාරට දාන්න තියෙන තාර ටික අරන් යන හැටි ගැනයි. කොන්ත්‍රාත්කාරයයි ඕවර්සියරුයි එකතු වෙලා අළුතෙන් හදන ගෙදරට යන්න තියෙන පාරට තාර දමා ගන්නව. නමුත් දුප්පත් පැල්පත්වලට යන්න පාරවල් නැහැ.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

කරුණා කර කතාව කෙටි කරන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

අපි දැන් කරුණා කර තියෙනවා බොහොම වැඩියි. තමුන්නාන්සෙල කියන විධියට කරුණා කෙරුව. [බාධා කිරීමක්.] එයා මොකද කියන්නෙ? අපි කරුණා කළා වැඩියි. කරුණා කරපු නිසයි අද මේ තත්ත්වයට රට බැහැල තියෙන්නෙ.

**පී. බී. බාලසූරිය මයා.** (ගලිගොමුව)
*(திரு. பீ. பி. பாலசூரிய—கலிகொமுவ)*
(Mr. P. B. Balasuriya—Galigomuwa)

ක්‍රෝධයට බහින්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ක්‍රෝධය නොවෙයි, කරුණාව, කරුණාව කියනව. නමුත් තමුන්නාන්සෙලගෙ වැඩ පිළිවෙළක් නැහැ. ටවුන් ඇන් කන්ට්‍රි ප්ලෑනිං නමින් දෙපාර්තමේන්තුවක් තියෙනව. ඒ මගින් ටවුන් කීයක් ප්ලෑන් කෙරුවද, ගම් කීයක් ප්ලෑන් කෙරුවද කියල මා අහනව. අය වැය ලේඛනයෙ ඒ අංශයට මුදල් වෙන් කරල තියෙනව. මා අහනව, කොහේද එවැනි වැඩ කරල තියෙන්නෙ කියල.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙවල් කී දහක් මහජනයට දුන්නාද? වහල නැතුව දුප්පත් අයගෙ ගෙවල් කී දහක් කැඩිල තියෙනවද කියල මා අහනව. කොලනිවල තියෙන ගෙවලින් දෙකෙන් කොටසක්ම කැඩිල, වහල නැතුව. ගෙවලට වහල ගහන්න සල්ලි දෙන්නෙ නැහැ. කච්චේරිවල එහෙම ඒ සම්බන්ධ වැඩ කෙරෙන්න මාස ගණනක් යනව. වහලෙ ගහනකොට ගේ කඩාගෙන වැටිල. වැඩක් කරන්න දන්නෙ නැතිකමයි, ඒ. මේ ගරු සභාවෙ අවුරුදු එකහමාරක් තිස්සෙ එක ඇමතිවරයෙක් නිවාස අංශය භාර ගෙන කටයුතු කළා. මෙලෝ දෙයක් දන්නෙ නැති කෙනෙකුට දැන් එම අංශය භාර දීල මේවට උත්තර දෙන්නෙ කොහොමද?

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

උත්තර දේවි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

එදත් නැහැ; අදත් නැහැ. කොහොමද උත්තර දෙන්නෙ කියල මා අහනව. මේක ප්‍රයෝගයක් නේද? අගමැතිනිය රට රැවටීමේ වංචා වැඩ පිළිවෙලක් නේද ගෙනියන්නෙ? විටින් විට ඇමතිවරුන් මාරු කර කර කටයුතු ගෙනියන්නෙ මේ ගරු සභාවට උත්තර නොදෙන්නයි. කෘෂිකර්ම ඇමතිතුමාගෙන් මා අහනව—

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

කෘෂිකර්ම අංශය මේකට අයිති නැහැ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

මේ ගෙවල් ප්‍රශ්නය සම්බන්ධයෙන් තව ටිකක් කියන්න තියෙනව. තමුන්නාන්සෙලගෙ ගෙවල් හදන්නෙ කුමන සැලැස්මක් උඩද? පවුලකට ඉන්න ගෙයක් සකස් කරන්නෙ කොහොමද? කාමරයයි; ඉස්තෝප්පුවයි; කුස්සියට බරාදයයි කියන කොටස් තුනක් ඇතුවයි, දැන් ගෙවල් හදන්නෙ. පදිංචියට යන දෙන්න කුටයි—යුවලකටයි—ඒ ප්‍රමාණයට ගෙයක් හදන්නෙ. අවුරුදු 8ක් විතර ගත වෙන කොට ළමයි තුන් දෙනා, හතර දෙනා, පස් දෙනා ඇති වෙනව. එතකොට ඒවායෙ කොහොමද ඉන්නෙ කියල මා අහනව. එතකොට තමුන්නාන්සෙලගෙ ගෙවල එක කාමරයක තුන් හතර දෙනා ඉන්න ඕනැ. දුප්පත් අයගෙ පවුල් ලොකු වෙනකොට ඒ අය හය හත් දෙනා ගණනෙ එක කාමරයක දමන්නද මේ සැලැස්ම ගෙනියන්නෙ කියල මා අහනව. අධිරාජ්‍ය වාදී වැඩ පිළිවෙල් හැම දම ගෙනියන්නද තමුන්නාන්සෙල සූදානම් වෙන්නෙ? එහෙම ඉදල දියුණු වෙන්න බැහැ. අන්තිමට තමන්ට අයිති ෆැක්ටරියෙ වැඩට, ගෙදර වැඩට සහ වත්තෙ වැඩට ගෙනෙන්නෙ ඒ දුප්පත් පවුල්වල අය නේද? ඒ ප්‍රතිපත්තිය නේද ගෙනියන්නෙ, කොලනිවලත් අනික් නැන්වලත් කියල මා අහනව. දූ දරුවන් ඇති වෙන විට ඒ අයට ඉන්න ඉඩ පහසු ඇති වන විධියට නිවාස සෑදීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕන. කම්කරුවන් සඳහා බඹ දෙකේ ලයින් කාමර පිළිබඳ සැලැස්මක් එදා අධිරාජ්‍යවාදීන් ඉදිරිපත් කළා. තවමත් තමුන්නාන්සෙල ගෙන යන්නෙ ඒ ප්‍රතිපත්තියම නේද? නිවාස දෙපාර්තමේන්තුවෙ තවමත් තිබෙන්නෙ ඒ ප්‍රතිපත්තියයි. ගම් පළල් කිරීමෙ ක්‍රමය යට තේ ගම්බද ගොවියාට දෙන්නෙත් ඒ විධියෙ නිවාස නේද? "බඹ දෙකේ කාමරයෙ උඹල ඔක්කොම ඉදපල්ල. දූ පුතුන් හැදුණම අපේ වැඩපලවලට එවපල්ලා" යන ප්‍රතිපත්තිය මේ රදළ ධනපති ආණ්ඩුව වෙනස් කෙළේ නැහැ. බඹ දෙකේ ලයින් කාමරය නේද අද ගම්වල ඉන්න ගොවියටත් දෙන්නෙ? පරම්පරාගතව කම්කරුවන් ගමේ ගොවියන් වහල් තත්ත්වයෙන් තබා ගැනීමේ නින්දිත ක්‍රමය තවමත් අනුගමනය කරනව.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

ගරු මන්ත්‍රීතුමා කරුණා කර කථාව කෙටි කරන්න. ඔය තරම් වේගවත් වෙන්ට වුවමනාවකුත් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 12.15

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

මෙවැනි වැඩ ගැන කථා කරන විට මා ටිකක් වේගවත් වෙනව. අනික් කාරණය, අපට මේ දූෂිත වැඩ ගැන ටිකක් කථා කරන්ටත් ඕනෑ. ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් මෙතැන ඇවිත් මේ ගැන කෑ ගසල වැඩක් නැහැ. ඒ ගොල්ලන් අතර බලය තිබියදී වුවමනා කරන කටයුතු නොකර මෙතැන ඇවිත් කෑගැසීමෙන් තියෙන ප්‍රයෝජනය මොකක්ද? ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් අත බලය තිබියදී, ඒ බලය පාන්නෙ නැතිව, මෙතැන අයවිත් යම් යම් දෙපාර්තමේන්තුවලට දෙස් කියා අන්තිමේදි කරබාගෙන ඉන්නව. අත උරුක් කරනව ; නමුත් අගමැතිනිය ආවම අත පාත් වෙනව. මොකක්ද මේකෙ තේරුම ?

**ටී. බී. එම්. හේරත් මයා.** (වලපනේ)
*(திரு. ரீ. பி. எம். ஹேரத்—வளப்பனே)*
(Mr. T. B. M. Herath—Walapane)

ඕක හැමදාම කියන එක නොවැ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ඔව්, අප හැමදාම කියන්ට තියෙන දේ කියනවා. නුඹුන්නාන්සෙල වගේ අප කාට වත් ඇව්ටඕකම් කරන්නෙවත්, පන්දම් අල්ලන්නෙවත් නැහැ.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

කරුණා කර කථාව අවසන් කරන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට කථා කරන්ට නුඹුන්නාන්සෙ ඉඩ දෙන්න ඕනෑ. [බාධා කිරීම්.] මා කිව්වේ ආණ්ඩුවේ මන්ත්‍රීවරුන්ගෙ තත්ත්වය ගැනයි. ආණ්ඩුව ඒ ගොල්ලන්ගෙ නම්, ඇයි උන් නැහෙලාට මේව හරියට කරන්ට බැරි? ආණ්ඩුවෙ මන්ත්‍රීවරුන් මෙහි අවුත් දෙස් කීමෙන් වැඩක් නැහැ. ඒ ගොල්ලන්ට පාර්ලිමේන්තු කණ්ඩායමේ රැස්වීමේදි මේව ගැන කියා සුදුසු පරිදි ක්‍රියා කරන්ට බැරි මොකද ? මෙතෙන්දි කියල මොකටද ? එතෙන්දි නේද කියන්ට ඕන ?

**හේරත් මයා.**
*(திரு. ஹேரத்)*
(Mr. Herath)

සංසුන්ව කථා කරන්න. ඔහොම කිව්වම කවුද ඕව පිළිගන්නෙ ?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ඔව්, ඔව්, නමුන්නාන්සෙල ගමන් කරන්නෙ බොහොම සංසුන්ව තමයි. පගා ක්‍රමය වර්ධනය කරමින්, කළුකඩ ක්‍රමය වර්ධනය කරමින්, ධනපතියන් අස්වද්දමින්, රදලයන්ගෙ වහල් වැඩ ගැනීම සඳහා ගම්බද දුප්පත් ජනතාව යොදමින්, මේ විධියෙ දහසකුත් එකක් දූෂණ කරමින් කටයුතු කරගෙන යන්නට නමුන්නාන්සෙලාට සාමය වුවමනා බව අපි දන්නවා. ඒ විධියෙ කටයුතු සඳහා ඉඩ දීමට සාමකාමීව ඉන්ට අප ලැස්ති නැහැ. මේ රටේ ජනතාව වහල් භාවයේ තබන්නට, මේ රටේ කම්කරුවන්ගෙ ශ්‍රමය ධනපතියන් විසින් සූරා කනු ලබන්නට, අධිරාජ්‍යවාදීන්ට පන්දම් අල්ලන්නට, අප ලැස්ති නැහැ. අප හැම දාම හැම විට ඊට විරුද්ධව සටන් කරනවා.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

කරුණා කර කථාව කෙටි කරන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ගරු සභාපතිතුමනි, මා කථා කරමින් සිටියෙ ගෙවල් ප්‍රශ්නය ගැනයි. [බාධා කිරීම්.] සෞඛ්‍ය අංශය ගැන කථා කරමින් මා එදා නවරත්න කෙනකු ගැනත් මතක් කළා. [බාධා කිරීම්.] ඔව්, කිරි ආහාර ගෙන් වීමෙ සම්පූර්ණ බලය දී තිබෙන්නෙ ඒ නැනැත්තාටයි. ඔහුගෙ වත්කම් ගැන සොයා බලන්ට ඕනෑ. පසුගිය අවුරුදු හතර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පහ තුළදී ඔහුගෙ වත්කම්වල කොතරම් වෙනසක් ඇති වී තිබෙනවද කියා සොයා බැලීම සඳහා කොමිසමක් පත් කරන්න. මේව පරීක්ෂා කර බලන්න. එයාගෙ අද තිබෙන වත්කම පරීක්ෂා කර බලන්න. අවුරුදු ගණනකට පෙර තිබුණු වත්කමත් මේක භාර ගත්තට පස්සෙ වත්කමත් පරීක්ෂා කර බලන මෙන් මම ඉල්ලනවා.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
කරුණාකර කෙටි කරන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

තවත් කරුණු අප්‍රමාණව තිබෙනව. පාලම් කඩනව; ගෙවල් කඩනව. ඒවායෙ යකඩ ගම්වල මිනිසුන්ට විකුණනවා නම් ඒ යකඩවලින් ඒ මිනිසුන් මොකක් හරි තලා ගන්නව. එහෙම ප්‍රතිපත්තියක් නැහැ. ඒ යකඩ ටික ගිහින් දමන්න ඕනැ අර රාගමට. අපේ ගම්කාර්ය සභා ප්‍රදේශ වල සුළු පාලම් සවි කළ යුතුව තිබෙන සථාන අනන්තවත් තිබෙනව. ලොකු පාලම්වලින් ගළවන කොටස්වලින් ඒ පාලම් හදන්න පුළුවනි. ගම්බද ගොවීන්ට වුවමනා කරන පාලම් ඒවායින් සද ගැනීමට පුළුවනි. ඒව කරන්නෙ නැහැ; ඒව රාගමට ගිහින් දාන්න ඕන. මේ ආරෝග්‍ය ශාලා ලොතරැයිය තිබෙනව. රුපියල් කෝටි ගණනක මුදලක් ලැබෙනව. කෝ ඒව ?

මගේ කොට්ඨාශයෙ කී දෙනෙකුට රුපියල් දෙදහෙ ණය මුදල් දුන්නද කියා මම ප්‍රශ්න කරනව. කී දෙනෙකුට දුන්නද ? අවුරුදු ගණනකට පෙර මේ රුපියල් දෙදහෙ ණය මුදල ලැබිය යුතුව තිබුණු කෙනෙක් ගැන මම මේ දවස් කීපයකට පෙර දෙපාර්තමේන්තුවට ටෙලිෆෝන් කළා. පසුගිය සුමානෙ කිව්වා, රුපියල් 25 ලක්ෂයක් ලැබෙන්න තිබෙනවාය, එය ලැබුණු විගසම ණය මුදල් දෙනවාය කියා. තවමත් දීල නැහැ. අර ඉස්සෙල්ල ණය දිය යුතුව තිබුණු උදවියට තවමත් ණය දීල නැහැ. මහානාම ඇමතිතුමා, හිටපු නිවාස ඇමතිතුමා, පසුගිය දවස්වල බටහිර ජර්මනියට ගියා ෆ්ලැට්ස් හදන්න කොන්ත්‍රාත් එකක් දෙන්න ගෙවල් හදන්න. කෝ, ඒවට උත්තර දෙන්න එතුමා අද මෙතන නැහැ. කොම්පැනිකාරයොත් එක්ක බටහිර ජර්මනියට ගිහින් කථා කළා. කෝ, ආවද ? ගෙවල් හැදුවද ? රට රැවටීම පිණිස සවාරි ගියා. බටහිර ජර්මනියට ගියේ රටේ නිවාස ප්‍රශ්නය විසඳීමටද ? තමුන්නාන්සෙල මේව දන්නව නේද ? [බාධා කිරීමක්.] ගිහින් නැද්ද. අර උන්නැහෙත් එක්ක—හිටපු නිවාස ඇමතිත් එක්ක—යන්න බලන්න. එතකොට පෙනෙයි මේවායෙ හැටි.

ගෙවල් සෑදීම සඳහා මගේ කොට්ඨාශයේ විශාල සංඛ්‍යාවක් රුපියල් දෙදහෙ ණය මුදල් ඉල්ලුව. නමුත් දුන්නෙ නැහැ. තමුන්නාන්සෙලාගෙ කොට්ඨාශවල කී දෙනෙකුට ඒ ණය මුදල් ලැබී තිබෙනවද කියා මම ප්‍රශ්න කරනව. අමූලික බොරු පත්‍රයේ ප්‍රසිද්ධ කරනව. මෙපමණ ගෙවල් දෙනවාය, රුපියල් දෙදහෙ ණය මුදල් මෙපමණ ගණනකට දෙනවාය, කියා පත්‍රයෙ අමූලික බොරු ප්‍රසිද්ධ කරනව. දාන් සිටින මුදල් ඇමතිතුමා සිටි කාලයෙ සිටම ප්‍රයෝග කළා. අද ඊට වඩා ලොකු ප්‍රයෝග කරනවා. අද පත්‍රයේ තිබෙනව, ගෙවල් සෑදීමට ගන්න බඩුවල මිළ අඩු කිරීම පිණිස කටයුතු කරනවාය කියා. මේ දෙඩම්ගහහේනෙ, කලපළුවාවේ, ගෙවල් කීපයක් සද තිබෙනවා; නමුත් වතුර ටික නැහැ; ළිං කඩල.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)
දාන් මේ අයවැය ලේඛන විවාදය සම්පූර්ණයෙන්ම සිකුරාදට කලින් අවසන් කරන්ට තිබෙනවා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

මට ඒ තරම් කරුණු තිබෙනව තමුන්නාන්සෙ ඉඩ දුන්නොත් මේ සිකුරාදා නොවෙයි, ලබන සුමානෙ සිකුරාද වන තුරු කථා කරන්න මට කරුණු තියෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

මම දන්නවා. නමුත් ඔක්කොම කරුණු ගැන මිනිත්තු දහයෙන් කථා කරනවාය කිව්ව නේද?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

දොඩම්ගහහේනෙ කලපලුවාවෙ නිවාස කීපයක් සදා තිබෙනවා. ඒවට වතුර ගන්න ළිං ටික කඩා දමල. ඒ ළිං ටික හදන්නෙ නැහැ. බවුසර්වලින්වත් හරියට වතුර ටික දෙන්නෙ නැත කියා මේ ඊයෙ මට කෙනෙක් ඇවිත් පැමිණිලි කළා. වතුර බොන්න විධියක් නැහැ කියා ඒ අය මට කිව්වා. මේවා ගැන බලන්නට බැරි ඇයි? නිවාස දෙපාර්තමේන්තුවක් තිබෙනවා නම්, එතන නිලධාරීන් සිටිනවා නම්, මේවා පරීක්ෂා කර ඒ වතුර ටික දීමට වැඩ පිළිවෙළක් සකස් කරන්නට බැරි ඇයි? පසු ගිය දවස්වල මම ඉල්ලීමක් කළා. අංගොඩ මානසික ආරෝග්‍ය ශාලවට ජලනල පහසුකම් තිබෙනව. එතන සිට බඹ 10ක් එය දික් කරන්නය කියා මම කිව්වා. ඒක කරන්න බැරි ඇයි? අංගොඩ මානසික ආරෝග්‍ය ශාලාවට වතුර තිබෙනවා. එයින් මෙහාට ගන්නට බැරි ඇයි? ඒකට ලැහැස්ති නැහැ. අර ලුණුගල කන්දකින් ගලාගෙන එන වතුර පාරක් තිබෙනවා. බොහොම ලෙහෙසියට ගන්න පුළුවන්. නමුත් ආරෝග්‍ය ශාලාවෙන් එහාට ගන්න දෙන්නෙ නැහැ. වතුර ටික අහක යනවා. මොකක්ද මේ වැඩ පිළිවෙල? පිදුරු ගොඩේ ඉන්නා බල්ලා වගේය කිව්වේ ඒ නිසයි. බල්ලා පිදුරු කන්නෙත් නැහැ, කන කෙනෙකුට කන්න දෙන්නෙත් නැහැ. ඒකයි තත්ත්වය. හැම දාම කියනවා, අපේ විදේශීය මුදල මෙපමණ නැග තිබෙනවාය කියා. ලක්ෂ 170කට නැග තිබෙනවා. ඒවා මේ ගෙවල්වලට ගැනීමේ මුදල්. මෙපමණ ගොඩවෙනවාය කියා කියනවා. ඒවා මේ සඳහා දුන්නාද? ගෙවල් හැදීමට දහස් ගණන් ඉල්ලනවා. දුන්නාද? නැහැ. පිටුපස ආසනයක ඉන්නා රත්තොට මන්ත්‍රීතුමා (චන්ද්‍රසේන මුණවීර මයා.) පැහැදිලිව කිව්වා, අක්කර දෙකක් ගන්න තිබුණු ඉඩම විශාල පලදාවක් තිබෙන තේ වත්තක් නිසා දෙන්නට බැරිය කියා කිව්ව බව.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

ගරු මන්ත්‍රීතුමා දැන්ම ඉවර කරනවාද?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

තව මිනිත්තු 10ක් පමණ ඕනෑ.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

නැහැ, තව මිනිත්තු තුනයි තිබෙන්නෙ. මිනිත්තු තුනකින් ඉවර කරන්න.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

මේ ප්‍රශ්නය අපේ එක ඇමතිවරයෙකුට එල්ල කරන විට ඒ ඇමතිවරයා මගහැර වෙන කෙනෙක් පත් කරන එකයි අගමැති නිය කරන්නෙ.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

ඔක කිව්වා නෙ. එක වරක් කිව්වාම මදිද? තවත් හුඟක් මන්ත්‍රීවරුන් කථා කරන්න සිටිනවා. මිනිත්තු 10කින් තමන්ගේ කථා ඉවර කරන්න ඔක්කොම මන්ත්‍රීවරුන් පොරොන්දු වුණා නෙ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම ගොහින් සාකච්ඡා කළා. නමුත් කරුණු කියන්නට තිබෙන්නෙ මේ පැත්තටයි. එහෙනම් ඇමතිවරයාවත් මෙතන ඉන්නෙ නැත්තෙ ඇයි?

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

දෙකට ඇවිත් උත්තර දේවි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ඇමතිවරුන්ට මෙතනට ඇවිත් මේ පුටු වල ඉන්නය කියා කියන්න තමුන්නාන් සේට බැරි ඇයි ?

**ගරු ද සොයිසා සිරිවර්ධන**
*(கௌரவ டி சொய்சா சிறிவர்தன)*
(The Hon. de Zoysa Siriwardena)

ඇමතිතුමා ඉන්නේ අසනීපයෙන්. අස නීපයෙන් හිටියත් ඇවිත් උත්තර දෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

මොකක්ද අසනීපය ?

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

රැස්වීම අ. භා. 2 වන තුරු තාවකාලිකව අත්හිටුවනවා. නැවත පටන් ගන්නා විට කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා මූලා සනය ගන්නවා ඇති.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 2 ට කාරක සභා නියෝජ්‍ය සභාපති තැන්පත් ඩී. ඒ. රාජපක්ෂ මහතාගේ සභාපතිත්ව යෙන් නැවත පවත්වන ලදි.**

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා කථා කරමින් සිටියේ රජයේ නිවාස ප්‍රතිපත්තිය ගැනයි. ඇත්ත වශයෙන් තමුන්නාන් සෙලාගේ ප්‍රතිපත්තිය කුමක්ද කියා දැන ගන්න කැමතියි. විටින් විට රාජාසන කථා වලින් ප්‍රසිද්ධ කරනවා, ලංකාවේ ගෙවල් සෑදීමට පොල් අතු ගෙවල්වලට උළු සෙවිලි කර ගැනීමට රජයෙන් උළු දෙනවාය කියා. දැන් අවුරුද්දකට පමණ ඉස්සර කළ රාජා සන කථාවේදීත් එසේ කීවා. මම මුදල් ඇමතිතුමාගෙන් අහන්න කැමතියි, ඒ දුන් පොරොන්දු කොයි තරම් දුරට ඉටු කළාද කියා. එක ආසනයකට අඩු ගණනේ හැත්තෑපස් දෙනකුට ණය මුදල් දෙන වාය කියා ඇමතිතුමා ප්‍රකාශ කර තිබෙනවා. ඒ අනුව කී දෙනකුට මුදල් දී තිබෙනවාද කියා මම අහනවා. ලොතරැයි ඇදලා, ලොත රැයි අනුව එක ආසනයකට කී දෙනෙකුට මුදල් ලැබී තිබෙනවාද ? මේවා පත්‍රවල ප්‍රසිද්ධ කරන්න නම් බොහෝම හොඳයි. නමුත් ක්‍රියාත්මක කිරීමට මේ ආණ්ඩුව කිසිම උත්සාහයක් දරා නැහැ. මුදල් ඇමතිතුමා අද ප්‍රකාශ කරනවා, ගෙවල් ඉදි කිරීමට අවශ්‍ය බඩු බාහිරාදිය කළුකඩයේ විකුණන්න දෙන්නෙ නැහැ, තහනම් කරනවාය කියා. ඇත්ත වශයෙන් මේ කරන ප්‍රකාශ මොනවාද ? අවුරුදු ගණනක් තිස්සෙ, මේ රටට ගෙන්වන කරවල නියම මිළට දෙන්න තමුන්නාන්සෙට වැඩ පිළි වෙළක් සකස් කරන්න බැරි වුණා නම්, අනික් ඒවා දෙන්න යන්නෙ කොහොමද ? වැඩි මිළට විකිණීම වැළැක්වීමට මිළ පාලක නිලධාරීන් පත් කරනවාය කියා කීවා. නමුත් අද වනතුරු මොකද වෙලා තිබෙන්නෙ ? කරවල විකවත් නියම මිළට දෙන්න තමුන්නාන්සෙ පිළිවෙළක් යොදා තිබෙනවාද ? නැහැ. එසේ නම් ගෙවල් සෑදීමට අවශ්‍ය බඩුබාහිරාදිය නියම මිළට දෙන්නෙ කොහොමද ?

අද උළු කර්මාන්ත ශාලා කීපයක්ම මේ රටේ තිබෙනවා. නමුත් උළු 1000ක් රුපියල් 350කින් අඩුව ගන්න බැහැ. තමුන් නාන්සෙලාගේ මහජන බැංකුවෙන් මුදල් දෙනවා කර්මාන්ත දියුණු කරන්නට. ඒ උදවියට අමුතු සහන දෙනවා. නමුත් ඒවා යේ සාදන උළු කැටයක මිළ නියම කරන්න තමුන්නාන්සෙලාට අද වන තුරුත් බැහැ. එහෙම නම් මේ ගෙවල් සෑදීම සඳහා තමුන්නාන්සෙලා දෙන්න යන සහන මොනවාද කියා මම අහනවා. උළු ටික නියම මිළට දෙන්න බැරි නම්. යකඩ නියම මිළට දෙන්න බැරි නම්, තියෙන සිමෙන්තිත් කළුගල් කුඩු දමා විකුණන්න ඉඩ දී තිබෙනවා නම්, හොඳ බඩු භාණ්ඩ නියම මිළට ලබා දෙන්න බැරි නම්, මේක කරනවාය කියන්නෙ කොහොමද ? රට රැවටීමක් නොවෙද මේ කරන්නෙ ? ඇමතිවරුන්ට නම් ගෙවල් ලැබෙනවා. යටිනුවර මන්ත්‍රීවරයාට (යූ. බී. වීරසේකර මයා.) බුලර්ස් පාරේ ගෙයක් දී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

තිබෙනවා, මාසයකට රුපියල් 125කට. මේ විධියට රජයෙන් ගෙයක් දී තිබෙන්නෙ මොන අයිතිවාසිකමක් උඩද? ඒ ගේ එම මන්ත්‍රීවරයාට දීලා තිබෙන්නෙ කොහොමද? බුලර්ස් රෝඩ් එකේ ඇමතිවරුන්ට සෑදු ගේ යටිනුවර මන්ත්‍රීතුමාට රුපියල් 125ට දුන්නෙ කොහොමද? තමුන්නාන්සෙලාගෙ මන්ත්‍රීවරුන්ට ඒ විධියට වැඩ කරන්න ඉඩ දීල තියෙනව නම් රටට වැඩ කරන්නෙ කොහොමද? ඇත්ත නොවෙයිද මම මේ කියන්නෙ? දරුවන් හතර පස් දෙනා ඉන්න ඊට වඩා බරපතළ පවුල්කාරයන් තමුන්නාන්සෙලාගෙ පැත්තෙ ඉන්නව. ඒ එක් කෙනකුට දුන්න නම් මම දොසක් කියන්නෙ නැහැ. යු. බී. වීරසේකර යටිනුවර මන්ත්‍රීතුමාට දෙන්න හේතුව මොකක්ද?

**පී. ජී. බී. කෙනමන් මයා.** (මැද කොළඹ දෙවන මන්ත්‍රී)

*(திரு. பீ. ஜீ. பி. கெனமன்—கொழும்பு மத்தி இரண்டாம் அங்கத்தவர்)*

(Mr. P. G. B. Keuneman—Second Colombo Central)

මැකාර්ති රෝඩ්.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**

*(திரு. டி. பி. ஆர். குணவர்தன)*

(Mr. D. B. R. Gunawardena)

ඔව්, බුලර්ස් රෝඩ් එකේ නොවෙයි, මැකාර්ති රෝඩ් එකෙයි ඒ විධියට දීල තියෙන්නෙ. මේවට උත්තර දෙන්න. ගෙවල් දෙනවය කියා තමුන්නාන්සෙල පත්‍රයෙ ප්‍රසිද්ධ කරනව. රුපියල් දෙතුන් සියයට දෙන්න පුළුවන් ගෙය රුපියල් 125ට දීල තියෙනව, තමුන්නාන්සෙලගෙ මන්ත්‍රීවරුන්ට. අවුරුදු 20ක් එක ගෙයි කුළියට හිටපු පවුල් ඉන්නව. අයිතිකාරයො ඒ ඉඩමත් ගෙයත් පිට විකුණනව. ගෙවල් කඩල, බ්ලොක් කරල, පිට විකුණන තැන් තියෙනව. තලන්ගම ළමයින් හතර පස් දෙනකු ඉන්න පවුලක් අවුරුදු 20ක් එක ගෙදර කුළියට හිටිය. ඉඩම අයිතිකාරයා ඉඩම කොටස් කරල පිට විකුණුව. අර මිනිහ ඉල්ලුව, දුන්නෙ නැහැ. අවුරුදු 20ක් හිටපු දුප්පත් පවුල ඒකෙන් පිට කළා. ඇයි මේ විධියෙ වැඩ නවත්වන්න නීතියක් ගෙනෙන්න බැරි? සමහර ප්‍රදේශවල ගම් පළල් කරන්න ඉඩම් ගන්න හදන විට අයිතිකාරයො ඉඩම් කට්ටි කඩල වෙන්දේසියෙ විකුණනව. මගේ ප්‍රදේශයෙ හුඟක් තැන්වල ඔහොම වෙනව. රජය මගින් ගම් පළල් කිරීමට ඉඩම් ගන්න ලෑස්ති වන විටම මිණින්දෝරුවන් ගෙන්වා ඉඩම කොටස් කරල විකුණනව. ඇයි මේව වළක්වන්න බැරි?

මම මුදල් ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහනව. භාණ්ඩාගාරය, බැංකුව, ආදිය භාරව ඉන්නෙ තමුන්නාන්සෙයි. තමුන්නාන්සෙගෙ අංශයෙන් දුප්පත් උදවියට ගෙවල් සදාගැනීමට කොච්චර ණය දීල තියෙනවද? ගම් පළල් කිරීමෙ වැඩ පිළිවෙළ යටතේ හෝ තමන්ට අයිතිව තිබෙන අක්කර බාගෙ හෝ කාලේ ඉඩමෙ ගෙයක් හදා ගැනීමට හෝ කොච්චර ණය දීල තියෙනවද? ඉල්ලුම් පත්‍ර දහස් ගණන් එවනව. අද වන තෙක් කොච්චර දීල තියෙනවද? මහජන බැංකුවට ඉල්ලුම් පත්‍ර යවා තිබෙනව; නිවාස දෙපාර්තමේන්තුවට ඉල්ලුම් පත්‍ර යවා තිබෙනව. ඇයි මේව අවුරුදු ගණන් ප්‍රමාද කරන්නෙ? තමුන්නාන්සෙල ඒ මුදලුත් අරගෙන වෙන වැඩවලට පාවිච්චි කරලද? ඒ තරම්ම බංකොලොත් තත්ත්වයට තමුන්නාන්සෙල පත් වෙලාද? බංකොලොත් නැහැ කියා රටට කියන්නෙ බොරුවට ද? මේවට අපට පිළිතුරු ඕනෑ. මුදල් ඇමතිතුමා අත්සන් කර කර ඉන්නව මිසක් එතුමා අපට පිළිතුරක් දෙන්නෙ නැහැ. ගෙවල් සෑදීම පිණිස ගන්න භාණ්ඩවල මිළ සීමා කිරීමට අද වන තෙක් තමුන්නාන්සෙලාට බැරි වෙලා තියනව. ගෙවල් සෑදීමට ලෑස්තිව ඉන්න කොටසට ඒ බඩු අඩු මිළට ලබා දීමට තමුන්නාන්සෙලාට බැරිව තියෙනව. තමුන්නාන්සෙ අවුරුදු ගණනක් සමුපකාර ආයතනය භාරව සිටිය· ඒ ආයතනයට ගෙන්වන රෙදිපිළි ටික, කරවලටික, හාල්මැස්සන් ටික, අනික් අනික් බඩු ටික, මිළ සීමා කර දෙන්න පුළුවන්කමක් තිබුණෙ නැත්නම් අනික් ඒව කරන්නෙ කොහොමද? මොකක්ද මේකට හේතුව? තමුන්නාන්සෙල කළු කඩකාරය වර්ධනය කරනව. ඒ වර්ධනය කිරීම උඩයි, මේ සියලුම වැඩ පිළිවෙළ ගෙන යන්නෙ. එපමණක් නොවෙයි, තමුන්නාන්සෙලාගෙ හිතවතුන්ට මේ රටේ සාමාන්‍ය ජනතාවගෙ දේපළ ගසාකන්ට ඉඩ සලසා දෙනව. බීර පැක්ටේරිය කාටද දී තිබෙන්නෙ? දුම්රියේ වෙළඳාම කාටද දී තිබෙන්නෙ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යු. කේ. එඩ්මන්ට නේද ? මේ සාමාන්‍ය ජන යාට ආධාර කරන හැටිද ? තමුන්නාන්සෙලාගෙ නෑදෑය කවුද, තමුන්නාන්සෙලාගෙ හිතවතා කවුද, අන්න ඒ උදවියට මේ රජ්යේ ඇතැම් ස්ථාන දීලයි, කටයුතු කර ගෙන යන්නෙ. ඒ මගිනුයි, තමුන්නාන්සෙල අද සමාජවාදය කරන්ට යන්නෙ. නැතෙයි කියන්ට පුළුවන්ද? සමුපකාර අංශය බලමු ගෙවල් අංශය බලමු. ගෙවල් අංශයෙ ඉන්න නිලධාරීන් කවුද ? ඒ නිල ධාරීන් නිවාස ප්‍රශ්නය විසඳන්ට යම්කිසි වැඩ පිළිවෙළක් යොදා තිබෙනවද ? වල-පනේ මන්ත්‍රීතුමාගෙන් (ටී. බී. එම්. හේරත් මයා.) මා අහනව, තමුන්නාන්සෙගෙ කොට්ඨාශයට ගෙවල් කොපමණ ලැබී තිබෙනවද කියා.

**හේරත් මයා.**
*(திரு. ஹெரத்)*
(Mr. Herath)
තව ටිකකින් කියන්නම්.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
ඒ පළාතට ලැබී ඇති. ඒ ප්‍රදේශය ගෙවල් දිය යුතු ප්‍රදේශයක්.

**හේරත් මයා.**
*(திரு. ஹெரத்)*
(Mr. Herath)
හම්බවෙලා නැහැ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)
ඒ ප්‍රදේශයට ගෙවල් දිය යුතු ප්‍රදේශයක් බව මා දන්නවා. කොළඹ නගරයට හැතැප්ම 8 ක් 10 ක් 15 ක් දුර ප්‍රදේශ වලට, ලක්ෂ ගණනක් ජනගහනය සිටින ප්‍රදේශවලට, නිවාස තනා දෙන්න ඕනෑ. ඒ උදවිය යාබද අක්කර සියයක වත්ත කින් අක්කර 25 ක් ගම් පළල් කර ගැනීමට ලබා දෙන්න කියා ඉල්ලනවා. මන්ද? ජනගහනය වැඩි නිසා ඒ උදවියට ගෙයක් දොරක් නැහැ. එහෙත් තමුන්නාන්සෙල ඒ සැලැස්ම දිහා බලන්නෙ නැහැ. තමුන්නාන්සෙලාට සැලැස්මක් නැහැ. සැලැස්මකට තිබෙන්නෙ පැල්පත් සැලැස්ම විතරයි. පැල්පත් 71,000 ක් විතර නගරයේ තිබෙනව. එයින් අදහස් කරන්නෙ මේ රටේ සමාජයට වුව මනා පහසුකම් ඇති කිරීමද ? නැහැ. මේ රටේ සමාජය තව තවත් පැරණි යුගවල තිබුණු ආකාරයට වහල් භාවයේ, දිළිඳු භාවයේ, තබාගෙන මේ පාලනය ගෙන යන ආණ්ඩුව පෝෂණය වෙනව. ඊට වඩා අමුතු යමක් අපට කියන්ට නැහැ.

මේ ස්ථානයේ දැනට ඉන්නෙ එක ඇමතිතුමයි. මේ සියල්ලටම මුදල් දෙන්නෙ එතුමා අතින්· බැංකුවල මුදල් කටයුතු භාරව තිබෙන්නෙත් ඒ අමාත්‍යාංශටයි. එහෙත් අපි දන්නව, පසුගිය කාලයේ එතුමා සමුපකාරයේ වැඩ කටයුතු කළ ආකාරය කෙසේද කියා. රජයේ ප්‍රතිපත්තිය අපට කියන්ට : ගෙවල් සදන උදවියට අවශ්‍ය බඩු භාණ්ඩ ටිකේ මිළ නියම විධියට සීමා කර දෙනවද ? ඒ වගේම අළුතෙන් නගර බවට පත් වීගෙන යන ප්‍රදේශවල ගෙවල් සෑදීම සැලැස්මක් අනුව කර ගෙන යන්ට වැඩ පිළිවෙළක් සකස් කරනවද ? එසේ නොකිරීමෙන් රටේ අද ඇති වී ගෙන යන සුළු නගර වැනි ප්‍රදේශවල මුඩුක්කු ඇතිකිරීමට ආධාර දෙනව නේද ? මේ සියලු කරුණුවලට අපට පැහැදිලිව පිළිතුරු ඕනෑ. අගමැතිනිය එහා ගෙදර ඉඳ-ගෙන තමුන්නාන්සෙලාගෙ මොල වහ ගෙන ඉන්නව. අගමැතිනිය තමුන්නාන්සෙලාට කිසියම් දෙයක් ඉදිරිපත් කළාම තමුන්නාන්සෙල ලැහැස්ති නැහැ, ඊට විරුද්ධව අපේ අදහස මේකයි, අපට මේ විධියෙ සැලැස්මක් ඕනෑ, කියා කියන්න. ඇමතිවරුන් ඔක්කොම එහෙමයි. මෙහෙදි මොනවා කීවත් ඇමතිවරුන් එතැනදී අත උස්සනව මිස තමුන්නාන්සෙලාගේ අදහස් අනුව කටයුතු කරන්නෙ නැහැ. මේ වැඩ පිළිවෙළ දන්වත් වෙනස් කරන්න. එක තැනක් පමණක් නොව මුළු රටම මේ ප්‍රශ්නය විසඳන ලෙස ඉල්ලා සිටිනව.

වරායේ සේවය කරන දහස් ගණනක් අවුරුදු ගණනක් තිස්සෙ ඉල්ලා සිටිනව. ඉඩම් කැබැල්ලක් අරගෙන ඒ උදවියට ගෙවල් පන්තියක් සදා දෙන්න කියා. ඔව්, ඔව්, සෑම දම පොරොන්දු වෙනවා. වරායේ වැඩ කරන කම්කරුවන් දස් ගණනක් ඉන්නවා පදිංචි වෙන්න ගෙවල් නැතිව. කොළඹ අවට පෙදෙස්වල කර්මාන්තශාලා බහුල වශයෙන් දැන් අරඹනවා. මේවායේ අවටත් දාස් ගණන් කම්කරුවන් පදිංචි වෙන්න පටන් ගනීවි. ඒ නිසා මේ පළාත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org
PUBLIC LIBRARY JAFFNA.

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]
කොළඹ තිබෙන මුඩුක්කුවල තත්ත්වයට වැටෙන්න කලින් සැලැස්මක් අනුව පාර වල්, පාසැල්, රෝහල් ආදිය සපයන්න ඕනෑ. ලංකාව කුකුල් කූඩුවක්ය කියා එක් ඇමතිවරයෙක් කියා තිබෙනවා. ඒ නිසා ඔය කුකුල් සැලැස්මවල් අනුව තවදුරටත් වැඩ කටයුතු කරන්න එපා, ඒවා වෙනස් කරන්නය කියා මා මේ අවස්ථා වේදී කියන්න ඕනෑ.

අ. භා. 2.15

ගෙවල් සෑදීමට වුවමනා කරන භාණ්ඩ ටික සාධාරණ මිලකට ගන්න විධිවිධාන සලස්වන්න. ගම්වල ගෙවල් නැති අයට ගෙයක් තනා ගැනීමට වුවමනාකරන ඉඩම් ටික ඒ අයට ලබා දෙන්න කටයුතු සලස් වන්න. මේ අයට විශාල ඉඩම් වුවමනා නැහැ, අක්කර කාලක්, බාගයක් පමණ ලබා ගන්න පුළුවන් වන විධියට වැඩ පිළිවෙ ළක් සලස්වන්න. මගේ කොට්ඨාශයේ ගම් 15 ක පමණ මෙම ප්‍රශ්නය තදින් බල පවත්වනවා. ඒ පළාත්වල ගන්න පුළුවන් විශාල ඉඩම්ද තිබෙනවා. නමුත් මේ ආණ්ඩු වට මා කොතෙක් කීවත් එය ඉටු කර දෙන්නෙ නැහැ. තමුන්නාන්සේලාට මේව කරන්න ශක්තියක් නැහැ. තමුන්නාන් සේලා නිවටයි. නිලධාරීන්ට යට වෙලායි වැඩ කරන්නෙ. නිලධාරීන් කරන හොරක මක් අල්ලා දුන්නත් ඔවුන්ට අච්චු කරන් නට ලැස්ති නැහැ. ඇහැට දකලා හොරාව අල්ලා දුන්නත් අච්චු කරන්නෙ හොරාට නොවෙයි, හොරකම අල්ලා දුන්න මිනිහ ටයි. ඒකෙන් තේරෙන්නෙ මෙවැනි හොර මැරකම් කිරීමට තමුන්නාන්සේලා අනුබල දෙන බවයි. මා මීට වැඩි යමක් කියන්නෙ නැහැ. ඒ නිසා මෙම ස්වරූපය වහාම වෙ නස් කරන්න කටයුතු සලස්වන්නය කිය මින් මගේ වචන ස්වල්ප අවසන් කර නවා.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(The Deputy-Chairman of Committees)
ගරු මන්ත්‍රීවරුන්ට මට ප්‍රකාශයක් කරන්න තිබෙනවා. අද සවස 3 ට ගරු ඇමතිතුමාට පිළිතුරු දීම පිණිස ඉඩ දීමට මන්ත්‍රීවරු එකඟ වී සිටිනවා. ඒ හෙයින් සවස 3 ට මත්තෙන් ගරු මන්ත්‍රීවරුන් ගේ කථා හමාර කරන හැටියට මා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**හේරත් මයා.**
*(திரு. ஹேரத்)*
(Mr. Herath)
ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අණට කීකරු වන්න මා බලාපොරොත්තු වනවා. නමුත් සවස 3 ට කථාවල් හමාර කළ යුතු යයි කියන උදවියමයි නැවත එය කඩාකප් පල් කර දමන්නෙ. ඒ ගැන අපේ කණගා ටුව පළ කරනවා. තමුන් ඉල්ලන දේ තමුන් විසින්ම කඩාකප්පල් කරනවා නම් ඊට පැත්තක සිටින අහිංසක මන්ත්‍රීවරුන්ට දඬුවම් දිය යුතුය කියා තමුන්නාන්සේ කල්පනා කරනවා නම් ඒ ගැන අපේ විරුද්ධත්වය පළ කරන්න ඕනෑ. මා වැඩි දුර කථා කරන්නෙ නැහැ. නිවාස දෙපාර්ත මේන්තුව සම්බන්ධයෙන් මේ ගරු සභාවේ දෙපාර්ශ්වයේම සිටින ගරු මන්ත්‍රීවරුන් කී දේවලට මාද සම්පූර්ණයෙන්ම එකඟ වනවා. ගරු සභාපතිතුමනි, නිවාස දෙපාර් තමේන්තුව වැඩක් නැති දෙපාර්තමේන් තුවක් බවට පත් වී තිබෙන බව කණගාටු වෙන් වුවද මේ ගරු සභාවේ සඳහන් කරන්න සිදු වී තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ රටේ නිවාස ප්‍රශ්නය ඉතා වැදගත් ප්‍රශ්නයක්. කිසිම සැලැස්මක් නැතුව, වැඩ පිළිවෙළක් නැතිව, අද කියන දේ හෙට වෙනස් කර මින්, පිස්සන්කොටුවක ස්වරූපයෙන් ක්‍රියා කරනව නම් එයින් සිදු වන්නෙ නිවාස ප්‍රශ්නය විසඳනව වෙනුවට එය වඩ වඩාත් උග්‍ර වීමයි. නිවාස ප්‍රශ්නය පිළිබඳ ප්‍රධාන කරුණු කීපයක් තිබෙනව. සමහර අයට ඉඩම් තිබෙන නමුත් ගෙවල් සෑදීමට මුදල් නැහැ. ඒ වාගේම සමහර අයට මුදල් තිබෙන නමුත්, ගෙවල් සෑදීමට ඉඩමක් නැහැ. සමහර අයට ඉඩමුත් නැහැ, මුදලුත් නැහැ. ඔය විධියට කොටස් තුනකට බෙදන්න පුළුවන්. ඉඩමක් නැති කෙනෙ කුට ඉඩමක් ලබා දීමට ඉක්මන් ක්‍රියා පිළි වෙළක් ආණ්ඩුවෙන් යොදන්න ඕන. දැන් තිබෙන ක්‍රමයෙ හැටියට නම් අවුරුදු පහක් හයක් යන තුරු කෙනෙකුට ඉඩම් කෑබෙල් ලක් ලබා දෙන්න පුළුවන්කමක් නැහැ. ඉඩම් ගැණීමෙ ආඥා පණතෙ මාර්ගයෙන් හදිසි නීතිය යටතෙ වුණත් ඉඩමක් ලබා දෙන්නට අවුරුදු දෙක තුනක් යනව. ඒ නිසා මේ ක්‍රමය සම්පූර්ණයෙන්ම වෙනස් කළ යුතුයි. මේ සම්බන්ධයෙන් කථා කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විට නීතියේ යම් යම් දුර්වලකම් තිබෙන වය කියා පිළිතුරු දෙනව. එසේ දුර්වලකම් තිබෙනව නම්, ඒව මේ සභාවට ඉදිරිපත් කර සංශෝධනය කර ගැනීමයි ඇමති වරුන්ගෙ යුතුකම. නීතිය මේ විධියයි කියා සෑමදාම ඉඳීමෙන් ප්‍රයෝජනයක් නැහැ. ඒ වගේ එවැනි සංශෝධන පණතක් මේ සභාවට ඉදිරිපත් වුණොත් මේ සියලුම පක්ෂවල ගරු මන්ත්‍රිවරුන්ගෙ සහයෝගය සියයට සියයක්ම ලැබී මිනිත්තු පහක සාකච්ඡාවක්වත් නැතිව ඒකච්ඡන්දයෙන් සම්මත වෙනවට කිසිම අඩමානයක් නැහැ.

සමහර විට විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රිවරු අපට චෝදනා කරනව, අපි මේ කරුණු කියන්නෙ නැත, කියා. නමුත් කියන්න පුළුවන් ඉතාම උස් ස්වරයෙන් අපි මේ කරුණු කියා තිබෙන බව මම ඒ ගරු මන්ත්‍රිවරුන්ට කියන්න කැමතියි. ඒව ඉටු වී නැති නිසා තමයි මේ ගරු සභා වෙදි අපි ඒව ඉදිරිපත් කරන්නෙ. වැරදි කරන උදවිය ආරක්ෂා කරන්න අපට වුව මනා නැහැ. මෙය පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. මෙය මහජන ප්‍රශ්නයක්. ඒ නිසා මන්ත්‍රිවරුන් හැටියට ප්‍රතිපත්තියක් වශයෙන් සම්ප්‍රදායානුකූලව ආණ්ඩු පක්ෂය ඇතුළෙ අපි අවුරුදු තුනක් තිස්සෙ කිය නව. ඒවට ඇහුම්කන් නොදෙන නිසා තමයි, ඒව මේ සභාවෙදි කියන්න අපට සිදු වී තිබෙන්නෙ. එතැනින් පමණක් නව තින්නෙත් නැහැ. මේ සභාවෙන් පිටතදි වුවත්, වැරද්ද වැරද්දක් හැටියට කියන්න අපි ලැහැස්තියි.

**නීල් ද අල්විස් මයා.** (බද්දේගම)
*(திரு. நீல் டி அல்விஸ்—பத்தேகம)*
(Mr. Neal de Alwis—Baddegama)
මේ පැත්තට ඇවිත් කියන්න.

**හේරත් මයා.**
*(திரு. ஹேரத்)*
(Mr. Herath)
ඒකෙන් ප්‍රශ්නය විසඳෙන්නෙ නැහැ. ඒක කරන්න බැරිකමක් නැහැ. ප්‍රශ්නය විසඳෙනවනම්. නමුත් පැති මාරු කිරීමෙන් මේ ප්‍රශ්නය විසඳෙන්නෙ නැහැ. මෙහිම ඉඳගෙන ප්‍රශ්නය සම්පූර්ණයෙන් විසඳ ගන්නයි අපි බලාපොරොත්තු වන්නෙ. කෙසේ හෝ මේ ප්‍රශ්නය විසඳීමයි අපට අවශ්‍යව ඇත්තෙ. දුප්පත් මිනිහෙකුට ඉඩම් කැබෙල්ලක් ලබා දීමට බැරි වන විධියට නීතියෙ යම් යම් දුර්වලකම් තිබෙන විට එය කට පාඩම් කරගෙන විත් මෙහිදි කීමෙ ප්‍රයෝජනයක් නැහැ. ඒ දුර්වලකම් වෙනස් කර ගැනීමට ක්‍රියා කරන්න ඕන. නිවාස කොමසාරිස්ට බලය දෙන්න ඕන, ඉතාමත් ඉක්මනින් ඉඩම් අරගෙන ගෙවල් සඳා අවශ්‍ය අයට දීමට.

ඊළඟ කාරණය මේකයි. දැනට කරගෙන යන්නෙ නිවාස සඳහා ණය මුදල් දීම පම ණයි. මම අහනව, ණය මුදලක් අරගෙන ගෙයක් සදා ණය මුදල ආපසු ගෙවා ගැනී මෙ පුළුවන්කමක් මේ රටේ සෑම කෙනෙ කුටම තිබෙනවද, කියා.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)
ණය මුදලවත් ලැබෙන්නෙ නැහැ.

**හේරත් මයා.**
*(திரு. ஹேரத்)*
(Mr. Herath)
ඔව්, මම පිළිගන්නව. පරණ මිනිසුන් ගෙ කථාවක් තිබෙනව, ගෙයක් සෑදීමට මුදල් යට කිරීම සල්ලි මුහුදට දානව වගේය කියා. ඒ මොකද? එයින් නැවත ඉපදීමක්, ආදායමක්, නැති නිසා. ඒ මුදල සම්පූර්ණයෙන්ම ආපසු ලැබෙන්නෙ නැහැ. ඒ අනුව දුප්පත් කෙනෙක් ණයට මුදල් අරගෙන ගෙයක් සෑදු විට, එයින් ලැබෙන ආදායමක් නැති නිසා ඒ ණය මුදල ගෙවන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා මං විශේෂයෙන් ඉල්ලා සිටිනව මේ රටේ නිවාස නැති දුප්පත් උදවියට කරන ආධාර යක් හැටියට සහනදායක දීමනාවක් හැටි යට ගෙවල් සදා ගැනීමට ණය මුදලක් දීම පිණිස යම් කිසි ක්‍රියා මාර්ගයක් ඇති කරන්නය කියා. දැනට රජයේ බදු ඉඩම් වල පදිංචි වී සිටින අයට රුපියල් දාහක පමණ මුදලක් දෙනව ගෙවල් සදා ගන්නය කියා. ඇත්ත වශයෙන්ම ඔවුන් තමන්ගෙ අතිනුත් මුදලක් වියදම් කර හොඳ ගෙයක් සදා ගන්නව. ඒ ආකාරයෙන්ම ගම්වල සිටින දුප්පත් මිනිසුන්ට ගෙයක් සදා ගැනීම සඳහා රුපියල් දාහක පමණ දීමනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[හේරත් මයා.]

වක් දීමට යම් කිසි වැඩ පිළිවෙළක් යොදන්න ඕන. මා එසේ යෝජනා කරන්නෙ ණය දීමෙන් පමණක් මේ ප්‍රශ්නය විසඳෙන්නෙ නැති නිසයි. ණය මුදල් දෙන්නට ගිය විට, නොයෙක් විධියෙ නීති රීතිවල බලපෑම්වලට අසු වෙනව. ආදායම් බදු ගෙවන උදවිය ඇප ඔප්පුවලට අත්සන් කරන්න ඕන. ඒවට නීතිඥ මහත්වරුන්ගෙන් සහතික ඕනලු. ණය ගන්න යන මිනිහ ඔය විධියට කබලෙන් ලිපට වැටෙනව.

ඒවට ගෙවන්න සිදු වන විට වෙන්නෙ ඒ මිනිසුන් කබලෙන් ලිපට වැටීමයි. අතේ තිබුණු මුදලත් නැති වුණා. ණය මුදල ලැබුනෙත් නැහැ. ඒ නිසා ණය දෙන්නෙ නැතැයි කෙලින්ම කිව්ව නම් මීට වඩා බොහොම හොඳයි. ණය දෙනවාය කී නිසා ඒ අය ළඟ තිබුණු මුදල් ටිකත් වියදම් කොට ණය ලබාගැනීමට සූදානම් වුණා. අන්තිමට ණය මුදල් දුන්නෙත් නැහැ. එය හරියට ගඟ මැදට ගෙන ගොස් අතුර කපා දැම්ම වගෙයි. මේ අතරමං වූ නිවාස ණය ක්‍රමය නැත්තටම නැති කර දමන්නය කියා මම කියනව. එසේ කොට, නිවාස සෑදීම සඳහා මුදල් වෙන් කර ක්‍රම දෙකකට මහජනයාට දෙන්නය කියා මම ඉල්ලනව. ඉන් එක ක්‍රමයක් නම් ආදායමක් නැති සාමාන්‍ය ජනයාට ආධාරයක් වශයෙන් මුදලක් දීමයි. අනික් ක්‍රමය නිවාස දෙපාර්තමේන්තුවෙන් ගෙවල් සදා කුලියට සින්න වීමෙ ක්‍රමය අනුව දීමයි. මේ ක්‍රම දෙකෙන් පමණයි, දුප්පත් ජනතාවට සාධාරණ විධියට ගෙයක් ලබාගැනීමට පුළුවන් වන්නෙ. රුපියල් 2,000ක් ලබාගැනීම සඳහා රුපියල් 500ක් වියදම් වෙනවා නම්, එයින් ප්‍රයෝජනයක් වන්නෙ නැහැ. ඒකත් ලැබෙන්නෙ නැහැ. මම හිතනව, කීප දෙනකුට පමණක් දී තිබෙනවාය කියා. කීප දෙනකුට පමණක් දීමෙන් මේ ප්‍රශ්නය විසඳෙන්නෙ නැහැ. 75 දෙනෙක් තෝරාගත්තා නම් ඒ 75 දෙනාටම දෙන්න ඕන.

දවසින් දවස නිවාස දෙපාර්තමේන්තුවේ නීති වෙනස් වෙනව. නිවාස දෙපාර්තමේන්තුව තුළ කඩාකප්පල්කාරී ව්‍යාපාරයක් තිබෙනවද කියා මම දන්නෙ නැහැ. දැනට සිටින නිවාස කොමසාරිස්වරයා 1956 දී පමණ බදුල්ලෙ දිසාපති හැටියට සිටිමින් එදා කළ සෙල්ලම් ගැන අපි දන්නව. දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා ඔහු කොහාට එළෙව්වද කියාත් අපි දන්නව. ඔහුගෙන් කුමන්ත්‍රණකාරී නොවන වැඩ පිළිවෙලක් අපට නම් බලාපොරොත්තු වෙන්නට බැහැ.

මට එක්තරා ආරංචියක් ලැබී තිබෙනව. මේ පිළිබඳව කොට්ටාවෙ ගරු මන්ත්‍රීතුමා (ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.) සඳහන් කළා. බටහිර ජර්මනියේ සමාගමකට තට්ටු ගෙවල් සෑදීමෙ කොන්ත්‍රාත්තුවක් අරගෙන දීම සඳහා මේ කොමසාරිස්වරයා භාණ්ඩාගාරයට කරුණු ඉදිරිපත් කර තිබෙනවා. නමුත් භාණ්ඩාගාරය එය ප්‍රතික්ෂේප කළා. ඊට පසු කොළඹ නගර සභාවත් සමග එකතු වී කොළඹ නගර සභාවට මෙය පැවරීමට ව්‍යාපාරයක් ගෙනයනවායයි අපට දැනගන්නට ලැබී තිබෙනවා. පසු ගිය ජූනි මාසයේ බටහිර ජර්මනියට සිය පවුලත් සමඟ ගිය මේ කොමසාරිස්වරයා තවමත් එහි වැජඹෙන බව අපි දන්නව. කොළඹ හිටපු නගරාධිපතිවරයත් වර්තමාන නගරාධිපතිවරයත් එහි ගොස් පෙරළා පැමිණ තිබෙන බැව්ද අපි දන්නව. කුමන කාරණා නිසා ඔවුන් ගියේදැයි අපි දන්නෙ නැහැ. නිවාස කොමසාරිස්වරයා තම පවුලේ සියලු දෙනාමත් සමග බටහිර ජර්මනියට යන විට කොපමණ මුදලක් ගෙන ගියාද, ඒ උදවියට එහි මාස තුනක් පමණ ජීවත් වීමට ඒ මුදල ඇත්ද, එහි සිටින කාලය තුළදී අර තට්ටු ගෙවල් තැනීමෙ කොන්ත්‍රාත්තුව ලබාගැනීමට බලාපොරොත්තුව සිටින සමාගමේ වියදමින් ජීවත් වෙනවද, යන මේවා ගැන පරීක්ෂා කර බැලීම වටිනව. මේ කොමසාරිස්වරයගෙ ක්‍රියා පිළිවෙල පිළිබඳව ගරු ඇමතිතුමා විසින් හෝ මේ ගරු සභාවේ කාරක සභාවක් මඟින් හෝ සොයා බැලීමට කාලය පැමිණ තිබෙන බැව් කිය යුතුව තිබෙනව. මේ රටේ දුප්පත් ජනතාවට රුපියල් දෙදහෙ ණයවත් ලබාගැනීමට නොහැකිව අමාරුවෙ සිටියදි නිවාස කොමසාරිස්වරය බටහිර ජර්මනියට ගොස් මාස ගණනක් එහි වැජඹීම පිළිබඳව අප විමසිලිවත් විය යුතුයි. කොළඹ හිටපු නගරාධිපතිවරයත් වර්තමාන නගරාධිපතිවරයත් බටහිර ජර්මනියට ගොස් තට්ටු ගෙවල් සෑදීමෙ කොන්ත්‍රාත්තුව අත්සන් කළාද, තට්ටු ගෙවල් මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රටේ හැදෙනවාද, යන කරුණු ගැනත් මේ රටේ පුරවැසියන් හා මන්ත්‍රීන් වශයෙන් අප විසින් දැනගත යුතුව තිබෙනවා. ඒ පිළිබඳව යම් කිසි වැදගත් තොරතුරක් දෙන්නට පුළුවන් නම්, ගරු ඇමතිතුමා අපට ඒ බව පවසන මෙන් මම ඉල්ලා සිටිනවා.

මගේ කොට්ඨාශයේ උඩපුස්සැල්ලාව රාගල ප්‍රදේශයට නිවාස සෑදීම සඳහා මුදල් දෙනවායයි මට 1960 දී ලියුමක් ලැබුණා. රුපියල් 60,000ක් වෙන් කළාය කියල ලියමනක් 1960 දී ලැබුණා. ඒ ලියමන පමණයි අද දක්වාම ලැබිල තියෙන්නෙ. දෙනව නම් දෙන්න ඕනෑ, නොදෙනව නම් නොදෙන්න ඕනෑ. ඒ බව කාටත් දැන ගන්න පැහැදිලි ලෙස කියන්නත් ඕනෑ. එහෙම නොකර දෙනවය කියමින් මිනිසුන් රවටා අමාරුවෙ දැමීම සුදුසු නැහැ. මුදල් දෙනවය කිව්වම මිනිසුන් ඒ ගැන බලාපොරොත්තු ඇති කරගෙන ඒ සම්බන්ධයෙන් යම්කිසි දුරක් ගමන් කරනව. ඒ විධියට තරමක් දුරට ගමන් කළායින් පස්සෙ ඒ අසරණ මිනිසුන් අතරමං කිරීම වැරදියි. උඩපුස්සැල්ලාව, රාගල වැනි වතුකර ප්‍රදේශ මැද තිබෙන කුඩා නගරවල මිනිසුන් පදිංචි කරවීම සඳහා නිවාස අවශ්‍යයි. ඒ නිසා එම නිවාස යෝජනා ක්‍රමය කෙරෙහි ගරු ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරන්න කැමතියි.

අ. භා. 2.30

එක් එක් මැතිවරණ කොට්ඨාශයට එක් එක් නිවාස ක්‍රමය බැගින්වත් දෙනවය කියා වරක් කිව්ව. ඒ අනුව නිල්දණ්ඩාහින්නෙන් නිවාස යෝජනා ක්‍රමයකට ඉඩම් ගැනීම සඳහා කටයුතු කරගෙන ගියා. මා හිතන හැටියට ඒ සම්බන්ධයෙන් ගැසට් නිවේදනයකුත් පළ කළා. ඒවා දැන් අතරමංවෙලයි තියෙන්නෙ. මේවා ගැන අනුකම්පාවෙන් කල්පනා කර බලා නැවත වරක් ක්‍රියාත්මක කිරීමට උත්සාහයක් දරණ ලෙසත් අලුත් නිවාස ඇමතිතුමාගේ සහයෝගය ඊට ලබා දෙන ලෙසත් මම ඉල්ලනව. එය ලැබේවා කියා මා ප්‍රාර්ථනය කරනව. මේ රටේ නිවාස ප්‍රශ්නය විසඳීම සඳහා හැකි හැම පරිශ්‍රමයක්ම දරා ක්‍රියා කළොත් සාර්ථක ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් වෙනවට මගෙ හිතේ නම් කිසිම අඩමානයක් නැහැ.

නිවාස තැනීම සඳහා වුවමනා කරන උපකරණවල මිළ බොහොම ඉහළ ගොස් තිබෙනව. ඒ නිසා සාමාන්‍ය මහජනයා අමාරුවට පත්වෙලා ඉන්න බව ගරු ඇමතිතුමාට කරුණාවෙන් මතක් කරන්න ඕනෑ. ගොඩනැගිලි සඳහා වුවමනා කරන යකඩ බඩු, සිමෙන්ති ආදියේ මිළ ඉතාම නරක විධියට ඉහළ ගොස් තිබෙනවා. ගෙවල් හැදීමට වුවමනා කරන බඩු සම්බන්ධයෙන් සීමා කිරීමක් ඇති නොකරන බවට ගරු මුදල් ඇමතිතුමා අයවැය කථාවෙනුත් සඳහන් කර තිබෙනව. එහෙත් අද වනතුරු මිළ ඉහළ යනවා මිස පහළ යන බවක් නම් පෙනී යන්නෙ නැහැ. ඒ නිසා ගෙවල් හැදීමට ගන්න බඩු ගැන ගරු ඇමතිතුමාගේ විශේෂ සැලකිල්ල යොමු කරන ලෙස ඉල්ලනව. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අණට කීකරු වීමක් වශයෙනුත්, දිගින් දිගට කථා කරමින් ඔබතුමාගේ අණට අකීකරු වීමට මේ පැත්තෙ ඉන්න ගරු මන්ත්‍රීවරුන් සූදානම් නැති බව පෙන්වා දීමක් වශයෙනුත් ඔබතුමාට ගෞරව කරමින් මම මගෙ කථාව මෙයින් අවසන් කරනව.

**කෙනමන් මයා.**
*(திரு. கெனமன்)*
(Mr. Keuneman)

Mr. Chairman, let me begin by following up a matter that was raised by the hon. Member for Walapane (Mr. Herath) regarding this proposal of giving contracts to various West German firms for building flats in Ceylon. I am glad that on mature consideration the Government has dropped the proposal.

I must also thank the hon. Leader of the Opposition, because I am personally aware that it was his intervention in the Colombo Municipal Council which persuaded his party people in that Council from taking a very undesirable step.

I raise this matter as a question of principle. I do not understand this great enthusiasm for giving contracts to firms abroad to build houses in Ceylon. We have got here all the necessary materials for building

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කෙනමන් මයා.]

houses and flats. I know there are a number of firms, particularly in West Germany, who are trying to move into this construction business in Ceylon. One of them was given a contract for the construction of the new Central Bank building. I do not know who took over the contract for the Ceylon Insurance Company building. But, I think, it is totally wrong in principle to give contracts to foreign firms to construct buildings in Ceylon. We have available here the necessary labour, skill and materials. Why should we give contracts outside Ceylon for the building of apartments and flats here ? I think, the whole matter is wrong in principle.

I know that our building techniques are antediluvian, completely out of date. The important thing is, let us send a few of our people abroad to learn about modern building techniques. There is no point in giving contracts to foreign firms to come and build for us. I want to register my strong protest against giving contracts to foreign firms to build in Ceylon.

I do hope that the abandonment of this highly questionable proposal does not mean that the Government continues to accept the principle of giving contracts to foreign firms for the building of apartments, flats, houses and other buildings.

You will recall, Mr. Chairman, that the Government told us in the Throne Speech that they are going to build four thousand houses. I do not know whether the Hon. Minister is in a position to tell us now what he intends to do about it.

I was very interested in a proposal to build a large number of flats in my constituency in the Maligawatte area, but up to now we know nothing about it. A large amount of money has in actual fact been voted by this House for the purpose of house construction, but the number of houses that are coming up are very few. There seems to be no systematic plan to push through housing on the scale that is required. Those of us who represent urban areas know the tremendous congestion that exists. We know the problems that exist in places like Colombo, where a third of the houses are unfit for human habitation and another third can only be made fit for human habitation after major structural alterations. I do not think the Government has, since Independence, put up in the City of Colombo more than 2,000 or 3,000 housing units.

I now want to return to a point which I started to deal with in my earlier speech and which the then Chairman asked me to bring up at this stage. I have already seen the Hon. Minister about this matter and I have forwarded to the Ministry protests from a number of tenants of flats in Armour Street, Wolfendhal Street, Blomendhal Road and other places. These flats belong to the Department of National Housing. I pointed out that a number of these persons have been asked to enter into agreements with the department by the 1st of this month by which they will be called upon to pay increases in rent amounting, in some cases, to 20 per cent. and, in other cases, to as much as 30 per cent. This is scandalous profiteering and rack-renting on the part of the department.

Apparently, the Government has decided that persons in Government flats belonging to the Department of National Housing, whose aggregate family incomes are over Rs. 200 a month, must have their rents increased. I want to point out that this is totally unfair in respect of the houses in the schemes that I mentioned, particularly in my constituency—Armour Street and Wolfendhal Street. These were, first of all, intended to be working class housing schemes, but the actual rents that are being charged are such that it is very difficult for workers to live in these flats. Persons living in some of these flats are asked to pay as much as Rs. 60 a month or more for a flat. This is hardly an amount of money which the average worker can afford to pay.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

At the time these persons were asked to come into these flats, the Government obtained a large number of particulars from them, including particulars of income. And it was on that basis that they were given the flats. Now, out of the blue comes an order from the department, "Those who have a family income of over Rs. 200 a month must pay increases ". I do not understand this principle. The rent of a house must be determined not by the income of the occupant ; the rent of a house must be determined by the facilities which you provide, or the cost of construction, or something of that sort. Or you must reverse your principle and say, " We will give you houses but everyone should pay 10 per cent. of his income ".

You are trying to mix up all types of principles, but the real thing is that you are trying to withdraw the subsidy on housing, or to limit the subsidy on housing—working class housing. You are making it more and more difficult for persons to be able to live in these houses. There is a tremendous amount of subletting going on. Why ? Because tenants cannot, out of their family income, pay something like 35 to 40 per cent. on rent and continue to live ; therefore they let out a part of their flat or Government house. I do not now why the Government gets so annoyed about it. These tenants are probably doing a service under the present circumstances because they are finding accommodation for people who have no accommodation.

I brought this to the notice of the Minister and asked him then, when I interviewed him, to see to it that this principle is abandoned. I hope he will be in a position to give an assurance that the Government will not pursue this utterly obnoxious principle on which a large number of persons in my constituency who are living in Government flats are being asked to pay as much as a 25 to 30 per cent. increase in rent. At least let the Minister give us this assurance. All these persons were told that if they do not negotiate new agreements by which they undertake to pay these enhanced rents by the 1st of September, action would be taken to remove them from their houses. The 1st of September has come and gone, and still a large number of people have not negotiated these new agreements. I ask the Government not to set a date like this, to withdraw the letters sent and to see that the whole matter is looked into and a full decision is reached, and only after that to take necessary action. I hope the Hon. Minister will give us a clear assurance that that will be done.

**අමරනන්ද රත්නායක මයා.** (පස්සර)
*(திரு. அமரானந்த ரத்ஞுயக்க—பஸ்ஸறை)*
(Mr. Amarananda Ratnayake—Passara)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන සන්තෝෂ වන අතර ඒ ගැන මම තමුන්නාන්සෙට ස්තුති කරනව. ආණ්ඩු පක්ෂයෙ මන්ත්‍රීවරයෙකු හැටියට ඉඳගෙනත් මේ ගැන විරුද්ධව කථා කරන්න සිදුවීම ගැන මා කනගාටු වෙනව. අලුත් ඇමතිවරයකු භාරයට මේ අංශය දී තිබීම ගැනත්, එතුමා කෙරෙහි විශ්වාසය තැබීමට හැකි වීම ගැනත් අපි සන්තෝෂ වෙනව. අප කියන දේට ඇහුම් කන් දී අපේ ප්‍රශ්න විසඳීමට එතුමා ක්‍රියා කරනවා ඇතැයි යන විශ්වාසයෙනුයි මම කථා කරන්නෙ. අද මේ ප්‍රශ්නය නිසා අපට අපේ ඡන්දදායකයන්ට මුහුණ දෙන්න බැරි තත්ත්වයක් මතුවෙලා තියෙනව.

එක් මැතිවරණ කොට්ඨාශයකින් 75 දෙනකු බැගින් තෝරාගෙන එක්කෙනාට රුපියල් දෙදාහ බැගින් නිවාස ණය දීමට මුලදී ක්‍රියා කළ බව අපි කවුරුත් දන්නව. මගෙ කොට්ඨාශයේ 140 දෙනකුගෙ නම් ඇතුළත් ලැයිස්තුවක් මට දකින්න ලැබුණා. එදා මම හිතුව ඒ මිනිසුන් බොහොම වාසනාවන්තයන් වෙන්න ඕනෑ කියල. එහෙත් දැන් නම් මට පෙනී යනව ඒ අය ඉතාම අවාසනාවන්ත පුද්ගලයින් බව. ඒ අය මේ ගැන බලාපොරොත්තුවෙන් හිටිය. මුදල් වියදම් කරලත් තියෙන්ව මුදල ලැබේය කියා හිතාගෙන. අද [illegible] සතයක්වත් ණය මුදලක් හැටි

[අමරනන්ද රත්නායක මයා.]

යට එක්කෙනෙකුටවත් ලැබිල නැහැ. මේ කටයුත්ත භාරව හිටපු ඇමතිතුමා සෑහෙන තරම් උනන්දුවක් දැක්වූයේ නැත කියලයි මම නම් හිතන්නෙ. ඒ වගේම දෙපාර්තමේන්තුවත් බොහෝ අසාධාරණ ලෙස නීතිරීති හදාගෙන ගම්බද මහජනයාට සහනයක් ලබා ගන්න බැරි වන ආකාරයට කටයුතු කරන බවයි කියන්න තියෙන්නෙ. මා නියෝජනය කරන ප්‍රදේශයේ නිවාස ප්‍රශ්න බොහොම කනගාටුදායක තත්ත්වයකයි තියෙන්නෙ. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවත් මේ ප්‍රශ්නය ගැන සැලකිල්ලකින් කටයුතු කිරීම ගැන මා සන්තෝෂ වෙනව. ජනතාවට ගෙයක් හදා ගැනීමට රජයේ ඉඩම් අක්කර දෙකකුත්, රුපියල් දාහකුත් දීමේ වැඩ පිළිවෙළක් අනුව සෑහෙන සහනයක් ලැබෙනව. තමන්ගෙ ගෙවල් දොරවල් දිරාපත්වීම නිසා ඒවා අලුත්වැඩියා කර ගැනීමට මුදල් නැති අය අප සොයාගෙන එනව, එවන්නත් හුඟක් ඉන්නව. ඒ අයට නිවාස දෙපාර්තමේන්තුවෙන් කුමන විධියෙ සහනයක්ද දෙන්නෙ කියල මා අහනව. එවැනි අයට රුපියල් 2,000 තබා රුපියල් 1,000 ක ණය මුදලක් වත් ලබා ගෙන ආපසු ගෙවන්න බැරි තරමයි. එම නිසා ඒ අය වෙනුවෙන්ද යම් කිසි වැඩ පිළිවෙළක් යොදන හැටියට මා ඉල්ලනව. ලක්ෂ ගණන් වියදම් කර නගරවල නිවාස ක්‍රම බිහි කරනව. ඊට අඩු ගණනක් වියදම් කිරීමෙන් ගම්බද ජනතාවට නොතෙමී ඉන්න නිවාස සාදා දෙන්න පුළුවනි.

අ. භා. 2.45

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තවත් කාරණයක් ගැන කියන්න තියෙනව. බොහෝ අයගෙ ගෙවල් ගින්නට අසු වීමෙන් වැස්සට අසු වීමෙන් සහ ගංවතුරට ගොදුරු වීමෙන් කැඩී යනව. එවැනි අවස්ථාවලදී සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් රුපියල් 50—100—200 යනාදී වශයෙන් ආධාර මුදල් ගෙවනව. එම වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම වැරදි බවයි මගෙ හැඟීම. ඒ විධියට කරුණු යෙදී යමෙකුට ඉන්න තැනක් නැති වුණහම ඇති. නිවාස දෙපාර්තමේන්තුවට එම වගකීම භාර ගෙන ඔහුට ඉන්න තැන සාදා දීමේ වැඩ පිළිවෙළක් යොදන්න ඕන. එවැන්නන්ගේ ගෙවල් අළුත්වැඩියා කරගන්නත් ඒ අන්දමින් ආධාර කරන්න පුළුවනි.

නගරබද නිවාස යෝජනා ක්‍රමත් නිසියාකාර ක්‍රියාත්මක වන්නෙ නැහැ. රජයේ සේවකයන් පිට පළාත්වලට මාරු වීමට අකමැත්ත ප්‍රකාශ කරන්නෙත් නිවාස සොයා ගන්න තියෙන අමාරුකම නිසයි. අළුත් තැනකට ගියාම දහස් ගණනින් "කී මනි" ගෙවන්න සිදු වෙනව. එම නිසා ආණ්ඩුවේ සේවකයන් සඳහාද මීට වඩා ක්‍රමවත් නිවාස ක්‍රමයක් ඇති කරන හැටියට මං ඉල්ලා සිටිනව. රජයේ සේවකයන්ට කරදරයක් නැතුව ඉන්න නිවාස සපයා දීම තමුන්නාන්සෙලාගෙ යුතුකමක්.

එක ඡන්ද කොට්ඨාශයකින් 75 දෙනකු බැගින් තෝරාගෙන නිවාස ණය දීමේ වැඩ පිළිවෙළක් ගෙනිච්ච. ඒ අනුව ලැයිස්තුගත කරන ලද අයට ඉක්මණින් ණය මුදල් දෙන්න ඕනැ. රුපියල් 2,000 ගණනෙ ණය මුදල් දෙන්න විධියක් දැනට නැති නම් ඊට අඩු ප්‍රමාණයකින් හෝ එම ලැයිස්තුවලට ඇතුළත් වෙලා ඉන්න අයට ණය දෙන්න උත්සාහ ගන්න ඕනැ. ණය මුදල් ලබා ගැනීමට පෙර ඔප්පු සම්බන්ධ කටයුතු කර ගැනීම සඳහා ඒ අයට පෙරකදෝරුවන්ට ගාස්තු ගෙවන්න සිදු වී තියෙනව. ප්ලෑන්වලට ගාස්තු ගෙවන්න සිදු වී තියෙනව. එපමණක් නොවෙයි, දෙමව්පියන්ගේ නමින් තිබුණු ඉඩම් තමන්ගේ නම් වලට ලියා ගන්නත් ඇතැම් අයට ඔප්පු ගාස්තු ගිහින් තියෙනව. ඒ වෙනුවෙන්ද නිවාස දෙපාර්තමේන්තුව මගින් මුදලක් ගෙවිය යුතු බව මතක් කරන්න කැමතියි.

මෙම ප්‍රශ්න කෙරෙහි අවධානය යොමු කරන හැටියට ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் பிரதி அக்கிராசனர்)*
(The Deputy-Chairman of Committees)

දැන් ගරු ඇමතිතුමා පිළිතුරු දෙනව ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බී. එච්. බණ්ඩාර මයා.** (බදුල්ල)
*(திரு. பி. எச். பண்டார—பதுளை)*
(Mr. B. H. Bandara—Badulla)

මටත් එක කාරණයක් ගැන කතා කරන්න තියෙනව. තව තුනට විනාඩි දහයයි තියෙන්නෙ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා** (යටියන්තොට)
*(டொக்டர் என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)*
(Dr. N. M. Perera—Yatiyantota)

Sir, there is only one point I wish to refer to and I want only one minute. All that I am saying is that you promised so much will be given as loans to the people, and I do not understand why such a long time is taken to get these things finalized. May I read out a letter that a constituent of mine had received regarding a loan that he had applied for ? It is dated 22nd October, 1962. I will read it :

"නිවාස ණය මුදල්

62. 10. 18 දින දරණ ලිපියත් සමග රුපියල් 125 සඳහා එවන ලද අංක 94818 හා 62. 10. 18 දින දරණ මුදල් ඇණවුම ලැබුණු බව දන්වමි. මුදල් භාර ගත් බවට කුවිතාන්සිය ඔබට යථා කාලයේදී ලැබෙනු ඇත. ඔබ ඉදිරිපත් කරන ලද නිවාස සැලැස්ම හා ඇස්තමේන්තු අනුමත කිරීමට සලසා ඇත. අනුමත කළ පසු ඉඩම තක්සේරු කිරීම පිණිස කටයුතු සලස්වන බවද දන්වමි."

Now, for one year what has the department been doing ? Nothing has happened ! This letter is dated October, 1962. Please find out from your department what they are doing. For one whole year these people are waiting. Are we to hold up for one year the construction of a house ? What is it that your department is doing ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

There is no money.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(டொக்டர் என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Then why do you not say so or inform them, so that they could make some other arrangements ? If there is no money, say so ; you must keep them informed of what is happening. Is it fair ? They have to pay Rs. 125 ; they are poor people. Please get your department to take some action in this matter. That is all. I am sorry that I took your time, and I only wanted one minute.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කරුණු දෙකක් ගැන පමණයි, මා මතක් කරන්ට අදහස් කරන්නෙ. එක් එක් ඡන්දදායක කොට්ඨාශයෙන් 75 දෙනා බැගින් තෝර ගෙන රුපියල් 2,000 බැගින් නිවාස ණය දෙන බව මීට කලින් අවුරුද්දක රාජාසන කථාවකදී සඳහන් කරන්ට යෙදුණා. මා මේ කථා කරන්නෙ මා නියෝජනය කරන කොට්ඨාශයේ තත්ත්වය ගැන සලකා ගෙන පමණයි. එදා රාජාසන කථාවෙන් ඒ විධියේ කාරණයක් ප්‍රකාශ වුණාට පසු අප අපේ ඡන්දදායක කොට්ඨාශවලට ගොස් එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව නම් රුපියල් ලක්ෂ ගණනින් ධනපතියන්ට පමණක් නිවාස ණය දුන් නමුත්—

**ඩඩ්ලි සේනානායක මයා.** (දැදිගම)
*(திரு. டட்ளி சேனநாயக்க—டெடிகம)*
(Mr. Dudley Senanayake—Dedigama)

මොකක්ද කිව්වෙ ?

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

මා කියන්නෙ මේ මා නියෝජනය කරන කොට්ඨාශය ගැන පමණයි. එදා ඒ විධියට කළත් අප එක එක ඡන්දදායක කොට්ඨාශයෙන් 75 දෙනකු බැගින් තෝරාගෙන රුපියල් 2,000 බැගින් නිවාස ණය දෙන බව කිව්ව. මේ නිවාස ණය ගැනීම පිණිස ඒ පළාත්වල දුප්පත් මිනිසුන් පෙරකදෝරු ගාස්තු ගෙවමින් ප්ලෑන් ආදිය සකස් කර ගැනීම සඳහා විශාල මුදලක් වියදම් කළා. එක්තරා පුද්ගලයකු මේ සඳහා රුපියල් 800 ක් පමණ වියදම් කළා. නමුත් තවම ඔහුට රුපියල් 2,000 ලැබුණෙ නැහැ. මා නියෝජනය කරන කොට්ඨාශයේ කී දෙනකුට නිවාස ණය ලැබුණාද කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බණ්ඩාර මයා.]

මට නම් ආරංචියක් නැහැ. නමුත් මට දැනගන්ට තිබෙන හැටියට නම් තවම කාට වත් ලැබී නැහැ. සමහර විරුද්ධ පාක්ෂික ගරු මන්ත්‍රීවරුන් නියෝජනය කරන කොට්ඨාශවලට නම් මේ ණය මුදල් ලැබී තිබෙන බව ආරංචියි. සමහර විට ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් නියෝජනය කරන කොට්ඨාශවලට නිවාස ණය දීම අත්සිටුවීමට නිලධාරීන් අතර කූට ව්‍යාපාරයක් තිබෙනවද කියා මා දන්නෙ නැහැ. ඇත්ත වශයෙන්ම මේ රුපියල් 2,000 නිවාස ණය මුදල් ලබා ගන්ට ගොස් සමහරුන් සතුව තිබුණු ඉඩම් කෑල්ලටත් තට්ටු වන තැනටයි, දැනට කරුණු සිදු වී තිබෙන්නෙ. එක් තැනැත්තකු රුපියල් 800 ක් වියදම් කළත් තවම රුපියල් 2,000 ලැබුණෙ නැහැ. එක්කෝ මේ රුපියල් 2,000 නිවාස ණය ලබා දෙන්න; එසේ නැත්නම් නිවාස ණය ලබා ගැනීම සඳහා සූදානම් වුණු මිනිසුන්ගෙන් ඒ සඳහා වියදම් වූ මුදල් ආපසු දෙන්න.

තට්ටු නිවාස සදන විට පිටිසර පළාත් ගැන සැලකිල්ලක් දක්වන්නෙ නැහැ. තට්ටු නිවාස කොළඹට පමණයි. අපේ පළාත්වලට නිකම්ම තට්ටු වෙනව. කර්මාන්තශාලා හදන්නෙත් කොළඹ හෝ කොළඹ අවටයි. කොළඹ, කැලණිය, පූගොඩ, වේයන්ගොඩ, ආදී ප්‍රදේශවලයි කර්මාන්තශාලා පිහිටුවන්නෙත්. නමුත් සල්ලි හම්බ කරන්නෙ ඌව පළාතෙ මිනිස්සු. ඌව පළාතෙ තේවතු නිසා තමයි, මේ රට නඩත්තු වෙන්නෙ. එසේ වුණාට විශේෂ සැලකිලි ලැබෙන්නෙ වෙන පළාත්වලටයි. අපේ පළාත නොදියුණුවම තිබෙන්ට ඉඩ හැරීම අසාධාරණයි. බදුල්ල ප්‍රදේශයෙත් නිවාස නැති අය ඉන්නව. අග හිඟකම් තිබෙන අය ඕනෑ තරම් ඉන්නව. එම නිසා තට්ටු නිවාස සදන විට ඒ පළාත් ගැනත් විශේෂයෙන් සලකා බලන ලෙස මා ඉල්ලා සිටිනවා.

**පී. බී. විජයසුන්දර මයා.** (කිරිඇල්ල)
*(திரு. பீ. பி. விஜேசுந்தர—கிரியல்ல)*
(Mr. P. B. Wijesundera—Kiriella)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂ කරුණු තුනක් ගැන සඳහන් කරන්ට බලාපොරොත්තු වෙනවා. දැන් නිවාස ණය දීම නතර කර තිබෙනවා. කෙසේ වෙතත් නැවතත් නිවාස ණය දීම ආරම්භ කළොත් පෞද්ගලිකව නිවාස ණය ලබා ගැනීමට බලාපොරොත්තු වන අයට දුෂ්කරතාවයන් තුනකට මුහුණපාන්ට සිද්ධ වෙනවා. එයින් පළමුවැනි කාරණය මෙයයි. ණය දීමේ ව්‍යවස්ථාවල සඳහන් කර තිබෙනවා, උගසට තබන ඉඩම බෙදූ ඉඩමක්, ඒනම් තනි අයිතියක් ඇති ඉඩමක් විය යුතුය කියා. ගම්බද ප්‍රදේශවල ණය ඉල්ලුම්කරුවන්ට තනි අයිතියක් ඇති ඉඩමක් සොයා ගන්න අමාරුයි. ඒ නිසා නොබෙදූ ඉඩම් උගසට තැබීමෙනුත් නිවාස ණය මුදල් දීමට හැකි වන සේ යම් නීතියක් සම්පාදනය කරන මෙන් මම ඉල්ලා සිටිනවා.

දෙවැනි කාරණය මෙයයි. නිවාස ණය ඉල්ලුම්කරුවෙකු ආදායම් බදු ගෙවන පුද්ගලයකුගෙන් සහතිකයක් ලබාගත යුතුව තිබෙනවා. දුප්පත් කෙනෙකුට ඒ විධියේ සහතිකයක් ලබා ගැනීම අමාරු දෙයක්. සෑහෙන මුදල් තත්ත්වයක් තිබෙන කෙනෙකුට පමණයි එවැනි සහතිකයක් ලබා ගැනීමට පුළුවන් වන්නෙ. ඒ නිසා අන්න ඒ ව්‍යවස්ථාවත් වෙනස් කරන්ට ඕනෑ.

තුන්වැනි කාරණය නම්, නිවාස ණය ඉල්ලුම් කළයුත්තේ ගෘහ මූලිකයෙකුය කියා කොන්දේසියක් තිබෙනවා. එතන, ගෘහ මූලිකයා පිරිමි පුද්ගලයෙක් විය යුතුයි. සමහර පවුල්වල පිරිමි ගෘහ මූලිකයන් නැති බව අපි දන්නවා. පියා නැතිවෙලා, දුව රක්ෂාව කරමින් අම්මත්, සහෝදර සහෝදරියනුත් නඩත්තු කරනවා. ස්ත්‍රියක් නිසා ඒ දුවට නිවාස ණය ඉල්ලුම් කරන්න බැහැ. ගෘහ මූලිකයා පිරිමියෙක් නම් පමණයි නිවාස ණය ඉල්ලුම් කළ හැකිව තිබෙන්නෙ. එම නිසා ඒ කොන්දේසියත් නිවාස ණය දීමේ කොන්දේසි මාලාවෙන් තුරන් කරන මෙන් මම ඉල්ලා සිටිනවා.

නිවාස ඇමතිතුමා පෞද්ගලික වශයෙන් දවසක් සාකච්ඡාවකදී කිව්වා, නිවාස සංයුක්ත මණ්ඩලයක් ඇති කරන්ට බලාපොරොත්තු වෙනවාය කියා. එය හොඳ අදහසක් බව මම හිතනවා. ඒ වගෙම ඡන්ද කොට්ඨාශවල නිවාස යෝජනා ආරම්භ කිරීම සම්බන්ධයෙන් මට කියන්ට තිබෙන්නේ, කිරිඇල්ල ඡන්ද කොට්ඨාශයේ මෙතෙක් නිවාස යෝජනා ක්‍රමයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පළමුදා වේරහැර හොරකමක් ඇල්ලුව. ඇලුමිනියම් ගොඩවල් ගණනෙ වික්ක, ටොන් ගණනෙ නොවෙයි. ඇලුමිනියම් ටොන් එකක් රුපියල් 4,500 ක් පමණ වෙනව. වික්කෙ තොග ගණනෙයි, ටොන් ගණනෙ නොවෙයි. මේ ගොඩ අහවලාට කියා වික්ක. ගොඩේ ටොන් 18 කට වඩා තිබුණ. ලොරිය ඇවිත් ගෙන යන විට ස්ටෝරුවෙ ඉන්න තැනැත්ත කීව, මේතන වැඩිපුර තියෙනව, මේක දෙන්න බැහැ, කියා. එතකොට ටොන් 14 ක් පිට වෙලා. හොරකම අල්ලා රිපොට් කළ තැනැත්ත තුණ්ඩු කැල්ලක් ඇරිය, ඉහළ නිලධාරියට. ඉහළ නිලධාරිය ඒ තුණ්ඩුවෙම අතික් පැත්තෙ ලියා එව්ව, මේක තමුසෙගෙ වැඩක් නොවෙයි, ගෙන යන්න ඉඩ දෙන්නය, කියා. ඒ වැඩෙන් රුපියල් 26,000 ක් හොරකම් කළා. ඊයෙ පෙරෙයිද ඒක උඩ ස්ට්‍රයික් එකක් ඇති වුණා. ඒ මොකද? රුපියල් 26,000 ෙහ හොරකම අල්ලා දුන් තැනැත්තට දඬුවම් දුන්න; ඉන්ටර්ඩික්ට් කළා. හොරකම් කළ මිනිහ නිදහස්. ඒ මිනිහට තවත් උසස්වීම් දෙයි.

**හේරත් මයා.**
*(திரு. ஹேரத்)*
(Mr. Herath)

කැකිල්ලෙ රජ්ජුරුවන්ගෙ නඩු තීන්දුව වගෙයි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

එතන තිබෙන සමිති ඔක්කොම එකතු වෙලා සාකච්ඡා කරන්න ගියා, ඒ ගැන. නමුත් එයාගෙ ඕඩර් එක එයා වෙනස් කළේ නැහැ. ඒ නිසා ස්ට්‍රයික් එක ඇති වුණාය කියා ඊයෙ මට දැන්නුවා. හොරකම අල්ලා දුන්න මිනිහට දඬුවම්. හොරකම කළ මිනිහ නිදහස්. කොටස් තියා ගෙනයි, මේව කරන්නෙ. රු. 26,000 ක ඇලුමිනියම් වැඩිපුර දුන්න නම් 13,000 ක්වත් ඇති කොටස් කාරයන්ට. මම මේ චෝදනා කෙළින්ම ඉදිරිපත් කරනව. කව්රුවත් නැත කියන්න එපා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

ගමේ මිනිහෙක් රුපියල් පහක දෙයක් හොරකම් කළොත් නඩු දමා වැලිකඩ අරිනව. ඉස්සර බස් කොම්පැනි කාරයන්ගෙ අයියල මල්ලිල මහජනයගෙ මුදල් හොරකම් කිරීම නැවැත්වීමට වැඩ පිළිවෙළක් යොදනවද? අරක්කු බෝතල බාගයක් බිව්වට මේ වැඩ කෙරෙන්නෙ නැහැ. අද සිදු වන දේයි මම කියන්නෙ. මහජනයත්, වැඩ කරන කම්කරුවොත් මේව ජනසතු කරන්නය කීවෙ බොහොම ආශාවෙන්. නමුත් මැෂින් එකක් හරි ගැස්සීම ගැන එක කම්කරුවකුවත් දෙන උපදෙස් පිළිගන්න ලෑස්ති නැහැ. එක අංශයක පමණක් නොවෙයි, වඩු අංශයේ වැඩ කෙරෙන්නෙ කොහොමද? පානදුරේ නැත්නම් වෙන තැනක ලී ටික ඉරනව, බස් බොඩි ගහන්න. කඳන් ටික ඉරල, පිට පළුත් සමග අඩුක්කු කරල, සම්පූර්ණ කරල එවන්න ඕනෑ. ලොරිය ගෙනෙනව. ඇතුළෙ තිබෙන හොඳම ලෑලි කීපය නැහැ. පිටපළුවලින් වහගෙන හොඳම හල් මිල්ල ලෑලි ටික කොන්ත්‍රාත්කාරයො අරගෙන යනව. කොන්ත්‍රාත්කාරයන් සමග වැඩ කරද්දි හොරකම ගියේ ඔහොමතමයි. මේව ඇල්ලුවද? කම්කරුවන් කී විතාවක් මේව ඉදිරිපත් කළාද? ඇළුමිනියම් ටික හොරකම් කරන්නෙ ඔහොමයි, ටයර් ටික හොරකම් කරන්නෙ ඔහොමයි, ලී ටික හොරකම් කරන්නෙ ඔහොමයි. ස්පෙයාර් පාට්ස් ගණන් නැහැ. පංචිකාවත්තේ කොම්පැනිකාරයන් කොපමණ ඉන්නවද? ඒ සියල්ලෙම කොටස්කරයො ලංගමයේ නිලධාරින්ගේ නෑදෑයො. ඒ බඩු යන්නෙ ඒ තැන්වලටයි. ගුණසේකරලා, සිරිල් ද සොයිසලා, අමරසේකරලා ඔක්කොම එතැන—

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

අපිද?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

තමුන්නාන්සෙ ඉන්නවද, මම දන්නෙ නැහැ. දින පතා කෙරෙන වැඩ පිළිවෙළ ඕකයි. බස් එකක ගජන් පින් එකක් වගේ සුළු කෑල්ලක් කැඩුණාම ඒක වේරහැරට ඇදගෙන යනව. ඒක ඒ ස්ථානයට ගෙනාවාට පසු කාබරේටර් එකේ ජෙට් එක ස්ටික් වෙන තවත් බස් එකක් ඒ ස්ථානයට ආවොත් අර ගජන් පින් එක කැඩී තිබෙන බස් එකේ කාබරේටර් ජෙට් එක ගලවල අනික් බස් එකට සවිකර හදා යවනව. ගජන් පින් කැඩී තිබුණ බස් එකේ කාබරේටර් ජෙට් එකත් ගජන් පින් එකත් දෙකම දැන් නැහැ. ඒක මාස ගණනක් අයින් කර තබා පසුව වෙන්දේසි කරනව. ඒක පාරට දමන්ට බැහැ, බඩු නැහැ, කැඩිල කියා වෙන්දේසි කරනව. මේ කරුණු ගැන කවුරුත් හොයනවද? සී. සී. එස්. එකේ හිටියය, නැත්නම් අසුවල් දෙපාර්තමේන්තුවෙ සිටියය, මේ ගොල්ල තමයි කෙරුම් කාරයො කියමින් නිලධාරින් පත් කරනව. නෑදෑයො කට්ටිය වට කරගෙන මේ හොරකම ගෙන යනව. සාධාරණ කම්කරු ඉල්ලීම්වලට ඇහුම්කන් දෙන්නෙ නැහැ.

අ. භා. 5.30

වේරහැර වැඩපොළේ 3,000 කට අධික කම්කරු පිරිසක් සේවය කරනව. බස් බොඩි හදන අංශය, එන්ජින් සාදන අංශය ආදී සෑම අංශයක්ම ඒ ස්ථානයේ තිබෙනව. ඔය සියලුම අංශවල සේවය කරන කම්කරුවන් වෘත්තිය සමිති යටතේ සංවිධානය වී සිටිනව. ඒ උදවිය කියන දේවල් අහන්නෙවත් නැහැ. හොරකම අල්ලල දුන්නොත්, අල්ලා දුන් පුද්ගලයාටයි අච්චු කරන්නෙ. දහස් ගණන් පඩි ලබන මේ නිලධාරි කට්ටියට මේ ස්ථානය මේ තත්ත්වයට කාබාසිනියා කරන්ට ඉඩ දී තිබෙන්නේ මේ සිරිමා බණ්ඩාරනායක ආණ්ඩුවත්, ඇමතිවරුත් බව මා කියන්ට ඕනෑ. බස් ධාවනය කිරීම ගැන සිරිමා බණ්ඩාරනායක අගමැතිනිය දන්නෙ මොන කෙහෙල්මලද? එකම මාර්ගයකටවත් අවශ්‍ය තරම් බස් නැහැ. හැම බස් නැවතුම් පොළකම වගේ පණහ-සියය පෝලිම්වල නිතරම වගේ ඉන්නව. බස් නහැ; කැඩිල.

කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඩී. එස්. සමරසිංහ මයා.) ඊයේ පෙරේදා වැඩ පිළිවෙළක් යෝදුව, බස් නිකම් විකුණන්ට එපාය, ගැසට් මාගීයෙන් මහ ජනයා අතර ප්‍රසිද්ධ කර වෙන්දේසි කරන්ටය කියා. ඊට කලින් බස් වෙන්දේසියෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගියේ රුපියල් 50ට, 60ට, 70ට 100ට, 200ට. වැඩිම එක ගියේ 600ට. මේ අන්දමට ගැසට් පත්‍රය මාර්ගයෙන් ප්‍රසිද්ධ කර වෙන්දේසි කරන්ට වුණාට පසු, දැන් රුපියල් 9,000 ටත් යනව. මීට හේතුව එතුමා මෝටර් රථ පිළිබඳව කරුණු ටිකක් දන්නව. ඉස්සර එතුමාට ගැරේජ් එකක්, ෂෙඩ් එකක් එහෙම තිබුණ. ඒ නිසයි, ඒ සොරකම නවත්වන්න පුළුවන් වුණේ. මේ වැඩ පිළිවෙළ ඇති කළාට පසු දැන් පරණ බස් රුපියල් 9,000 ටත් වෙන්දේසි වෙනව. මේ කටයුතුවල යෙදී ඉන්න නිලධාරීන් නේද මේවාට වගකියන්න ඕනෑ? සී. සී. එස්. නැත්නම් වෙනත් ඉහළ විභාග පාස් කළ අයනේද මේ තනතුරුවලට පත් කර සිටින්නෙ? අඩු වශයෙන් මේ සී. සී. එස්. කාරයන්ට මොළේ නැද්ද මේ හොරකම්වත් නවත්වන්න? [බාධා කිරීමක්] ඉස්සෙල්ලම මේ කටයුතු භාරව හිටියේ සී. සී. එස්. කාරයොයි.

සභාපතිතුමනි, මා හිතන්නෙ මේ කටයුතුවලට රජයේ වැඩ දෙපාර්තමේන්තුවත් සම්බන්ධයි. ඒ දෙපාර්තමේන්තුව පාරවල්වල වළවල් හදනව, බස් එක වැටුණු හැටියෙ කැඩෙන්න. පුදුම සම්බන්ධකමක් තිබෙන්නෙ. මේක මහා පුදුම සම්බන්ධකමක්. මම හොඳට දන්නවා, පී.ඩබ්ලිව්.ඩී. එකේ ඕවර්සියර්වරුයි, ඉංජිනේරුවරුයි මේ කට්ටිය සමග පුදුම සම්බන්ධකමක් තියෙනවා. පාරේ තිබෙන වළවල් සාදන්නෙ නැති නිසා දිනකට බස් හතර බැගින් කැඩුණා ඒ දවස්වල බත්තරමුල්ල-තලංගම පාරෙ. ඔව් මේවා කොපමණ කීවත් ගණනක් නැහැ. මහජන මුදල් කාබාසිනියා කරමින් බිබී ඉන්න පමණයි දන්නෙ. බිව්වත් කමක් නැහැ අනික් වේලාවට, තියෙන වැඩ ටික කරනවා නම්. මේවා කාට කියන්නද? හරියට වැඩ ටික කරන්න බැරි නම් යන්න ඕනෑ දොට්ට. කොම්පැනිකාරයන්ගේ නැඳැයින් දමාගෙන ඒ අයට ඕනෑ විධියට ලංගමයෙ වැඩ කෙරෙන නිසයි එතන කම්කරුවන් ස්ට්‍රයික් කරන්නේ. අද දින ලංගමයේ ස්ට්‍රයික් එකක් පටන් ගෙන තිබෙන්නෙ ඔවුන් අල්ලා දුන් හොරුන්ට දඬුවම් දී හිරගෙදරට නෑර ඔවුන් ආරක්ෂා කරන නිසයි. ඔවුන් කරන්නෙ විශාල ජාතික සේවයක්. [බාධා කිරීමක්]

දැන් ලංගමයෙන් හොරකම් කරන්නෙ ලී සහ ඇලුමිනියම්. නිලධාරීන් නොදැනුවත්ව නොවෙයි මේවා පිට වන්නෙ. මෙතනින් පිටවෙනවා, අනික් පැත්තෙන් ඒ ගොල්ලන්ගෙ සාක්කුවලට කොටස එනවා. මේ නිලධාරීන්ට වැඩි කාලයක් රක්ෂාව නොකළාට කමක් නැහැ. සමහර අය ඉන්නෙ හය හත් මාසයයි. වැඩි වුණොත් අවුරුද්දයි. මේ කාලය තුළදී ඒ ගොල්ලන්ට පුළුවන් රුපියල් දහ පාලොස් දාහක් හම්බකර ගන්න. ඇයි, මතක නැද්ද අර කස්ටම්ස් එකේ එක්කෙනා දවසකට රුපියල් ලක්ෂයක් හම්බ කරන්න ගිය හැටි? ඒ නැනැත්තා කීවා, ඒ මුදල හම්බ වුණා නම් ඒ ඇතිය කියා. සමහර උදවිය නම් කියනවා, මේ සභාවෙ තත්ත්වය ආරක්ෂා කරන්න ඕනෑය කියා. මේ විධියට හොරමැරකම් කරන අය කරන්නෙ තමන්ගෙ තත්ත්වය කෙළසීමක්ද රැකීමක්ද? ඉතින් මෙවැනි අයගේ විස්තර මෙහි කීවාම මොකක්ද කෙළසෙන්නෙ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

අපිත් ඕනෑකමින් අහගෙන ඉන්නවා, නමුත් සමහර වචන තේරෙන්නෙ නැහැ, මන්ත්‍රීතුමා බොහෝම වේගයෙන් කථා කරන නිසා.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

සෑම දාම මේ කාරණා කියලත් ඒවායින් ප්‍රතිඵලයක් නොලැබුණාම ටිකක් වේගයෙන් කථා කරන්න වෙනවා.

බස් කොම්පැනි තිබුණ කාලෙ ජනතාව සූරාගෙන කෑවා. ඒ නිසයි එය ජාතික ව්‍යාපාරයක් වශයෙන් පටන් ගත්තෙ. කොම්පැනි ක්‍රමය අධිරාජ්‍යවාදීන්ගෙ කාලෙ පටන් ගෙන යූ. එන්. පී. කාලේත් ගෙන ගියා. මේ ක්‍රමය වෙනස් කර ජනසතු කිරීමේ අවස්ථාවට ගෙනාවෙ බොහෝම අමාරුවෙනුයි. යූ. ඇන්. පී. ආණ්ඩුව කාලෙත් කළා. අධිරාජ්‍ය කාලෙත් කළා. බණ්ඩාරනායක කාලෙත් කළා. මම නැතෙයි කියන්නෙ නැහැ. අන්තිමට එන කොට වෙනස් කෙළේ ජනතාවගෙ බල පෑම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

උඩයි. නමුත් ඒ වෙනස් කළ එකේ ප්‍රයෝජනය රටට දුන්නද? නැහැ. අද දිනෙන් දිනම මොකක්ද වෙන්නෙ? අපි බස් එකක් ඉල්ලුවාම බස් එකක් දෙන්නෙ නැහැ. තිබෙන බස් එක පාරට ලොකු වැඩියි කියා එවන්නෙ නහැ. කඩුවෙල ගමේ සිට මාලාබෙ, හෝකන්දර පන්නිපිටිය හරහා මහරගමට යන්න බස් සේවයක් අපි ඉල්ලා තිබෙනව. ඒ ප්‍රදේශයේ ගමනාගමනය කරන උදවියයි මේ ඉල්ලන්නෙ. සමිති සමාගම්, ට්‍රැවලර්ස් ඇසෝෂියේෂන් වල ඉල්ලීම් උඩයි මේ සේවය ඉල්ලා ඇත්තෙ. ඔහෙ නැහැ බස් එකක්. නමුත් මේ දෙපාර්තමේන්තුවෙන් පිට කරන බඩුවලින් හදුගත් වෑන් ඒ පාරෙ දුවනව. වෑන් එකය කිව්වට තිහක්-හතළිහක් පටවනව. පිටරටින් ටයර් එන්නෙ නැතිලු. එහෙනම් ඒ වෑන්වලට ටයර් කොයින්ද? මෙන්න ටයර් එන හැටි. සීටීබී එකෙන් අහවල් ටයර් රිට්රේඩින් කොම්පැනියට කියා රිට්රේඩ් කර ගන්නය කියා ටයර් දාහක් එවනව. එතැනදි ටයර් 400ක් පමණ රිජෙක්ට් වෙනව රිට්රේඩ් කරන්න බැරිය කියා. ඒ 400 නැවත සීටීබී එකට ගියාම පාවිච්චි කරන්න. බැරි පරණ ටයර් හැටියට ශත 50ට, 60ට, 75ට විකුණනවා. විකුණුවට පස්සෙ ආයෙත් එනව අර කෙම්පැනියට රිට්රේඩ් කරන්න. එත කොට ඒක අපූරුවට කරනව.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

ඒක ජාතික අපරාධයක්.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ටයර් යන්නෙ ඔහොමයි. ස්පෙයාර් පාට්ස් විකිණිල්ලත් ඔය විධියයි. ඇන්ජින් එකක් අතන 6 මාසයක් වැඩ කළාට පස්සෙ ඉංජිනේරුවන්ගෙ නියමයක් තිබෙනව, ඒකට පාට්ස් නැහැ ඒ නිසා ඒක එතැනින් අයින් කරන්නය කියා. ඒකෙන් අගේට වැඩ ගන්න පුළුවන්. නමුත් ඒක අස් කළ හැටියෙ එන්නෙ කොහාටද? පංචිකාවත්තට. ඉස්සර බස් කොම්පැනි වල වැඩ කළ කට්ටියගෙ; ආර්. ටී. ද සිල්වගෙ, සිරිල් ද සොයිසාගෙ කොම්පැනිවලටයි ඒව යන්නෙ.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

මේව තමයි ඒ ගොල්ලන්ගෙ ප්‍රයිවෙට් එන්ටර්ප්‍රයිස්.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

ආර්. ටී. ද සිල්වගෙ ලොරි අර කෝට්ටෙ එහා පැත්තෙ දිගටම තිබෙනව, ආර්. ටී. ද සිල්වා කියා නම ගහල. මම දන්නෙ නැහැ කොයි ආර්. ටී. ද සිල්වා ද කියල. ඔතන හිටිය සිල්ව කියලයි මම හිතන්නෙ. 7 වෙනි ප්‍රමාණය පාස් නොකළ ආර්. ටී. ද සිල්වාට නේද ඔතන භාර දී තිබුණෙ? ඔහොම උදවියටද මේ රටේ ගමනාගමනය භාර දෙන්නෙ? කෝ මේකෙ ප්‍රයෝජනය? අද කෝටි ගණන් පාඩුයි.

මේ සීටීබී අංශයට පාරවලුත් සම්බන්ධයි. මම ඉදිරිපත් කළා, සීටීබී අංශයට පාරවල් හදන්නය කියා. පාරවල් තිබෙන්න ඕනැ නොවේද? නැත් නම් කොහෙද බස් ධාවනය කරන්නෙ? පාරවල් අංශයට කිව්වට පාරවල් හදන්නෙ නැහැ. ඒ මොකද? ඒක හැමදාම කොන්ත්‍රාත් දෙන්න ඕනැ. ඒකෙ ඉන්න ඉංජිනේරුවන්ටයි. ඔවර්සියර්ලටයි, අර "රයිඩර්" ලටයි වාසිය ගන්න ඉඩ තියන්න. ඒ ගොල්ලන් සියයට 10 නොවෙයි, අද සියයට 75ක් ඒකෙන් ගහනව. පාරවල් සකස් කිරීම සඳහා වියදම් කරන මුදලෙන් සියයට 75කට සිද්ධ වෙන්නෙ මොකක්ද? සියයට 75ක් යන්නෙ ඉංජිනේරුවන්ටයි, කොන්ත්‍රාත් කාරයින්ටයි, ඔවර්සියර්ලටයි. 10 අවුරුද්දකට අලුත් වැඩියා කරන්න සිද්ධ වෙන්නෙ නැති විධියට අර කාපට් එක දාන්නය කියා අපි ඉල්ලුව, ඒක දැම්මම 10 අවුරුද්දකට රෙපයාර් කරන්න ඕනැ නැහැ. නමුත් ඒකට ලෑස්ති නැහැ. මන්ද? තද වැසි වැස්සාම මේ පාරවල් නොකැඩෙන නිසා අවුරුදු පතා පාරවල් හදන්නය කියා ඔවර්සියර්ලාට මුදල් ටිකක් ඇදගන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බැරි නිසයි. අපි මේවා ගැන කියන කොට සමහරුන්ට අමාරුයි. සම්ප්‍රදාය අනුව කථා කරන්නෙ නැතිලු. ගරුත්වය රකින්නෙ නැතිලු. මේ අයටද ගරුත්වය තිබෙන්නෙ? මහජන මුදල් හොරකම් කරන මේ අයටද? ගමේ සිටින මිනිහාගේ ඉනේ තිබෙන ශත 50 ඇදගන්න හැදුවොත් මොකක්ද වෙන්නෙ? ඒ මිනිහා පිහියෙන් කොටනවා. නමුත් මෙතන කට්ටිය මුදල් ඇද ගන්න කොට ඒවා ගැන බලන්න කවුරුත් නැහැ. මේ අය ගන්නෙ ඒ ගමේ මිනිසුන්ගේ සල්ලි නේද? ඒ ගමේ මිනිස්සු බස්වල ගිහින් දෙන සල්ලි නේද, මේ හොරකම් කරන්නෙ? ඒකටද, ජන සතු කළේ? මෙතන මේ පාර්ලිමේන්තු කුඩුවට එනවා මොනවාද කියන්නෙ බලන්න. කියන්නෙ ඒ අය කරන හොර කම් ගැන; මහජන මුදල් ගසාකන හැටි ගැන. කොම්පැනිකාරයිනුත්, නිලධාරීනුත් එකතුවී මේ ජනසතු සේවාවන් ගසාකන හැටියි, මම කියන්නෙ.

අ. භා. 5.45

කම්කරුවන් වැඩ වර්ජනයක් කළොත් ඒක ගැන තමයි මේ උදවිය කියන්නෙ. ඒකෙන් පාඩු වෙනවාලු. මීට පස්සෙ වැඩ වර්ජනවලදී අපි කියනවා, පැට්‍රල් ගහ ගෙන හැම තැනම යන්න කියා. රටේ මහ ජනතාවට වුවමනා තැන්වලට යන්න කියා. මේ උදවිය මේ විධියට හොරකම් කරනවා නම් මීට පස්සෙ අපි කරන්නෙ ඒකයි.. මුදල් අය නොකර හැම තැනම යන්න කියන්නයි සිද්ධ වෙන්නෙ. ගමේ ගොවි කම්කරුවනුත් සමග එක් වී බස් රථත්, දුම්රියත් පදවන්නයයි කියනවා. හොරකම් කිරීමට ඉඩ දෙන්නේ නැතිව ඒ විධියට වැඩ කරන්නයයි කීමට අපට සිද්ධ වෙනවා ඇති. මේවායේ එකතු වන මුදල් කාබාසිනියා කරන්නේ මේවායේ සිටින නිලධාරීන් ආණ්ඩුවත් සමග එකතු වී. ඒ මුදල් ඒ විධියට හොරකම් කර ඔවුන් තර වෙනවා. හැම තැනම කෙරෙන්නේ ඒ විධියටයි. ලංගමයේ බැලුවත්, වරායෙ බැලුවත්, පී. ඩබ්ලිව්. ඩී. එකේ බැලුවත් හැම තැනම කෙරෙන්නේ හොර කමයි. මේ රුලම කරන්නේ හොරකමයි. නීති හදාගෙන තිබෙනවා. ඒවා ජනතාව මුළා කරන නීති අධිරාජ්‍යවාදී කාලයේ නීති. හැබැයි, මේවා විවේචනය කරන්න හොඳ නැහැ. එත කොට බොහොම රිදෙනවා. ඒක වැරදිලු. [බාධා කිරීමක්] මේකද මේ සමාජවාදය? මේ රදළ ධනපති යූ. එන්. පී. එක වාගේ අද ආණ්ඩුවේ හැම අංශයකම වැඩ කෙරෙන්නේ ඒ විධියටයි. දැන් රම්පාල උන්නැහේට පිටරටින් "ස්ලිපර්" කොටන් ගේන්න බාර දීලලු. මෙහි තිබෙන බුරුත කොට ටික පුච්චනවා. පිටරටින් කොට ගේන්න කොන්ත්‍රාත් දෙනවා. ඔන්න වැඩ කෙරෙන හැටි. මේ රටේ දේවල් ඉවර කරලයි තියෙන්නෙ. කවුද කියල හොයල බලන්නෙත් නැහැ. කොම්පැනිකාරයන් තර කරන්නයි බලන්නෙ. පහුගිය දවසක බටහිර ජර්මනියෙන් ගෙවල් හැදිල්ලටත් කොම්පැනිකාරයින් ගෙන්න ගන්න නැත් කළා අපට ඇන ගන්න ලැබුණා. මේවා කරන්න තමුන්නාන්සෙලාට බැරි බව දැන් මුළු රටටම පැහැදිලිවෙලයි තියෙන්නෙ. ඒ නිසා පාලනය කරන්න පුළුවන් උදවියටවත් කරන්න ඉඩ දෙන්න. රටට ආදරයක් ඇති, වැසියා ගැන ඇල්මක් කැක්කුමක් ඇති උදවියට ඉඩ දීල අයින් වෙන්න. අරක්කු බෝතලේ ගහන, ඒ වෙරියෙන් රට හැම තැන ඇවිදින උද වියට රටක් පාලනය කරන්න පුළුවන්ද? සිහිය නැති කරගෙන තැනින් තැන ගිහිල්ල, ගෙන යන සාකච්ඡාවලින් කෙරෙන දෙයක් නැහැ. මේ රටට අනාගතයක් තියෙන්න නම් ඇල්මක් ඇතුව සිහියෙන් වැඩ ටික කරගෙන යන්න ඕනැ. ඔය කොම්පැනිකාරයනුත් ටිකක්වත් ඈත් කරන්න. දූෂණවලින් පිරිල ඉන්න නිලධාරීන්ගෙනුත් බේරිලා වැඩ කරන්න බලන්න ඕනැ. එහෙම නැතුව මොකුත් කරන්න බැහැ. බොහොමයක් දෙනෙකුගෙ අද හිතේ තියෙන්නෙ "මම තමයි ඩිපෝ මැනේජර්, මම තමයි සුපිරින්ටෙන්ඩන්ට්, මම තමයි හෙඩ් සුපිරින්ටෙන්ඩන්ට්, මම දක්ෂයා, මම තමයි අධ්‍යක්ෂවරයා, මම තමයි ඔය ඔක්කගෙම ලොක්කා" කියන එකයි. ඒ අය තමයි දහස් ගණින් පඩි ගන්නෙ. හරියට වැඩක් කරලත් නො වෙයි ඇතැම් අය ඒ තරම් ලොකු පඩි ගන්නෙ. උදේ සිට රෑ වනතුරු වැඩ කරන මිනිහ හම්බ කරනව. ඒ හම්බ කරන ටික කන්න ලෑස්තිවෙලයි මොවුන් ඉන්නෙ. මේ අධිරාජ්‍යවාදී, ධනපති ක්‍රමයට හැඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.]

ගැසුණු, කොම්පැනි ක්‍රමයට වැඩ කර ඊටම හුරු වුනු නිලධාරියාට අර වැඩ කරන මිනිහගෙ අමාරුවක්වත් තේරෙන්නෙ නැහැ.

මේ වැඩේ භාරව ඉන්න අලුත් ඇමති වරයා ගැන කියන්න දෙයක් තියෙනවද? කලින් එක ඇමති ධුරයක් භාර අරන් වැඩ කළ ආකාරය නොදන්නෙ කවුද? පළාත් පාලන කටයුතු භාරව ඉන්න කාලෙ මොකද කළේ? යටියන්තොට සුළු නගර සභාවක් ඇති කළා නේද මිනිසුන් අටසිය ගණනකට? ඒ කොට්ඨාශයේ ඉන්නවය කියන්නෙ 883 දෙනාලු. ඔය 883 දෙනාට ටී. සී. එකක් හෙවත් ටවුන් කවුන්සලයක් දුන්නෙ ඔය ඇමතිතුමා පළාත් පාලනය භාරව ඉන්න කාලෙ නොවෙයිද? හපුත තේ අට සීයක් තරම ඇති. එතැනටත් ටී. සී. එකක් දුන්නා නේද? ඔහොමයි වැඩ කරල තියෙන්නෙ. ඇනුත් ඔහොමයි කරන්නෙ. අමුතු වැඩ පිළිවෙළක් උඩයි ඒ දේවල් ගෙන ගියේ. අධිරාජ්‍යවාදී යුගයෙ හිටපු සිවිල් සේවකයන් නැත් නම් පළමුවන පේළියෙ වෙනත් නිල ධාරීන් කියන විධියටයි වැඩ ගෙන ගියේ. මේවා කියන කොට නම් ආණ්ඩු පක්ෂයේ ඇතැම් ගරු මන්ත්‍රීවරුන්ට අමාරු වෙනව ඇති. ඒක මම දන්නව. නමුත් කරන්න දෙයක් නැහැ. රටේ ජනතාවට අවශ්‍ය නීති රීති සම්පාදනය කරන්න ඕනෑ නියම විධි යට. තමුන්නාන්සෙලා අත උස්සනවද මේ වැඩ අනුමත කෙරෙන විධියට? එහෙම නම් මේවට වගකියන්න ඕනෑ. අවුරුදු තුනක් තිස්සෙ වැඩ කරල තියෙන්නෙ ඔහොමයි. ගමනාගමනය වෙනුවෙන්ය කියා කෝටි ගණන් කාබාසිනිය කරන් නෙත් ඔය අන්දමටයි.

අලුත් ඇමතිවරයා හරියට කරාවිය කියල හිතන්න ඉඩක් නැහැ. ගරු අගමැතිනිය මාතරට ගිය වෙලාවෙ උන්නැහේ ක්‍රියා කළ ආකාරය දන්නව නේද? ඔය විධියට කොච්චර කලක් කරගෙන යන්න පුළු වන්ද? වරායේ ගත්තා. කෝටි ගණන් එතන හොරකමට ගියා. අනෙක් තැන් වලත් එහෙමයි. මොකද හේතුව? එකම කට්ටිය තමයි වැඩ කරගෙන යන්නෙ. ඉස්සර යූ. එන්. පී. කාරයන් කළ හැටිය ටයි ඊට පස්සෙ බණ්ඩාරනායක ආණ්ඩු වත් කරන්න හැදුවෙ. ඒ රදලී ක්‍රමයමයි, බණ්ඩාරනායක ප්‍රතිපත්තිය අනුගමනය කරනවාය කිය කියා, තමුන්නාන්සෙලත් කරගෙන යන්නෙ. ඉතින් කොහොමද රටේ වැඩි දියුණුවට අදාළ වන ආකාරයට වෙනස් කරන්නෙ? ආර්ථික පදනම වෙනස් කරන්න ඒ ප්‍රතිපත්තිය අරගෙන නම් බැහැ. මේ රටේ ආර්ථික පදනම වෙනස් කරන්න නියම අඩියක් ගන්න ඕනෑ. එසේ කිරීමට නම් ශ්‍රමය යොදා වැඩ කරන අය, ඒ ඒ කරුණු ගැන තේරෙන අය, පාලන අංශවලට හවුල් කර ගන්න ඕනෑ. එසේ නැතිව ඒක කරන්න බැහැ. සිවිල් සර්විස් එකෙන් පත් කරල, පොත් වල ලිව්වට බැහැ. කොග් වීල් එකේ දැත්ත කැඩිල තියෙන්නෙ කොතනද කියල ඒ අය දන්නෙ නැහැ. [බාධා කිරීමක්] රිදී හැන්දෙන් බෙදනවාය; රත්තරන් හැන්දෙන් බෙදනවාය කියල ඇමතිතුමා පසු ගිය දවස්වල කියල තියෙ නව. ඒ එයාගෙ ගෙදරට බෙදන හැඳි වෙන්න ඇති. ජනතාවට නම් ඔය හැඳි වලින් බෙදන්න එන්න එපා කියල මා කියනව. මේ අමාත්‍යාංශය භාරව සිටින ඇමතිතුමා නිච්චි නැතුව ඒ ඒ ස්ථානවලට ගමන් කරල කවදාවත් වැඩක් කෙරෙන් නෙ නැහැ. සිහි බුද්ධිය ඇතුව වැඩ කරන්න ඕනෑ. රටේ කරුණු ගැන දැන ගන්න ඕනෑ. ඔය විධියට කැබිනට් එක තියාගත්තට පලක් නැහැ. පිටිපස ආසන වල ඉන්න හත්තෑ ගණනක් මන්ත්‍රීවරු වත් සිහි බුද්ධියෙන් වැඩ කරන්න ඕනෑ. මේව දිනපතා දකින්න තියෙන දේවල්. ඇයි ඉතින් ඇස් වහගෙන ඉන්නෙ, කියල මා අහනව. රටට එළි වෙනව කියල ඒව කියන්න නරකයි. තමුන්නාන්සෙල ඒ මගින් අමුතු ගරුත්වයක් බලාපොරොත්තු වෙනවද? මහජන බලාපොරොත්තු උඩයි, ජනසතු සේවා ව්‍යාපාර බිහි කළේ. ඒවා නැවත නැවතත් කාබාසිනිය කර දමන්න ඉඩ දෙන්න බැහැ. මේව කිව්වට වැඩක් කෙරෙන්නේ නැහැ. එම නිසා මා මේව රටට කියනව. ඉක්මණට මේ කොටස වෙනස් කරල දමන්නය කියල මා රටට කියනව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා එකක් දෙකක් ගැන නොවෙයි කියල තියෙන්නෙ; හුඟක් කරුණු කියල තියෙ නව. ඩයර් හොරකම් කරන හැටි; ලී හොර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කම් කරන හැටි; ඇලුමිනියම් හොරකම් කරන හැටි; ස්පෙයාර් පාට්ස් හොරකම් කරන හැටි; ස්පෙයාර් පාට්ස් කොම්පැනි වලට ගෙන ගොස් ග්‍රීස් ගාල පරණකම නැතුව අළුත් විධියට පෙනෙන්න හරි ගස් සල එවන හැටි යනාදී වශයෙන් නොයෙකුත් දේ ගැන මා කියල තියෙනව. මේ බෝඩ් එකේ ඉන්න සභාපතිගෙන් මා අහනව, වරායෙ ඉඳල—කස්ටම් එකේ ඉඳල—වේරහැරට බඩු ගෙනියන්න "සිටි කැරියර්ස්ලට" දුන්නෙ මොන කරුණක් උඩද කියල. එතන නමුන්නාන්සෙලගෙ වැන් නැද්ද? වරායෙ ඉඳල වේරහැරට බඩු අදින්න "සිටි කැරියර්ස්ලට" දුන්නෙ ඇයි කියල මා අහනව, ගරු ඇමතිතුමාගෙන්. මෙච්චර රථ වාහන තියෙද්දී ඒ අයට දුන්නෙ ඇයි? ඒ ගොල්ලො එතෙන්ට බඩු අර ගෙන යනකොට බඩුවලින් බාගයක් විතර හොරකම් [බාධා කිරීමක්.] මා දන්නෙ නැහැ, අයිතිකාරයො කවුද කියල. නමුන්නාන්සෙලගෙ යූ. ඇන්. පී. එකේ හිටපු අය වෙන්න ඇති. ඒකෙ අමුත්තක් වෙලා නැහැ. මේවට උත්තර දෙන්න ඕනෑ.

නමුන්නාන්සෙල හුඟක් ඩිපෝ අර ගත්ත. අද ඒව සේරම වහල. නමුන්නාන්සෙල ඒව සේරම එක්තැන් කරනව. වේරහැර, මීතොටමුල්ල සහ කඩවත යනාදි තැන්වල තියෙන ඩිපෝ දිරා වැටෙනව. බස් 50, 60 දමන්න පුළුවන් ගොඩනැඟිලි ඒ තැන්වල තියෙන බව අපි දන්නව. මේව කාගෙ සල්ලිද? නමුන්නාන්සෙලගෙ සල්ලිද; නැහැ. මේව ගත්තෙ ජනතාවගෙ සල්ලිවලින්. ඒව දිරා වැටෙන කොට කෝටියකට වැඩිය මුදල් නැති වන්නෙ නැද්ද කියල මා අහනව. තැන් තැන්වල අත්හැර දමූ ස්ථාන කොච්චර තියෙනවද? ඒවායෙ යකඩ තහඩු එහෙම, කොච්චර දිරා යනවද? පිදුරු ගොඩේ ඉන්න බල්ලන් වාගෙ වැඩ නොකර ගම්වල ඉන්න මිනිසුන්ටවත් නිවාස හදා ගන්න ඒව දෙනව නම් හොඳයි.

අ. භා. 6

ගරු කම්කරු ඇමතිතුමා නම් පුළුවන් තරම් හොඳින් වැඩ කරන බව කියන්ට කැමතියි. රටට ආදරයක් ඇතිව හොඳ චේතනාවෙන් වැඩ කරනව. ඉදිරියට යම් අරගලයක් ඇති වුවහොත් එය නියම විධියට විසඳන්න කටයුතු කරන බවත් දන්නව.

20 දහකට අධික ගණනක් අද සී. ටී. බී. එකේ වැඩ කරනව. එයින් 17 දහක් මුදල් උපයන අංශවලයි, වැඩ කරන්නෙ. එවැනි අයගෙ ඉල්ලීම් දී, පහසුකම් දී, වැඩ කර ගෙන යන්ට ලැස්ති කරන්න. ඒ වගේම ඒ අයගේ නියෝජිතයන් සී. ටී. බී. පාලන මණ්ඩලයට පත් කරගන්න. එතකොට දනට වඩා හොරකම් අල්ලා දේවි; සල්ලි නැති වන ආකාරය පෙන්වා දේවි. නමුත් මේ ආණ්ඩුව කරන්නෙ ඒ කොටස තව තවත් පාලන කටයුතුවලින් ඈත් කිරීමයි. තව තවත් ඒ අයට පහර ගැසීමයි. අද කරන්නෙ, හොරකම් සහ වංචා වර්ධනය කර ගැනීමට ඉඩ සලසා දීමයි. ඒක අපරාධයක්. මේව කාගේවත් පෞද්ගලික සල්ලි නොවෙයි. පසුගිය කාල සීමාවේදි වංචා සහගත කරුණු නිසා සේවයෙන් පහ කරන ලද අය ගැන මා කථා කරන්ට යන්නෙ නැහැ; නමුත් එකක් කිව යුතුයි. යම් යම් නිලධාරීන්ගෙ හොරකම් ගැන කරුණු ඉදිරිපත් කිරීම නිසා, වංචා ගැන කරුණු ඉදිරිපත් කිරීම නිසා, ඇතැම් අයට දඬුවම් දී තිබෙනවා නම්, වහාම ඒ දඬුවම් අස්කර ගන්න.

බස් කොම්පැනි තිබියදී ඒව යටතේ සේවය කළ ඩ්‍රයිවර්ලාට, කොන්දොස්තරලාට සහ ඉංජිනේරු අංශවලට අයත් අයට ලැබිය යුතු මුදල් තවම ලැබී නැහැ. ඒ මුදල් දෙන බවට පොරොන්දුවක් දී ඇතත් තවම ඒ මුදල් ලැබී නැහැ. කොන්දොස්තර කම්, ඩ්‍රයිවර්කම් දීම සඳහා කොම්පැනිකාරයන් යම් යම් අයගෙන් මුදල් කඩාගත්තා. ඒ මුදල් ආපසු දෙන තුරු කොම්පැනිකාරයන්ට සතයක්වත් දෙන්ට එපා.

අද වේරහැර විශාල සේවක පිරිසක් වැඩ කරනවා. එතැන විශාල වැඩපලක්. විශාල වැඩපලක් නම් ඇයි සැලැස්මක් අනුව වැඩ කරගෙන යන්නෙ නැත්තෙ? බොහෝ ඈත ප්‍රදේශවල සිට එහි වැඩට එන අය ඉන්නවා. ඔවුන් සඳහා නිවාස ක්‍රමයක් ඇති නොකරන්නේ ඇයි? ඇයි නියම සැලැස්මක් නැත්තෙ? නමුත් මේ ඇමතිවරයා සිටින තුරු නම් මේ අංශය සඳහා වැඩක් වේයයි කල්පනා කරන්ට බැහැ. මේ ඇමතිවරයා මේ වැඩ කාබාසිනියා කර දමනව ඇති. කලින් සිටි ඇමතිතුමත් ඔහේ නිකම් උඩ බලාගෙන හිටිය විතරයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

මේ ඇමතිවරයාට මොලේ නැද්ද ?

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

මොලේ නැතුව නොවෙයි, මොලේ තියෙනවා. නමුත් බෝතල බාගෙ ගැසුවට පසු මොලේ කොහෙ යනවද දන්නෙ නැහැ. මේ හංගන්න කාරණයක් නොවෙයි. කවුරුත් දන්න දෙයක්.

මේ අංශයේ නිලතල දරන උදවියගෙ වත්කම් හෙළි කළ යුතුයි. ඒ සඳහා වැඩ පිළිවෙළක් යෙදිය යුතුයි. The assets and liabilities of these officers must be probed into. මේ නිලධාරීන්ගෙ පමණක් නොව, ඔවුන්ගෙ නෑදෑයන්ගේත් වත්කම් සොයා බැලිය යුතුයි. මා 1959 සිට ඉදිරිපත් කරගෙන අවුත් සම්මත කරවා ගත් යෝජනාව ක්‍රියාත්මක කරන්න. උසස් නිලතල දරණ අය සතු වත්කම් කොහොම ලැබුණාද කියා සොයා බලන්න. කොහොමද මේව ආවෙ කියා ප්‍රශ්න කරන්න. ඒකට උත්තරයක් දෙන්න බැරි වුණොත් ඒ අය වැලිකඩට යවන්න මගක් සලස්වන්න.

අ. භා. 6.5

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

Order, please ! Sir Razik Fareed will now take the Chair.

**අනතුරුව පත් කරන ලද මන්ත්‍රී ආර්. එස්. වී. පෝලියර් මයා. මූලාසනයෙන් ඉවත් වුයෙන් ශ්‍රීමත් රසීක් ෆරීඩ් මූලාසනාරූඪ විය.**

**ගාමණී ජයසූරිය මයා.** (හෝමාගම)
*(திரு. காமனி ஜயசூரிய—ஹோமகம)*
(Mr. Gamani Jayasuriya—Homagama)

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, අවසථාවේ හැටියට දීර්ඝ අන්දමින් කථා කිරීම අසාධාරණය කියා මම අදහස් කරනවා. එම නිසා ඉතාම කෙටියෙන් වචන සවල්පයක් ප්‍රකාශ කරන්ටයි මම අදහස් කරන්නෙ. ගමනාගමන මණ්ඩලයේ ඇතිවන හොරකම් ආදී දේවල් ගැන කොට්ටාවේ ගරු මන්ත්‍රීතුමා (ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.) දීර්ඝ අන්දමින් කරුණු ඉදිරිපත් කළා. හොරකම් කෙරෙන අන්දම කෙසේ වුනත්, හොරකම් කෙරෙනවාය යන්න කවුරුත් පිළිගන්න දෙයක්. හොරකම් කෙරෙනවාය, පාලනය දුර්වලය යන කරුණු දෙක ලංකාවේ සැම දෙනාම පිළිගන්නවා. 1958 වර්ෂයේ බස් සේවය රාජසන්තක කළා. එදා ඒ කටයුත්ත කළ අවසථාවේදී මට හොඳට මතකයි, මමත් උදේ පාන්දර ගෝල්පේස් පිට්ටනියට ආවා. ඇවිත් බණ්ඩාරනායක අගමැතිතුමාගේ කථාවටත් ගරු මෛත්‍රීපාල සේනානායක ඇමතිතුමාගේ සිංහල හා දෙමළ කථාවටත් ඇහුම්කන් දීමෙන් පසු මමත් ඒවාට අත්පුඩි ගැසුවා. මේ රටේ ජනතාවට, විශේෂයෙන්ම බස් මගීන්ට යහපතක් ඇති වෙයි කියා අපි බලාපොරොත්තු වුණා. නමුත් අද ඒ ගැන කල්පනා කර බලන විට යහපතක් නොව අයහපතක් ඇති වී තිබෙන බව අප කාටත් පේනවා.

මට මතකයි, පසුගිය අවුරුද්දේ මේ ගැන මම මේ ගරු සභාවේ කථා කරන අවස්ථාවේදී එදා සිටි ඇමතිතුමා ලංගමයෙන් ඇති වන කෝටි ගණන් පාඩු ගැන කථා කරමින් දැන් ඒ පාඩුව ටිකක් අඩුය කියා ප්‍රකාශ කළා. එදා ඒ උත්තර දුන් පිළිවෙළ බැලුවාම මේ ඇමතිවරුන්ට රුපියල් කෝටි ගණන් කියන ඒවා හරියට කොස් ඇට, කජු ඇට වාගෙ බව මට පෙනී ගියා. මේ ගමනාගමන මණ්ඩලයේ දුර්වල පාලනය නිසා එදා සිට අද වන තුරු මේ රටේ ජනතාවට විශාල පාඩුවක් භුක්ති විඳින්ට සිද්ධ වී තිබෙනවා. මට පසුව කථා කරන ගරු මන්ත්‍රීන් ගමනාගමන මණ්ඩලයේ අඩුපාඩුකම් ගැන කථා කරා විය කියා මම සිතනවා. ඒ අඩුපාඩුකම් හා පාඩුව ගැන ගිය අවුරුද්දෙත් කථා කළා. ඊට පෙර අවුරුද්දෙත් කථා කළා. මේක ඉතාමත්ම අවශ්‍ය කරුණක්. මේ පාඩු කෙසේ වුණත් හොරකම් ඇතිවීම වැළැක්වීමට නම් රජයේ ආයතනයක වේවා, පෞද්ගලික ආයතනයක වේවා වෙන කොයි විධියේ ආයතනයක වේවා, ඒ ආයතනයේ කටයුතු, පොත් පත්, ගණන් හිලව් හරියාකාරව තියෙන්නට ඕනැ. දවසින් දවස පොත්වල ඒ විස්තර සැම දෙයක්ම හරියාකාරව පොත් පත්වල සඳහන් වී තියෙන්නට ඕනැ. ඒක කරන්නෙ නැතිනම් මොනවා කළත්, කිසිම ආයතනයක් කවදාවත් නියම අන්දමට පාලනය කරන්න බැහැ. මම හිතන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නෙ අද වනතුරුත් ගමනාගමන මණ්ඩලයේ අයවැය සකස් කර නැහැ. මාස හයක්, හයක් නොවෙයි, දැන් අවුරුදු ගණනක් ප්‍රමාදවී තිබෙනවා. එහෙම තත්ත්වයක් තිබෙනවා නම් අර කොට්ටාවේ ගරු මන්ත්‍රීවරයා (ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.) කීවා වාගේ හොරකම් සිදුවීම පුදුමයක්ද? මේ ගරු සභාවෙත්, ඉන් පිටස්තරත් කොයි තරම් කෑගැහැව්වත්, මොනවා කළත්, ඒ හොරකම් වළක්වන්න බැහැ, නියම අන්දමට දිනපතා හරියාකාර ඒ ගණන් හිලව් ඉදිරිපත් කරන්නෙ නැති නම්, එය තමයි පළමුවැනි කාරණාව. කොයි ආයතනයක වුණත් ගණන් හිලව් හරියාකාර සෑම වෙලාවෙම නියම අන්දමට සඳහන් වෙන්න ඕනැ. ඒ සමගම, ගමනාගමන මණ්ඩලයේ සිදුවන මෙවැනි දේවල් නැවැත්වීමට, වෙනස් කිරීමට ඇමතිතුමාගේ සම්පූර්ණ ශක්තිය යොදවන්න ඕනැ බව මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. මොනවා කීවත් කළත් අවශ්‍ය මූලික දේ කළේ නැතිනම් එයින් ප්‍රයෝජනයක් වෙන්නෙ නැහැ. මහජනතාවගේ මුදල් නාස්ති වන එක පමණයි වෙන්නෙ. එමනිසා තමුන්නාන්සේගේ මුළු ශක්තිය යොදා හෝ මේ තත්ත්වය වෙනස් කිරීමට, ගණන් හිලව් සටහන් තැබීමට වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනැ.

දෙවැනි කරුණ නම්, වැඩ කරන සේවකයන්ගේ හිත් දිනාගැනීමයි. වැඩ කරන සේවකයන්ගේ සිත් දිනා ගන්නෙ නැතුව ආයතනයක් හොඳින් පවත්වාගෙන යන්න බැහැ. ඒ වාගේම සේවකයන්ට සැලකීමේදී යුක්ති සහගත බවක්, සාධාරණ කමක් තිබෙන්න ඕනැ. රජයේ ආයතනයක පමණක් නොවෙයි, පුද්ගලික ආයතනයක වුණත් වැඩ කරන සේවකයන්ට යුක්ති සහගත අන්දමින් සලකන්නෙ නැතිනම්, ඒ අයගේ හිත් දිනාගෙන කටයුතු කරන්නට පුළුවන් කමක් නැතිනම් ඒ ආයතනය කවදාවත් දියුණු වෙන්නෙ නැහැ; දියුණු කරන්න බැහැ. මම මේ විධියට කියන්න අදහස් කළේ, රිදී හැන්දෙන් වුණත්, රත්‍රන් හැන්දෙන් වුණත් බෙදන්න ඇමතිතුමා කල්පනා කරනවාය කියා ඇමතිතුමා කළ ප්‍රකාශනයක් පත්‍රයේ පළ වී තිබෙනවා මා දුටුව නිසයි. ඇත්ත වශයෙන්ම ඇමතිතුමාගේ මේ ප්‍රකාශය ගැන මම පුදුම වුණා. ඇමතිතුමා එහෙම කීවා නම් එය ලොකු වරදක්. ඕනෑම ස්ථානයක හෝ වේවා, එතැන වැඩ කරන සේවකයන්ගේ සිත් අධෛර්‍යමත් කරලා නම් කටයුතු කරන්න පුළුවන්කමක් ඇති වෙන්නෙ නැහැ. පළමුවෙන්ම වැඩ කරන පිරිසගේ හිත් දිනාගන්න ඕනැ. සාධාරණකමක්, යුක්තියක් තිබෙනවාය කියා පෙන්වන්න ඕනෑ පමණක් නොවෙයි, වැඩ කරන සේවකයන්ගේ හිතේ එබඳු අදහසක් හට ගන්නත් ඕනැ. එහෙම නැතිනම් කවදාවත් කිසිම තැනක දියුණුවක් ඇතිකරන්න පුළුවන් වෙන්නෙ නැහැ.

ඒ සමගම කියන්න ඕනැ, ලංගමයේ වැඩ කරන විශාල පිරිසකට ලැබිය යුතු මුදල් දිය යුතු බව. 1960 දී එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව මාස තුනක පමණ කාලයක් මෙය පාලනය කර ගෙන යද්දී සේවකයන්ට ලැබිය යුතු මුදල් සෑහෙන ප්‍රමාණයක් ලබා දුන්නා. ලැබෙන්න තිබුණු ඉතිරි මුදල් කොටස් එදාට පස්සෙ අද වන තුරුවත් ලැබිලා නැහැ.

අ. භා. 6.15

ඇමතිතුමා මේ ඇමති අංශය භාර ගත්තෙ ළඟදියි. ඒ උදවියට ලැබෙන්න තිබුන මුදල ඉතාමත් ඉක්මනින් ලබා දෙන්න ඕනැ. එහෙම නැත්නම් වැඩ කරන පුද්ගලයගෙ හිතේ කහටක් තියෙනව. උදේ පාන්දර නැගිටල වැඩට ගියාම හිතේ කහට ඇතිවයි වැඩ කරන්නෙ. මනුෂ්‍යයන් හැටියට අප කාටත් එවැනි දේ වෙනව. අපට අයිති දෙයක් ලැබෙන්නෙ නැත්නම් අපේ සම්පූර්ණ ධෛර්‍ය යොදා ඒ වැඩය කරන්න බැහැ. දැන් අවුරුදු 5 ක් ගත වෙලා තියෙනව. තවම ඒ අයට ලැබිය යුතු මුදල ලැබී නැහැ. ඒ කම්කරුවන් පොහොසත් උදවිය නොවෙයි සාමාන්‍ය උදවිය. රුපියල් 100ක්, 150ක්, 200ක් කියන එක ඒ උදවියට ලොකු දෙයක්. ඒ නිසා ඇමතිතුමා ඉක්මනින්ම ඒ මුදල එම උදවියට දීමට කටයුතු කරනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනව.

මට තව කාරණයක් කියන්න තියෙනව. මගේ කොට්ඨාශයෙ වගේම අනික් කොට්ඨාශවලත් මේ වගේ ප්‍රශ්න ඇති. මගේ කොට්ඨාශයේ පොල්ගස්ඕවිට කියන ප්‍රදේශයේ බස් මගීන් කිප දෙනෙක් ඉවසන්නම බැරි අවස්ථාවෙදි තරමක හිතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගාමණී ජයසූරිය මයා.]

චක්කාර වැඩක් කළා. ඒක කල්පනා කර කළ දෙයක් නොවෙයි. පැය ගණනක් තිස්සෙ බස් එකකට නගින්න බලාගෙන හිටිය. හිටිය, හිටිය, බස් එකක් ආවෙ නැහැ. හුඟක් පරක්කු වෙලා බස් එකක් ආව. ඒකත් නවත්වන්නෙ නැතුව යන්න ගියා. ඒ වෙලාවෙ පිරිස අතර සිටි තරුණ යන් කීප දෙනෙක් පැනල ඒ බස් එක නවත්වල පොඩි කලබලයක් ඇති වුණා. ඒක කල්පනා කරල කරපු දෙයක් නො වෙයි. ඒ පළාතෙන් විශාල පිරිසක් හැමදම කොළඹට එනව. ආණ්ඩුවෙ කන්තෝරුවල ටත්, පෞද්ගලික කන්තෝරුවලටත් එන අය ඉන්නව. ඒ අයට 8 ට කන්තෝරුවෙ ඉන්න සිදු වෙනව. මිනිත්තු 15 ක් 20 ක් ප්‍රමාද වුණොත් වැඩ කරන උදවියගෙන් ප්‍රශ්න අහනව, ඒ ස්ථාන අයිති උදවිය. දවස් දෙකක් පිටපිටම පරක්කු වුණොත් දඩුවම් විඳින්න සිදු වෙනව; චෝදනාවලට උත්තර දෙන්න සිදු වෙනව. සමහර විට අපට ඒකෙ අමාරුව තේරෙන්නෙ නැහැ. ඒ විධියෙ දෙයක් අපට වෙන්නෙ නැති නිසා. එවැනි දේකට මුහුණ පාන්න වුණාම තමයි, ඒකෙ අමාරුව දැනෙන්නෙ. කොයි කාරණයෙදිත් එහෙමයි. ගෙයක් නැති මිනිහට තමයි ඒකෙ තියෙන අමාරුව තේරෙන්නෙ. පොල්ගස් ඕවිට සිට කොට්ටාව හන්දිය දක්වා බස් එකක් දමන්නය කියා මම අවුරුදු 3 ක කාලයක් තිස්සෙ ඉල්ලනව. ඒ පාරට බස් එකක් ඉතාමත්ම අවශ්‍යයි. හැතැප්ම දෙකක්, තුනක් යන්නට තියෙනව. පාසල්වලට යන්න ළමයින් විශාල පිරිසක් ඉන්නව. ගුරු මහත්වරු වෙලාවට ඉස්කෝලවලට යන්න ඕනෑ. ධර්මපාල විද්‍යාලයට යන අය ඉන්නව. ගුරුවරුන් පුහුණු කරන අභ්‍යාස විද්‍යාලයකුත් ඒ ප්‍රදේශයේ තියෙනව. එවැනි තත්ත්වයක් තියෙන පළාතක බස් එකක් නැහැ. අවුරුදු 3 ක කාලයක සිට මම ඒ ඉල්ලීම ඉදිරිපත් කර තියෙනව. ළඟදිත් මම මේ ගැන මතක් කළා. නමුත් තවම සතුටුදායක පිළිතුරක් ලැබී නැහැ. ගමනාගමන මණ්ඩලයෙ නිලධාරි මහත්වරුන් කියනව නම් ඒ පළාතට බස් එකක් අවශ්‍ය නැහැ කියා ඒකීම අපට පිළිගන්න පුළුවන්. ඒ උදවියත් පිළිගන්නව බස් එකක් අවශ්‍ය බව. එසේ නම් ජනතාවගෙ ඒ අඩුපාඩුව නැති කරන්ට ඕනෑ නේද? අළුතෙන් බස් ආවම දෙනවයයි කිව්ව. එහෙත් අළුතෙන් බස් ආවද නැද්ද කියා මා දන්නෙ නැහැ; තවම අඩුපාඩුව සම්පූර්ණ වෙලා නැහැ. ඇමතිතුමාණෙනි, කරුණා කර මේ ගැන කටයුතු කරන්න. ඔවැනි තවත් කීප පොළක් තිබෙන නමුත් විශේෂයෙන්ම මේ ගැන සඳහන් කළේ පොල්ගස්ඕවිට-කොට්ටාව පාරට බස් එකක් ඉතාම අවශ්‍ය නිසයි. අනික් ස්ථානවලට අවශ්‍ය නැහැ කියනව නොවෙයි; මේ පාරට ඉතාමත් අවශ්‍යයි. ඒ නිසයි මේ කාරණය මේ ගරු සභාවේදී විශෙෂයෙන් මතක් කළේ.

මට දූෂමාන ආරංචියක් ලැබුණ, කැලණි වැලි දුම්රිය මාර්ගය අස් කරන්ට යනවාය කියා. ඇමතිතුමාණනි, තමුන්නාන්සෙ දන්නව, පුත්තලම් දුම්රිය මාර්ගය අවශ්‍ය නැත කියා මීට පෙර ආණ්ඩුවකින් වසා දැම්ම බව. අද නැවත වරක් එය අවශ්‍යය කියා පටන් ගන්ට යනව. මා තමුන්නාන් සෙගෙන් ඉල්ලා සිටින්නෙ, අඩු ගණනෙ අවිස්සාවේල්ල දක්වාවත් පළල්—broad gauge—දුම්රිය මාර්ගයක් ඇති කරන්ට කියායි. අද මහජනයා ඒ දුම්රියවලින් ගමන් නොකරන්නෙ ඒ දුම්රිය ඉතා දුර්වල තත්ත්වයක පවතින නිසයි. හොඳ දුම්රිය සේවාවක් ඇති කරනව නම් එය පාවිච්චි කරන්ට ඕනෑ තරම් මහජනයා සිටිනව. ඒ වගේම තේවතු යායවලට අවශ්‍ය පෝර වැනි බඩු ඕනෑ තරම් ඒ දුම්රියවලින් යවන්න පුළුවනි. ඒ වගේ ම ඒ මාර්ගයේ දුම්රියපොළවල පහසුකම් ටිකක් ඇති කරන්ට ඕනෑ. විශාල දේවල් නොවෙයි; බොන්ට පිරිසිදු වතුර ටිකක්, වැසිකිළියක්, ආදි සුළු පහසුකම් ඒ දුම්රියපොළවල ඇති කරන්ට ඕනෑ. මේ දුම්රිය මාර්ගය පළල් කරනව නම් එය තමුන්නාන්සෙලාගෙ ආණ්ඩුවෙන් ආරම්භ කළ ඔරුවල යකඩ වැඩපොළටත් විශාල ලෙස ප්‍රයෝජනවත් වෙනව. ඒ යකඩ කර්මාන්තශාලාව පිහිටුවන්ට අදහස් කිරීමෙදි රුසියන් ඉන්ජිනේරු මහත්වරු මේ දුම්රිය පහසුවත් කල්පනාවට ගත්ත. යකඩ කම්හල එහි පිහිටුවීමෙ තීරණයට බහින්ට එක් කාරණයක් තමයි, දුම්රිය පහසුකම. එම නිසා මේ දුම්රිය මාර්ගය වසා දැමීමෙ අදහසක් තිබෙනවා නම් ඒ අදහස අස් කරගෙන ඒ දුම්රිය මාර්ගයෙන් යම්කිසි ප්‍රයෝ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජනයක් ලබා ගැනීමට පුළුවන් වන අන්දමට, එයින් යම්කිසි ආදායමක් ලැබෙන අන්දමට —narrow gauge දුම්රිය මාර්ගය පළල් කර විශාල දුම්රිය යොදවා, මා කලින් සඳහන් කළ අන්දමට දුම්රිය පොළවල පහසුකම් ඇති කරන ලෙස ඉල්ලා සිටිනව.

මා මීට වඩා කථා කරන්ට යන්නෙ නැහැ. මා සඳහන් කළ කරුණු දෙක තුන ඉතා අවංක ලෙසයි මම ඉදිරිපත් කළේ. ඒවා ගැන කල්පනා කර ප්‍රයෝජනවත් වැඩ පිළිවෙළක් ඒ කරුණු සම්බන්ධයෙන් යොදනවා ඇතැයි බලාපොරොත්තු වෙමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනව.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අමාත්‍යාංශය යටතේ මටත් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්ට තිබෙනව.

ගරු සභාපතිතුමනි, මෙම අමාත්‍යංශය යටතේ තිබෙන දෙපාර්තමේන්තු වෙන් වෙන් වශයෙන් නොගෙන සෑම අංශයක් පිළිබඳවම කථා කරන්නයි මා බලාපොරොත්තු වන්නෙ.

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

ඒක හොඳයි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

ලංගමය සම්බන්ධයෙන් කොට්ටාවේ ගරු මන්ත්‍රීවරයා (ඕ. බී. ආර්. ගුණවර්ධන මයා.) ඉතා දීර්ඝ විවේචනයක් කළා. අපත් මෙම මණ්ඩලය ආරම්භ කළ දින වල පටන්ම විවේචනය කළ බව තමුන්නාන්සේලාට මතක ඇති. කොට්ටාවේ ගරු මන්ත්‍රීවරයා සඳහන් කළ දේ මම යළිත් කියන්න යන්නෙ නැහැ, නමුත් එකක් කිව යුතුව තිබෙනවා, ලංගමයේ දූෂණ ක්‍රියා, අදක්ෂකම්, මහජන වුවමනාකම්වලට ඇහුම්කන් නොදීම්, වංචා කිරීම්, මුදල් අපතේ ඇරීම් යනාදී වැරදි රාශියක් අද දින එහි කෙරෙනවා. අවුරුද්දක් පාසාම අප මේ කාරණා මෙහිදී ප්‍රකාශ කර තිබෙන නමුත් තවම බැරි වී තිබෙනවා නිසි වැඩ පිළිවෙළක් යොදන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, බස් සේවය පෞද්ගලික හිමියන්ගේ අතේ තිබුණ කාලයේදි ආණ්ඩුවටත් එමගින් ආදායමක් ලැබුණ අතර බස් හිමියන්ද විශාල ලාභයක් සොයා ගත් බව කවුරුත් දන්නා කාරණයක්. බස් මගීන්ගේ සංඛ්‍යාව සියයට පණහකින් පමණ දැන් වැඩි වී තිබෙනවා. නමුත් ලංකා ගමනා ගමන මණ්ඩලයෙන් අවුරුද්දක් පාසා අප පාඩු විඳිනවා. එන්න එන්නම එය වැඩි වනවා. මීට හේතුව කුමක්ද කියා සොයා බලා ඒවා නැති කර දමන්න ඕනෑ. දැන් නම් සෑම දෙනාම කියන දෙයක් තමයි, මෙහි තිබෙන සංවිධානයේ වැරද්ද නිසා මේ අන්දමට පාඩු විඳින්න සිදු වී තිබෙන බව. නමුත්, ගරු සභාපතිතුමනි, මෙම මණ්ඩලය පටන් ගත් අවධියේම ඌව පරණගම ගරු මන්ත්‍රීවරිය (කුසුමා රාජරත්න මිය.) පැහැදිලි කර දුන්නා, එදා ඒ පටන් ගත් ක්‍රමය අනුව කවරදාවත් මෙයින් ලාභ ලබා ගන්න බැරි බව. ඒ විධියේ වැටුප් දෙමින් එම ව්‍යාපාරයෙන් කවරදාවත් මහජනයාට සේවයක් කරන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න බැරි බව පැහැදිලිවම පෙන්වා දුන්නා. වියර් ද මෙල් මහතා එම මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කිරීම ගැනත් අප එදා විරුද්ධ වුණා. මුලින්මයි අපේ විරුද්ධත්වය පළ කළේ. නමුත් අවුරුදු දෙක තුනක් ගත වුණායින් පසුව අනික් කොටස්වලිනුත් විරුද්ධත්වය ප්‍රකාශ වුණා. ඒ විරුද්ධත්වය වැඩි වීම හේතුකොටගෙන ඒ මහත්මයට අයින් වෙන්න සිද්ධ වුණා. ඒ මහත්මය ඉන්න කොට එහි එක් වැඩ පිළිවෙළක් ගෙන ගියා: පුළුවන් තරම් ඒ මහත්මයගෙ නෑදෑයො ඒකට දාගැනීමෙ වැඩ පිළිවෙළක් ගෙන ගියා. ඒක කවුරුත් දන්න කාරණයක්. මේ සභාවෙත් කියන්න යෙදුණා. මුල් තැන සිට අග තැනට යන තුරු වියර් ද මෙල් මහත්මයගෙ නෑදෑ හිත මිතුරන් සියලු දෙනෙක්ම එයට ඇතුළත් කර ගැනීමෙ වැඩ පිළිවෙළකුයි ඒ මහත්මය ගෙන ගියේ. ඊට පසුව පත් වුණ ආර්. වී. ද සිල්වා මහත්මයත් ඒ වැඩ පිළිවෙළමයි අනුගමනය කෙළේ. ඒ මහත්මයගෙ හිත මිත්‍රයො නෑදෑයො ඔක්කොම දා ගත්ත. ගාල්ලෙ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) මේ සභාවේදි කියන්න යෙදුණ, මේ ලංගම නොවේය " සලංගම " ය කියා. දැන් ලංගම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

යට මොකක්ද සිදු වී තිබෙන්නෙ? සභාපති මාරු වුණ නමුත්, මිත්‍රකම් සම්බන්ධකම් නෑදෑකම් ඔක්කොම තිබෙනව. සභාපති පමණයි මාරු වුණේ. වැරදි ක්‍රමය මාරු වුණේ නැහැ. හැමදාම පාඩුයි. මේ ගැන සෑම දාම මේ සභාවෙ කියවෙනව. ඒ වැරදි ක්‍රමය තවම වෙනස් වී නැති වීම ගැන අපි කනගාටු වෙනව.

අ. භා. 6.30

මේ ඊයෙ පෙරේද මම දැක්ක, ගමනාගමන මණ්ඩලයට එන බඩු වරායෙ සිට ගමනාගමන මණ්ඩලයට ගෙන ඒම සඳහා ආකෘති පත්‍ර පිරවීමට පමණක් රුපියල් 40,000 ක් වියදම් කිරීමට ලංගමයට සිදු වී තිබෙනවාය, කියා. සිටි කැරියර්ස් කියන කොම්පැනියටයි ඒ මුදල ගෙවා තිබෙන්නෙ. ඇයි ගමනාගමන මණ්ඩලයෙ සිටින ලිපිකරුවන්ට කියා ඒ වැඩේ ගන්න බැරි? ලංගමයට බැරිද ඔය බඩු ගෙනෙන්න? පාවිච්චි කරන්න බැරි පරණ බස් තිබෙනව. ඒවයෙ මිනිස්සු පටවන්න බැරි වුණාට බඩු පටවාගෙන එන්න පුළුවන්. මොකක්ද මේ විහිළුව? මේ ආකෘති පත්‍ර පුරවනවට දවසකට රුපියල් 20 ක්ද කොහෙද ගෙවනව. ඊට වැඩි වුණොත් මිසක් අඩු වෙන්නෙ නැහැ. ඒ අවසරය දුන්න නිලධාරිය ලංගමයෙන් වහාම පන්නන්න ඕන. ඇමතිවරයට මේ ගැන දෙස් කියන්න බැහැ. මෙය පසු ගිය අවුරුදු දෙක තුන ඇතුළත කෙරුණු දෙයක්. මේව නිකම්ම වසා දමන්න බැහැ. සොයා බලන්න ඕන.

අද ලංගම සේවකයන්ගෙ අර්බුදයක් ඇති වී තිබෙනව. එය මම හිතන්නෙ රියැදුරු මහත්වරුන්ගෙ සහ කොන්දොස්තර මහත්වරුන්ගෙ ඇඳුම් පිළිබඳවයි. දැන් කාකි බුෂ් කෝට් එකක් ඔවුන්ට දෙනව. දැන් 6 මාසයක් පමණ තිස්සෙ මේ ගැන ලොකු කඹ ඇදිල්ලක් තිබෙනව, රෙදි ගන්නෙ කොහෙන්ද, ඒව මහන්න දෙන්නෙ කාටද, කියන එක ගැන. පසු ගිය දෙසැම්බර් මාසෙ ඔක්කොම පිළියෙල කර ටෙන්ඩර් කැඳවා ඇඳුම් මහන කෙනෙකුට දෙන්න බලාපොරොත්තුවක් තිබුණ. එය මණ්ඩලයේ සාකච්ඡාවකින් පසු වෙනස් වුණා. සමුපකාර සමිතිවලට දෙන්න චූවමනාය කිව්ව. ඊට පසු දැන් රෙදි ප්‍රශ්නයක් ඇවිත් තිබෙනව. මණ්ඩලය තීරණයක් ගෙන තිබෙනවා, දකුණු ඉන්දියාවෙ තිබෙන බකිංහැම් ඇන්ඩ් කානටික් රෙදි කර්මාන්ත ශාලාවෙන් රෙදි යාර 70 දහසක් ලංකාවට ගෙන්වීමට. ඒ රෙදි ගෙන්වීමට බඩු ගෙන්වීමෙ පණත උඩ අවසර දෙන්නයි කර්මාන්ත හා වෙළඳ කට යුතු පිළිබඳ ඇමතිතුමාගෙන් ඉල්ලා තිබෙනව. ඒ කොන්දේසියෙන් නිදහස්ව මේ රෙදි ගෙන්වීමටයි, අවසර ඉල්ලා තිබෙන්නෙ. අද ඉන්දියාවෙන් රෙදි ගෙන්වීමට වැඩ පිළිවෙල යොදා තිබෙනව; නමුත් ලංකාවෙ රජයේ බඩු ගබඩාවෙ කාකි රෙදි යාර 1,50,000 ක් තිබෙනව, මේ බුෂ් කෝට් මැහීමට සුදුසු. ඒව චීනයෙන් ගෙනෙන ලද රෙදි. චීනයත් ලංකාවත් අතර ඇති වෙළඳ ගිවිසුම උඩ මේ රටට ගෙනන ලද රෙදි. මේ රෙදි ගන්නෙ නැතිව දකුණු ඉන්දියාවේ බකිංහැම් ඇන්ඩ් කානටික් කර්මාන්තශාලාවෙන් රෙදි යාර 70,000ක් ගෙන්වන්නට යන්නෙ මක්නිසාද? මේ පිළිබඳව සම්පූර්ණ පිළිතුරක් ඇමතිතුමා දෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනව. ඇයි චීන රෙදි නොගන්නෙ. මේ චීන රෙදි වලින් ඒ ඇඳුම් මැහීම ගැන කවුද විරුද්ධ? ලංකාවේ දැනට ඇති විශාල රෙදි ප්‍රමාණයක් දිරාපත් වන්නට ඉඩ දී, විශාල මුදලක් කාබාසිනියා වන අන්දමින් දකුණු ඉන්දියාවට මුදල් යවා මේ විධියට රෙදි ගෙන්වීමට යන්නේ කාගෙ වුවමනාවක් අනුවද? ඊට සම්පූර්ණ පිළිතුරක් දෙන ලෙස මම නැවතත් ඉල්ලා සිටිනවා.

මගේ ප්‍රදේශය පිළිබඳව කාරණයක් කියන්න තිබෙනව. බදුල්ලෙ කච්චේරියේ පැවැත්වෙන දිස්ත්‍රික්ක සම්බන්ධතා කාරක සභාවට ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජිතයා හරියට පැමිණෙන්නෙ නැහැ. මෙහි පස්සර ගරු මන්ත්‍රීතුමත් (අමරනන්ද රත්නායක මයා.) ඉන්නව. ඒ මන්ත්‍රීතුමත් ඒ පිළිබඳව සාක්ෂි දරනව ඇති. ඒ නියෝජිතයා ඒ රැස්වීම ගැන ශත පහක සැලකිල්ලක් දක්වන්නෙ නැහැ. තවත් ආණ්ඩුවෙ නිලධාරීන් ඒ රැස්වීම්වලට පැමිණෙනව. ඒ රැස්වීම්වලදී සාකච්ඡා කොට, කළ යුතු වැඩ පිළිවෙල ක්‍රියාවෙ යොදවන්න පුළුවනි; නමුත් ඒ නිලධාරියා එන්නෙ නැහැ. හරි විධියට නම් ඊට උත්තර දිය යුත්තෙ කලින් සිටි ඇමතිවරයායි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ද සොයිසා සිරිවර්ධන**
*(கௌரவ டி சொய்ஸா சிறிவர்தன)*
(The Hon. de Zoysa Siriwardena)

වුවමනා නම් මම උත්තර දෙන්නම්.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

උත්තර දෙනව නම්, ගිය අවුරුද්දේ අප කී දේ හැන්සාඩ් වාර්තාවෙන්වත් බලා පසුව උත්තර දෙන්න. ගිය අවුරුද්දෙත් ඊට කලින් අවුරුද්දෙත් ගරු මන්ත්‍රීවරුන් මෙහිදී කියන ලද ඒවායින් සියයට 10 ක් වත් කර තිබෙනවායයි ඒ ඇමතිතුමාට කියන්න පුළුවන්ද ?

මම මේ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටි නවා, මණ්ඩලයේ ඒ නියෝජිතයාට නිති පතා ඒ රැස්වීම්වලට පැමිණෙන්නයයි නිවේදනයක් යවන ලෙස. එහිදී අපි තීරණ කිහිපයක්ම ගෙන තිබෙනවා. පස්සර මන්ත්‍රීතුමාත් ඒව පිළිබඳව දන්නව ඇති. අපි යම් කිසි ඉල්ලීමක් කළාම ඒ ගැන ඇහුම්කන් දෙන්නෙ නැහැ. නැදුන්ගමට බස් සේවයක් දෙන්නයයි මම ඉල්ලා සිටිය. ඌව පරණගම ආසනයේ උළුගලට බස් සේවයක් දෙන්නයයි ඉල්ලා තිබෙනව. පස්සර මන්ත්‍රීතුමාත් (අමර නන්ද රත්නායක මයා.) නිතරම ඉල් ලීමක් කරනව. නමුත් මොකක්ද, ලංකා ගමනාගමන මණ්ඩලය දෙන උත් තරය? පාර නුසුදුසු නිසා එය ඉටු කරන්න බැරිය කියනවා. ඒ නිසා ඒ පාරට බස් සේව යක් දෙන්න බැරිය කියනව. ඒ කියමන පිළිගන්න අපි ලෑස්ති නැහැ. ඒ පාරේ බස් රියකට වඩා බර ඇති ලොරි ගමන් කරන නිසාත්, නිතරම පාහෙ වෑන් රථ පවා ගමන් කරන නිසාත්, ඒ කිසිවකට කිසිම අමාරුවක් නැතිව එහා මෙහා යන්න හැකි වී තිබෙන නිසාත්, ඒ පාරට බස් රියක් නොදෙන්නෙ පාර නුසු දුසු තත්ත්වයක තිබෙන නිසාය, කියන කියමන පිළිගන්න අපට බැහැ කියල යෝජනාවක් ගෙනැවිත් සම්මත කර ගත්ත. බස් රථයක් නොදීම නිසා මිනිසුන් ට දිගටම ඇවිදින්න සිද්ධවුණොත් කකුල් වල හම ගැලවිලා හමාර වන නිසා බස් රථ යක් ඒ පාරට දෙන ලෙස ඉල්ලා යැව්ව. මේ පාරවල තත්ත්වය බලා ගන්න ඕනෑ නම් කරුණා කරල ගරු මන්ත්‍රීවරුනුත්, පළාතේ දිසාපතිතුමත් එක්ක ඇවිදින්න එන ලෙස මම ඉල්ලනව. යෝජනාව සම් මත කරගෙන මාස දෙකක් ගත වුණා. ඒත් තවම ඊට පිළිතුරක් හරියාකාර ලැබිල නැහැ. අපි බලාපොරොත්තු වුණා, ඒ යෝජ නාවෙ ප්‍රතිඵල ඊළඟ දිස්ත්‍රික් සම්බන්ධිතා කාරක සභාව ඉදිරියෙ තබන්න. නමුත් කියන්නත් කනගාටුයි, අපේ ඒ යෝජ නාව සත පහකටවත් ගණන් ගත්තෙ නැහැ ලංකා ගමනාගමන මණ්ඩලය. ඒ වෙනුවෙන් එන නිලධාරියා කවුද? මහ ජන මන්ත්‍රීවරුන් කියන දේ සත පහකට වත් සලකන්නෙ නැත්තෙ තමන් පණ් ඩිතයන්ය කියල හිතන නිසාද? මහජන මුදල් සූරා කෑම සහ වෙනත් නොයෙකුත් දූෂණ ක්‍රියා කිරීම, හොරමැරකම් කිරීම, මහ ජනයා අමාරුවේ දැමීම මේ අයගෙ එකම සුදුසුකම වෙලා තියෙන හැඩයි. ලංගමයෙ උසස් නිලතලවල වැජඹෙන්න මේ උදවියට තිබෙන එකම සුදුසුකම ඒකද? අපේ යෝජනාව පිළිගත්තෙ නැත්තෙ ඇයි කියන ප්‍රශ්නයට පිළිතුරක් ගරු ඇමති තුමාගෙන් බලාපොරොත්තු වෙනව. අප ඉදිරිපත් කළේ ඒකමතිකව සම්මත වුණු යෝජනාවක්. ඒ යෝජනාව නොසලකා හැරිය නිලධාරියා කවුද කියා දැන ගන්න කැමතියි. මීට වගකිවයුතු නිලධාරියට මො කක්ද කරන්න බලාපොරොත්තු වෙන් නෙ? ඔය වගේ මිනිසුන් එක තැනකින් තවත් තැනකට මාරු කරල මදි. එහෙම එක තැනකින් තවත් තැනකට මාරු කිරීම හරියට හිසේ රදයට කොච්චෙ මාරු කිරී මක් වගෙයි. ඔය වගේ හොඳ යෝජනාවල් ඉදිරිපත් කිරීම නිසා බදුල්ලෙ හිටපු දිසා පති තුමාටත් එතනින් යන්න සිද්ධ වුණා. මොකක් නිසාද එතුමට අපේ පළාතෙන් යන්න සිද්ධ වුණෙ කියන කාරණය මීට කලින් කියන්න බැරි වුණා. වෙලාව ආවම මම ඒකත් කියන්නම්. අප දැන් සාකච්ඡා කරන ශීර්ෂය ඊට අදාළ නොවන එකක් නිසා දැන් ඒ ගැන කියන්න බලාපොරො ත්තු වන්නෙ නැහැ. ඒක හොඳ කතා වක්. පස්සෙ කියනව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

කරුණා කරල ඒක දැන්ම කියන්න. පස්සෙ කියන්න ඉඩක් නොලැබෙන්නත් පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பி. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

කොස්ලන්දෙදි හොර දර ලොරියක් ඇල්ලුවා. ලොරිය අයිතිකාරයා මුදලාලි කෙනෙක්. එයාට රුපියල් දාහක් දඩත් ගැහැව්වා. මුදලාලි ඊට පස්සෙ මොකද කළේ ? පෙත්සමක් පිළියෙළ කරල මිනිසුන් කීප දෙනකු ලවා අත්සන් කරවගෙන යැව්ව. චක්ගෝළයින් හතර පස් දෙනෙක් ඒ පෙත්සමට අත්සන් කරල තියෙනව. ඒ පෙත්සමේ සඳහන් කරල තියෙනව, බදුල්ලේ දිසාපතිතුමා යූ. එන්. පී. කාරයෙක්ය කියල. ඔය පෙත්සම ඔය කියන විධියට පිළියෙළ කරල, අත්සන් කරවල, කතරගම දේවාලෙ බස්නායක රත්වත්තෙ උන්නැහේගෙ මාර්ගයෙන් ගරු අගමැතිනියට භාර දුන්න. එතනදි නෙවිල් ජයවීර මහත්මයා යාපනේ. මම මේ ගැන සොයා බැලුව මේ ගරු සභාවේදී මේ ගැන කියන්න ඕනෑ නිසා. ගිය සතියෙ වැල්ලවායෙ හිටිය මේ ගැන සොයා බලන්න. මේ ආණ්ඩුව යටතෙ හොරුන්ට, බොරුකාරයින්ට, වංචාකාරයින්ට, යසඓශ්වර්යයෙන් වැජඹෙන්න පුළුවනි. මම ඇමතිවරයගෙන් අහනව, ආත්ම ගෞරවයක් තියෙනවද කියල. ආත්ම ගෞරවයක්ය කියල දෙයක් තියෙනව නම් කරුණා කර මෙවැනි දේවල් සිද්ධ වෙන්න ඉඩ දෙන්න එපා. කවදාවත් ඔය විධියට වැඩ සිද්ධ වෙන්න ඉඩ දුන්නොත් මේ ආණ්ඩුවටත්, ආණ්ඩුව කරවන ඔය පක්ෂයටවත්, රටටවත් හරියන්නෙ නැහැ. කාටවත් සෙතක් වෙන්නෙ නැහැ මෙවැනි වැඩ කටයුතුවලට ඉඩ දීමෙන්. වැරදි කරන මිනිසුන් ආරක්ෂා කිරීමෙන් කවදාවත් කිසිම දෙයක් කාටවත් නියම සෙතක් ලැබෙන විධියට හරියන්නෙ නැහැ.

දුම්රිය සේවය ගැනත් වචන ස්වල්පයක් කියන්න බලාපොරොත්තු වෙනවා. ඊට ඉස්සර වෙලා ලංකා ගමනාගමන මණ්ඩලය ගැන තවත් එක් කාරණයක් පමණක් කියන්න තිබෙනවා. අද ලංකා ගමනාගමන මණ්ඩලයෙ සිංහල භාෂාවට මොකක්ද වෙලා තියෙන්නෙ? ලංකාවේ බස් ධාවනය මුදලාලිවරුන් අතේ තිබුණු කාලෙත් ඒ මුදලාලිලා ඒ වැඩ රාජකාරි කරගෙන ගියෙ සිංහලෙන්ම මිස ඉංග්‍රීසියෙන් නම් නොවෙයි. ඒ අය හැම වැඩක්ම කළේ සිංහලයෙන්මයි. නමුත් ගමනාගමන සේවය ජනසතු කළාට පස්සෙ හෙවත් ආණ්ඩුවට ගත්තට පස්සෙ එතන සිංහල නැහැ. මා ළඟ ඒ ගැන ලියා තිබෙන ලිපියක් තිබෙනව. ඒ ලිපිය "සිංහලේ" පත්‍රයේ පළ කරන ලද එකක්. කවුද ඒක ලියල තියෙන්නෙ? ශ්‍රී ලංකා නිදහස් වෘත්තීය සමිති සම්මේලනයේ සමලේකම්වරයෙකු වන සුගතදාස කයිකාවල මහත්මයායි. තරමක් දිග ලිපියක් නිසා ඒ ලියමන කියවන්න ගිහිල්ල මේ ගරු සභාවෙ කාලය තවත් වැඩිපුර ගන්න මම බලාපොරොත්තු වෙන්නෙ නැහැ. නමුත් එය බොහොම වැදගත් ලිපියක් හැටියට පෙනෙන නිසා එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වෙනව නම් හොඳයි. එසේ කිරීම සඳහා මම 1963 සැප්තැම්බර් මස 5 වනදා "සිංහලේ" පත්‍රයේ පළ කරන ලද ඒ ලියමන මේ ගරු සභාවට ඉදිරිපත් කරනව. එය වාර්තාගත කරන ලෙස මම තමුන්නාන්සෙගෙන් ගෞරවයෙන් ඉල්ලනව.

අ. භා. 6.45

මා එම ලිපියෙන් සුළු කොටසක් මේ අවස්ථාවේදී කියවන්නම්.

'1963 අගෝස්තු 26වෙනි දින ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමනාකරු විසින් නිකුත් කර ඇති ඔහුගේ අංක වී/ඒ/173 දරන චක්‍රලේඛනයකින් ලංගමය තුළ භාෂා පණත ක්‍රියාත්මක කිරීම තවත් අවුරුද්දකින් පසස්ට තල්ලු කිරීමට තීරණය කර තිබේ."

තවත් අවුරුද්දකින් පස්සට තල්ලු කරන්නයි යන්නෙ. ඒ අය හිතනවද ඒ අයට විතරක් විශේෂයක් තියෙනව කියල. එතකොට 1964.1.1 වන දින ඉඳල මුළු ලංකාවෙම සිංහලෙන් වැඩ කරයි ,කියල අපි හිතන්නෙ කොහොමද? ලංකා ගමනාගමන මණ්ඩලය, භාෂා ප්‍රශ්නය අවුරුද්දකින් පස්සට තල්ලු කරලයි තියෙන්නෙ. මේ අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු ලේකම්තුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ ලේකම්වරයෙක්ලු. මොකක්ද මේකෙ තේරුම කියල මා අහනව. මේක පක්ෂයේ ප්‍රතිපත්තියක්ද ?

---

* මෙහි සඳහන් කර ඇති ලිපිය මෙදින වැඩ කටයුතු අවසානයේ "පරිශිෂ්ටය අංක I" වශයෙන් දක්වා ඇත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩී. එස්. සමරසිංහ මයා. (ප්‍රවාහණ කට යුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டி. எஸ். சமரசிங்க—போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. D. S. Samarasinghe—Parliamentary Secretary to the Minister of Communications)

ඒක වැරදියි.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

තමුන්නාන්සෙලගෙ පත්‍රවල පළවන දේවල් මේව. මේ කොටස මා කියෙව්වෙ 1963.9.5 වන දින "සිංහලේ" පත්‍රයෙන්. එහෙමනම් "සිංහලේ" පත්‍රයට දොස් කියන්න. එහෙමනම් මේ රටේ කලබල ඇති කරන්නෙ ඒ අයයි. ඒක තමුන්නාන්සෙල පිළිගන්න ඕනෑ, එහෙමනම්. එම කාරණය පිළිබඳව ප්‍රකාශයක් කරන ලෙස මා ඉල්ලනව. දැනට සිටින තැපැල් ඇමතිතුමා ගමනාගමන ඇමතිවරයා වශයෙන් කටයුතු කරද්දී කොන්දොස්තර වරුන් වශයෙන් සිංහල ජ්‍යොෂඨ සමතුන් පත් කරන්න තීරණයක් අරගත්ත. කොන්දොස්තර තනතුරුවලට ජ්‍යොෂඨ සමත් අය පත් කරනව නම් ජ්‍යොෂඨ විභාගය නොගත් අයට කරන්නෙ මොකක්ද කියල මා එතුමාගෙන් එදත් ඇහුව. ඒ ඇමතිතුමාටත් ජ්‍යොෂඨ නැතිව ඇමතිකමක් ලැබුණ—පරණ තිබුණු කුණු කූඩෙ වාසනාවකට. අනික් හැමෝටම ඔය තත්ත්වය තියෙනවද?

**පර්සි වික්‍රමසිංහ මයා.**

*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*

(Mr. Percy Wickremasinghe)

පෙර පිනකින්.

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

ජ්‍යොෂඨ සමත් නොවුණු අය මේ රටේ කොපමණ සිටිනවද කියල මා අහනව. අස මත් වන අයගෙ සංඛ්‍යාව සමත්වන අයගෙ සංඛ්‍යාවට වඩා වැඩියි. ඒ අයටත් අවස්ථාවක් ලබා දෙන්න වුවමනා නේද කියල මා අහනව. මේ අය හිතන්නෙ සිංහල ජ්‍යෂ්ඨ සමත් අය සුදුසු වන්නෙ කොන්දොස්තර තනතුරුවලට පමණය කියලද? ඉංග්‍රීසි ජ්‍යොෂඨ සමත් අයට සබ් ඉන්ස්පෙක්ටර් තනතුරු, යුද හමුදාවෙ කොමිෂන් නිල එහෙම දෙන්න පුළුවනි. රුපියල් 400, 500 පඩි ලබන තනතුරු—ඒ කියන්නෙ යුද හමුදාවෙ කොමිෂන් නිලතල, පොලීස් හමුදාවෙ උප පරීක්ෂක තනතුරු යනාදි නොයෙකුත් උසස් නිලතල—ඒ අයට දෙන්න පුළුවනි. නමුත් සිංහල ජ්‍යොෂඨ සමත් අයට දෙන්නෙ කොන්දොස්තරකම්. එම තනතුරු සඳහා ජ්‍යොෂඨය සමත් නොවුණු අයගෙනුත් සියයට 50 ක් වත් පත් කර ගන්න කියල එදා අපි ඉල්ලා සිටිය. නමුත් පිළිගත්තෙ නැහැ. මා සිතනව නැවතත් වරක් ගැසට් නිවේදනයක් පිට කරල තියෙනව කියල ජ්‍යොෂඨය සමත් අයගෙන් පමණක් ඒ සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවන්න.

**ගරු එම්. සමරවීර (ප්‍රවාහණ කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ எம். சமரவீர—போக்குவரத்து அமைச்சர்)*

(The Hon. M. Samaraweera—Minister of Communications)

ඒක වැරදියි.

PUBLIC LIBRARY JAFFNA

**කේ. එම්. පී. රාජරත්න මයා.**

*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*

(Mr. K. M. P. Rajaratna)

එහෙනම් අනික් අයගෙනුත් සියයට ගණනක් ගන්නවද? මේ ක්‍රමය ක්‍රියාවේ යොදවන්නෙ කොහොමද කියල කරුණා කර කියන්න. ජ්‍යොෂඨ සමත් නැති අයටත් අවස්ථාවක් දෙන්න ඕන. ඒ අය බොහොම ඉන්නව. ඒ අයටත් වැඩ කරන්න පුළුවනි. ජ්‍යොෂඨ සමත් වීමට වුවමනා නැහැ, එම රක්ෂාව කරන්න. ඊට අඩු සුදුසුකම් තියෙන අයටත් එම රක්ෂාව කරන්න පුළුවනි.

දුම්රිය දෙපාර්තමේන්තුව ගැනත් යමක් කියන්න කැමතියි. විශේෂයෙන් මා දැන් කියන්න යන්නෙ "උඩරට මැණිකෙ" ගැනයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**

*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*

(An hon. Member)

ලඟ ඉන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

කොච්චර සෙනඟ හිටියත් උඩරට යන දුම්රියවල තත්ත්වය එකයි. පසුගිය මාස පහ හය තුළ උඩ රට සෙනඟ ප්‍රමාණය වැඩි වුණා. කොළඹ සිට බදුල්ලටත් බදුල්ලෙ සිට කොළඹටත් විශාල සංඛ්‍යාවක් සෙනඟ ගමන් කරනව මෙම දුම්රියෙන්. සිරි පා වන්දනා සමය, මහනුවර උත්සව සමය යනාදි කාල සීමාවලදී විශෙෂ වශයෙනුත්, අනිකුත් කාල සීමාවලදී සාමාන්‍ය වශයෙනුත් විශාල ගණනක් ගමන් කරනව, මෙම දුම්රියෙන්. ගමන් කරන මගීන් කොතරම් වැඩි වුණත් දුම්රිය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට පුළුවන් කමක් නැහැ ඒ අය සඳහා අඩු වශයෙන් පෙට්ටි කීපයක් වත් වැඩිපුර යොදන්න. දවල් දුම්රියෙ තත්ත්වයත් එකයි; රෑ දුම්රියෙ තත්ත්වයත් එකයි. මේකෙ තේරුම මොකක්ද කියල මා අහනව. වැඩිපුර පෙට්ටි දමන්න බැරි නම් වැඩිපුර දුම්රියක් යොදන්න. මේ තත්ත්වය ගමන් කරන අයට තේරෙනව නම් අවුරුදු හතරෙ පහේ සිට දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරි මහත්වරුන්ට තේරෙන්නෙ නැත්තෙ ඇයි?

දුම්රිය දෙපාර්තමේන්තුවේ සිංහලට මොකද වෙලා තිබෙන්නෙ, කියා මා ගරු ඇමතිතුමාගෙන් දැනගන්ට කැමතියි. දුම්රිය දෙපාර්තමේන්තුව තුළ රාජ්‍යභාෂා පණත ක්‍රියාත්මක නොවන්නෙ ඇයි? [බාධා කිරීමක්] එහි සිංහල කියන ජාතියක් නැතැයි මාවනැල්ලේ ගරු මන්ත්‍රීතුමා (පී. ආර්. රත්නායක මයා.) කියනව. "දුම්රිය දෙපාර්තමේන්තුවෙ තිබෙන්නෙ විශේෂඥ වැඩ; කාර්මික වැඩ; වචන නැහැ" යනාදි වශයෙන් කියන්නෙ අමූලික බොරුවක්. ඕනෑ හැටියට මෙහි වැඩ සිංහලෙන් කරන්ට පුළුවනි. සිංහලෙන් කරන්ට බැරි දෙයක් මේ ලෝකයේම නැහැ. ඒ සඳහා වුවමනා කරන්නෙ, ඊට ඇල්ම, අවංකකම, හා ශක්තිය පමණයි. මීට කලින් සිටි ඇමතිවරුනුත් මේ කාරණයෙහිදි බුම්මගෙන හිටිය. දුම්රිය දෙපාර්තමේන්තුවේ සිංහලෙන් වැඩ කටයුතු කිරීම සඳහා ගන්න පියවර කුමක්ද කියා දැන් අප දැනගන්ට කැමතියි. මේ දෙපාර්තමේන්තුවේ සිංහලෙන් වැඩ කරන්න කැමති නිලධාරීන්ට අරියාදු කරනව. ඔවුන් තැනින් තැනට මාරු කරනව. මේ ගැන මට කරුණු ඉදිරිපත් කරන්ට පුළුවන්කම තිබෙනව. නානුඔය සිංහලෙන් වැඩ කරන්ට ඉදිරිපත් වූ නිලධාරියකුට අද දඬුවම් විඳින්න සිදු වී තිබෙනව. සිංහලෙන් වැඩ කරන්ට වුවමනා බව කීමයි, ඔහු කළ වැරද්ද. ඔහුගෙ අදහසට ප්‍රධානීන් කැමති වුණේ නැහැ. මෙවැනි සිද්ධීන් පිළිබඳව අප්‍රමාණ නිදර්ශන තිබෙනව. කරුණා කර මේ පිළිබඳව අනුගමනය කරන වැඩ පිළිවෙළ මොකක්ද කියා කියන්න.

මීළඟට ලංකා ගුවන් සේවය ගැන වචනයක් කියන්ට කැමතියි. අද මෙහි තත්ත්වය මොකක්ද? මේක අද හරිම හොර ගුහාවක්. කලින් සිටි ඇමතිතුමා මෙහි සභාපති වශයෙන් පත් කර තිබෙන්නෙ මොලමුරේ නමැති තැනැත්තෙකුයි. දැන් ඔහු එහි සිට හොඳ හොඳ සෙල්ලම් කරනවා. මොලමුරේ මේ ස්ථානය භාර ගත්තට පසු දවසින් දවස මෙය බංකොළොත් වන තත්ත්වයට, මෙය එපා වන තත්ත්වයට වැඩ කරනව. ඊට හේතුව මොකක්ද? මෙය සංයුක්ත මණ්ඩලයක් වශයෙන් පවත්වාගෙන යෑම අහෝසි කර දමා පෞද්ගලික කොම්පැනියකට භාරදීමෙ බලාපොරොත්තුවයි හේතුව.

මේ මොලමුරේ කියන මහත්මයට විරුද්ධව අද මා ප්‍රසිද්ධියේම චෝදනාවක් ඉදිරිපත් කරනව. ගරු ඇමතිතුමා ඒ ගැන පරීක්ෂා කර බලනවා ඇතැයි මා කල්පනා කරනවා. මොලමුරේ මහත්මයට සහ තවත් නිලධාරියකුට විරුද්ධව හොර මැණික් ජාවාරමක් ගැන මීට පෙරත් රත්නපුර ප්‍රදේශයේ ගරු මන්ත්‍රීවරුන් විසින් කරුණු ඉදිරිපත් කරන්ට යෙදුණා. මේ මොලමුරේ මහත්මය ප්‍රධාන පෙළේ හොර මැණික් ජාවාරම්කාරයෙක්. ඔහු සතු මැණික් පතලයකුත් තිබෙනව. දැනට මාස ගණනකට පෙරදී රුපියල් ලක්ෂ ගණනක් වටිනා මැණික් ගලක් ඒ පතලයෙන් ලැබුණලු. මේ මැණික් ගල ලංකාවෙදි විකුණුවාද? ලංකාවෙදි විකුණුවා නම්, ආදායම් බදු ගෙව්වද? මේ මැණික් ගල විකුණලා තිබෙන්නෙ ලංකාවෙදි නොවෙයි. වෙනත් රටකදීයි. ඒ නිසා ආණ්ඩුවට කිසිම ආදායමක් නැහැ. මේ පතලෙන් ලැබෙන මැණික් ගල් වැඩි හරියක් විකු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ණත්තේ පිටරටදීයි. මොලමුරේත්, මුදල් පාලක බර්ටි ගුණවර්ධනත් නිතරම ලංකාවෙන් පිටරට යන්නෙ මොන හේතුවක් උඩද, කියා දැනගන්න කැමතියි. ඊේගු නිලධාරිනුත් අල්ලගෙන මෙතැන ලොකු හොර ජාවාරමක් ගෙන යනව. ලංකා ගුවන් සේවයේ ලොක්කා පිටරට යන කොට කවුරුන්වත් ඔහු ගැන සැක කරන්නෙ නැහැ. මෙහෙම මැණික් හොරාට විකුණන්න යනවාය කියා කවුද කල්පනා කරන්නෙ ? මේ සල්ලි තියෙන්නෙ පිටරටවල. වග කීමක් ඇතිවයි මම මේ චෝදනාව කරන්නෙ. ඇමතිතුමා මේ ගැන සම්පූර්ණ පරීක්ෂණයක් කරන්න. අපි කරුණු ඉදිරිපත් කරනවා. පරීක්ෂණයක් කර මේක ඇත්තද නැත්තද කියා මේ ගරු සභාවට කියන්න.

තවත් කරුණක් තිබෙනවා. බර්ටි ගුණවර්ධන මහත්මයා තමයි මුදල් පාලක. (Financial Controller). ඇමතිතුමා මෙය දන්නවාද නැද්ද කියා මම දන්නෙ නැහැ. ටික කාලයකට පෙර බර්ටි ගුණවර්ධන මහත්මයා එංගලන්තයට ගියා. පිටරටකට යන අවස්ථාවකදී එක්තරා ප්‍රමාණයක් විනිමය මුදලක් ලැබෙනවා. නමුත් මේ මහත්මයා එංගලන්තයට ගොස් මොකක්ද කළේ ? පවුම් 150ක් ගත්තා. ලංඩන් නුවර එයාර් සිලෝන් කාර්යාලයට ගොස් පවුම් 150ක් අර ගෙන වියදම් කළා. පසුව කිව්වා, ඒ මුදල ලංකාවේ තමන්ගෙ පඩියෙන් කපා ගන්න කියා. ඒ විධියට විනිමය පාලන රෙගුලාසි උල්ලංඝනය කළා. මේක හොර ජාවාරමක්. රජයේ සේවකයන්ම කරන හොර ජාවාරමක්. ඇමතිතුමාට මේ කරුණු ගැන ලෙහෙසියෙන් සොයා බලන්න පුළුවනි. වැඩ තහනම් කර මේ නිලධාරියා වහාම අස් කරන මෙන් මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ නිලධාරියා ලංකාවේ විනිමය පාලන නීති උල්ලංඝනය කළා. වෙන කෙනෙක් එහෙම කළා නම් හිරේත් යවනවා. ඒ විධියට ලංඩන් නුවර එයාර් සිලෝන් කාර්යාලයෙන් පවුම් 150ක් අර ගෙන වියදම් කළා. මේ සම්බන්ධයෙන් ඇමතිතුමාගෙන් ප්‍රකාශයක් අපි බලා පොරොත්තු වෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රී**
*(தலைமை தாங்கும் அங்கத்தவர்)*
(The Presiding Member)

Order, please ! ගරු මන්ත්‍රීතුමා දැන් පැය භාගයකට වඩා කථා කළා.

**කේ. එම්. පී. රාජරත්න මයා.**
*(திரு. கே. எம். பீ. ராஜரத்ன)*
(Mr. K. M. P. Rajaratna)

තව ස්වල්ප වේලාවක්, ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි.

ඊළඟට, මේ එයාර් සිලෝන් සංයුක්ත මණ්ඩලයේ පරිපාලන වාර්තාවක් නැහැ. ඇයි මේකට පමණක් එවැනි නිදහසක් දී තිබෙන්නෙ ? අනික් හැම ආයතනයක්ම, හැම සංයුක්ත මණ්ඩලයක්ම පරිපාලන වාර්තා ඉදිරිපත් කරන්ට ඕනෑ. නමුත් මේකට පමණක් නිදහසක් දී තිබෙනවා. මට ආරංචියි. එක්තරා කරුණක්. එය සත්‍ය ආරංචියක් බව මම දන්නවා. එයාර් සිලෝන් සංයුක්ත මණ්ඩලයේ ගණකාධිකාරිතුමා දීර්ඝ කාලයක සිට මේ ගණන් හිලව් අනුමත කර නැහැ. ගණන් හිලව් අනුමත කරලත් නැහැ ; පරිපාලන වාර්තාත් නැහැ. නමුත් ඒ මිනිස්සුම ඉන්නව මේක හොරා කන්න. මේ ගැන වැඩ පිළිවෙළක් යොදන්න ඕනෑ. ඇයි පරිපාලන වාර්තාවල් දෙන්නෙ නැත්තෙ ? ඇයි ගණකාධිකාරිතුමා ගණන් හිලව් අනුමත කර නැත්තෙ ? මේවා ගැන සොයා බලන්න ඕනෑ. එපමණක් නොවෙයි, මේවා ගැන තදින් වැඩ කරන්ට ඕනෑ. මෙවැනි සාමාන්‍ය යෙන් කළයුතු දේවල්වත් හරියට කෙරෙන්නෙ නැත්නම් මේ ගරු සභාව මොකටද ? ඒකෙ සාමාන්‍යාධිකාරි රදළයෙක් හැටියට කල්පනා කරනවා. අගමැතිතුමිය සමග ඥාති සම්බන්ධයක් තිබෙන නිසා කොයි වරදක් කළත් බේරෙන්න පුළුවන්ය කියා ඔහු කල්පනා කරනවා. ඥාති සම්බන්ධය වෙනම එකක්. රජයේ සේවකයෙක් නම්, සංයුක්ත මණ්ඩලයේ සේවකයෙක් නම් හරියට වැඩ කරන්ට ඕනෑ. දැන් අපට අළුත්ම තර්කයක් ඉදිරිපත් කරනව, ගරු මන්ත්‍රීවරුන් නිලධාරීන්ගෙ පටි කඩන්න ව්‍යාපාරයක් පටන් ගෙන තිබෙනවාය කියා.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කේ. එම්. පී. රාජරත්න මයා.]

මම තවත් කරුණක් කියන්නම්. මේ මොලමුරේ මහත්මයා හරි පුදුම කෙනෙක්. වෘත්තීය සමිති පෙන්නන්න බැහැ. ඒවා කඩාකප්පල් කිරීම ඔහුගේ පරම චේතනා වයි. මෙන්න, වෘත්තීය සමිතියකට එවා තිබෙන ලියමනක්. මම කියවන්නම්:

"Ref. CH. 2/9/63 of 5.9.63.

The President,
Ceylon Air Transport Employees' Union,
C/o Engineer, Workshop,
Air Ceylon Ltd.,
Ratmalana.

Please be informed that in future all representations to the Chairman or the Board should be forwarded through the General Manager.

(Sgd.) M. W. F. Abeykoon,
Chairman, Air Ceylon Ltd."

මොකක්ද මේකෙ තේරුම? මින් මතු සාමාන්‍යාධිකාරි මාර්ගයෙන් මිස ලියුම් ලියන්න එපයි කියා වෘත්තීය සමිතිවලට කියනවා. වෘත්තීය සමිති දියුණු කරන්නෙ මෙහෙමද? වෘත්තීය සමිති කඩාකප්පල් කිරීමට, භය ගැන්වීමට සාමාන්‍යාධිකාරීවරයා නැත් කරනවා. එයාගෙ වැරදි වැඩ විවේචනය කරන්ට ඉඩ නොදී යකඩ අතක් වෘත්තීය සමිතිවලට දමන්න හදනවා. මේ ලියමන වහාම ඉවත් කර ගන්නය කියා අණ දෙන හැටියට මා ඇමතිතුමාගෙන් ඉල්ලනවා.

අ. භා. 7

ඊළඟට තවත් කරුණක් කියන්න කැමතියි. ගුවන් ගමනාගමන සේවක සමිතිය දීර්ඝ සන්දේශයක් ඉදිරිපත් කර තිබෙනව. මේ සේවය පිළිබඳ අඩුපාඩුකම්, මේ සේවය දියුණු කළ යුතු ආකාරය, පාඩු ලබන අංශ ඉවත්කර ලාභ ලබා ගන්න ආකාරය, ආදි දේවල් මෙහි විස්තර කර තිබෙනව. ඔබතුමාගෙ අවසරය පිට මෙයත් වාර්තාගත වේය* කියා මා බලාපොරොත්තු වෙනව. මෙහි වැදගත් යෝජනා ගණනාවක්ම තිබෙනව. එය ලැබුණද නැද්ද මම දන්නෙ නැහැ. මේ වෘත්තීය සමිතිය කැඳවා මේ යෝජනා පදනම් කරගෙන සාකච්ඡාවක් පවත්වලා මේ සේවයෙන් ලාභයක් ලබාගැනීමට වැඩ කටයුතු කරන්නය කියා මා ඉල්ලනවා.

* ඉදිරිපත් කළ සන්දේශය අද දින වැඩකටයුතු අවසානයේ පරිශිෂ්ටයක් වශයෙන් මුද්‍රණය කර ඇත.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, තව කරුණු දෙකයි තිබෙන්නෙ. ලංකාවට අළුතින් අහස් යාත්‍රාවක් ගන්නට යනව. මේ ගුවන් සේවයේ හුඟක් ලෙඩ තිබෙනව. මේ ගන්නට යන අහස්යාත්‍රාව කොහෙන්ද ගන්නට යන්නෙ? සාමාන්‍යාධිකාරිවරයයි, මුදල් පාලකවරයයි—Financial Controller—හදනවා ඕලන්දයෙන් කසිකබලක් ගන්නට. ඉංජිනේරුවරුන් හා පයිලට්වරුන් එයට සම්පූර්ණයෙන්ම විරුද්ධයි. එංගලන්තයෙන් හෝ රුසියාවෙන් ගන්නය කියා ඒ අය යෝජනා කර තිබෙනව. මේ විධියෙ කබල් ඒවා අරගෙන වැඩක් නැහැ. තිබෙන ඒවා විකුණලයි මෙය ගන්නට යන්නෙ. මේ සම්බන්ධව සාමාන්‍යාධිකාරිවරයා කියන දේ පිළිගන්නට එපා. මේ සේවකයින්ගෙන් අහන්න. ඉංජිනේරුවරුන්ගෙන් හා පයිලට්වරුන්ගෙන් අසා සුදුසු වැඩ පිළිවෙළක් අර ගන්න.

අනිත් කාරණය මේකයි. බදුල්ලේ අහස්යාත්‍රා තොටුපලක් ඇති කරන්නය කියා බදුල්ලේ දිස්ත්‍රික් සම්බන්ධතා කොමිටියෙන් අවුරුදු දෙකකට පමණ උඩදී යෝජනාවක් සම්මත කළා. ඒ යෝජනාව බදුල්ලට ගුවන් තොටුපලක් ඇති කරන්නය කියන එකයි. එය මේ සේවය ඇති කරන්න හොඳ ස්ථානයක්. වැඩි වියදමක් යන්නෙත් නැහැ. ඒ යෝජනාව සම්මත වුණේ 1961 දීයි. ඒක බදුල්ලේ මන්ත්‍රීවරයා (බී. එච්. බණ්ඩාර මයා.) ගෙනා යෝජනාවක්. නමුත් අද වන තුරු ඒ ගැන කිසිවක් වෙලා නැහැ. මේ පිළිබඳව මේ ඇමති වරයාගේ අදහස මොකක්ද කියා දැනගන්නට මා කැමතියි. සල්ලි නැහැ කියන්නත් බැහැ. ඉලංගරත්න ඇමතිතුමා කියනවා, සීනි බෝල දෙනවා වගේ ඕනෑ තරම් සල්ලි දෙන්නම් කියා. ඒකයි හැම එකකටම අයවැය ලේඛනය ඉදිරිපත් කරන්නෙ. ඒ නිසා, මේ දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවෙ යෝජනාව ගැන මේ ඇමතිවරයා ගන්නට යන ක්‍රියා මාර්ගය කුමක්ද කියා දැනගන්නට අපි සතුටුයි. මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා.**

*(ஜனுப் எம். ஈ. எச். முகம்மது அலி)*

(Mr. M. E. H. Mohamed Ali)

கனம் தலைவர் அவர்களே, எனது பேச்சை ஆரம்பிப்பதற்கு முன் ஒரு விஷயத்தையிட்டு எனது மனவருத்தத்தைத் தெரிவிக்க விரும்புகின்றேன். அதாவது, இன்று காலை வீடமைப்பு இலாகாவின் மானியத்திலே பங்குபற்றும் நோக்கமாக நான் எனது பெயரைச் சபைச் செயலதிகாரியிடம் கொடுத்திருந்தேன். நான் மட்டுமல்ல, என்னுடைய நண்பர் கௌரவ மட்டக்களப்பு முதலாவது பிரதிநிதி (திரு. சி. இராஜதுரை) அவர்களும் தமது பெயரைக் கொடுத்திருக்கின்றார் என்று அவர் என்னிடம் சொன்னார். அத்துடன் குறிப்பிட்ட சில அங்கத்தவர்கள் பேசியதன் பின் நாங்கள் பேசலாம் எனவும் அவர் பதில் தந்தார். நாங்களும் காத்துக்கொண்டிருந்தோம். அப்போது மதிய போசனத்துக்காகச் சபை ஒத்திவைக்கப்பட்டது. அதன் பிறகு அந்த ஆசனத்தில் வேறொருவர் காட்சியளித்தார். எங்கள் பெயர்களெல்லாம் வெட்டப்பட்டுத் தவிர்க்கப்பட்டிருந்தன. நாங்கள் மக்களால் தெரிவுசெய்யப்பட்டு இந்தச் சபைக்கு அனுப்பப்பட்டிருக்கும் பிரதிநிதிகள். எங்கள் தொகுதிகளின் குறைகளை எடுத்துக் கூற எங்களுக்கும் உரிமையிருக்கின்றது. அவ்விதம் எங்கள் தொகுதிகளின் குறைகளை எடுத்துக்கூற நாங்கள் இந்தச் சபையின் செயலதிகாரியின் தயவை நம்பியிருக்க வேண்டிய நிலையைப் பற்றிச் சிந்திக்கும் பொழுது என்போன்ற பலரும் வருந்தாமலிருக்க முடியாது. இப்படியான காரியங்கள் இனிமேலும் தொடர்ந்து நடக்காமல் இருக்கவேண்டுமென்று உங்களைக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

இபபோது போக்குவரத்து அமைச்சரின் மானியத்தின் கீழ்ச் சில குறிப்புக்களைக் கூற விரும்புகின்றேன். எனக்கு முன் பேசிய பல கௌரவ அங்கத்தவர்கள், போக்குவரத்து இலாகாவின் சீர்கேடுகளைப் பற்றியும் அவ்விலாகா ஏன் இப்படிக் கேவலமான நிலையிலிருக்கின்றது என்பது பற்றியும் விவரமாக எடுத்துக் கூறினார்கள். நான் கூற விரும்புவது என்னவென்றால், ஒருகாலத்தில், இந்தப் போக்குவரத்துச் சபை ஏற்படுவதற்கு முன், தனிப்பட்ட கம்பனிகளும் முதலாளிமார்களும் பஸ்களை ஓடவிட்டு மக்களுக்குச் சேவை புரிந்து வந்தார்கள். அந்தக் காலத்தில் அவர்கள், அச்சேவையை மிகவும் திறமையான முறையிற் செய்து வந்தார்கள். அத்துடன் அதனால் இலாபமும் பெற்று வந்தார்கள். அதன்பின் ஸ்ரீலங்கா சுதந்திரக் கட்சி அரசாங்கம் பஸ் போக்குவரத்தைத் தேசியமயமாக்கியது. இன்று நாங்கள் எதைக் காண்கிறோம். தேசியமயமாக்கப்பட்ட சேவைகள் அனைத்தும் இன்று நட்டத்திலேயே ஓடிக்கொண்டிருக்கின்றன. இத்தகைய சீர்கேடுகளைப் பற்றி விசேஷமாக எதிர்க் கட்சி அங்கத்தவர்களும் பொதுவாக அரசாங்கக் கட்சி அங்கத்தவர்களும் தமது கண்டனங்களைத் தெரிவித்திருக்கிறார்கள். இந்த நிலையில் கௌரவ அமைச்சர் அவர்கள் செய்ய வேண்டியதென்ன? போக்குவரத்துச் சபையிலுள்ள சீர் கேடுகளைத் திருத்தியமைத்து அதன் நாளாந்த நடைமுறை வேலைகளை நல்ல நிலைக்குக் கொண்டு வர வேண்டும்.

இன்று இச்சபையிலே போக்குவரத்து இலாகா சம்பந்தப்பட்ட இந்த விவாதத்திலே எனக்கு முன்பு பேசிய கௌரவ அங்கத்தவர்கள் பஸ் சேவையின் கேவலமான நிலையைப் பற்றிக் குறிப்பிட்டார்கள். பொதுவாகத் திருமலை மாவட்டத்தையும் குறிப்பாக என்னுடைய தொகுதியையும் பொறுத்த அளவில் பஸ் போக்குவரத்துச் சேவை மிகவும் மோசமாக இருக்கிறதென்றே குறிப்பிட வேண்டும். இப்பகுதிகளில் மிக மோசமான, அதாவது ஒன்றுக்கும் உதவாத பஸ் வண்டிகளே சேவையில் உள்ளன. திருமலை மாவட்டத்தின் பஸ் போக்குவரத்துச் சேவையைத் திருத்தியமைத்து அப்பகுதி மக்களுக்கு நல்ல போக்குவரத்து வசதிகளை அளிக்க வேண்டியது அரசாங்கத்தின் கடமையென்று வற்புறுத்திக் கூற விரும்புகிறேன்.

குறிப்பாக என்னுடைய தொகுதியில் பல சிறிய கிராமங்கள் இருக்கின்றன. அங்கிருந்து பட்டணம் போவதாக இருந்தால் பொது மக்களுக்கு எவ்வளவோ பிரயாணக் கஷ்டம். சாதாரண ஏழைப் பொது மக்களுக்குத் தனிப்பட்ட கார் வசதிகள் உண்டென்றோ அல்லது கிடைக்குமென்றோ சொல்வதற்கில்லை. இந்த நிலையில் இலங்கைப் போக்குவரத்துச் சபையின் கடமையென்ன? கிண்ணியா, தம்பலகாமம், சம்பூர், கந்தளாய் போன்ற கிராமப்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මොහමඩ් අලි මයා.]

பகுதிகளுக்குத் தகுந்த பஸ் வண்டிகளை அனுப்ப நடவடிக்கைகளை எடுக்க வேண்டும். சில காலங்களுக்கு முன்பு கிண்ணியா, சம்பூர் ஆகிய கிராமங்களுக்கு நல்ல பஸ் வண்டிகளை அனுப்பிக் கொண்டிருந்தார்கள். இப்பொழுதெல்லாம் இந்த வசதிகள் இல்லை. மீண்டும் இப்பகுதி மக்களுக்கு நல்ல போக்குவரத்து வசதிகளை அரசாங்கம் செய்து கொடுக்க வேண்டும்.

அடுத்ததாகத் திருமலைத் துறைமுகப்பாலம் —அதாவது Passenger Jetty—சம்பந்தமாகச் சில குறிப்புக்கள் கூற விரும்புகிறேன். திருமலை எங்கள் மாவட்டத்தின் தலை நகரமாகும். திருமலையிலிருந்துதான் மூதூருக்குச் செல்ல வேண்டும். பொது மக்கள் மட்டுமல்ல எவருமே திருமலையிலிருந்துதான் இயந்திரப்படகோ அல்லது வள்ளத்தின் உதவியோ கொண்டு மூதூருக்குச் செல்ல வேண்டி இருக்கிறது. திருமலையின் இன்றைய துறைமுகம் மிகவும் கேவலமான நிலையில் இருக்கின்றது. இந்தத் துறைமுகப்பாலத்தைக் கௌரவ அமைச்சர் அவர்கள் வந்து பார்வையிட்டால் அவரே அதன் நிலையைக் கண்டு மிகவும் துக்கப்படுவார்; மிகவும் வெட்கப்படுவார். இதைத் திருத்த உடன் நடவடிக்கை எடுக்கப்பட வேண்டுமென்று கேட்டுக் கொள்கிறேன். அத்துடன் மூதூர் இறங்கு துறையையும் திருத்தியமைக்க நடவடிக்கைகள் எடுக்கப்படவேண்டும். இதைப் பற்றிப் பல தடவைகளில் நான் வற்புறுத்தியிருக்கிறேன். இதற்கு முன்பிருந்த அமைச்சர்களின் கவனத்திற்கும் இவ்விஷயத்தைக் கொண்டுவந்திருக்கிறேன். நாங்கள் அதைச் செய்வோம், இதைச் செய்வோம் என்று காலத்தைக் கடத்திக் கொண்டு இவர்கள் வந்திருக்கிறார்களேயொழிய எதையும் செய்யவில்லை. நடைமுறையில் எதுவும் காணப்படவில்லை. நான் இந்த அரசாங்கத்தைக் கேட்க விரும்புவது என்னவென்றால், வாய்ச் சொல் வீரர்களாக இல்லாமல்—பத்திரிகைகளுக்கு அறிக்கைகள் விடுபவர்களாக மாத்திரம் இல்லாமல்—செயல் வீரர்களாக இருக்கும்படி நான் உங்களைக் கேட்டுக் கொள்ளுகிறேன். நடைமுறையில் இந்த வேலைகளைச் செய்து பிற்போக்கான கிராமங்களிலுள்ள மக்களுக்குச் சேவை செய்யுங்கள் என்று கேட்டுக் கொள்ளுகிறேன்.

அடுத்ததாக புகையிரதப் பகுதியைப் பற்றிச் சில குறிப்புக்கள் கூற விரும்புகின்றேன். இன்று கொழும்பிலிருந்து திருகோணமலைக்கு ஒரு புகையிரதச் சேவை யிருக்கின்றது. அப்புகையிரதத்திலே போடப்பட்டிருக்கும் பெட்டிகள் போதாமலிருக்கின்றன. பிரயாணிகள் விசேடமாக மூன்றும், இரண்டாம் பெட்டிகளைத்தான் அதிகமாகப் பாவிக்கிறார்கள். ஆகையால் இவ்விரு வகுப்புப் பெட்டிகளையும் இப்புகையிரதத்தில் கூடுதலாகச் சேர்க்க வேண்டும்.

இன்று திருகோணமலையிலிருந்து மட்டக்களப்புக்கு ஏராளமான மக்கள் போய்க்கொண்டிருக்கின்றார்கள். இவர்களுக்கு இந்தப் புகையிரதத்தில் ஒரேயொரு பெட்டிதான் போடப்படுகின்றது. இதனால் இம்மக்கள் மிகவும் கஷ்டப்பட்டிருக்கிறார்களாகையால் இதனை நீங்கள் கவனத்துக்கெடுத்து இவர்களுடைய கஷ்டங்களை நீக்குவதற்கேதுவாக திருகோணமலை-மட்டக்களப்புப் புகையிரதத்தில் இன்னுமொரு பெட்டி சேர்க்க வேண்டுமென்று நான் கேட்டுக்கொள்ளுகிறேன்.

அடுத்ததாக சீனன் குடாவில் ஒரு புகையிரத நிலையம் இருக்கின்றது. இந்நிலையம் மிகவும் மோசமான நிலையில், எந்நேரத்திலும் விழுந்துவிடக்கூடிய ஒரு பழுதடைந்த கட்டடத்தில், பிரயாணிகள் தங்கியிருப்பதற்கு எவ்வசதியுமற்ற நிலையில் இருந்துகொண்டிருக்கின்றது. ஆகையால் பொதுமக்கள் இவ்விடத்தைக் கஷ்டங்களின்றி உபயோகிக்கக் கூடியதாக வேறொரு கட்டடத்தை இங்கு அமைத்து இப்புகையிரத நிலையத்தைச் சீர் செய்ய வேண்டுமென்றும், இப்புகையிரத நிலையத்தில் வந்திறங்கும் பிரயாணிகள் தங்கி இருக்கக் கூடிய வாங்குகளையும், போதிய வெளிச்ச வசதியையும் செய்து கொடுக்க வேண்டுமென்றும் கேட்டுக்கொள்ளுகிறேன். அதுமாத்திரமல்லாமல், "றிங்கோமலே ரீ அட்மினிஸ்ற்றேஷன்" என்ற கம்பனி மூலமாக சீனன்குடாவிலுள்ள புகையிரத நிலையம் இன்று மிகவும் பிரபல்யம் அடைந்து வருகின்றது. இதனை நீங்கள் கவனத்துக்கெடுத்து இந்தப் புகையிரத நிலையத்தைத் திருத்தி அமைக்க வேண்டியது மல்லாமல் "நேவி" யிலிருந்து இந்நிலையத்துக்கு மின்சார விநியோகத்தையும் நீங்கள் எடுத்துக் கொடுக்க வேண்டும்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

அடுத்ததாக கந்தளாய்க் குடியேற்றத் திட்டத்தைப் பற்றி நீங்களெல்லோரும் அறிவீர்கள். இங்கே தம்பலகாமத்திலொன்று, கந்தளாயிலொன்று என இரு புகையிரத நிலையங்களிருக்கின்றன. இவ்விரு இடங்களுக்கிடையேயும் ஏராளமான மக்கள் வசிக்கிறார்கள். இம்மக்களின் வசதிக்காக முள்ளிப்பத்தானையில் ஒரு புகையிரத நிறுத்துமிடத்தை அமைத்திருந்தீர்கள். ஆனால் கடந்த சில காலமாக இதனை நீங்கள் அகற்றிவிட்டீர்கள். இதனால் இப்பகுதியிலுள்ள மக்கள் மிகவும் கஷ்டத்துள்ளாகியிருக்கிறார்கள். ஆகையால் இப்பகுதியின் மத்திய இடமாகிய கந்தளாயில் கொழும்பிலிருந்து திருகோணமலைக்கும் திருகோணமலையிலிருந்து கொழும்புக்கும் போகும் புகையிரதத்தை நிறுத்துவதற்காக ஒரு தற்காலிக நிறுத்துமிடத்தை நிறுவ வேண்டுமென்று நான் கேட்டுக் கொள்ளுகின்றேன்.

அடுத்ததாக புகையிரதப் பாதைகள் பொதுப் பாதைகளுடன் சந்திக்கும் றெயில்வே கடவைகளில் ஏராளமான விபத்துகள் நடப்பதை நீங்கள் அறிவீர்கள். இதற்குக் காரணம் இத்தகைய இடங்களில் 'கேற்று' க்கள் இல்லாமலிருப்பதுதான். இதனால் எத்தனையோ புகையிரத-பஸ், லொறி மோதல்கள் இடம் பெற்று சிறியோரும் பெரியோரும் உயிரிழப்பதையும், கால் கைகளை இழப்பதையும் பற்றி நாங்கள் அடிக்கடி பத்திரிகைகளிலே படிக்கிறோம். ஆகையால் றெயில்வே கடவைகளில் கேற்றுக்களைப் போட்டு இவ்விபத்துக்களை நீங்கள் தடுக்க ஆவன செய்ய வேண்டுமென்று நான் கேட்டுக் கொள்ளுகிறேன்.

கொழும்பிலிருந்து திருகோணமலைக்கு ஒரு கடுகதிப் புகையிரதம் வேண்டுமென்று நான் மட்டுமல்ல, பொது மக்களும், பல தாபனங்களும் கேட்டிருக்கிறோம். கொழும்பிலிருந்து மட்டக்களப்புக்கு ஒரு கடுகதிப் புகையிரதச் சேவையை ஆரம்பித்து வைக்க நீங்கள் இப்பொழுது ஆயத்தமாகிக் கொண்டிருக்கிறீர்கள். யாழ்ப்பாணத்துக்கும் மலைப் பிரதேசங்களுக்கும் இத்தகைய புகையிரதங்கள் இப்பொழுது ஓட்டிக் கொண்டிருக்கிறீர்கள். ஆனால் திருகோணமலைக்கு இவ்வசதியை நீங்கள் அளிக்காமலிருக்கிறீர்கள். அந்தப் பகுதி மக்களின் நன்மை கருதி கொழும்பி லிருந்து திருகோணமலைக்கு கடுகதிப் புகையிரதச் சேவையொன்று ஏற்படுத்தப்பட வேண்டுமென்று கேட்டுக் கொள்ளுகின்றேன். அவ்வாறு ஏற்படுத்தப்படும் கடுகதிப் புகையிரதத்துக்கு 'திருமலையாள்' என்று பெயர் சூட்ட வேண்டுமென்றும் கேட்டுக் கொள்ளுகின்றேன்.

அ. ஹ. 7.15

1956 ஆம் ஆண்டிலிருந்து எங்களது பாராளுமன்றத்தில் மது ஒழிக்கப்பட்டு விட்டது. ஆனால் இன்று புகை வண்டிகளில் மது விற்பனை பெருமளவில் நடைபெற்றுக் கொண்டிருக்கின்றது. இதனால், புகையிரதப் பிரயாணிகளிற் பலர் மது அருந்திவிட்டு மற்றைய பிரயாணிகளுக்குப் பலவிதமான கஷ்டங்களை ஏற்படுத்திக் கொண்டிருக்கின்றார்கள். புகைவண்டிகளில் மது விற்பனை செய்யப்படுவதனால், பிரயாணம் செய்யும் மாணவர்கள் கூட மது அருந்தப் பழகிக் கொண்டிருக்கின்றார்கள். இதனால் சில சந்தர்ப்பங்களில் பெண்கள் தனியாகப் பிரயாணம் செய்ய முடியாமலுமிருக்கின்றது. புகை வண்டிகளில் விற்கப்படும் மதுவை அருந்தி விட்டு, பெண்கள் பிரயாணம் செய்யும் பெட்டிகளுக்குச் சிலர் சென்று பல விதமான பிரச்சனைகளை ஏற்படுத்தி அவர்களைக் கஷ்டப் படுத்துகின்றார்கள் என்பதை நீங்களும் அறிவீர்கள் என்று நம்புகின்றேன். இது மாத்திரமல்ல, வணக்க ஸ்தலங்களுக்குப் பிரயாணம் செய்து கொண்டிருப்பவர்கள் கூட மது அருந்துபவர்களால் கஷ்டத்துக்குள்ளாக்கப் படுகின்றார்கள். இத்தகையவர்களது செயல்களால், வணக்கத்துக்குரிய ஸ்தலங்களுக்குப் பிரயாணம் செய்பவர்களுடைய புனிதமான நோக்கமே கெடுவதற்கு ஏதுவுண்டாகின்றது. ஆதலால், பாராளுமன்றத்தில் மதுவை ஒழித்த நாங்கள் ஏன் புகை வண்டிகளிலும் மதுவை ஒழிக்கக் கூடாது என்று கேட்க விரும்புகின்றேன்.

இலங்கை போக்குவரத்துச் சபை, இளம் பெண்களை பஸ் கொண்டக்டர்களாக நியமனம் செய்யப் போவதாக நான் பத்திரிகைகள் மூலமும், சில சஞ்சிகைகள் மூலமும் அறிந்தேன். இதனை நீங்களும் அறிந்திருப்பீர்கள் என்றே நம்புகின்றேன். அவ்விதமாக இளம் பெண்களை நியமனம் செய்தால் விபத்துக்கள் அதிகமாக ஏற்படுமென்றே நான் நினைக்கின்றேன். இளம் பெண்களை கொண்டக்டர்களாகத் தெரிவு செய்தால், பஸ் சாரதி

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මොහමඩ් අලි මයා.]

கள் பாதையைப் பார்த்துக் கொண்டு பஸ் வண்டியைச் செலுத்தாமல் இப் பெண்களின் முகத்தைப் பார்த்துக் கொண்டு செலுத்த ஆரம்பித்துப் பல விபத்துக்களை ஏற்படுத்தக் கூடும். சில வேளை ரிக்கற்றுக்கள் அதிகமாக விற்பனையாகலாம். இளம் பெண்கள் ரிக்கற் விற்பனை செய்வதால் அதிகமானவர்கள் பஸ் வண்டிகளிற் பிரயாணம் செய்ய முன்வருவதனால் ரிக்கற் விற்பனை அதிகமாகலாம். ஆனால், பஸ் சாரதிகளுக்கும் மற்றவர்களுக்கும் ஏற்படக் கூடிய சிற்சில பிரச்சனைகளின் மூலம் விபத்துக்களும் அதிகமாகிக் கொண்டுதான் வரும். ஆதலால், இவ்விஷயத்தைப் பற்றித் திரும்பவும் சிந்திக்க வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன். மேல் நாடுகளில் சாரதிகளாகவும், கொண்டக்டர்களாகவும் பெண்கள் கடமையாற்றுகின்றார்கள். இங்கும் அந்த விதத்தில் செய்தால் நன்றாக இருக்கும். ஆண் சாரதிகள் கிடைப்பதில் தட்டுப்பாடு இருக்குமேயானால் இங்கும் பெண் சாரதிகளை நியமிக்கலாம். ஆனால் ஆண்களைச் சாரதிகளாகவும், பெண்களைக் கொண்டக்டர்களாகவும் நியமித்தால் நிச்சயம் விபத்துக்கள்தான் ஏற்படும்.

**රාසමානික්කම් මයා.**
*(திரு. இராசமாணிக்கம்)*
(Mr. Rasamanickam)

அதற்குப் பஸ் வண்டியும் நன்றாக இருக்க வேண்டும்.

**මොහමඩ් අලි මයා.**
*(ஜனுப் முகம்மது அலி)*
(Mr. Mohamed Ali)

எனக்குச் சற்று முன் பேசிய கௌரவ வெலிமடைப் பிரதிநிதி (திரு. கே. எம். பீ. ராஜரத்ன) அவர்கள், 'எயர் சிலோன்' விமான சேவை பற்றிக் குறிப்பிட்டார். நான் அறிந்த அளவில் எங்கள் 'எயர் சிலோனில்' குறைந்த அளவு விமானங்கள் தான் இருக்கின்றன. ஆனால் அங்கிருக்கும் உத்தியோகத்தர்கள் தொகை அதிகம். விமான சேவை பற்றிப் பொதுமக்கள் மிகுந்த அதிருப்தியடைந்திருக்கின்றார்கள். ஆதலால், இதனையும் நீங்கள் பரிசீலனை செய்து நல்ல நிலைக்குக் கொண்டு வர வேண்டுமென்று கேட்டுக் கொள்ளுகின்றேன்.

கடைசியாக, திருகோணமலை மாவட்டத்துக்கு நல்ல பஸ் வண்டிகள் அனுப்பப்பட வேண்டும். திருகோணமலை, மூதூர் கடலோரங்களுக்கு துறைமுகப் பாலங்கள் அமைக்க வேண்டும் என்று கேட்டுக் கொண்டு எனது பேச்சை முடித்துக் கொள்ளுகின்றேன். இத் தருணத்தில் பேசுவதற்கு எனக்குச் சந்தர்ப்பமளித்தமைக்காக தலைவரவர்களுக்கும் எனது நன்றியைத் தெரிவித்துக் கொள்ளுகின்றேன்.

**ඩී. එම්. ගුණසේකර මයා.**
*(திரு. டீ. எம். குணசேக்கர)*
(Mr. D. M. Gunasekere)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගමනාගමන මණ්ඩලය ගැන මටත් වචන ස්වල්පයක් කථා කරන්න තියෙනව, ගමනා ගමන පහසුකම් සම්බන්ධයෙන් මගේ ප්‍රදේශයෙ නොයෙක් අඩුපාඩු තියෙන නිසා. ගමනාගමන මණ්ඩලය ගැන මේ ගරු සභාව තුළ පමණක් නොව සාමාන්‍ය මහජනයා අතරත් නොයෙක් විධියේ ගුණ දෝෂ විවේචන කෙරෙනව. ඒ මණ්ඩලයෙ හොඳත්, නරකත් දෙකම කියවෙනව. දැන් 'ගමනාගමන මණ්ඩලයෙන් බොහොම පාඩු සිදු වන බව අප කාටත් පෙනෙනව. රජයෙන් පටන් ගෙන තිබෙන සංයුක්ත මණ්ඩලවලින් වැඩිම පාඩුව සිද්ධ වන්නෙ ලංකා ගමනාගමන මණ්ඩලයෙන් බව පෙනෙනව. මෙසේ විශාල පාඩුවක් සිදු වන්නෙ වුවමනාවට වඩා නිලධාරීන් ඒ ගමනාගමන මණ්ඩලයට පත් කර තිබීම නිසයි. ඉස්සර බස් මුදලාලිලාට බස් තිබුණු කාලයෙදී ලොකු නිලධාරි මහත්වරුන් හතර දෙනකු කළ වැඩ කරන්නට දැන් ඒ වගේ නිලධාරි 400 ක් පමණ ඉන්නව. වැඩි පඩි ලබන නිලධාරීන් බොහෝ දෙනෙක් වුවමනාවට වඩා වැඩිපුර පත් කර තිබෙනව. එසේ පත් කළාට කමක් නැහැ, ඒ අයගෙන් සෑහෙන වැඩක් කෙරෙනව නම්. එසේ නොකෙරෙනව නම් මුදල් නාස්ති කිරීම පමණයි, සිදු වන්නෙ. මේ තරම් විශාල ප්‍රමාණයක් බස්වල ගමන් කරනව නම් පාඩු සිදු වන්නෙ ඇයි කියා මහජනය ප්‍රශ්න කරනව. පාඩු සිදු වන්නෙ ඒ මණ්ඩලයට අවශ්‍ය ප්‍රමාණයට වඩා නිලධාරි මහත්වරුන් වැඩි පඩි ගෙවා පත් කර තිබීම නිසයි.

ගමනාගමන මණ්ඩලය බස් ධාවනය කරවීම සඳහා කාල සටහන් සකස් කරනව. මේ කාල සටහන් සකස් කරන්නෙ ජීවිතයටම බස් එකක වාඩි නොවුණු, බස් එකක නොයන, බස් ගැන දන්නෙ නැති,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිලධාරි මහත්වරුයි. ඒ අය කන්තෝරුවට වෙලා කාල සටහන් හරිගස්සනව. අසවල් වෙලාවට බස් එක ගියාට පසු මෙ පමණ වෙලාවකින් යනව, මෙපමණ වෙලාවකින් බස් එකක් අවශ්‍යය, කියා කාල සටහන් සකස් කරන මහත්වරු දන්නෙ නැහැ. එම නිසා මෙයින් මහජනයාට වෙන්නෙ පාඩුවක්. බස් එක පිටත් වෙන වෙලාවක් යම් යම් ස්ථානවලට ළඟාවෙන වෙලාවක් මහජනයා දන්නෙ නැහැ. බිබිලෙ සිට මොනරාගලට යන්න ඕන වුණොත්, කච්චේරියට හෝ උසාවියට යන්න ඕන වුණොත්, නියමිත වෙලාවට බස් එක පිටත් වෙන්නෙ නැහැ. බස් එක පිටත් වෙන වෙලාවක් දන්නෙ නැහැ. මේ නිසා නියමිත වෙලාවට උසාවියට යන්න ඕන පුද්ගලයකුට එසේ යන්න ලැබෙන්නෙ නැහැ. එම නිසා අවශ්‍යතාවන් ගැන කල්පනා කර බලා, අවශ්‍ය වෙලාවල් ගැන සොයා බලා කාල සටහන් සකස් කරන්න ඕන පමණක් නොවෙයි, බස් රථවල ගමන් කර අත්දැකීම් ලැබූ පුද්ගලයන් මේව සම්පාදනය කරන්න ඕන. එහෙම නැති නම් මහජනයාට අවශ්‍ය හැටියට, මහජනයාට ගමනාගමනය පහසු වන අන්දමට, බස් රථ ධාවනය සකස් කරන්න පුළුවන්කමක් කවදාවත් ලැබෙන්නෙ නැහැ.

ඒ වාගේම කොළඹ සිට තිස්සමහාරාමය දක්වා බස් එකක් යනව. දවසකට රුපියල් හත්සියයකට වඩා මෙම බස් රථයෙන් ආදායම ලැබෙනව. ඉඩකඩ මදිකම නිසා හැමදාම මේ බස් රථයෙ ගමන් කරන මගීන් බොහොම දෙනෙකු හිටගෙනයි ගමන් කරන්නෙ. මෙපමණ ආදායමක් ලැබෙනවා, මෙපමණ මගීන් සංඛ්‍යාවක් ගමන් කරනවා, මෙයට වඩා ආදායමක් ලබා ගන්නනම්, මෙයට වඩා බස් යොදන්න ඕනෑය කියා කල්පනා කරන්න ඕන.

ඉංජිනේරු අංශය ගැනත් වචනයක් කියන්න ඕන. මේ ගැන මන්ත්‍රීවරුන් කීප පොලක්ම කථා කළ නිසා දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නෙ නැහැ. ඉංජිනේරු අංශයෙහි වැඩ කරන අය ගැන මම නොකීවත් ඇමතිතුමත් දන්නව ඇතැයි මම හිතනව. මම දන්නව එක කාරණයක්. මෙය කියන්නෙ, ඉංජිනේරු අංශයෙ ඉන්න සමහර මහත්වරුන් වාහනයක කොටස්වත් හරි හැටියට නොදන්න බව පෙන්නා දෙන්නයි. නොදන්න බව පෙන්වන්න උවමනාවෙන්ම උත්සාහ කරනවද කියන්න මම දන්නෙ නැහැ. දවසක් දික්වැල්ලෙදි බස් එකක fපෑන් බෙල්ට් එක කැඩී තිබෙනව. පස්සෙ ඒ ගැන දැන්නුවාම —fපෑන් බෙල්ට් එක කැඩී තිබෙනවා, අලුත් බෙල්ට් එකක් එවන්නය කියා—එතැන ඉංජිනේරු අංශයෙ වැඩ කරන මහත්තයෙක් කියා තිබෙනව, එහෙම නම් ඒක මාතර ඩිපෝවෙන් වෙල්ඩ් කරගෙන එන්නය, කියා. පුදුම කථාවක් නේද මේක? වාහනයක fපෑන් බෙල්ට් එක හඳුනන්නෙ නැති මහත්වරු ඉංජිනේරු අංශයේ තබා ගැනීම සුදුසුද කියා මම ප්‍රශ්න කරනව. මේ විධියෙ නිලධාරීන් පත් කිරීමෙන් වෙන්නෙ මුදල් නාස්තිවීම පමණයි. එම නිසා ගරු ඇමතිතුමාට කියන්නෙ මේ වාගේ ඉංජිනේරුවන් අස් කර දමා,—ඒ අයට වැඩ කරන්න පුළුවන් දෙපාර්තමේන්තු තිබෙනව නම් ඒවට යවා,—දැනට ලංගමයේ වැඩ කරන බාස් උන්නැහෙලාගෙ පඩිය රුපියල් 50 කින් වැඩිකර, ඒ වාගේම ඒ අංශයේ සේවය කරන අයගෙ වැටුප වැඩි කර, මේ වැඩ කටයුතු ගෙන යාම සුදුසු බවයි. එසේ කළොත් ඉතාමත් ලක්ෂණට මේ වැඩ කටයුතු කරගෙන යන්න පුළුවන් වෙනවට සැකයක් නැහැ.

තවත් එක කාරණයක්. මෙය ලංගමයට පමණක් සීමා වුණු දෙයක් නොවෙයි, දෙපාර්තමේන්තු රාශියකටම පොදු දෙයක්. එනම්, යම් උසස් නිලධාරියෙක් වරදක් කරනව සේවකයකු විසින් පෙන්නා දුන්නොත්, එයින් එම සේවකයට වෙන්නෙ පාඩුවක්. බොහෝ විට ඒ අයට දඬුවම් පමුණනවා. මෙයට නිදර්ශනයක් වශයෙන් එක සිද්ධියක් ඉදිරිපත් කරන්නම්. බදුල්ලෙ ඩිපෝවෙ ටිකට් පරීක්ෂකයකු වශයෙන් සේරම් කියන මහත්මයෙක් සේවය කළා. මේ මහත්මය අවංක පුද්ගලයෙක්. ලංගමය දියුණු කරන්න, මහජනතාවගෙ සම්බන්ධතාව ඇතුව මේ මහත්මය කටයුතු කළා. එම නිසා එහි සිද්ධ වුණු වැරදි රාශියක්ම පෙන්නා දුන්න. එසේ පෙන්න දීම නිසා දඬුවම් කිරීමක් වශයෙන් අනුරාධපුරයට මාරු කළා. වරදක් පෙන්නූ නිලධාරියාට, වැඩ ගැන ආශාවක් ඇතිව, මහජනයාට ආදරයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. එම්. ගුණසේකර මයා.]

ඇතිව කටයුතු කළ පුද්ගලයාට, කළ සැල කීම තමයි, කළ හොඳ වැඩවලට ප්‍රශංසාව තමයි, දඬුවම් සහිතව අනුරාධපුරයට මාරු කිරීම. ඒ නිසා විශේෂයෙන්ම ඇමතිතුමා සොයා බලන්ට ඕනෑ මේ සේරම් නමැති ටිකට් පරීක්ෂක බදුල්ලෙන් මාරු කළේ මොන හේතුවක් නිසාද කියා.

මීට කලින් කථා කළ මන්ත්‍රීතුමා කිව්ව, දුම්රියේ මත්පැන් විකිණීම නවත්වන්න කියා. මමත් එහෙම කියනව. බස්වල නම් මත්පැන් විකුණන්නෙ නැහැ. බස්වලින් මත්පැන් බෝතල ගණන් ගෙන ගිහින් නැනින් තැන කඩවලට දී ගෙන යනව. මගේ කොට්ඨාශයේ එක්තරා රියැදුරෙක් ඉතාමත් හොඳින් මේ ජාවාරම කරගෙන යනව. ඔහුගේ නම මම කියනව. බදුල්ලේ ඩිපෝවේ සිට උදේ සවස බකිණිවෙල දක්වා ධාවනය කරන බස්වල සේවය කරන රියැදුරු මහත්මයෙක් ඉන්නව, ජේම්ස් කියා. මා නොයෙක් විට පැමිණිලි කර තිබෙනව, අසුවල් අසුවල් ස්ථාන වලට මේ රියැදුරා අරක්කු ගෙන ගොස් දෙනවාය ඒ ගැන පරීක්ෂා කර බලන් නය කියා. විශෙෂයෙන් මේ සම්බන්ධ යෙන් බදුල්ලේ ඩිපෝවට මතක් කර තිබෙනව. එහෙත් තවම ඔහුට විරුද්ධව කිසි දෙයක් කෙරුණේ නැහැ. අදත් ඒ රියැදුරා අරක්කු ජාවාරම කරගෙන යනව. අරක්කු විකුණා වැඩි ලාභ ලබාගන්නව. ඒ ගැන පරීක්ෂා කළා දැයි මා දන්නෙ නැහැ.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

තමුන්නාන්සේ කළ පැමිණිලිවලට මොනව වුණාද?

**ඩී. එම්. ගුණසේකර මයා.**
*(திரு. டீ. எம். குணசேக்கர)*
(Mr. D. M. Gunasekere)

කිසිවක් නැහැ.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

තමුන්නාන්සේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක්.

**ඩී. එම්. ගුණසේකර මයා.**
*(திரு. டீ. எம். குணசேக்கர)*
(Mr. D. M. Gunasekere)

මන්ත්‍රීවරයෙක් වුණත්, මහජනයා වුණත් යම්කිසි පැමිණිල්ලක් ඉදිරිපත් කළාම ඒ ගැන සොයා බලන්න ඕනෑ. ඒව ගැන සොයා බලන්ට නිලධාරීන් නැහැ. ඒ උදවියට ඒවා ගැන සොයා බලන්න වුවම නාවක් ඇත්තෙ නැහැ. ඒ නිසා ඇමති-තුමාට මා විශේෂයෙන් මතක් කරනව, මේ රියැදුරාගේ සේවය පිළිබඳව මෙතෙක් ඩිපෝවට ලැබී තිබෙන පැමිණිලි රාශිය විශේෂයෙන් පරීක්ෂා කර බලන්න කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොනරා ගල දිස්ත්‍රික්ක සම්බන්ධතා කාරක සභාවේ අපි යෝජනාවක් ඉදිරිපත් කළා, බිබිලේ සිට නුවර දක්වා බස් රථයක් ධාවනය කර වන්න කියා. දැන් පාලම හොඳට තනා තිබෙන නිසා මහියංගනය පාරෙ නුවර ඔස්සෙ කොළඹට ලෙහෙසියෙන් එන්න පුළුවන්. වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (කේ. එම්. පී. රාජරත්න මයා.) කිව්ව වගේ මොනරාගල දිස්ත්‍රික්ක සම්බන්ධතා කාරක සභාවට ලංගම නිලධාරිතුමා එන්නෙ නැහැ. ඒ නිලධාරියා බොහොම වටින නිලධාරියෙක්දැයි මා දන්නෙ නැහැ. උන්නැහෙට මේ කටයුතු ගැන කිසිම වුව මනාවක් නැහැ. උන්නැහේ එන්නෙත් නැහැ. දිසාපතිතුමා ලියුම් යවමින් ප්‍රශ්න කරනව මොකද එන්නෙ නැත්තෙ කියා. ඔහු ආවත් අපි කරන යෝජනා ගණන් ගන්නෙවත් නැහැ. බිබිලේ සිට නුවරට ගමන් කරන්ට වෑන් යොදවා තිබෙනව. මේ වෑන් ධාවනය කරවන්නෙ කවුද? බදුල්ලේ ප්‍රධාන බස් හිමියෙක්ව සිටි පීරිස් මහත්මයාගෙ නෑයෙක්. වෑන් කාරයන් සමග සම්බන්ධ කම් තිබෙන නිසා බස් රථ යක් යොදවන්නෙ නැහැ. මේ යෝජනාව අවශ්‍යතාවක් උඩ ඉදිරිපත් කළ එකක්ද, කියා සොයා බලන ලෙස ගරු ඇමතිතුමා ගෙන් ඉල්ලා සිටිනව.

මා තවත් යෝජනාවක් කරන්ට කැම තියි, ලංකා ගමනාගමන මණ්ඩලයට සම් බන්ධතා නිලධාරියෙක් පත් කිරීම අවශ්‍යයි කියා. විශේෂයෙන්ම සේවකයන් ගේ අඩුපාඩුකම්, මණ්ඩලයේ තිබෙන අඩු පාඩුකම් නොදන්න සමහර උදවිය නො යෙක් විට ලංගම විවේචනය කරනව. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිසා සම්බන්ධතා නිලධාරියෙක් ඊට පත් කිරීම ඉතා අවශ්‍යයි. හැබැයි, සම්බන්ධතා නිලධාරියෙක් පත් කරන විට හොඳට සිංහල දන්න කෙනෙක් ඒ සඳහා තෝරා ගන්න ඕනෑ. පේරාදෙනියෙ සංස්කෘතිය නොවෙයි; හොඳින් සිංහල දන්න කෙනෙක් පත් කරන්න ඕනෑ. මහජනයා සමග ආශ්‍රය කර ඒ කාරණා ගැන වැටහීමක් ඇති, අවබෝධයක් ඇති නිලධාරියෙක් මේ තනතුරට පත් කළ යුතුයි. දැනටත් මහත්මයෙක් පත් කර සිටිනවා. ඒ මහත්මයා වැඩ කටයුතු කීපයක් කරන්ට ඕනෑ. මේ ආයතනය දියුණු කරන්ට ආශාවක් තිබෙනව නම්, රටට ආදරයක් තිබෙනව නම් යහපත් අදහස් ඇති අවංකව සේවය කරන්ට පුළුවන් හොඳ නිලධාරියෙක් පත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් ගරු සභාපතිතුමනි, මගේ කොට්ඨාශය ගැන තවත් එක කරුණක් මතක් කරන්න ඕනෑ. බිබිලේ සිට මොනරාගල හරහා දඹගල දක්වා එක බස් එකක් දුවනවා. දහස් ගණන් මහජනතාව ජීවත් වන, ගමන් බිමන් යන ඒ මාර්ගයෙහි අඩු වශයෙන් බස් දෙකක්වත් වැඩ කරන්නය කියා මම අනන්ත ඉල්ලා සිටියා. නමුත් එයට කිසි සේත්ම ඇහුම්කන් දුන්නෙ නැහැ. සොයා බැලුවෙ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
කවුද?

**ඩී. එම්. ගුණසේකර මයා.**
*(திரு. டீ. எம். குணசேக்கர)*
(Mr. D. M. Gunasekere)
බදුල්ලෙ ඩිපෝවෙන්. (බාධාකිරීම්) වල පනේ මන්ත්‍රීතුමා (පී. බී. එම්. හේරත් මයා.) කියනව බීරි අලිය කියා. ඔව්. බීරි අලියට වීණා ගයන්නෙ වගේ තමයි. ඒ නිසා මා ඉදිරිපත් කළ මේ කරුණු ගැන විශේෂයෙන් සොයා බලා ක්‍රියා කරන්නය කියා **ඇමතිතුමා ගෙන්** අවසාන වශයෙන් ඉල්ලනවා.

අ. භා. 7.30

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)
සභාපතිතුමනි, බිබිලේ ගරු මන්ත්‍රීතුමාට (ඩී. එම්. ගුණසේකර මයා.) පසුව කථා කිරීමට ඉඩ ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. එපමණක් නොවෙයි, බිබිලේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ කරුණුවලින් රාශියක්ම මම අනුමත කරනවා. එය අනුමත කරමින් මම එක කාරණාවක් අහන්න කැමතියි. ලංගමය පාලනය කිරීම පිළිබඳව නොයෙකුත් කාරක සභා තිබුණා. ඒ කාරක සභා අතර ආණ්ඩුවේ ගරු මන්ත්‍රීවරුන්ගේ උපදේශක සභාවක්ද තිබුණා.

**හේරත් මයා.**
*(திரு. ஹேரத்)*
(Mr. Herath)
ඒව දැන් අහෝසි වෙලා.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)
මේ තිබෙන වාර්තාවෙ—මෙය තමයි ළඟදී නිකුත් වී ඇති වාර්තාව, මීට පසුව වාර්තාවක් නැහැ—කියා තිබෙනවා, ආණ්ඩුවේ පාර්ලිමේන්තු කණ්ඩායමේ උපදේශක සභාවක් තිබෙනවය, ඒ උපදේශක සභාවේ මන්ත්‍රීවරු මෙසේ කියනවාය කියා. ඒ නිසා මම හිතන්නෙ නැහැ, ආණ්ඩුවෙ පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගේ උපදේශක සභාව අහෝසි කර දමා තිබෙනවය කියා.

**හේරත් මයා.**
*(திரு. ஹேரத்)*
(Mr. Herath)
දැන් තිබෙන්නෙ දිස්ත්‍රික් උපදේශක සභා.

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)
බිබිලේ ගරු මන්ත්‍රීතුමා එවැනි බරපතල චෝදනාවක් ඉදිරිපත් කළා නම්, මම අහන්න කැමතියි, ඇයි ඊට ඇහුම්කන් දුන්නෙ නැත්තෙ කියා. ඉතාම නරක විධියට හැසිරෙන, ඒ වාගේම ලංගමයට අලාභ සිදු කරන කොන්දොස්තර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]
කෙනෙක් ඉන්නව නම්, ඒ සේවකයාට විරුද්ධව පළාතේ මන්ත්‍රීවරයා විසින් පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබෙනව නම්, ඇයි ඒ ගැන ක්‍රියා කරන්නෙ නැත්තෙ කියා මම අහනව. ඇයි බිරී අලි වගේ ඉන්නෙ කියා මම අහනව. මටත් ඒ විධියේ සිද්ධීන් තිබෙනව. මට කියන්න පුළුවන් එමානිස් කියන ලංගමයෙ සේවකයෙකු ගැන. ඔහු අයිආර්සී කාරයෙක්. කොපමණ පැමිණිලි කළත් වැඩක් නැහැ. ඉස්සර සිටි කොම්පැනි කාරයින්ගෙ අත කොළුවක් නිසා එමානිස්ට කිසිම විරුද්ධ කමක් ලංගමයෙන් කරන්නෙ නැහැ. ගාල්ලේ එමානිස් වගේම තමයි බිබිලේ සිටින සයිමන් පිරිසුත්. මම අඳුනනව සයිමන් පීරිස් කවුද කියා.

තමුන්නාන්සෙලා හිතනවද බිබිලේ මන්ත්‍රීතුමා (ඩී. එම්. ගුණසේකර මයා.) ඒ බස් සේවකයට විරුද්ධව පැමිණිල්ල කෙළේ සන්තෝෂයෙන් කියා? බස් සේවකයෙකුට විරුද්ධව පැමිණිලි කරනව නම් කරන්නෙ සන්තෝෂයෙන් නොවෙයි. නිකම් මිනිස්සු තරහ කර ගන්න වුවමනාවක් නැහැ. මහජනයට සිදු වන හිරිහැර නිසා ලංගමයට සිදු වන පාඩු නිසා මහජන මන්ත්‍රීවරයෙක් වශයෙන් යුතුකමක් ඉටු කිරීමක් වශයෙන් බිබිලේ මන්ත්‍රීතුමා ඒ පැමිණිල්ල කළා. අර සේවකයා ගරු මන්ත්‍රීතුමා සමග ඉතාමත් තදින් තරහ වෙන්න ඇති. කොපමණ තරහ වුණත් ඒ මන්ත්‍රීතුමා කෙළේ යුතුකමක් ඉටු කිරීමයි. නමුත් තමුන්නාන්සෙලගෙ යුතුකම තමුන්නාන්සෙල ඉටු කළාද? ඉතින් කොහොමද මන්ත්‍රීවරයෙක් වැඩ කරන්නෙ?

ඊ ළඟට ඒ මන්ත්‍රීතුමා තවත් පැමිණිල්ලක් කළා. ඒ වගේම පැමිණිල්ලක් මමත් කර තිබෙනව, සමහර මාර්ගවල එක බස් එකක් පමණක් ධාවනය කිරීම ගැන. වන්බස් රූට්ස්. එක බස් එකයි ඒ මුළු පාරටම තිබෙන්නෙ. ඒ මන්ත්‍රීතුමා කී එක බස් එකේ මාර්ගය වගේම මගේ කොට්ඨාශයෙත් තිබෙනව ගාලු ඩිපෝවෙන් දුවන එක බස් එකේ සේවයක්.

ඒ එක බස්රථයේ සේවය තිබෙන පාරවල සුමානයේ දවස් හතරක් බස්රථය දුවන්නේ නැහැ. දවස් තුනයි දුවන්නේ. ඉතින් ඒ පාරේ ඇති බස් සේවයෙන් මහජනයා ප්‍රයෝජන ගන්නෙ කොහොමද? ඒ මන්ත්‍රීතුමා මේ ගැන පැමිණිලි කර තිබෙනවා. ඇයි බිබිලේ මන්ත්‍රීතුමාගේ පැමිණිල්ල ගැන ඇහුම්කන් නුදුන්නෙ? මට පෙනෙන හැටියට ලංගමයේ ලෙඩේ කාටත් එකයි. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුනුත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනුත් එක සේ ලංගමයේ අඩුපාඩු පෙන්නා දෙනවා. නමුත් ලංගමයේ පාලන පක්ෂයේ සිටින ලොකු ලොක්කන් ඒවාට ඇහුම්කන් දෙන්නෙ නැහැ. දැන් අළුත් ඇමතිවරයෙක් පත් වී සිටිනවා. මේ අළුත් ඇමතිවරයා අපේ කීම්වලට ඇහුම්කන් දේ යයි අපි විශ්වාස කරනවා. අප කියන දේවල ඇත්තක් තිබෙනවා නම් ගතයුතු දෙයක් තිබෙනවා නම් ඒ පිළිබඳව ලංගමයේ නිලධාරීන්ගෙන් ප්‍රශ්න කරන හැටියට මම ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ ඇමතිවරයාට හොඳ ඇමතිවරයෙක් වීමට වුවමනා නම් නිලධාරීන්ගේ බසට එකඟ නොවන මෙන් මම ඉල්ලා සිටිනවා. නිලධාරීන් කියන දේට විරුද්ධව යම් තරමක් වැඩ කළොත් ඒ තරම්ම හොඳ ඇමතිවරයෙක් වෙන්න පුළුවනි. ලංගමයේ සිටින නිලධාරීන් නුහුරු අවවාදයි දෙන්නෙ.

බිබිලේ මන්ත්‍රීතුමාට ප්‍රශංසා කළාට පසු මම ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා. ලංගමයේ මේ තරම් උසස් නිලධාරීන් සිටියදී අය වැය වාර්තා ආදිය මේ තරම් ප්‍රමාද කරන්නේ ඇයි? දැනට අප ළඟ ඇත්තේ 1960 වාර්තාවයි. 1963 සැප්තැම්බර් මාසයේ අපට ඇත්තේ 1960 වාර්තාවයි. ඒ අනුව අපට සාකච්ඡා කරන්න පුළුවන්ද? වාර්තා සහ අය වැය ලේඛන මෙසේ පමා වී දෙන විට අපි කොහොමද, ලංගමයේ වැඩ කටයුතු ගැන හරි අවබෝධයක් ඇතිව සාකච්ඡා කරන්නෙ? ඒ නිසා මම ඉල්ලා සිටිනවා, සෑම අවුරුද්දේම ලංගමයේ අය වැය ලේඛන සහ වාර්තා ඊළඟ අවුරුද්දේ අගෝස්තු මාසයේ පාර්ලිමේන්තු විවාදයට පෙර මන්ත්‍රීවරුන්ට ලැබෙන්න සලස්වන්නය කියා. එපමණක් නොවෙයි. ලංගමයේ නිලධාරීන්ට දිනයක් නියම කර මේ පාර්ලිමේන්තුවට ඇවිත් සියලුම ගණන් හිලව් ආදිය ඇතිව, මන්ත්‍රීවරුන් කැඳවා සම්පූර්ණ විස්තරයක් දෙන්නට සලස්වන්නය කියා මම ඉල්ලනවා. ලංගමයේ වැඩ හැඟි හොරා කරන්න පුළුවන්කමක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැහැ. කොළේ වහල ගහන්න එපායයි මම නිලධාරීන්ට කියනවා. කොළේ වහල ගහන නිසා තමයි, මේ විධියේ හොරකම් ලංගමයේ සිදු වන්නෙ. වැඩ වර්ජන ඇති වෙන්නෙත් මේවා වහගෙන සිටින නිසයි. ලංගමයේ කරන සියලුම වැඩ ගැන දැන ගැනීමට මන්ත්‍රීන් වශයෙන් අපට යුතුකමක් තිබෙනවා. කරුණු හරි හැටියට අව බෝධ කරගෙනයි, අප කථා කළ යුත්තේ ඒ නිසා ලබන අවුරුද්දේ මේ පිළිබඳව අපි මෙහි සාකච්ඡා කිරීමට එන්නට පෙර මේ අවුරුද්දේ සිදු වූ දේ පිළිබඳව විස්තර සහිතව දැනගත යුතුයි. කොපමණ බස් තිබෙනවාද, කොපමණ බස් දුවවා තිබෙනවාද, එක එක ඩිපෝවේ ආදායම කොපමණද, සේවකයින්ගේ තත්ත්වය මොකක්ද, යනාදී ලෙසින් හැම අංශයක් ගැනම අප දැනගත යුතුයි. ගරු මන්ත්‍රීවරුන් මෙහි අවුත් ඕනෑවට එපාවට කෑගහනවා නොවෙයි. බොහොම සීරුව කල්පනා කර තමුන්නාන්සේලාට උපදෙස් දීමට මන්ත්‍රීවරු කැමතියි. තමුන්නාන්සේලා හොඳින් වැඩ කරනවා නම් මේ ගරු මන්ත්‍රීන් තමයි පළමුවෙන්ම ප්‍රසංසා කරන්නට ලෑස්තිව සිටින්නෙ. ඒක දැනගෙන තමුන්නාන්සෙල කරුණාකර අපට වහාම අ්යවැය ලේඛන සහ වාර්තා දෙන්න කියා මම ඉල්ලනව. ඔඩිටර් ජනරාල්තුමාගෙ වාර්තාව අරන් බැලුවත් අපට පැහැදිලි වෙනව 1961 ගණන් හිලව් වාර්තා ආදිය ඒ විධියට වහාම දී නැති බව. 1961 ගණන් තවම ස්ථිර වෙලා නැහැ. ඔඩිටර් ජනරාල්තුමා මෙන්ම මෙහෙමයි කියන්නෙ:

"The Annual Accounts for 1961 were rendered for audit on February 12, 1963, and my Report thereon was furnished to the Chairman on February 27, 1963. These Accounts and the Report had not been tabled in the Senate and in the House of Representatives up to May 31, 1963."

1961 ගණන් හිලව් ඉදිරිපත් කළේ 1963 පෙබරවාරි මාසෙ 12 වැනිදලු. ඇයි ඒ තරම් ප්‍රමාද වුණේ? 1961 අවුරුද්දේ ගණන් හිලව් ඉදිරිපත් කරන්න 1963 පෙබරවාරි මාසෙ වන තුරු හිටියෙ ඇයි? ප්‍රමාද කිරීමත් එක ලෙඩක්. ප්‍රමාද කිරීමෙන් තමයි තමුන්නාන්සෙල වැරදි හුඟක් හරිය වහගන්නෙ. ඒ තරම් ප්‍රමාද කරන්න වුවමනාවක් නැහැ. ඔඩිට් දෙපාතීමේන්තුව දවස් පහළොවෙන් ඒ වාර්තාව සොයාබලා ආපසු යවා තිබෙනව. නමුත් මේ වාර්තාව නියෝජිත මන්ත්‍රී මණ්ඩලයටත් සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයටත් ඉදිරිපත් කරල තියෙන්නෙ 1963 මැයි 31 වැනිදයි. එතෙක් ඉදිරිපත් කළේ නැහැ. ඉතින් අපි කොහොමද තමුන්නාන්සෙල මොනවද කරන්නෙ කියල දැන ගන්නෙ? ඉතින් මොනව ගැනද අපි කථා කරන්නෙ පරණ දේවල් ගැන නොවෙයිද අපට කථා කරන්න සිද්ධ වෙලා තියෙන්නෙ? ඒ මහත්වරු අපට සාකච්ඡා කරන්න දෙන්නෙ නැහැ, සියලුම දේවල් වහගන්නව. ඒ නිසා ගරු ඇමතිතුමාට කරන්න පුළුවන් ලොකු උදව්වක් තමයි, වාර්තාවල් නියම වෙලාවට එවන්න කටයුතු කිරීම.

1961 ගණන් හිලව් බැලුවම පෙනී යන වලු රුපියල් විසි අට ලක්ෂයක පාඩුවක් වෙලා තියෙනව. 1960 දීත් ලක්ෂ 28 ක් අලාභ වෙලා තියෙනව. කොහොමද අලාභ සිද්ධ වෙන්නෙ කියල අපි දැනගන්න ඕන.

ගාල්ලෙ කෙරීගෙන ගිය එක්තරා හොරකමක් අහු වුණා. අවුරුදු දෙකක් තිස්සෙ එක්තරා බස් කොන්දොස්තර කෙනෙක් ටිකට් එක ලියන විට කාබන් කඩදාසියක් තබාගෙන උඩ ටිකට් කොළේ සිලිම් තුනක්ය කියල ලියනව නම් යටින් තියෙන කාබන් පිටපතේ ඒ ගණන ශත 50 ක් හැටියටයි ලිවීම කරගෙන ගිහින් තිබෙන්නෙ. ගණන් පරීක්ෂා කර බලන විට මේ ආකාරයට ගෙන ගිය මුදල් වංචාවෙන් රුපියල් හතළිස් දාහකට තව්වු කර තිබෙන බව පෙනී ගියා. ඕය එක් කොන්දොස්තර කෙනෙක් කළ හරිය තමයි. මම අහන්නෙ, තමුන්නන්සෙල හිතනවද මේ කොන්දොස්තරට මෙපමණ කාලයක් තිස්සෙ තනියම ඕය විධියෙ වංචාවක් අහු නොවී දීගටම කරගෙන යන්න පුළුවන් කමක් තිබෙනවද කියලයි. නැහැ, එහෙම කරන්න බැහැ. ඊට ඉහළින් ඉන්න කීප දෙනකුත් එකතුවෙලයි ඒක කළේ. කොන්දොස්තරල එකතු කරගෙන එන මුදල් හරියාකාර ගණන් බලා භාර ගැනීමෙ ක්‍රමයක් ඇති කරල තියෙනව නම් ඕය විධියෙ වංචාවල් කෙරෙන්න පුළුවන්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

කොහොමද අපි මේව ගැන විපරම් කරන්නෙ? කොහොමද අපි මේව සාකච්ඡා කරන්නෙ? කොච්චර ලාභයක් තියෙනවද කොච්චර අලාභයක් තියෙනවද, කොච්චරක් මුදල් එනවද, කොච්චරක් මුදල් යනවද, යනාදි වශයෙන් අපට කිසිම දෙයක් දැනගන්න විධියක් නැහැ.

ගාල්ලෙ තිබෙන බස් ව්‍යාපාරය ලංකාවෙ තිබෙන දෙවැනි ප්‍රධාන බස් ව්‍යාපාරය හැටියට ගණන් ගන්න පුළුවනි. එහෙම වුණාට ඒ ප්‍රදේශයේ ජනගහනය අනුව, ඒ ප්‍රදේශයේ බස් ධාවනය කරන හැතප්ම ගණන අනුව, පමණයි දෙවැනි ප්‍රධාන තැන ලැබෙන්නෙ. ආදායම අනුව දෙවැනි තැනට එන්න බැරිවෙලා තිබෙන්නෙ මොන කරුණු නිසාද කියා සොයා ගෙන තිබෙනව. කාරක සභාවක් පත් කර අපි තමුන්නාන්සෙලාට දැනුම් දුන්න, නමුත් තමුන්නාන්සෙල කිසිම විදියකින් අප දුන් උපදෙස්වලට ඇහුම්කන් දීල නැහැ.

දැන් ගාල්ලේ ප්‍රාදේශීය කළමනාකාරයෙක් ඉන්නව. එයා ගාල්ලට මාරුවෙලා දැන් අවුරුද්දක් පමණ වෙනව. ඒ මහත්මය කවුද කොයි විධියෙ කෙනෙක්ද, උසද මහතද, කියා එකම ගරු මන්ත්‍රීවරයෙක් වත් තවම දන්නෙ නැහැ කියලයි මම හිතන්නෙ. එයා පදිංචිව ඉන්නෙ කොළඹලු. එයාගෙ නෝන කොළඹ මොකක්ද රක්ෂාවක් කරනවලු. එයාගෙ දරුමල්ලො කොළඹ ස්කෝලවලටලු යන්නෙ. එයා තමයි, ගාල්ලෙ රීජනල් මැනේජර්. පැමිණිල්ලක් බාරගන්න කෙනෙක් එතන නැහැ. ගාල්ලෙ කච්චේරියෙ පවත්වන මන්ත්‍රීවරුන්ගෙ කොමිටිය අවුරුද්දකින් පැවැත්තුවෙ නැහැ. ඇයි පැවැත්තුවෙ නැත්තෙ? ඒ කොමිටිය මුල් අවුරුද්දෙ වුවමනාවටත් වඩා උනන්දුවෙන් වැඩ කළ නිසා, ඒ කොමිටිය කාරක සභාවක් පත් කරගෙන ගිහින් ගාල්ලෙ වැඩ කටයුතු ගැන පරීක්ෂා කළ නිසා, ඒ කොමිටියට තවත් ඉඩ දුන්නෙ නැහැ කිසිම පරීක්ෂාවක් කරන්න. සභා රැස්වීම් පවත්වලත් නැහැ.

අ. භා. 7.45

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොළඹට පමණක් දෙවන වී තිබෙන මෙම මධ්‍යස්ථානයට කුඩම්මගෙ සැලකිල්ල දක්වන්නෙ ඇයිද කියල මා අහනව. තමුන්නාන්සෙල ගාල්ලට නියම තරමට බස් දීල නැහැ. ඉතින් කොහොමද වැඩ කරන්නෙ ගාල්ලෙ මධ්‍යස්ථානයෙ බස් 114 ක් වැඩ කරන්න ඕන. නමුත් නාන්සෙලාගෙ පොත් පත්වල ගාල්ලෙ බස් 128ක් තියෙන හැටියට සඳහන් වෙනව. එම 128 න් 26 ක් අවුරුදු 10 කට වඩා පැරණියි. ඒ බස් 26 පැරණි කෝපි කාලෙ ඒව. දැන් ඒව පාවිච්චි කරන්න බැහැ. එතකොට 102 කට වඩා පාවිච්චි කරන්න බැහැ; නමුත් බස් 114 ක් වැඩ කරන්න ඕන. කොපමණ හොඳට වැඩ කළත් බස් 102 කට වඩා දුවවන්න බැහැ. මේ පිළිවෙළට තමුන්නාන්සෙලාගෙ භාණ්ඩාගාරයට එන මුදල් කොපමණ නැති කර ගන්නවද?

**හේරත් මයා.**
*(திரு. ஹெரத்)*
(Mr. Herath)
නුවරඑළියෙ ඊට වඩා—

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகனாயக்க)*
(Mr. W. Dahanayake)

නුවරඑළියෙ තත්ත්වය තමුන්නාන්සෙ කියා දෙන්න.

පාලක පක්ෂය තත්ත්වය අවුල් කරල. නියම ප්‍රමාණයට සෑහෙන්න ගාල්ලට බස් නොදෙන්නෙ ඇයි? අවශ්‍ය ප්‍රමාණයට බස් දෙන්නය කියල අපි කොපමණ ඉල්ලනවද? ඇයි ඉතින් නොදෙන්නෙ? තමුන්නාන්සෙල කියනව බස් නැහැ, කියල. "නැහැ" යන වචනය අපට පිළිගන්න බැහැ. තමුන්නාන්සෙල මේ රටට ගෙනාපු බස්වල ප්‍රමාණය ගැන කල්පනා කර බලන විට අපට එම වචනය පිළිගන්න බැරි වෙනව. තමුන්නාන්සෙල සමහර මධ්‍යස්ථානවලට කුඩම්මගෙ සැලකිල්ලක් දක්වනවාය කියල මා සිතනව. කාල සටහන අනුව බස් ධාවනය නොකිරීම—missed turns බොහෝ දුරට කෙරෙනව. ගාල්ලෙ සියයට 20 ක් පමණ එම තත්ත්වය පවතිනව. ගාල්ලෙ බස් සියයක් දුවවන්න වුවමනා වන තැනදි ඒවායින් 20 ක් දුවවන්නෙ නැහැ. බස් නැහැ කියනව. වැඩ කරන්න සේවකයො ඉන්නව. ඇයි එහෙනම් බස් නැති වෙන්නෙ? වැඩ කටයුතු නියම විධියට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙනියනව නම්, බස් ධාවනය සියයට 20 කින් අඩුවෙන්නෙ කොහොමද? සේවක්යන් වැඩ කරන්න ලෑස්තියි; මගීන් සල්ලි දෙන්න ලෑස්තියි; නමුත් බස් නැහැ. තමුන්නාන්සෙල මොකද කරන්නෙ? ලංගමයෙ උසස් නිලධාරීන් සියලු දෙනාම නොවේ නම් සියයට 90 ක් පමණ එක එක් කෙනාගෙ පගාවලට යට වී සිටින නිසයි මේව හරිගස්සන්නෙ නැත්තෙ, කියල මේ අවස්ථාවෙදි කියන්න කැමතියි. උසස් නිලධාරීන්ගෙන් හරියට වැඩක් කෙරෙන්නෙ නැහැ. උසස් නිලධාරීන් සියයට 90 ක ගේම හිස ගසා දමන්න.

දැන් වේරහැර ස්ටරයික් එකක් තිබෙනව. එහි හොරකමක් තිබුණ. ඒ හොරකම සඳහා අසු වී තිබෙන්නෙ පුංචි මිනිහයි. මිටි තැනින් වතුර බැස යෑම සිරිතක්. විශේෂයෙන්ම ලංගමයේ තිබෙන්නෙ ඒ තත්ත්වයයි. මේ හොරකම සිදු වුණේ සුළු මිනිසකුගේ අතින් නොවෙයි. සුළු මිනිසකුට තනියම මෙවැනි හොරකමක් කරන්ට බැහැ. මෙවැනි හොරකමක් සඳහා උසස් නිලධාරියකුගෙ දැනුවත්කම තිබෙන්ට ඕනෑ. මේ හොරකම ගැන විභාගයක් පැවැත්තුවා. නමුත් මෙවැනි විභාගවලින් කිසිම වැදගැම්මක් නැති බව කියන්න කැමතියි. උසස් නිලධාරීන් විසින් පවත්වනු ලබන විභාගවලින් කිසිම වැඩක් නැහැ. විභාග පැවැත්වීම සඳහා උසස් නිලධාරීන් යොදවන්ට එපා. මෙවැනි විභාග පැවැත්වීම සඳහා ලංගම සේවකයන්ගෙ මණ්ඩලයක් පත් කරන්න. උසස් නිලධාරීන් විසින් අසනු ලබන නඩුවකින් යුක්තියක් ඉෂ්ට වන බවක් මා කොතැනකදීවත් දැක නැහැ. උසස් නිලධාරීන් හැම විටම නඩුවල වාසිය තබන්නෙ ලොකු පැත්තටයි. මෙයින් පාඩු සිදුවන්නෙ සුළු සේවකයින්ටයි. උසස් නිලධාරීන් සාක්ෂි සටහන් කර ගන්නෙ තමන්ට වුවමනා හැටියටයි. ඔවුන්ගෙ බලාපොරොත්තුව පුංචි මිනිහ පෙරළා දැමීමයි. එම නිසා ලංගම සේවකයන්ගෙ නඩු ඇසීම උසස් නිලධාරීන්ගෙන් ඉවත් කොට ඒ සඳහා ලංගම සේවකයන්ගෙ මණ්ඩලයක් පත් කොට ඒ මණ්ඩලයට ඒ නඩු භාර දෙන්න.

එවිට නියම යුක්තිය ඉෂ්ට වෙනව ඇති. (බාධා කිරීමක්) හොඳයි, අත්හදා බැලීමක් වශයෙන් ඒ කටයුත්ත කරන්න. වගකීම භාර දුන්නොත් අපේ රටේ කම්කරුවන් තරම් ආදර්ශමත් විධියට උගත් අය වැඩ කරන්නේ නැති බව කියන්ට කැමතියි. කම්කරුවන්ටත් වගකීම් පවරා බලන්න. කම්කරුවන් වැඩ කරන ආකාරය එවිට පෙනී යනව ඇති. (බාධා කිරීමක්) ලංගම සේවකයන්ගෙ නඩු ඇසීම සඳහා පිටින් යම් යම් අය පත් කරන්ටයයි මා නම් කියන්නෙ නැහැ. බැරි උදවිය සහ පුළුවන් උදවිය යනුවෙන් දැනට ලංකාවෙ දෙවර්ගයක මිනිසුන් ඉන්නව. පුළුවන් උදවිය යම් නඩුවක් විභාග කළොත් බැරි අය කපෝතියි. පුළුවන් අයගෙ විභාග ගැන මට නම් කිසිම විශ්වාසයක් නැහැ. මාත් විභාග බොහෝ ගණනක් දැක තිබෙනව. ඒව සියල්ලේම තීන්දු වැරදි බව මගේ මතයයි.

ගාල්ලෙ තිබෙන තවත් වැරදි ගැන මම පෙන්වා දෙන්නම්. One bus route කියමින් බොහෝ ජනකායක් සිටින ප්‍රදේශවලට එක බස් රථයක් පමණක් යොදා තිබෙනව. ඇයි එසේ කර තිබෙන්නෙ? තනි බස් රථය ප්‍රමාණවත් නැහැ. Town service එකට අයිති කලේගාන-ගිංතොට උක්වත්ත-ගිංතොට වැඩ කරන්නෙ එක බස් රථයයි. තමන්ගෙ දරුවන්ට ගමන් කිරීම සඳහා බස් නැති බව කියමින් පාඨශාලා ශිෂ්‍යයන්ගෙ දෙමාපියන් විසින් පෙත්සම් 12 කටත් වඩා ඉදිරිපත් කර තිබෙනව. කලේගාන-ගිංතොට, උක්-වත්ත-ගිංතොට සඳහා එක බස්රථයක් යොදා තිබෙන්නෙ ඇයි? පංචාලිය -වැලිගම, කනංකෙ-වැලිගම, හරුමල්ගොඩ-දික්කුඹුර, බද්දෙගම-උනන්විටිය පාරවල් සඳහා යොදා තිබෙන්නෙ එක බස් රථයයි. නමුත් ගමනාගමනය කිරීම සඳහා විශාල ජනකායක් සිටිනව. සතියකට දවස් 5 ක් බස් රථය නැහැ. දවස් දෙකක් පමණයි, බස් රථය තිබෙන්නෙ. මේ විධියට සේවයක් පවත්වාගෙන යෑමෙන් වැඩක් තියෙනවද? දැනට එක බස් රථයක් පමණක් යොදන පාරවලට අඩු ගණනෙ බස් රථ දෙකක්වත් යොදන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

මොනවද පාරවල් ?

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)

ඇයි මා දැන් කිව්වෙ. කලේගාන-ගිංතොට, උක්වත්ත-ගිංතොට, පංචාලිය-වැලිගම, කනංකෙ-වැලිගම, හරුමල්ගොඩ-දික්කුඹුර, බද්දෙගම-උනන්විටිය.

මාර්ග 6 ක් තිබෙනව ; නමුත් ඒ තැන්වලට දමන්නෙ එක බස් එකයි. මොකක් ද මේකෙ තේරුම ? ලංගමයක් තිබෙනව ද නැද්ද ? අර බිබිලෙ ගරු මන්ත්‍රීතුමා (ඩී. එම්. ගුණසේකර මයා.) කිව්වා සියඹලා අඹුව දඹරගලද කොහොද දමා තිබෙන්නෙ එක බස් එකයි කියා. ඇයි මේ විහිළු කරන්නෙ ? ඇයි මේ රැවටිලි කරන්නෙ ? එක බස් එකක් දමනව නම් ඒකත් පැත්තකට කර බස් නැතැයි කියන්න. මහජනයා මේ විධියට රවටන්න එපා. බස් එකක් දමනවය කියා සුමානයකට දවස් දෙකක් පමණක් බස් එක දුවවා අනෙක් දවස් පහේ බස් එක දුවවන්නෙ නැත්නම් එයින් වැඩක් නැහැ. ඒ විධියට කළා ම ඒ පාරවල් වෑන් හිමියන්, කුලී කාර් හිමියන් අල්ලා ගන්නව.

ඔය සමහර කාර්යාලවල සිටින අය හොරකම් කරනව. ඒ හොරකම් අල්ලා දුන්නට කවදාවත් ඒ හොරාට දඬුවම් ලැබෙන්නෙ නැහැ. වේරහැර කම්කරුවන්ගෙන් ඇසුවොත් ඔවුන් කියනවා "මොනවටද මන්ත්‍රීතුමනි, හොරකම් අල්ලල දීල, හොරුන්ට දඬුවම් දෙන්නෙ නැහැ" කියා. මේක මහ පුදුම ස්ථානයක් ; හොරුන්ට සත්කාර කරන ස්ථානයක් ; හොරුන් ඉහළ දමන ස්ථානයක් ; හොරුන් බෝ කරන ස්ථානයක් ; හොරුන් දියුණු කරන ස්ථානයක්. "මේ ස්ථානයට ඇතුල් වන අය හොරු විය යුතුය" කියා ලොකු සටන් පාඨයක් වේරහැර සවි කරන්න. එක්තරා පුද්ගලයෙක් ගැන මම තමුන්නාන්සෙට ටෙලිෆෝන් එකෙන් කිව්ව. බස් එකක නියම රියැදුරා වාඩි වී නොසිටියොත් වෙන රියැදුරෙක් සොයා ගන්න ඕන. ඔහු 'ස්ටැන්ඩ්-බයි' රියැදුරෙක් වෙන්න ඕන. එහෙම ලැහැස්ති වී සිටින රියැදුරෙක් සොයා ගන්න බැරි වුණොත් ඒ වෙනුවට වැඩ කරන රියැදුරන් සිටිනව. නමුත් නියම රියැදුරු නැති වුණාම, 'ස්ටැන්ඩ්-බයි' රියැදුරෙක් ගන්නෙ නැතිව 'රොස්ටර්' එකෙන් රියැදුරෙක් ගන්නව. ඒ මොකද ? 'ස්ටැන්ඩ්-බයි' රියැදුරෙක් අර ගත්තොත් ලංගමයට වියදම අඩුයි. 'රොස්ටර්' එකෙන් රියැදුරෙක් ගත්තොත් වියදම වැඩියි. ඒ රියැදුරා ගත්තොත් ඒ රියැදුරාටත් එය කරන නිලධාරියාටත් ලාභයක් තිබෙනව. ඒකට තමුන්නාන්සෙල මොකක්ද කළේ ? මම මේක තමුන්නාන්සෙට ටෙලිෆෝන් එකෙන් කිව්ව. මම ලියුම් එව්ව. නමුත් ඒ ගැන කිසිම සැළකිල්ලක් කළේ නැහැ. විරුද්ධ පාර්ශ්වයෙ මන්ත්‍රීවරයෙක් කියූ දෙයක් නිසා ඒක අහන්ට ඕන නැත කියා ඒක කුණු කරදාසි පෙට්ටියට දමන්න ඇති. නමුත් අපි කියන දේට සැලකිල්ලක් නොදැක්වුවොත් ඒව කවද හරි පලදේවි. අපි කියන කාරණා මොනවාද කියා සොයා බලන්න. මගේ අත්සන සහිත ලියුම් ඇමතිතුමා විසි කරනව නම්, අත්සන නැතිව මට ලියුම් එවන්න කියනවද ? එහෙමද කියන්නෙ? ලංගමයේ අවංකව වැඩ කරන අයත් සිටිනව. හොරකම් කරන්නෙ නැතිව හොඳට යුක්තියට වැඩ කරන අයත් ඉන්නව. මේ ගාල්ලෙ ඩිපෝ ඉන්ස්පෙක්ටර්, කේ. ඩබ්ලිව්. ජී. ද සිල්වා මහත්මයා පැමිණිල්ලක් කළා. ඊට මාසයකට පෙර ලියමනකුත් යැව්වා, රියැදුරෙක් නිවාඩු ගත්තම, 'ස්ටැන්ඩ්-බයි' රියැදුරෙක් ගන්නෙ නැතිව 'රොස්ටර්' එකෙන් රියැදුරෙක් ගෙන ලංගමයට අසවල් පුද්ගලයා අලාභ කරනවායි කියා. ඒ පුද්ගලයාගෙ නම කියන්ට වුවමනා නැහැ. ඒ කාලකන්නි මනුෂ්‍යයා කණින් ඇද දොට්ට දමන්න ඕන.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නමුත් තමුන්නාන්සෙ කේ. ඩබ්ලිව්. ජී. ද සිල්වා මහත්මයාගෙ ඒ පැමිණිල්ලට මොකක්ද කළේ ? කේ. ඩබ්ලිව්. ජී. ද සිල්වා මහත්මය ඒ පැමිණිල්ල ගාල්ලෙ ලොකු මහත්මයට දුන්නම, ඒක අරගෙන නිකම් තබා ගත්ත. එපමණයි.

අ. භා. 8

නිකම් ඒක අරගෙන තියෙව්වා පමණයි. පැමිණිල්ල ගැන කිසිවක් ඇහුවෙත් නැහැ ; විභාගයක් කළෙත් නැහැ. ඒ පැමිණිල්ල කොළඹට එව්වා. එතනදිත් ඒක තමුන්නාන්සේලාගේ හමස් පෙට්ටියට ගියා. ඒ නිලධාරියා තවමත් ඒ වැඩය කර කර ඉන්නවා. එක ට්‍රිප් එකෙන් රුපියල් 5 ක් ලැබෙනවා. ඒ පුද්ගලයා මසකට රුපියල් හාර පන් සියයක් මේ ක්‍රමය අනුව සාක්කුවට දමා ගන්නවා. ඒ හොරකම තමුන්නාන්සේලාට පෙන්නුවාම තමුන්නාන්සේලා ක්‍රියා කළේ නැත්තේ ඇයි ? කේ. ඩබ්ලිව්. ජී. ද සිල්වා ඩිපෝ ඉංස්පෙක්ටර් මහත්මයා කැඳවා සාක්ෂි විභාග කළොත් තමුන්නාන්සේලා පුදුම වේවි. අර හොරකම කරන පුද්ගලයා දළකාරයෙක්. අර අතන සයිමන් පීරිස් සමග එකතු වී සිටිනවා වගේ දළකාරයන් ඔක්කෝම ගාල්ලේ පැටි මහත්මයා සමග එකතු වී සිටිනවා. ඒ අය කොපමණ වැරදි කළත් වරදක් සිදු වෙන්නෙ නැහැ. ඒ අයට පුදුම විධියේ ආරක්ෂාවක් තිබෙනවා. ඒ අය මොන වැරැද්දක් කළත් කිසි වරදක් සිදු වන්නෙ නැහැ. මේ පුද්ගලයා අකුරැස්සේ සිටින විටදී හොරකමක් අසු වී තංගල්ලට දැම්මා.

**ගරු සමරවීර**
*(கௌரவ சமரவீர)*
(The Hon. Samaraweera)
What is his name ?

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)
සෞඛ්‍ය අමාත්‍යාංශය පිළිබඳ වැය ශීර්ෂය සාකච්ඡා කරන විට නම් කියන්න බැරිය කියා තමුන්නාන්සේට කිව්වෙ——

**ගරු සමරවීර**
*(கௌரவ சமரவீர)*
(The Hon. Samaraweera)
එහෙනම් අනික් උදවියගේ නම් කිව්වේ ?

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)
ඒ තරම් ලොකු උසස් නිලධාරියෙක් නොවෙයි. මම නම ලියා එවන්නම්. සුළු සේවකයකු ගැන මා මේ විධියට කථා කරන එක මදුරුවෙක් මරන්න කාලතුවක්කුවක් පාවිච්චි කරනවා වගෙයි. මට ඕනෑ ඒ පුද්ගලයා නොවෙයි, හොරකම නැවැත්වීමයි.

**ගරු සමරවීර**
*(கௌரவ சமரவீர)*
(The Hon. Samaraweera)
එහෙනම් එමානිස් කියා අයි. ආර්. සී. කාරයෙක්ද කවුද ගැන කිව්වෙ ?

**ඩබ්ලිව්. දහනායක මයා.**
*(திரு. டப்ளியு. தகநாயக்க)*
(Mr. W. Dahanayake)
ඔහු බොහොම දරුණු මනුෂ්‍යයෙක්. ඒ කත් කී එක වැරදියි. නමුත් මට නම කියවුණා. හොඳයි එහෙනම් මම දන් නම කියන්නම්. ඔහුගේ නම සී. වීරතුංග. අකුරැස්සේ සිට හොරකමක් අහුවෙලා තංගල්ලට මාරු කළා. ඊට පසුව දළකාරයෙක් නිසා තංගල්ලට යන්න බැරිය කියා ගාල්ලට මාරුව හරිගස්සා ගත්තා. වඩා හොඳ තැනකට ගියා. අකුරැස්ස හොඳ නැහැ. ගාල්ලට ආවා. ඔය විධියේ හොරකමක් අල්ලා දුන්නාම ඒ තැනැත්තාට තෑග්ගක් ප්‍රදානය කිරීම තමුන්නාන්සේලාගේ යුතුකමක්. තමුන්නාන්සේ දන්නවා "කලෙක්ෂන්" නැත්නම් මුදල් එකතු කිරීම ගැන තෑගි ක්‍රමයක් ඇති කළා. ගාල්ලේ මධ්‍යස්ථානයෙන් දවසකට රුපියල් 15,000ක් එකතු වුණා. අද දිනකට රුපියල් 22,000ක් එකතු වෙනවා, ඒ තෑගි ක්‍රමය ඉදිරිපත් කළාට පසුව. ඒ සුළු තෑග්ග, දවසකට රුපියල් 7,000ක් එකතු කර ගැනීමට තමුන්නාන්සේලාට උපකාරී වුණා. ඒ වාගේම හොරකමක් අල්ලා දෙන තැනැත්තාටත් තෑගි දීමේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

ක්‍රමයක් ඇති කරන්නය කියා මා කියනවා. හොරකමක් අල්ලා දුන්නාම ඒ තැනැත්තාට සංග්‍රහයක් කරන්නය කියා මා කියනවා. එවිට සමහර විට සම්පූර්ණයෙන්ම හොරකම් නැති වේවි.

එපමණක් නොවෙයි, මේ ඊයෙ පෙරේද හදිසියෙන්ම වාගේ ගාල්ලෙ මධ්‍යස්ථානයෙන් දුප්පත් කම්කරුවන් දොළොස් දෙනකු මාරු කර තිබෙනව. මෙයින් දහ දෙනකු මහරගමටත් එක් කෙනෙකු නුවරටත් අනික් පුද්ගලයා කොළඹටද කොහේදත් මාරු කර තිබෙනව. මේ කම්කරුවන් දොළොස්දෙනා මාරු කිරීමට ඇති හේතුව මොකක්ද ? මම කියන්නම් හේතුව. මේ අය ගිය අවුරුද්දෙ ස්ට්‍රයික් එකකට සහභාගිවුණාය කියා ඒකට තරහ වෙනුයි එහෙම කළේ. මේ අයගේ නම් ටික ලියා තියාගෙන ඉඳල, දැන් ඒ නම් ටික යවා මාරු කර තිබෙනව. මෙහෙම මාරු කළාම ඒ අය තමන්ගෙ වෘත්තීය සමිති මාර්ගයෙන් මේ මාරුව වෙනස් කර ගැනීමට මහන්සි ගත්තා. මාතර පදිංචි සේවකයකුවන ගුණපාල මහත්මයාගේ දෙමව්පියන්, ඇමතිතුමා සම්බවෙලා හඬල දොඩල කීවා, අනේ මේ දරුවා කිසි වැරැද්දක් කළේ නැහැ, මාරු කරන්න එපාය කියා. මේ ගැන පරීක්ෂා කර බලන විට මට පෙනී ගියා එතැන මධ්‍යස්ථානයේ—ඩිපෝවේ—වැඩ කරන ලොකු මහත්මයා—දූල්ලැව මහත්මයා—කියා තිබෙනව, මේ දොළොස් දෙනා මාරු කළොත් මෙතැන වැඩ කරගෙන යන්න බැරි බව. නමුත් ඒ දොළොස් දෙනා මාරු කිරීමේ තීරණය වෙනස් කරවගන්න බැරි වුණා.

ලොකු මිනිසුන් වැරදි කරද්දි ඒ අය තබා ගෙන වැරදි නොකරන පුංචි මිනිසුන් මාරු කර දැමීමේ ව්‍යාපාරයක් ලංගමයේ ගෙන යනව. තමුන්නාන්සෙලා පුරුද්දක් වශයෙන්ම පුංචි මිනිහාට තැලීමේ වැඩ පිළිවෙළක් ගෙන යන්නෙ ඇයි ? ඒවාගේම හොරුන්ව බේරා හැර පුංචි මිනිහාට තැලීම ලංගමයේ දැන් තිබෙන වැඩ පිළිවෙළක්. පුංචි මිනිහාට සහනයක් ඇත්තෙම නැහැ. එම නිසා මේ දොළොස් දෙනා මාරු කිරීම ගැන සම්පූර්ණයෙන්ම විභාගකර බලන ලෙස මා තමුන්නාන්සෙගෙන් ඉල්ලා සිටිනව. එතකොට තමුන්නාන්සෙට පෙනේවි, මේ දොළොස් දෙනා මාරු කිරීම අයුක්තියක්, වරදක් බව. වෘත්තීය සමිති හතරකුත් මේ ගැන සාකච්ඡා කළත් මේ මාරු කිරීම අවලංගු කරවගන්න ලැබී නැහැ. එහෙම බැරිවුණු තැන, අන්තිමේදී මට ඇවිත් කීවාම, මම බී. එෆ්. එම්. අමරසේකර මහත්මය සම්බවෙල කීවා, මේ අමාත්‍යාංශය ගැන සාකච්ඡාව හෙට අනිද්දා පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් වුණාම මේ කාරණය ගැනත් කියනවාය, එම නිසා කරුණා කර මේ ගැන කල්පනා කර බලන්නය කියා. අමරසේකර මහත්මයා බොහොම කරුණාවන්ත මහත්මයෙක්. ඒ මහත්මයා කීවා මේ ගැන පරීක්ෂා කර බලන තුරු මාරුකිරීම තාවකාලිකව කල් දමනවය කියා. ඒ අනුව මාරු කිරීම තාවකාලිකව කල් දැම්මා. එපමණක් නොවෙයි, ඒ මහත්මයා කීවා, මේ මාරු කිරීමට හේතුව දන්නෙ නැතෙයි කියා. මේ විධියට එක පාරටම දොළොස් දෙනකු මාරු කිරීමට ඇති හේතුව ගැන සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වන ලෙස මම ඉල්ලා සිටිනව. යම්කිසි විධියකින් කියනව නම් දොළොස් දෙනකුට මේකෙ කරන්න දෙයක් නැතෙයි කියා, එහෙම නම් මෙපමණ කාලයක් තිස්සෙ වැඩි පුර දොළොස් දෙනකු දමාගෙන කළේ මොනවාද කියා මම ප්‍රශ්න කරනව. එහෙම නැතිනම් මේ දොළොස් දෙනා වැඩිපුර අයය කියනවා නම්, හදිසියේම මේ විධියේ වෙනස්කමක් ඇති වුණේ මොන කාරණයක් නිසාද කියා පෙන්වන්න ඕනෑ. තමුන්නාන්සෙලා පුංචි මිනිසුන් පාගා දැමීමේ ව්‍යාපාරයක් ගෙන යනව නම්, ඒ අනුව මේ අයත් පාගා දැමීමේ වැඩ පිළිවෙළක් නොවෙද තමුන්නාන්සෙලා ගෙන යන්නෙ. එපමණක් නොවෙයි, මෙතැන කෙරෙන වැරදි මට හුඟක් කියන්න පුළුවනි.

විටින් විට මේ ගරු සභාවේදීත් මම පැමිණිලි කර තිබෙනව, දුප්පත් කම්කරුවන්ගේ පඩිය හොරකම් කර ගැනීම පිණිස විශ්‍රාම කාමරයට අල්ලපු කාමරයේ ප්‍රසිද්ධ වශයෙන්ම සූදුවක් ගෙන යනවාය කියා. තෝන් එකතු කර ගැනීමෙන් විශාල මුදලක් ලබා ගන්නව. බස් කොන්දොස්තර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කෙනෙකු සුදු පිටියට මුදල් අරගෙන ඇවිත් ඒ මුදල් සියල්ලම අවසාන වුණොත් ආපසු යන්නෙ කොහොමද? ඒ මුදල් ගෙවන්නෙ කොහොමද? තමුන්නාන්සේලාගේ භූමිය ගැන පරීක්ෂාවෙන් සිටින්න බැරි ඇයි? සුදුවකට ඉඩ දෙන්නේ ඇයි? තමුන්නාන්සේට මේ සූදුව නැවැත්වීමට වැඩ කටයුතු යොදන්න බැරි මන්ද? විශ්‍රාම ශාලාවක් තිබෙනව. ඒ විශ්‍රාම ශාලාවට අල්ලපු කාමරේ සූදුව. තෝන් එකතු කරන අය ඉන්නව. ලොකු මිනිස්සු ඒකට උදව් කරනව.

මම තව එක කාරණයක් ගැන කියල, ලංගමය ගැන කරුණු කීම ඉවර කරනව. ඉංජිනේරු අංශයේ අවශ්‍ය සම්පූර්ණ සංඛ්‍යාව සිටිනවද? තමුන්නාන්සෙගෙ වාර්තාවෙ මෙහෙම එකක් තියෙනව.

"The dearth of qualified and experienced personnel at both supervisory and floor levels continued to be one of the handicaps the Division of Engineering faced during the year".

ඉංජිනේරු අංශයට සුදුස්සන් අඩු වීම නිසා ලොකු පාඩුවක් වුණා.

"There were as many as 15 posts out of a sanctioned cadre of 53 posts in the engineering grades and 75 posts out of a strength of 180 posts in the foreman and assistant foremen grades which remained vacant in the Rolling Stock Section at the end of the year".

එක අංශයක තනතුරු 53 න් 15 කට පමණයි, පත් කර තිබෙන්නෙ. තවත් අංශයක තනතුරු 180 න් 75කට පමණයි, පත් කර තිබෙන්නෙ. ඒ නිසා වැඩ නියමෙ විධියට ගෙන යන්න බැරි වුණා.

"The Works Section too, in addition to being without a qualified Mechanical Engineer in full charge, was working short of quality skilled workmen and supervisory staff. In a determined effort to step up production an intensive recruiting campaign was started early in the year. Although about 200 additional skilled workers were employed for body building work it was not possible to get the requisite number of foremen and assistant foremen. Of the authorised cadre of 80 foremen and assistant foremen for the Central Workshops only 49 were in employ at the end of the year."

එක අංශයක 80 දෙනකු වෙනුවට 49 දෙනයි, සිටියෙ. මේ නිසා ෆෝර්මන්වරුන්ගෙ සහ උප ෆෝර්මන්වරුන්ගෙ ලොකු හිඟයක් තිබුණා.

මේ සම්බන්ධව මම වැදගත් ප්‍රශ්නයක් අහනව. ඉංජිනේරු අංශයෙ නියම ප්‍රමාණයට සුදුස්සන් නැත කීමත් ඇත්තක් නොවෙයි, බොරුවක්. ඉන්න අය ගන්නෙ නැහැ. තමුන්නාන්සේල ඒක හොඳට දැන ගන්න. වුවමනාවෙන්ම ෆෝර්මන්වරුන් ගන්නෙ නැතිව ඉන්නව. මම තමුන්නාන්සෙට ලියමනක් එව්ව, නිදර්ශනයක් හැටියට. තමුන්නාන්සෙගෙ දෙපාර්තමේන්තුව විතරක් නොවෙයි, ලංකාවෙ තිබෙන දෙපාර්තමේන්තුව. ළිඳේ ඉන්න ගෙම්බො වගේ කල්පනා කරන්න එපා. මේ ආණ්ඩුවෙ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙ කාර්මික විද්‍යාලයක් තියෙනව, බදුල්ලෙ. බදුල්ලෙ ගරු මන්ත්‍රීතුමාගේ ආසනයෙ ළමයි, ඒ කාර්මික විද්‍යාලයෙ ඉගෙන ගන්නව. නුවර, ගාල්ලෙ, කොළඹ තවත් කාර්මික විද්‍යාල තියෙනව. අනුරාධපුරයෙ සහ මඩකලපුවෙ තවත් කාර්මික විද්‍යාල පිහිටුවන්න මේ ආණ්ඩුව හැකි තරම් මහන්සියෙන් කටයුතු කරනව. ඒ තැන්වල ඉගෙන ගන්න අයට ලංගමයෙ රක්ෂා දෙන්නෙ නැහැ. බදුල්ලෙ ගරු බණ්ඩාර මන්ත්‍රීතුමා දන්නවද, බදුල්ලෙ කාර්මික විද්‍යාලයෙන් පාස් වෙලා ඉන්න ශිෂ්‍යයන්ට ලංගමයේ රක්ෂා නොදෙන බව? අපේ ඇමතිතුමාට මම කදිම ලියමනක් ලිව්ව, 1963 පෙබරවාරි මස 26 වැනිද. එදා "දිනමිණ" කතෘ වාක්‍යය තිබුණේ ලංගමය ගැනයි. ලංගමයට සේවකයන් ගන්නෙ කුලය අනුවය කියා ඒ කතෘ වාක්‍යයේ තිබුණා. කියවා බලන්න, එදා කතෘ වාක්‍යය. මම 1963 පෙබරවාරි මස 26 වැනිදා මේ කතෘ වාක්‍යය කියවා ඇමතිතුමාට ලියමනක් ලිව්ව. ඒ ලියමනේ මේකයි, තියෙන්නෙ.

ගරු ඇමතිතුමනි,

කරුණාකර අද "දිනමිණේ" ප්‍රධාන කතෘ වාක්‍යය කියවා බලනු මැනවි. ඒ කතෘ වාක්‍යයේ කියා තිබෙන්නේ එළිදරව්වෙම ලංගමය විසින් සේවකයන් ගැනීමේදී කුල භේදය ගැන සලකන බවය.

මේ කරුණු කියා සිටින්නෙ ලංකාවෙ තිබෙන ඉතාමත්ම ශ්‍රේෂ්ඨ සිංහල ප්‍රවෘත්ති පත්‍රය වන "දිනමිණ" යි.

අ. භා. 8.15

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් මට නිදර්ශනයක් පෙන්වා දෙන්ට තමුන්නාන්සෙ ඉඩ දිය යුතුයි. දැනට හෝකන්දර පාරෙ පනම්පිටියේ පදිංචිව සිටින සී. ඒ. ද ජූව් මහතා ලංකා කාර්මික විද්‍යාලයේ මිකැනික් වැඩ පිළිබඳ


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. දහනායක මයා.]

කටුනායක කිසිම වැඩ පිළිවෙළක් අනුව සකස් වී නැති ස්ථානයක්. එහි එක පැත්තකින් මිලිටරිය තුවක්කු මානා ගෙන ඉන්නව. ඇතුල් වෙන්නත් බයයි. ඒවාගේම එහි බිමත් හරියාකාරව සකස් වී නැහැ. රාත්‍රියේ ජෙට් යානා බැස්වීමට සුදුසු තත්ත්වයක් කටුනායක ගුවන් තොටුපළේ නැහැ. එහි ජෙට් යානා බස්වන්නෙ ටිකක් අවදානම් තත්ත්වයකින්. එපමණක් නොවෙයි, ලෝකයේ සෑම ගුවන් තොටුපොළකම ප්‍රදර්ශනාගාර තිබෙනව. හදිසියේ ස්වල්ප වේලාවකට රැඳෙන සංචාරකයකුට වුවත් එවැනි ප්‍රදර්ශනාගාරවලින් රට ගැන සාමාන්‍ය හැඟීමක් ඇති කර ගත හැකි වෙනව. ඒවාගේ ප්‍රදර්ශන ඇති කිරීමෙන් ආදායමක්ද ලබා ගැනීමට පුළුවන්. නමුත් කටුනායක එහෙම ප්‍රදර්ශනාගාරයක් නැහැ. පරණ ගාලකත් කටුනායකත් අතර ඇත්තෙ සුලු වෙනසක්. එහි ප්‍රදර්ශනාගාරයක් ඇති කර අපේ රටේ මැණික් වර්ග, නොයෙක් නොයෙක් ප්‍රතිරූප යනාදිය එහි ප්‍රදර්ශනය කළොත් පිටරටවලින් එන සංචාරකයින්ට ඒවා විශාල වශයෙන් අලෙවි කරන්ට පුළුවනි. ඒවාගේම පැය භාගයක්, සුලු කාලයක්, ගුවන් තොටුපොළේ රැඳී සිටින කෙනෙකුට වුවත් ප්‍රදර්ශනාගාරයක් තිබෙනවා නම් එයින් අපේ රට ගැන සාමාන්‍ය හැඟීමක් ඇති කර ගන්ට පුළුවනි. නමුත් අද ස්වල්ප වේලාවකට වුවත් කටුනායක ගුවන් තොටුපොළට බසින සංචාරකයකුට පෙනෙන්නෙ එය හදිසියේ ගොඩ නැගූ ස්ථානයක් හැටියටයි. රට ගැන අවබෝධයක් ලබා ගනු තබා ඔහුට එහි ඉන්නවත් තැනක් නැහැ. ඒ නිසා කටුනායක ගුවන් තොටු පොළ ප්‍රතිසංස්කරණය කළයුතු බව මම පිළිගන්නව. කටුනායක ප්‍රධාන ගුවන් තොටුපොළයි. ඒ නිසා ඒ ගැන ඇමතිතුමාගේ අවධානය වහාම යොමු විය යුතුයි.

ඊළඟට දුම්රිය සේවාව ගැන වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්ට ඕනැ. ඔය දුම්රිය එන්ජින්වල නාමත් අර "ඇන්ඩ්‍රූ කැල්ඩිකොට්", "ජෝන් වැන්ඩන් ඩ්‍රීසන්" ආදී නම් තිබෙනව. ඒ කාලයේ දුම්රිය තිබුණු තත්ත්වයේමයි අදත් පවතින්නෙ. අපේ පැත්තෙ යන දුම්රියවල යෑම ටිකක් අවදානම් සහිතයි. මොකද, ඇස්වලට ගල් කෑලි වැටෙනවා පමණක් නොවෙයි, පාරෙ තියෙන දූවිලිත් ඇස්වලට එනව. පරණ ඉංග්‍රිසි කාලෙ තිබුණු එන්ජින්මයි තවමත් තියෙන්නෙ. ඒවා ටිකක් අයින් කර පුළුවන් තරම් හොඳ එන්ජින් යොදවනවා නම් හොඳයි. ඒවා එක පාරටම යොදවන්න ඕනැය කියා අපි කියන්නෙ නැහැ. නමුත් කරන්නට ඕනැ බව අපි කියනව. බොහෝ රටවල උසස් ගමනා ගමන ක්‍රමයක් හැටියට සලකන්නේ දුම්රියේ ගමනයි.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டி. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

සිල්පර කඳන් ගෙන්වීම ගැනත් කියන්න.

**ජයසේන මයා.**
*(திரு. ஜயசேன)*
(Mr. Jayasena)

පිට රටින් සිල්පර ගෙන්වීමේ ක්‍රමයක් ගැන සාකච්ඡා කර තිබෙනවා නම්, අපේ හිටපු අගමැතිවරයකුගේ වචනවලින් කියනවා නම්, ඒ තැනැත්තා හිටුවපස් ගහන්න ඕනැ. අද අපේ කැලෑවල බුරුත ගස් ලක්ෂ ගණන් තිබෙනවා. පුත්තලම් දිස්ත්‍රික්කයේ පමණක් රුපියල් ලක්ෂ ගණනක බුරුත කඳන් කැලෑ දෙපාර්තමේන්තුවෙන් එක වාරයකට පුච්චනවා ඇති. මේවා කපා සිල්පර කඳන් හදන්නට බැරිව පිටරටින් ගෙන්වනවා නම්, සමාජවාදී රටක නම් ඔවුන් ඉතුරු නොකළ යුතු පිරිසක් හැටියට ප්‍රකාශ කරන්නට ඕනැ. සිල්පර කඳන් පිටරටින් ගෙන්වනවා නම් එය මේ රටට කරන ලොකු අගෞරවයක්. මේ රට සර්ම කලාපීය රටක්. උෂ්ණ දේශගුණයක් මෙහි තිබෙන්නෙ. මේ රට හිම මිදෙන ශීත රටක් නොවන බව ඒ නිලධාරියාට කියන්න සතුටුයි.

අ. භා. 9.30

අනික දුම්රිය පාරවල් තැනීමයි. පුත්තලම් දුම්රිය පාරට යන වියදමෙන් ලංකාව වටේට දුම්රිය පාරක් දමන්නට පුළුවන්ය කියා භය නැතිව, සවිරවම කියන්නට ඕනැ. මෙහි වැඩ කටයුතු ගැන හිතන්න. එක්තරා ස්ථානයක හදා තිබෙන ගොඩනැගිලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සංඛ්‍යාව බලන්න. කාට ඉන්නද, සුළු කම් කරුවන් කීදෙනෙකුට ඉන්නද, නැත් නම් කුමන නිලධාරීන්ට ඉන්නද කියා මා දන්නෙ නැහැ. රුපියල් ලක්ෂ ගණනක ගෙවල් හදා ගෙන යනවා. කලින්ම පටන් ගත්තෙ ගෙවල් හදන්නයි. එක රේල් පාරක ගල් කොන්ත්‍රාත්තුවකට පමණක් ගල් පයිල් 2,000 කට කොන්ත්‍රාත්තුවක් එක පුද්ගලයෙකුට දී තිබෙනවා. ඔහු ඇඳ තිබුණේ ගල් පයිල් 1,200 යි. ඉතිරි ගල් පයිල් 800 යේ සල්ලි ඔහු තනියම ගත්තාය කියා මා හිතන්නෙ නැහැ. ඒ පළාතේ අය අතර කට කථාවක් තිබෙනවා. කට කථා මෙවැනි සභාවක කියන එක හරි නැහැ. නමුත් එය මතක් කරන්න කැමතියි. එක්සත් ජාතික පක්ෂය තිබුණු කාලයේ විජය බස් මුදලාලිට බස් ගමනා ගමන සාර්ථක කරගන්න මේ රේල් පාර ගැලෙව්වාය කියා කියනවා. ඇත්තද නැත්තද මම දන්නේ නැහැ. මේ පාරේ එක ස්ථානයක් ධනවත් මුස්ලිම් මහත්මයෙකුට කොන්ත්‍රාත් දී තිබෙනවා. ලක්ෂ ගණනකට හැතැප්මක් කොන්ත්‍රාත් දී තිබෙනව. නැත්නම් දෙන්නට ලෑහැස්ති කරගෙන තිබෙනවා. ඒ සඳහා ඒ මුදලින් සියයෙන් එකක්වත් වියදම් වන්නෙ නැහැ. පුත්තලම් නගරයෙන් හැතැප්මකට මෙහා තාර පාර හරහා යන කොටසයි ඒ. ඒක ගත්තේ කවුද? ඒ කොන්ත්‍රාත් එක දුන්නේ කවුද කියා බලන්නය කියා ඇමතිතුමාගෙන් ඉල්ලනවා. මේකට මෙතරම් මුදලක් යයිද කියා බලන්න.

මම එක චෝදනාවක් නගනවා. රුපියල් කෝටි ගණන් වැය කොට විශාල වැඩ පටන් ගන්නවා. ලක්ෂ ගණන් මුදල් යොදවනවා. මේවා නිලධාරීන්ට පවරා මැති ඇමතිවරු ඒ ගැන නොබලා ඉන්නවා. මෙහි වරදක් තිබෙනවාද, මේ වැඩ කරනවාද, සීමා කොහොමද, මේ පාර යන්නේ කොහොමද, ගල් යන ප්‍රමාණය කොපමණද, ආදී වශයෙන් බලනවා නම් මේ වායේ සිදුවන විනාශය ඇස් දෙකටම බලා ගන්න පුළුවන්. කොතරම් මුදල් මේවාට වැඩිපුර යනවාද කියා දන්නේ රේල් පාරත් ගන්නා පුද්ගලයාත් පමණයි. නිලධාරීන් සමග එක් වී මේ දේ කිරීමෙන් විශාල වැඩ කොටසක් කරන්න පුළුවන් මුදල් නිකම් අපතේ යනවාය කියා කියන්න කැමතියි.

මම එකක් ඉල්ලා සිටිනව. යකඩ කර්මාන්තයට අවශ්‍ය වන යපස් බිංගිරිය ප්‍රදේශයෙන් සොයා ගත හැකි බව ඛනිජ දෙපාර්තමේන්තුව මගින් ගිය සතියේ නිකුත් කළ වාර්තාවක සඳහන් වෙනව. මේ යකඩ කම්හල ඔරුතොට හදනව නම්, ඒ සම්බන්ධ ශාඛාවක් යපස් සම්භ වන ප්‍රදේශවල දමනවා නම්, ඒ ප්‍රදේශ සම්බන්ධ කර දුම්රිය මාර්ග තැනීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕන. ඒ වාගේම ඇළ ප්‍රතිසංස්කරණය කිරීමෙ කටයුතු වහාම ආරම්භ කරන්න ඕන. මන්ද? ඇළ දැන් බොහෝ දුරට තැනින් තැන ගොඩ වෙලා. ඕවර්සියර්වරු ඉන්නව නම්, මුදල් තිබෙනව නම්, ඇයි මේව කරන්න බැරි? අද මේ ඇළේ පාරුවක් යන්න බැරි තත්වයක් තිබෙන්නෙ.

**ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.**
*(திரு. டீ. பி. ஆர். குணவர்தன)*
(Mr. D. B. R. Gunawardena)

දුම්රියට වඩා හොඳ නැද්ද ඇළ මාර්ගය දිගේ ගේන්න සැලැස්සුවොත්?

**ජයසේන මයා.**
*(திரு. ஜயசேன)*
(Mr. Jayasena)

ඇළෙන් ගෙන ඒමට පුළුවන් නම් හොඳයි. ඒ වාරිමාර්ග ක්‍රමය සකස් කර ගන්න පුළුවන් නම් වඩාත් හොඳ බව මම පිළිගන්නව. එසේ නැතිනම් දුම්රිය මාර්ගයක් අවශ්‍යය කියා මූලික යෝජනාවක් වශයෙන් අද මම මෙය ඉදිරිපත් කරන්න කැමතියි.

මෝටර් රථ කොමසාරිස්වරයාගෙ දෙපාර්තමේන්තුව ගැන වචනයක් කියන්න ඕනෑ. මෝටර් රථ බලපත්‍ර නිකුත් කරන මේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙ දේපල පිළිබඳ විස්තරයක්—පත්වීම් ලබන විට මේ අයට තිබුණු දේපල, දැනට තිබෙන දේපලවල වටිනාකම—ඉතා ඉක්මනින් සොයා බලන්න ඕනෑ. මන්ද? උන්නැහෙලට රියදුරු බලපත්‍ර ලබා දීම සඳහා මිනිසුන් අල්ලා දෙන අපේ ප්‍රදේශයේ සිටින උදවිය රුපියල් විසි තිස් දහසකට වඩා දැනට සම්භ කර තිබෙන බව සථිර වශයෙන්ම මම දන්නව. හැම කෙනෙකුටම බලපත්‍රයක් ලබා ගැනීම සඳහා රුපියල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසේන මයා.]

සීයක් දෙසීයක් දෙන්න සිදු වෙනව. බැරිම කෙනෙකුට නම් රියදුරු බලපත්‍රයක් රුපියල් දෙසිය පණහක් ගෙවා ලබා ගත හැකියි. ස්ටියරිං වීල් එකවත් හරියට අල්ලන්න දන්නෙ නැති, මිනිසුන් හත් අට දෙනකු මරපු උදවියට වුණත් පවුම් විසි පහක් ගෙව්වම රියදුරු බලපත්‍රයක් ලබා ගන්න පුළුවනි. සාමාන්‍යයෙන් රියදුරු බල පත්‍ර නිකුත් කරන නිලධාරි තනතුරක් කෙනෙකුට ලැබෙනව නම්, ඒ පුද්ගලයා හරියට සතිපතාම ස්වීප් දිනුමක් වැටෙන මිනිහකු වාගෙයි. හැමදාම ගෙදර යද්දි සල්ලි මිටි දෙකක් ලැබෙනව. එක සල්ලි මිටියක් ලැබෙන්නෙ ඒ ජාවාරමට සම්බන්ධ අනික් පුද්ගලයන්ගෙන්. මේව ගැන පරීක්ෂාකර බලා මෙවැනි දූෂණ කටයුතු සම්පූර්ණයෙන් නවත්වා දමන්න ඕන. එසේ නොකෙළාත් අල්ලස් ගැනීමට ගිජුවූ, පොදු වශයෙන් රටේ දූෂණ කටයුතුවල යෙදෙන අයගෙ තත්ත්වය තව තවත් තහවුරු වෙනව. ඒ අයට මේ රටේ තැනක් ලැබෙනව. සමාජය දූෂණය කර කොයි අන්දමින් හෝ මුදල් උපයා ගැනීමට ඉඩකඩ සැලසීම හොඳ නැහැ. එවැනි අයගෙන් නරකක් මිස හොඳක් සමාජයට වෙන්නෙ නැහැ. ඒවා වළක්වා ලන්න, සමාජය එවැනි පුද්ගලයන් පිළිකුල් කරන්න හැඩ ගැස්විය යුතුයි. නමුත් කනගාටුයි කියන්න— එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් මේ අවස්ථාවෙ සභාවෙ නැහැ—පිළිම ගෙවල් කඩා රත්රන් පිළිම මකවල සල්ලි හම්බ කර ගත් එවැනි මිනිසුන් ලවා බුදු ගෙවල්වලට මුල් ගල තැබීමට එක්සත් ජාතික පක්ෂයේ උදවිය පෙරහැරින් කැන්දාගෙන යනව. එහෙම නම් දූෂණ ක්‍රියා මේ රටින් කවදා කොහොම නැති කරන්නද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම තත්ත්වයක් මෝටර් රථ කොමසාරිස්වරයගෙ දෙපාර්තමේන්තුවෙ තිබෙන්න හොඳ නැහැ. ගරු ඇමතිතුමා දන්නවද, මෝටර් රථ කොමසාරිස්වරයගෙ කන්තෝරුව ඉදිරිපිට කොයිතරම් තැරැව් කාරයන් සිටිනවද කියා? තැරැව්කාරයින් හම්බ නොවී කිසි වැඩක් කර ගන්න පුළුවන් කමක් නැහැ. එසේ කළාට හරි යන්නෙත් නැහැ. එහෙම නැතුව ගියොත් එක කාර් එකක් අයිතිකාරයකුගෙන් තව අයිතිකාරයෙකුට පැවරීමට යාමේදී—ඒ අයට ගණු දෙනුවක් නොදුන්නොත්—තුන් අවුරුදක්වත් යන තුරු ඒ කටයුත්ත කර ගන්න හම්බ වෙන්නෙ නැහැ. නඩු වැටිල කරදර වෙලයි එය ආපසු හරවගන්න හම්බ වෙන්නෙ.

වරාය කොමිෂන් සභාව ගැන දීර්ඝ වශයෙන් කථා කරන්න යන්නෙ නැහැ. හිටපු ඇමතිතුමාගෙ කාලයේදි උපදේශක මණ්ඩලයේ සාමාජිකයකු හැටියට වරාය කොමිෂන් සභාව පිළිබඳව අප නොයෙකුත් යෝජනා ඉදිරිපත් කර තිබෙනව; නමුත් ඒ යෝජනා කොහේ ගියාද, කුමක් වුණාද, කවුරුන් පිළිගත්තද, කියා අප කියන්න දන්නෙ නැහැ. වරාය කොමිෂන් සභාවෙ වැඩ කටයුතුත් ඒකාධිකාරි අන්දමට කෙරී ගන යන බව නම් කියන්න පුළුවනි. බොහෝ දෙනෙක් වරායෙ කෙරෙන අකටයුතුකම් ගැන දන්නව; සමහරු කම්කරුවන් පිට වරද පටවනව; සමහරු නිලධාරීන්ට දොස් කියනව; සමහරු කොන්ත්‍රාත් කාරයින්ට දොස් කියනව. නමුත් අපි ඉක්මනින් වරායේ ප්‍රතිසංවිධානයක් ඇති කරන්න ඕනැ. ගාල්ලෙ ගරු මන්ත්‍රීතුමා ගාල්ලෙ වරාය පිළිබඳව කී දේ ඇත්තයි. අපි ඒ කීම පිළිගන්නව. ගාල්ලෙ වරායෙන් වුවමනා තරම් බඩු බාන්නට පුළුවන්කම තියෙනව. ත්‍රිකුණාමලේ වරායෙනුත් එසේම බඩු බාන්න පුළුවන්කම තියෙනව. නමුත් මෙතන තියෙන රහස් කුමන්ත්‍රණය නිසා බඩු නැව් එහෙ යවන්නෙ නැතිව නැව්වලින් බඩු ගොඩ බෑම ප්‍රමාද කරල, අනික් වෙළෙන්දන්ගෙ බඩු අලෙවි වුණාම මේ බඩු ගොඩ බානව. මේවා පෙන්නුම් කළාම, තවත් අවුරුද්දකට මේව කියන්න ඉඩ තියන්නෙ නැතිව, ඉදිරි වර්ෂයේදි මේ ගැන පියවරක් ගැනීම නව ඇමතිතුමාගේ යුතුකමක් බව මම මතක් කරන්න කැමතියි.

මේ අමාත්‍යාංශය යටතෙම තව කිව යුතු කරුණක් තියෙනව. මාරාවිල තල්විල පිහිටි ධීවර වරායේ පහන් කණුවක් තැබීමට ඇමතිතුමා අනුමත කළා. තවම ඒ ගැන කටයුතු ආරම්භ කළ බවක් මම දන්නෙ නැහැ. පසුගිය වර්ෂයේ ඒ පහන් කණුව සඳහා මුදල් වෙන් කර තිබුණ. නමුත් මේ වර්ෂයේ ඒ සඳහා මුදල් වෙන් කර තිබෙන බවක් පෙනෙන්නෙ නැහැ. ඒ පහන් කනුව ඉතාමත් අවශ්‍ය දෙයක්. ඒ ප්‍රදේශයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දහස් ගණන් මිනිස්සු ධීවර කර්මාන්ත යෙනුයි, ජීවත් වන්නෙ. ඒ නිසා ඒ පහන් කණුව සෑදීම පිළිබඳ කටයුතු ප්‍රමාද කරන්නෙ නැතිව ඉටු කර දෙන ලෙස මම ඉල්ලා සිටිනව. එවැනි පහන් කණුවක් ඒ වරායන් අසබඩ තිබීම ධීවර කාර්මිකයන්ට ඉතාමත් ප්‍රයෝජනවත් දෙයක්. මීගමුවේ සිට හලාවත දක්වා ධීවර තොටුපොළවල් රාශියක් තිබුනත් කිසිම තැනක පහන් කණුවක් නැහැ.

තවත් එක කරුණක් ගැන ඇමති තුමාගේ කල්පනාව යොමු කරවන්නට ඕනෑ. අපේ ප්‍රසිද්ධ වරායන් ගැන වගේම ධීවර වරායවල් කීපයක් ගැනත් අපි සලකා බලන්න ඕනෑ. ධීවර කර්මාන්තය මේ රටේ දියුණු කිරීමට නම් ධීවර වරායවල් අපි ඇති කරන්න ඕනෑ. ස්ථිර ධීවර වරාය වල් කීපයක් ඇති කිරීම ගැන පසුගිය දින වල යෝජනා තිබුණ. බෝට්ටු දීමේ නියම ප්‍රයෝජන ගන්න පුළුවන්, දකුණේ හෝ කොහේ හෝ ඒ සලකා බැලූ තැන්වල ධීවර වරායවල් ඇති කරනව නම්. ඒ ගැන කටයුතු නොකිරීම අඩුපාඩුවක් හැටියට මම සලකනව.

මම අවසාන වශයෙන් ගරු ඇමතිතුමාට එක් කාරණයක් මතක් කරන්න කැම තියි. මාතර, දෙනියායේ බස් දිව්වට අපි විරුද්ධ නැහැ. එහෙ ඉන්නෙත් මනුෂ්‍යයෝ. නමුත් බිංගිරියෙත් බස් දුවන්න ඕනෑ බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

**ලක්ෂ්මන් ද සිල්වා මයා.** (බලපිටිය)
*(திரு. லக்ஷ்மன் டி சில்வா—பலப்பிட்டிய)*
(Mr. Lakshman de Silva—Balapitiya)

මගේ කොට්ඨාශය ගැන මේ අවස්ථාවේ දී වචන ස්වල්පයක් කථා කරන්න බලා පොරොත්තු වෙනව. මගේ කොට්ඨාශයේ දුම්රිය පොළවල් 5 ක් තියෙනව. ඒ පහෙන් මහ ඉඳුරුවේ දුම්රිය නැවතුම් පොළ දියුණු කළ යුතු බව මම අවුරුදු ගණනක් තිස්සෙ රජයට කියා තිබෙනව. දුම්රියට නැගීමට එන මගින්ට වර්ෂා වෙලාවකදි පවා ගොඩ වෙන්න තියෙන්නෙ එක කෝච්චි පෙට්ටි යක් පමණයි. දුම්රියට නැගීමට එන මගීන් ට නැවතීමට එතන හොඳ ශාලාවක් සාදා දෙන්නය කියා මම ඉල්ලා තිබෙනව. එම ඉල්ලීමට ප්‍රමුඛස්ථානය දෙනවාය කියා ලියුම් ලැබී තිබෙනව. නමුත් තවම ඒ ශාලාව හැදීමට අත්තිවාරමක් දමා තිබෙන බවක්වත් පෙනෙන්නෙ නැහැ. ඒ ගැන කිසි දෙයක් නොකිරීම ගැන මගේ කන ගාටුව ප්‍රකාශ කරනව. අවුරුදු ගණනක් තිස්සෙ ලියුම් ලීවත් එයින් කිසි ප්‍රයෝජන යක් නැති බවයි, මට පෙනෙන්නෙ. මම මහ ඉඳුරුවේ දුම්රිය පොළට ටෙලිෆෝන් එකක් ඉල්ලා තිබෙනව. ටෙලිෆෝනයක් ලැබී තිබෙනව. නමුත් ඒකෙන් කථා කරන්න පුළුවන් වන්නෙ ඉඳුරුවේ දුම්රිය පොළට පමණයි. එවැනි ටෙලිෆෝනයක් ඒ දුම්රිය නැවතුම් පොළට ලැබීමෙන් ප්‍රයෝජනයක් නැහැ.

මම දිනපතාම දුම්රියෙ ගමන් කරන කෙනෙක්. මන්ත්‍රී කෙනෙක් හැටියට අම්බලන්ගොඩ දුම්රිය පොළෙන් "රුහුණු කුමාරි" දුම්රියට නැගී කොටුවේ දුම්රිය පොළෙන් දිනපතා බහින කෙනෙක්. අවුරුදු 3 ක් තිස්සෙ ඔය "රුහුණු කුමාරි" දුම්රියෙ මම ගමන් කරල තියෙනව. ඔය අවුරුදු 3 ඇතුළත එක දවසක්වත් "රුහුණු කුමාරි" දුම්රිය නියම වෙලාවට කොටුවේ දුම්රිය පොළට නොපැමිණීම ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරනව. එසේ සිදු වීමට හේතුව මොකක්ද කියා දුම්රිය දෙපාර්තමේන්තුව භාර නිලධාරි මහත්වරුන් සොයා බලා නියම වෙලාවට දුම්රිය ධාවනය කරව නව නම් හොඳ බවයි, මම අදහස් කරන්නෙ. එක දවසක්වත් "රුහුණු කුමාරි" දුම්රිය නියම වෙලාවට කොටුවේ දුම්රිය පොළට ආවෙ නැහැ. ඔය ප්‍රමාද වීම නිසා ඕවර් ටයිම් ගාස්තු ගෙවීම් ආදියෙන් මහ ජන මුදල් වියදම් කරන්නටත් රජයට සිදු වෙනව.

මම යාපනේ පළාතෙත්, උඩරට පළාතෙත් දුම්රියෙන් ගමන් කරල තියෙන ව. දකුණු පළාතේ මන්ත්‍රීවරයකු හැටියට මගේ කනගාටුව ප්‍රකාශ කරනව, අපට ගමන් කිරීමට ඉතාම නරක දුම්රිය පෙට්ටි දී තිබීම ගැන. කොළඹ සිට මාතර දක්වා යන සෑම දුම්රියකම දමා තිබෙන්නෙ කබල් වූ දුම්රිය පෙට්ටියි. යාපනය බලා යන දුම් රියට "එයාර් කන්ඩිෂන්" කළ දුම්රිය මැදිරිය පවා දමා තිබෙනව. අපේ පැත්තට යන දුම්රියවල පළමුවෙනි පන්තියේ මැදිරි යක වාඩි වෙන්ට වත් පුළුවන් තත්ත්ව යක් නැහැ. මන්ද? ඒවායෙ කිසි පිරිසිදු කමක් නැහැ. ර. 7.45 ට කොළඹ කොටු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ද සිල්වා මයා.]
වෙන් මාතර බලා පිටත්වන දුම්රියේ පළමුවෙනි පන්තියේ මැදිරි ඉතා අපිරිසිදු නිසා වාඩි වෙන්ට පුළුවන්කමක් නැහැ. කොළඹ කොටුවේ සිට මාතර දක්වා ගමන් කරන මගීන්ට ඔය විධියෙ කරදරවලට මුහුණ පාන්ට සිදු වී තිබෙනව. ඒ ප්‍රදේශයට ධාවනය කරනු ලබන දුම්රියවලට පිරිසිදු මැදිරි දැමීමට කිසි සැලකිල්ලක් දක්වා නැහැ.

අ. භා. 9.45

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට අවුරුදු 2 කට කලින් මගේ ප්‍රදේශයේ ඉතා භයානක අනතුරක් සිදු වුණා. අහුන්ගල්ල දුම්රියපොල අසළ මීගහ හන්දියේ සිට ඌරුගස්මන්හන්දිය දක්වා ගමන් කරන මාර්ගය හරහා දුම්රිය මාර්ගය වැටී තිබෙනව. දුම්රිය පාරත් ඌරුගස්මන් හන්දිය දක්වා යන පාරත් සන්ධි වන ස්ථානයේ වෑන් රථයක් දුම්රියේ හැපී මෙන් ජීවිත 4 ක් විනාශ වුණා. ඊට පෙර කාර් එකක් දුම්රියේ හැපී ජීවිත ගණනක් විනාශවී තිබෙනව. මේ අනතුරු දෙක ගැනම දුම්රිය දෙපාර්තමේන්තුවට දැනුම් දී ඒ ස්ථානයට ගේට්ටුවක් දමන ලෙස මා ඉල්ලා සිටි අවස්ථාවේ ගේට්ටු දැමීමේදී ඊට ප්‍රමුඛස්ථානය දෙනවායයි මට දෙපාර්තමේන්තුවෙන් ලිපි ලැබී තිබෙනව. එපමණයි, මේ දක්වා ඒ ස්ථානයට ගේට්ටුවක් දමා නැහැ. මේ දෙපාර්තමේන්තුවට කොයි තරම් කරුණු දැනුම් දුන්නත් හරියට බීරි අලින්ට වීණා ගායනා කරන්න වගේ කියායි මට කියන්ට තිබෙන්නෙ. අපි දුම්රිය දෙපාර්තමේන්තුවට මොනව ලිව්වත්, ඒ කරුණු ගැන හරි හැටි සලකා නොබැලීම ගැන මගේ කණගාටුව මේ අවස්ථාවේ ප්‍රකාශ කරනව. විශාල අනතුරු කීපයක් සිද්ධ වුණු ඒ ස්ථානයට, අහුන්ගල්ල දුම්රියපොළ අසල හරස් පාරට, ගේට්ටුවක් දමන්න කියා විශේෂයෙන් මේ අවස්ථාවේ ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනව. එය සිදු නොවුණොත් ඉදිරියටත් එවැනි භයානක සිදුවීම් ඇති වන්ට ඉඩ තිබෙනව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගීන් විශාල සංඛ්‍යාවක් රුහුණු කුමාරි දුම්රියට නැගීමට අම්බලන්ගොඩ දුම්රියපොළ පාවිච්චි කරනව. ඒ ස්ථානයේ වේදිකාවට වහලක් නැති නිසා වර්ෂාවට තෙමි තෙමී ඕනෑ දුම්රියට නගින්න. එම නිසා ඒ ස්ථානයේ වේදිකාවට වහලක් දමා, ඒ ස්ථානයේ ගොඩනැගිලි ප්‍රතිසංවිධානය කර අනිකුත් පහසුකම් යොදන ලෙස මා ඉල්ලා සිටිනව. ඒ ස්ථානයේ මගීන්ට වාඩි වෙන්ට තිබෙන කාමරයේ තිබෙන්නෙ කැඩුණු පුටු කබල් වගයක්. ඒවායෙ කිසි කෙනෙකුට හරියාකාර ඉඳ ගන්න බැහැ. ඒවායෙ මකුණො පිරිල. ඒ වගේම ඒ ස්ථානයට සුදුසු වැසිකිළියක් නැහැ. සමහර විට ඒ ස්ථානයේ දැනට තිබෙන වැසිකිළියේත් දොර වසා එහි යතුර දුම්රිය ස්ථානාධිපති ළඟ තබා ගන්නව. ඔය අන්දමටයි, දුම්රිය පොළවල ඇතැම් වැසිකිළි පාවිච්චි කරන්නෙ. ඔය විධියෙ බොහොම කණගාටුදායක සිද්ධීන් රාශියක් ඒ ස්ථානයේ පවතිනව. ඒව නැති කර දමන ලෙස මා ඉල්ලා සිටිනව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එකම දුම්රියක්වත් නියමිත වෙලාවට යන්නෙ නැහැ. ඒ ගැන ප්‍රශ්න කළාම දුම්රිය දෙපාර්තමේන්තුවට කෙළවරක් නැති උත්තර නම් තිබෙනව කියන්න. ගාල්ලෙ ගරු මන්ත්‍රීතුමා (ඩබ්ලිව්. දහනායක මයා.) සමහර විට මතක් කරන අන්දමට "කිතුල් ගහට ගිය මිනිහටත් උත්තරයක් තිබෙනව" කියන්න වගේ, දුම්රිය දෙපාර්තමේන්තුවටත් ඒ සෑම එකකටම මොකක් හරි උත්තරයක් තිබෙනව. ඒවා පිළිගන්ට පුළුවන් උත්තර නොවන බව මා මතක් කරන්ට කැමතියි.

කතරගම දක්වා යන වන්දනාකරුවන්ගෙන් විශාල පිරිසක් දුම්රියෙන් මාතරට යනව. ඊට හේතුව, දුම්රිය මාර්ගය තිබෙන්නෙ මාතර දක්වා විතරයි. කතරගම දක්වා මුහුදුබඩ දුම්රිය මාර්ගය දීර්ඝ කරනව නම්, අපේ රටේ විශාල දියුණුවක් ඇති වෙනවා පමණක් නොවෙයි, එයින් රජයටත් විශාල ප්‍රයෝජනයක් ඇති වෙනව.

දුම්රිය දෙපාර්තමේන්තුවෙන් දකුණු පලාතට සිදු විය යුතු කරුණු රාශියක් මා සඳහන් කළා. මා විශ්වාස කරනව, පුළුවන් තරම් ඉක්මනින් ඒව ඉටු කරනවා ඇති කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊ ළඟට ලංගමය ගැනත් වචනයක් දෙකක් කථා කිරීමටයි මා අදහස් කරන්නෙ එදා බස් මුදලාලිලා බස් ව්‍යාපාරය කළ කාලයට වඩා 1958 බස් ජනසතු කිරීමෙන් පසු මගීන්ට හොඳ සේවයක් සිදු වන බව මා විශේෂයෙන් පිළිගන්නවා. එය නො කියා බැහැ. ඒ මන්ද කියතොත් පෞද්ගලික බස් හිමියන්ට බස් තිබෙන කාලෙදි අර ඉස්සර කෝච්චියට නැග්ගම වාගෙ හරියට වාඩි වෙන්න ආසනයක් නැහැ. එදා නියම වෙලාවට බස් ගමන් කෙළෙත් නැහැ, හොඳ බස් තිබුණෙත් නැහැ. නමුත් ජනසතු කළාට පසුව, කෝටි ගණන් පාඩුය කිව්වත්, අපට කියන්න පුළුවනි අපට හොඳ ගමනාගමන සේවයක් ලැබී තිබෙන බව. ඒ වගේම හොඳ බස් රථත් ලැබී තිබෙනවා. මට මතකයි ඉස්සර බස් මුදලාලිගෙ කාලෙදි හැතැප්ම 12 ක පමණ කෙටි දුරක ගමනක් යතත් බස් එක හත් අට පළක නවත්වා රේඩියේටර් එකට වතුර දමමින් යන බව. රේඩියේටර් එකෙන් දුම් දානවා. ඒ නිසා වතුර වළවල් ළඟ නවත්වා දුම් නගිද්දි රේඩියේටර් එකට වතුර වත් කරනවා. ඔය විධියට හැතැප්ම 12 ක පමණ ගමනක් වුනත් යාමට පැය ගණනක් ගත වෙනවා. නමුත් ජනසතු කළාට පසුව දැන් ඒ ගමන පැය භාගයකින් නැත්නම් පැයකින් යාමට අපට පුළුවන්කම ලැබී තිබීම ගැන අපි සන්තෝෂ වෙනවා.

ලංගමයේ නොයෙකුත් අඩු පාඩු තිබෙනවා. මීට කලින් කථා කළ කොට්ටාවෙ ගරු මන්ත්‍රීතුමා (ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.) ඒ ගැන හොඳ විස්තරයක් කළා. ඒවා ගැන නැවත නැවත කීමට අපි බලාපොරොත්තු වෙන්නෙ නැහැ. එදා බස් හිමියන්ගෙ කාලෙදි තිබුණාට වඩා විශාල දියුණුවක් අද තිබෙන බව නොකියාම බැහැ. ලේලන්ඩ් වර්ගයේ බස් රථ වැනි බස් රථවලින් අපට ඉතා පහසුවෙන් ගමන් කිරීමට පුළුවන්කම ලැබී තිබෙනවා. දැන් කොළඹ සිට කතරගමටත් බස් තුන හතරක් වැඩ කරනවා. එයින් මහජනයා හොඳ සේවයක් ලබනවා. ඒ බස් දුවන්නේ සීග්‍රගාමී හැටියටයි. කෝටි ගණන් ලංගමයට පාඩු වුණත් හොඳ සේවයක් අපට ලැබෙන බව කවුරුත් පිළිගෙන ඉවරයි.

නමුත් අපේ ගරු මන්ත්‍රීතුමාගෙ කථාවෙදි ශ්‍රීමත් සිරිල් ද සොයිසා මහත්මයා ගැන සඳහන් කළා. ඒ ගැන මාද වචන කීපයක් කීමට අදහස් කරනවා. සවුත් වෙස්ටර්න් බස් සමාගම අයිතිකාරයා හැටියට සිටියේ ඒ ශ්‍රීමත් සිරිල් ද සොයිසා මහත්මයායි. මා විශේෂයෙන්ම කියන්න කැමතියි, සවුත් වෙස්ටර්න් බස් රථ සමාගම ඉතාමත් දක්ෂ ලෙස පාලනය කර හොඳ බස් සේවයක් රටට එදා ඇති කර දුන්නෙ ශ්‍රීමත් සිරිල් ද සොයිසා මහත් මයා බව. [බාධා කිරීම්.] උන්නැහෙගෙ පාලනය නිසා ඉතා හොඳින් ඒ බස් සේවය ගෙන ගියා. ජනසතු කිරීමෙ නීති රීති අනුව ඒ සමාගමේ සේවයේ සිටි නිලධාරීනුත් සමගයි බස් සේවය ජනසතු වුණේ. උන්නැහෙලත් දැන් ලංගමයෙ වැඩ කරනවා. ඒ නිලධාරි මහත්වරු අතර හොඳ නිලධාරි මහත්වරුත් ඉන්නවා. සමහර විට නරක උදවියත් ඉන්න පුළුවන්. කොයි දෙපාර්තමේන්තුවක බැලුවත් හොඳ නරක දෙකොටසම ඉන්නවා. කෙසේ වුණත් සවුත් වෙස්ටර්න් බස් රථ සමාගම ඉතා හොඳ පාලනයකින් ගෙන ගිය සමාගමක් බව මට කියන්න පුළුවන්. ඒ සමාගමේ හොඳට පුහුණු වූ ඉංජිනේරු මහත්වරු සිටියා. එයින් එක් ඉංජිනේරු මහත්මයෙක් දැන් ලංගමයෙ දෙවැනි ඉංජිනේරු තැන හැටියට වැඩ කරනවා. ඒ මහතා ඉතාම දක්ෂ ලෙස වැඩ කරන්න පුළුවන් හොඳ පුහුණුවක් තිබෙන ඉංජිනේරු මහත්මයෙක් බව මට කියන්න පුළුවන්. සවුත් වෙස්ටර්න් බස් රථ සමාගම ඉතාමත් හොඳින් පාලනය කරගෙන යාමට පුළුවන් වූයේ එවැනි හොඳ දක්ෂ ඉංජිනේරු මහත්මයෙක් සිටි නිසයි. එවැනි අය නොසිටියා නම්, හොඳ පාලනයක් නොතිබුණා නම්, ඒ තරම් දක්ෂ ගමනාගමන සේවයක් දීමට ඒ සමාගමට එදා පුළුවන් වන්නෙ නැහැ.

ඒ වාගේම තවත් සමාගම් තිබුණා. මීගමු පළාතෙත් දකුණු පළාතෙත් තිබුණා. ඒ සියලුම සමාගම්වල බස් ජනසතු කළ බව අපි දන්නවා. සමාගම්වලට බස් අයිතිව තිබුණු කාලයට වඩා හොඳ සේවයක් දැන් ලැබෙනවා. ජනසතු කිරීමෙන් පසු ඒ සේවය හොඳ වීම ගැන අපි සන්තෝෂ වෙනවා. ලංගමයෙන් පාඩු වන්නේ එහි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ද සිල්වා මයා.]

පාලනය හරියාකාර නොකෙරෙන නිසයි. සිරිල් ද සොයිසා මහත්මයා නීතිඥ මහත්මයෙක්. ඒ නිසයි, ඒ මහත්මයාට ඒ බස් සමාගමේ හොඳ පාලනයක් කර ගෙන යන්න පුළුවන් වුණේ. අපේ අළුත් ඇමතිතුමාත් නීතිඥ මහත්මයෙක්. ඒ නිසා අළුත් ඇමතිතුමාටත් සිරිල් ද සොයිසා මහත්මයා වාගේ ඉතා දක්ෂ පාලනයක් ගෙන යන්නට පුළුවන් වනු ඇතැයි අපි විශ්වාස කරනවා. කොට්ටාවේ ගරු මන්ත්‍රීතුමාත් පිළිගන්නවා ඇති, සවුත් වෙස්ටර්න් බස් සමාගමේ පාලනය ඉතා දක්ෂ අන්දමින් ගෙන ගිය බව. ඒ විධියටම අළුත් ඇමතිතුමාත් ලංගමයේ දැනට ඇති සියලුම දූෂණ ඉවත් කොට එහි හොඳ පාලනයක් ඇති කරනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

ලංගමය ගැන කොට්ටාවේ ගරු මන්ත්‍රීතුමා කී බොහොමයක් දේ ඇත්තයි. ලංගමයේ උසස් නිලධාරි මහත්වරුන්ට වුවමනාවට වැඩිය පඩි දීම ඉන් එක කාරණයක්. දහස් ගණන් පඩි දෙනවා. අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩිය පඩි ගන්න නිලධාරිනුත් ඉන්නවා. ඒ නිසයි, එහි පාලනය හරියට ගෙනයන්න බැරි. එහි සිටින ඒ නිලධාරීන්ගේ ගණන අඩු කරනවා නම් මීට වඩා හොඳින් එහි පාලනය ගෙන යන්න පුළුවනි. සමහර නිලධාරීන්—විශෙෂයෙන්ම උසස් නිලධාරීන්—උදේ 10 ටවත් කන්තෝරුවට එන්නෙ නැහැ. සමහර විට අපි ටෙලිෆෝන් කළාම නිලධාරීන් කන්තෝරුවේ ඇත්තෙ නැහැ. හරියට සේවය කරනවා නම් වෙලාවට නොවෙයි, වෙලාවට කලින් කන්තෝරුවට එන්න ඕනැ. උදේ 8 වන විට වැඩ පටන් ගන්න පුළුවනි. රටට ආදරයක් ඇතිව අවංක සේවයක් කිරීමට අදහස් කරනවා නම්, එසේ කොට මේ රට දියුණු කිරීමට කල්පනා කරනවා නම්, පැය 8 ක් නොවෙයි, ඊට වඩා වුවත් වැඩ කිරීමට සූදානම් වෙන්න ඕනැ. මට මෙහිදී වෙනත් ආයතනයක වැඩ කරන නිලධාරියකු ගැන මතක් වුණා. වරාය සංයුක්ත මණ්ඩලයේ සේවය කරන ප්‍රධාන ඉංජිනේරු මහත්මයා උදේ හතහමාර නැති නම් අට වන විට කන්තෝරුවට එනවා. උන්නැහේටත් මේ ලංගමයේ නිලධාරීන්ට වාගේ උදේ 10 ට කන්තෝරුවට එන්න පුළුවනි. නමුත් උන්නැහේ කවදාවත් එහෙම එන්නේ නැහැ. ප්‍රතිපත්තියක් වශයෙන්ම කන්තෝරුවට ඉතාමත් උදෙන් එනවා. රටට ආදරයක් ඇතිව රට දියුණු කිරීමේ අභිලාෂයක් ඇතිව අවංක සේවයක් කිරීමට ඒ මහත්මයා උත්සාහ කරනවා. ඒ නිසයි ඒ තරම් උදෙන් කන්තෝරුවට ඇවිත් වැඩ කරන්නෙ. ඒ ඉංජිනේරු මහත්මයා වරාය සංයුක්ත මණ්ඩලයේ සේවයට බැඳී වැඩි කාලයක් ගත වූයේ නැහැ. දැන් ප්‍රධාන ඉංජිනේරුවා හැටියට පත් වී වැඩ කරනවා. රටට ආදරයක් ඇතිව, කරුණාවක් ඇතිව, රට දියුණු කිරීමේ අදහසින් ඉතා දක්ෂ ලෙස වැඩ කරන ඒ මහත්මයා උදේ 8 ට කන්තෝරුවට පැමිණියාම රෑ හය හත වන තුරු වැඩ කරනවා.

නමුත් ලංගමයේ නිලධාරීන් උදේ 10 වන තුරුත් කන්තෝරුවට එන්නෙ නැහැ. අපට යම් කාරණා සඳහා ලංගමයේ උසස් නිලධාරීන්ට—සභාපතිතුමාට නැති නම් කළමනාකාරතුමාට—ටෙලිෆෝන් කරන්න සිදු වෙනවා. අපේ කොට්ඨාශවල සිටින දුප්පත් ළමයින් එනවා රක්ෂා සපයා දෙන්නටය කියාගෙන. අපි එවැනි අවස්ථාවක ටෙලිෆෝන් කළාම—උදේ 10 ට ටෙලිෆෝන් කළත්—කියනවා කන්තෝරුවට ඇවිත් නැත කියා. සමහර වෙලාවට කියනවා, බෝඞ් මීටිමකට ගිහින් ය කියා. මේ විධියට වැඩ කරන විට කොහොමද රටක් දියුණු කරන්නෙ? අවංකව වැඩ කරනවා නම්, හොඳ පාලනයක් තිබෙනවා නම් වැඩි කලක් ගත වෙන්නට පෙර—අවුරුදු ; තුන හතරකදී—මේ රට දියුණු කරන්න පුළුවනි. ලංගමයේ අද සිදු වන නාස්තිය බොහොමයි. බස් රථයක ඇණයක් නරක් වුණාම, නැති නම් වයිපරය නරක් වුණාම, හැතැප්ම දහස් ගණනක් දුවන්න පුළුවන් බස්වල දිවීම නතර කරනවා. ගාල්ලේ ඩිපෝවේ දින පතාම වාගේ බස් 10 ක් 12 ක් සුළු සුළු වැරදි තිබෙනවාය කියා ගරාජයට දමනවා.

එකල්හි වේලාව අ. භා. 10 වුයෙන්, මන්ත්‍රී මණ්ඩලයට ප්‍රගතිය වාර්තා කරනු පිණිස මූලාසනාරූඪ මන්ත්‍රීතුමා මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 1963 සැප්තැම්බර් 12 වන බ්‍රහස්පතින්ද.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කල්තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

එකල්හි වේලාව අ. භා. 10 පසු කර තුබූයෙන්, මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 10.1 ට, 1963 සැප්තැම්බර් 5 වන දින සභාසම්මතය අනුව, 1963 සැප්තැම්බර් 12 වන බ්‍රහස්පතින්දා පූ. භා. 10 වන තෙක් කල් ගියේය.**



*1963, செப்டம்பர் 5 ஆம் தேதிய, சபையினது தீர்மானத்துக்கிணங்க, பி. ப. 10.1 மணிக்கு 1963, செப்டம்பர் 12, வியாழக்கிழமை மு. ப. 10 மணி வரை சபை ஒத்திவைக்கப்பெற்றது.*

Adjourned accordingly at 10.1 P.M. until 10 A.M. on Thursday, September 12, 1963, pursuant to the Resolution of the House of September 5, 1963.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்

## WRITTEN ANSWERS TO QUESTIONS

### නිවිතිගල ඡන්දදායක කොට්ඨාශය : ගම් පළල් කිරීම සඳහා ඉඩම් අත් කරගැනීම

### நிவித்திகலத் தொகுதி : கிராம விஸ்தரிப்புக்குக் கொள்ளப்பட்ட காணிகள்

### NIVITIGALA ELECTORATE : LANDS ACQUIRED FOR VILLAGE EXPANSION

260/63.

**ස්ටැන්ලි මොල්ලිගොඩ මයා.** (නිවිතිගල)

*(திரு. ஸ்டான்லி மொல்லிகொட—நிவித்திகல)*

(Mr. Stanley Molligoda—Nivitigala)

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : 1960-61, 1961-62, 1962-63 යන වර්ෂ තුළ ගම් පුළුල් කිරීමේ කටයුතු සඳහා නිවිතිගල ඡන්දදායක කොට්ඨාශය තුළ රජයට අත් කර ගන්නා ලද ඉඩම්වල නම්, එම ඉඩම් පිහිටි ආදායම් පාලක නිලධාරි කොට්ඨාශ හා ගම් මුලාදෑණි කොට්ඨාශ, එක් එක් ඉඩමේ අක්කර ගණන, වන්දි ගෙවන ලද දිනය හා වන්දි ගෙවනු ලැබූ අය සහ ගෙවන ලද මුදල් ප්‍රමාණය සඳහන් ලැයිස්තුවක් එතුමා ඉදිරිපත් කරනවාද ?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா : கிராம விஸ்தரிப்புக்கென 1960-61, 1961-62, 1962-63 ஆகிய வருடங்களில் நிவித்திக்கலைத் தேர்தற்றொகுதியில் கொள்ளப்பட்ட காணிகளின் பெயர்களையும், அத்தகைய காணிகள் அமைந்துள்ள பெரும் பாக இறைவரியுத்தியோகத்தரினதும் கிராமத் தலைமைக்காரரினதும் பிரிவுகளையும் அக்காணியொவ்வொன்றினதும் பரப்பையும், நட்டஈடு வழங்கப்பட்ட தேதியையும் நட்டஈடு யாருக்கு வழங்கப்பட்டதென்பதையும், சம்பந்தப்பட்ட தொகைகளெவ்வளவென்பதையும் கொண்ட அறிக்கையொன்றை அவர் சமர்ப்பிப்பாரா ?*

asked the Minister of Land, Irrigation and Power : Will he table a statement showing the names of the lands acquired in Nivitigala Electorate for village expansion in 1960-61, 1961-62, 1962-63, the D.R.O's and village headmen's divisions in which such lands are situated, the acreage of each land, the date on which and to whom compensation was paid, and what the amounts involved were ?

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති හා සභා නායක)**

*(கௌரவ சி. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

ඔව්. මේ සමග අමුණා ඇති විස්තර වාර්තාව බලන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලිඛිත පිළිතුරු

| මුදල් වර්ෂය | ඉඩමේ නම | ආදායම් පාලක කොට්ඨාශය | ගම්මුලාදැනි කොට්ඨාශය | ප්‍රමාණය අ. රූ. ප. | වන්දි මුදල් ගෙවූ දිනය | මුදල් ලැබූ අයගේ නම | ගෙවන ලද මුදල රු. ශ. |
|---|---|---|---|---|---|---|---|
| 1960/61 .. | තිප්පොලහේන ... | නවදුන් කෝරලය ... | නිවිතිගල වසම ... | 36 0 13 ... | වන්දි මුදල් ගෙවා නැත. | ඔප්පුව පිළිබඳ ආරවුලක් තිබෙන නිසා උසාවියට නඩුවක් ඉදිරිපත් කර තිබේ. | |
| 1960/61 ... | ඉල්ලෙඹුළුව වත්ත ... | එම ... | දඹුලුවන වසම ... | 4 0 0 ... | 12. 9.61 | ජේ. ඒ. ඩී. එස්. පෙරේරා ... ... | 191.47 |
| | | | | | එම | කුසුමාවතී සිංහබාහු ... ... | 499.49 |
| | | | | | එම | එච්. ඊ. පෙරේරා ... ... | 499.49 |
| | | | | | එම | එච්. ඒ. ප්‍රේමතිලක ... ... | 124.87 |
| | | | | | එම | එච්. සිරිපාල ... ... | 83.25 |
| | | | | | එම | ටී. බී. සමරනායක ... ... | 332.99 |
| | | | | | එම | ඒ. බී. එම්. එම්. නයින මරික්කාර් ... | 83.25 |
| | | | | | එම | ඒ. එම්. ඒ. බවෝ ... ... | 41.62 |
| | | | | | එම | ඒ. අයි. එම්. ඒ. හලීම් ... ... | 208.12 |
| | | | | | එම | ඒ. අයි. එම්. සම්සුදීම් ... ... | 224.77 |
| | | | | | එම | අයි. එල්. එම්. එම්. සාලි ... ... | 137.36 |
| | | | | | එම | අයි. එල්. එම්. හරිදු ... ... | 220.61 |
| | | | | | එම | බී. එල්. සැමී ... ... | 83.25 |
| | | | | | එම | එම්. කේ. ජීදිරික් ... ... | 41.62 |
| | | | | | එම | එම්. කේ. ඇල්බට් ... ... | 41.63 |
| | | | | | එම | එන්. ඩී. ඩී. පෙරේරා ... ... | 49,95 |
| | | | | | එම | පී. ඒ. ජයවර්ධන ... ... | 33.30 |
| | | | | | එම | එන්. ඊ. එස්. ප්‍රනාන්දු ... ... | 49.95 |
| | | | | | එම | ඒ. ඩී. ජේ. ජයතිස්ස ... ... | 41·63 |
| | | | | | එම | එච්. ඩී. ඒ. ජයසේකර ... ... | 8.33 |
| | | | | | එම | එම්. ඒ. කුස්තන්සිංඤෝ ... ... | 41.63 |
| | | | | | එම | එල්. ඩී. දයානන්ද ... ... | 208.12 |

ලිඛිත පිළිතුරු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| මුදල් වර්ෂය | ඉඩමේ නම | ආදායම් පාලක කොට්ඨාශය | ගම්මුලාදැනි කොට්ඨාශය | ප්‍රමාණය අ. රූ. ප. | වන්දි මුදල් ගෙවූ දිනය | මුදල් ලැබූ අයගේ නම | ගෙවනලද මුදල රු. ශ. |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 12.9.61 | යූ. කේ. ගුණවර්ධන ... ... | 33.30 |
| | | | | | එම | එච්. එම්. ජයවර්ධන මැණිකෙ ... | 82.50 |
| | | | | | එම | එම්. ඩී. එම්. හඳුරුකන්ද ... ... | 13.75 |
| | | | | | එම | එම්. එන්. එම්. හඳුරුකන්ද ... ... | 18.75 |
| | | | | | එම | එච්. එම්. ජයතිලක බණ්ඩාර ... | 13.75 |
| | | | | | එම | එච්. එම්. කරුණාරත්න බණ්ඩාර ... | 27.50 |
| | | | | | එම | අයිතිවාසිකම් කියා නැත. රත්නපුර උසාවියේ අංක 79 දරණ නඩුවේ ගාස්තුව ... | 3.58 |
| | | | | | | | 3,434.83 |
| 1961/62 ... | දෙඹගහදෙනිය හේන්යාය | නවදුන් කෝරලය ... | දෙලොස්වල වසම ... | 146 1 26 ... | 6.11.61 | එෆ්. ආර්. ද සේරම් ... ... | 24,673.00 |
| 1962/63 ... | ... | ... | නැත ... | | | | |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ஆம். அறிக்கை கீழே தரப்பட்டுள்ளது :

| நிதி வருடம் | காணியின் பெயர் | பகுதிக் காரியாதி காரியின் பிரிவு | கிராம அதி காரியின் பிரிவு | விஸ்தீரணம் ஏ. று. பே. | நஷ்டஈடு கொடுபட்ட திகதி | பணம் கொடுக்கப்பட்டவர்களின் பெயர்கள் | கொடுக்கப்பட்ட தொகை ரூ. ச. |
|---|---|---|---|---|---|---|---|
| 1960/61.. | திப்பொலா கெனை | நாவடுன் கோரளை | நிவித்திகல வசம் | 36 0 13 .. | நஷ்டஈடு கொடுக்கப்படவில்லை. உரிமைபற்றித் தகராறிருப்பதால் வழக்கு நிதிமன்றத்திற்குச் சமர்ப்பிக்கப்பட்டிருக்கிறது | | |
| 1960/61.. | இப்பெனுவ தோட்டம் | நாவடுன் கோரளை | டம்புலுவன வசம் | 4 0 00 .. | 12 9 61 .. | ஜெ ஏ. டி. எஸ். பெரேரா .. .. .. | 191 47 |
| | | | | | | திருமதி. குசுமாவதி சிங்கபாகு .. .. .. | 499 49 |
| | | | | | | எஸ். ஈ. பெரேரா .. .. .. .. | 499 49 |
| | | | | | | எஸ். ஏ. பிரேமதிலக .. .. .. | 124 87 |
| | | | | | | எஸ். சிறிபால .. .. .. .. | 83 25 |
| | | | | | | ரி. பி. சமரநாயக .. .. .. .. | 332 99 |
| | | | | | | ஏ. பி. எம். எம். நயினு மரிக்கார் .. .. .. | 83 25 |
| | | | | | | ஏ. எம். ஏ. பச்சோ .. .. .. | 41 62 |
| | | | | | | ஏ. ஐ. எம். ஏ. ஹலிம் .. .. .. | 208 12 |
| | | | | | | ஏ. ஐ. எம். சம்சுடீன் .. .. .. | 224 77 |
| | | | | | | ஐ. எல். எம். எம். சலீ .. .. .. | 137 36 |
| | | | | | | ஐ. எல். எம். கரிடோ .. .. .. | 220 61 |
| | | | | | | பி. எல். சமி .. .. .. .. | 83 25 |
| | | | | | | எம். கே. சேட்றிக் .. .. .. .. | 41 62 |
| | | | | | | எம். கெ. அல்பெட் .. .. .. .. | 41 63 |
| | | | | | | என். டி. டி. பெரேரா .. .. .. | 49 95 |
| | | | | | | பி. ஏ. ஜயவார்டன .. .. .. .. | 33 30 |
| | | | | | | என். ஈ. எஸ். பொர்ளுந்து .. .. .. | 49 95 |
| | | | | | | ஏ. டி. ஜெ. ஜயதிச .. .. .. | 41 63 |
| | | | | | | எஸ். ஏ. டி. ஜயசேகர .. .. .. | 8 33 |
| | | | | | | எம். ஏ. குஷ்தன் சிங்கோ .. .. .. | 41 63 |
| | | | | | | எல். டி. தயானந்த .. .. .. | 208 12 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| நிதி வருடம் | காணியின் பெயர் | பகுதிக் காரியாதி காரியின் பிரிவு | கிராம அதி காரியின் பிரிவு | விஸ்திரணம் ஏ. றூ. பே. | நஷ்டஈடு கொடுபட்ட திகதி | பணம் கொடுக்கப்பட்டவர்களின் பெயர்கள் | கொடுக்கப் பட்ட தொகை ரூ. ச. |
|---|---|---|---|---|---|---|---|
| 1960/61 .. | இப்பெறுவ தோட்டம் | நாவடுன் கோரளை | டம்புலுவன வசம் | 4 0 00 .. | 12 9 61 | யு. கே. குணவர்தன .. .. .. | 33 30 |
| | | | | | | எச். எம். ஜயவர்தன மெனிகே .. .. .. | 82 50 |
| | | | | | | எம். டி. ஷந்துறுகந்த .. .. .. | 13 75 |
| | | | | | | எம். என். எம். ஷந்துறுகந்த .. .. .. | 13 75 |
| | | | | | | எச். எம். ஜயதிலக்க பண்டாற .. .. .. | 13 75 |
| | | | | | | எச். எம். கறுணாரத்தின பண்டாற .. .. .. | 27 50 |
| | | | | | | உரிமை கோரப்படாதது இரத்தினபுரி சி. ஆர். நிதிமன்றத்திடம் ஒப்படைக் கப்பட்டுள்ளது. வழக்கு இல. 79/தொடர்பு .. .. | 3 58 |
| | | | | | | | 3,434 83 |
| 1961/62 .. | டொம்பகஷ தேனிய | நாவடுன் கோரளை | டொலஸ்வல வசம | 146 1 26 .. | 6 11 61 .. | திருமதி எவ். ஆர். டி சேரம் .. .. .. | 24,672 0 |
| 1962/63 | .. | .. | .. | .. | | ஒன்றுமில்லை .. .. .. | |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Yes. The statement is given below :

| *Financial Year* | *Name of Land* | *D. R. O's Division* | *V. H's Division* | *Extent* A. R. P. | *Date of Payment of Compensation* | *Names of Persons paid* | *Amount paid* *Rs. c.* |
|---|---|---|---|---|---|---|---|
| 1960–61 .. | Tippolahena .. | Nawadun Korale .. | Niwitigala Wasama .. | 36 0 13 .. | Compensation not paid. Case referred to Court as there is a dispute regarding the title | | |
| 1960–61 .. | Illebuluwa Estate .. | do. .. | Dambuluwana Wasama .. | 4 0 00 .. | 12. 9.61 .. | J. A. D. S. Perera .. | 191 49 |
| | | | | | ,, .. | Mrs. Kusumawathie Sinhabahu .. .. | 499 47 |
| | | | | | ,, .. | H. E. Perera .. | 499 49 |
| | | | | | ,, .. | H. A. Prematillake .. | 124 87 |
| | | | | | ,, .. | H. Siripala .. .. | 83 25 |
| | | | | | ,, .. | T. B. Samaranayake .. | 332 99 |
| | | | | | ,, .. | A. B. M. M. Naina Marikkar | 83 25 |
| | | | | | ,, .. | A. M. A. Batcho .. | 41 62 |
| | | | | | ,, .. | A. I. M. A. Halim .. | 208 12 |
| | | | | | ,, .. | A. I. M. Samsudeen .. | 224 77 |
| | | | | | ,, .. | I. L. M. M. Sally .. | 137 36 |
| | | | | | ,, .. | I. L. M. Harido .. | 220 61 |
| | | | | | ,, .. | B. L. Sammie .. | 83 25 |
| | | | | | ,, .. | M. K. Gedrick .. | 41 62 |
| | | | | | ,, .. | M. K. Albert .. | 41 63 |
| | | | | | ,, .. | N. D. D. Perera .. | 49 95 |
| | | | | | ,, .. | P. A. Jayawardena .. | 33 30 |
| | | | | | ,, .. | N. E. S. Fernando .. | 49 95 |
| | | | | | ,, .. | A. D. J. Jayatissa .. | 41 63 |
| | | | | | ,, .. | H. D. A. Jayasekara .. | 8 33 |
| | | | | | ,, .. | M. A. Kusthan Singho .. | 41 63 |
| | | | | | ,, .. | L. D. Dayananda .. | 208 12 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| Financial Year | Name of Land | D. R. O's Division | V. H's Division | Extent A. R. P. | Date of Payment of Compensation | Names of Persons paid | Amount paid Rs. c. |
|---|---|---|---|---|---|---|---|
| 1960-61 .. | Illebuluwa Estate .. | Nawadun Korale .. | Dambuluwana Wasama .. | 4 0 00 | 12.9.61 .. | U. K. Gunawardena .. | 33 30 |
| | | | | | ,, .. | Mrs. H. M. Jayawardena Menike .. .. | 82 50 |
| | | | | | ,, .. | M. D. M. Handurukanda .. | 13 75 |
| | | | | | ,, .. | M. N. M. Handurukanda .. | 13 75 |
| | | | | | ,, .. | H. M. Jayatillake Bandara .. | 13 75 |
| | | | | | ,, .. | H. M. Karunaratne Bandara | 27 50 |
| | | | | | ,, .. | Unclaimed credited to CR—Ratnapura Case No. 79/Ref. | 3 58 |
| | | | | | | | 3,434 83 |
| 1961-62 .. | Dombagahadeniya | do. .. | Doloswala Wasama .. | 146 1 26 .. | 6.11.61 .. | Mrs. F. R. de Saram .. | 24,672 0 |
| 1962-63 .. | Henyaya | | | NIL | | | |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# පරිශිෂ්ටය අංක 1

## 3016 වන තීරයෙහි සඳහන් කරන ලද ලිපිය

### ලංගමට සිංහල එපා වුණේ ඇයි?

මේ රටේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව 1964 ජනවාරි 1 වෙනි දා සිට රජයේ සියලුම දෙපාර්ත මේන්තුවල හා සංයුක්ත මණ්ඩලීය ආයතන වලද රාජකාරි කටයුතු සියල්ලක්ම සිංහලෙන් කළයුතු යයි රජය තීරණය කර ඇති බව අපි දනිමු.

රජයේ නියෝගය එසේ වුවද, 1963 අගෝස්තු මස 26 වෙනි දින ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමනාකරු විසින් නිකුත් කර ඇති ඔහුගේ අංක පී. ඒ. 173 දරන චක්‍ර ලේඛනය කින් ලංගමය තුළ භාෂා පණිත ක්‍රියාත්මක කිරීම තවත් අවුරුද්දකින් පස්සට තල්ලු කිරීමට තීරණය කර තිබේ.

**එම චක්‍ර ලේඛණයේම "සී" ඡේදයෙන් ප්‍රකාශන යට පත්කර ඇති පරිදි 1959 තුන්වෙනි මස 1 වෙනි දිනට ප්‍රථමයෙන් පත්කර ගනු ලැබුවාවූද, සිංහල පිළිබඳ අවශ්‍ය ප්‍රවීණත්වය ලබාගත නොහැකි වන්නාවූද, නිලධාරීන් සිංහල භාෂාව පිළිබඳ පාඩම් මාලාවක් හදාරන බවත්, සුදුසුකම් ලබා ගැනීමට හැම ප්‍රයත්නයක්ම දරන බවත්, ඔප්පු වුව හොත් 1964 සැප්තැම්බර් මස 1 වෙනි දා වනතෙක් එකී ප්‍රවීනත්වය ලබාගත නොහැකි වීමේ විපාකයක් වශයෙන් පඩි වැඩිවීම් හා උසස් වීම් සම්බන්ධ යෙන් පාඩුවක් සිදු නොවිය යුතුය.**

පුදුමයකි. රාජ්‍ය භාෂාව පිළිබඳව රජය එක ප්‍රති පත්තියකුත්, ලංකා ගමනා ගමන මණ්ඩලය තවත් ප්‍රතිපත්තියකුත්, ගැනීම වූ කලී නොකෙරෙන වෙද කමට කෝඳුරු තෙල් හත්පට්ටයකුත් විකක් අවශ්‍ය යයි කියන ගැමි කතාවට දෙවෙනි නොවේ. තවද, පූර්වෝක්ත චක්‍ර ලේඛණය අනුව බලන විට මෙය පිළියෙළ කර තිබෙන්නේ ලංකා ගමනා ගමන මණ්ඩලයේ මුදල් වැයකොට පැයකට රුපියල් 10 ගණනේ ගෙවා විශේෂ ගුරුවරුන් ලවා පැවැත්වූ සිංහල පුහුණු වීමේ පංතිවලින් ප්‍රයෝජනයක් නො ගත් එම පංති වර්ජනය කළ, ලංගමයේ සවභාෂා විරෝධී, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට පටහැනිව ක්‍රියා කිරීමට නිතරම යත්න දරණ, එසේම සවභාෂා වෙන් කටයුතු කිරීමට දැඩි විරෝධයක් දක්වන ලංගම භාෂා ද්‍රෝහීන්ගේ යහපත පතා බව පැහැ දිලිව පෙනේ.

පසුගිය අවුරුදු තුනකින් ප්‍රයෝජනය ගැනීමට බැරි වුණු පිරිසකට දීර්ඝකර ඇති මේ අවුරුද්දෙන් ප්‍රයෝජනයක් වේයයි සිතන්නේ නම් එය නිකම්ම



සිතුවිලි මාත්‍රයක් පමණි. මෙවැනි දෙබිඩි භාෂා ප්‍රතිපත්තියකට අප සම්මේලනය තදින්ම විරුද්ධත්වය ප්‍රකාශ කරන අතර, භාෂාව පිළිබඳව දැනට රජය ගෙන ඇති තීරණය පරිදි ලංගමය තුළද එය ක්‍රියාත් මක කිරීම මොහොතකින් වත් පමා නොකළ යුතු බව ලංකා ගමනා ගමන මණ්ඩලයේ නිලධාරි මහ තුන්ට අවධාරණයෙන් මතක්කර සිටිමි.

සුගතදාස කයිකාවල,
සම ලේකම්,
ශ්‍රී ලංකා නිදහස් වෘත්තීය සමිති සම්මේලනය.

# පරිශිෂ්ටය අංක 2

## 3023 වන තීරයෙහි සඳහන් කරන ලද සන්දේශය

**ලංකා ගුවන් සේවයෙහි නුවුමනා වියදම් කපා හැරීම, ආදායම් මාර්ග වැඩි කිරීම හා සැලැස්මක් අනුව එය දියුණුකිරීම පිළිබඳව ලංකා ගුවන් ගමනාගමන සේවක සමිතියේ යෝජනා**

1. ලංකා ගුවන් සේවයෙහි නුවුවමනා වියදම් කපා හැරීම පිළිබඳ අප සමිතියේ සාමාජික සාමාජිකාවන් ගේ යෝජනා වෙතොත්, ඒවා ඉදිරිපත් කරන ලෙස ලංකා ගුවන් සේවයේ සාමාන්‍යාධිකාරි තැන විසින් එවන ලද 1963 ජූලි 4 වැනි දිනය හා ජී ඇම් 6. 7. 63 අංකය දරණ ලියුම් සමිතියේ සාමාජික සාමාජිකාවන් අතර බෙදා හරින ලදුව 1963 ජූලි මස 9 වැනි දින පැවැති විශේෂ මහා සභා රැස් වීමේදී එය සාකච්ඡාවට භාජනය කරණ ලදි. මේ සම් බන්ධයෙන් සාකච්ඡා කළ ඒ විශේෂ මහා සභාව සාමාජිකයන්ගේ හා තමන්ගේ යෝජනා ඇතුළත් සන්දේශයක් කෙටුම්පත් කරනු ලැබීම පිණිස අනු කාරක සභාවක් පත් කළාය. වියදම් කපා හැරීම පමණක් නොව, ආදායම් වැඩි කිරීම, හා සංවර්ධන සැලැස්මක් අනුව ලංකා ගුවන් සේවය දියුණු කිරීම පිළිබඳ යෝජනාද ඒ සංදේශයට ඇතුළත් කළ යුතු යයි මෙදින තීරණය විය.

2. සමිති නියෝජිතයන් සමග මේ සංදේශය සාකච්ඡාවට ගැනෙන විට ගරු ප්‍රවාහන ඇමැති තුමාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේද පැමිණීම සලස් වන ලෙස සාමාන්‍යාධිකාරි තැනගෙන් ඉල්ලීමට සභා තොමෝ තීරණය කළාය.

3. ලංකා ගුවන් සේවයේ වියදම් කපා හැරීමටත් ආදායම් මාර්ග වැඩි කිරීමටත්, සැලැස්මක් අනුව දියුණුවක් ඇති කිරීමට යෝජනා බොහොමයක් මීට ඉහත නොයෙක් වතාවලදී සමිතිය විසින් ඉදිරිපත් කරන ලද බැව් මෙහිලා සඳහන් කිරීමට විශේෂ මහා සභාව තීරණය කළාය. කිසිම ඉවක් බවක්,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විචාරයක් නොමැතිව ඉතා දක්ෂ ලෙසත් අවංක ලෙසත් සේවය කළ සාමාන්‍ය සේවකයන් ගණනාවක්ම පාලකයන් විසින් අස් කිරීමේ හේතුවෙන් අද ලංකා ගුවන් සේවය අවුල් ජාලාවක් බවට පත් වී තිබේ. වියදම් අඩුවෙනවා වෙනුවට වියදම් වැඩිවී තිබේ. අතිකාල වැඩ වැඩිවී තිබේ. සේවකයන් අස් කළ විගසම තාවකාලික වශයෙන් අළුත් සේවකයන් බඳවා ගෙන අළුත් නිලතල හා උසස් තනතුරු ඇති කොට අවංකව වැඩ කරන සේවකයන්ට පහර ගසා ඇතැම් පාලකයන්ගේ හිතවතුන්ට විශේෂයෙන් සලකන වැඩ පිළිවෙලක් පාලකයෝ අනුගමනය කරති. ඔව්හු රුපියල් වියදම් කරති. ශත ඉතිරි කිරීමට යත්න දරති.

4. සාමාන්‍යයෙන් සෙබලුන්ට වඩා ලයිතන් වරු හා සෙනවියන් ඉන්න හමුදාවක් වැනිය, අද ලංකා ගුවන් සේවය. එහි සාමාන්‍ය සේවකයන්ට වඩා කළමනාකාරවරු හා පාලකවරු සිටිති. ලංකා ගුවන් සේවය අද ස්වාධීන ජාතික ගුවන් සේවයක් නම් නොවේ. එය ටිකට් පත් විකුණන, ගුවන් යානාවලට බඩු පටවන, හා ඒවායේ බඩු බාන තැරැව්කාර සංස්ථාවක් පමණි. ලංකාව නිදහස ලබා ගන්නා විට ද ඊට පසුවද නිදහස ලැබුවාවූ ආසියානු අප්‍රිකානු රටවල් බොහොමයක් අද නවීන අවශ්‍යතාවන්ට අනුකූලව ජාතික ගුවන් සේවා පටන් ගෙන තිබේ. රට ඇතුලේත්, රටින් පිටත් ඒ සේවාවෝ මගින් හා බඩු බාහිරාදිය එහා මෙහා ගෙන යාමෙහි යෙදෙති. ගුවන් ගමන් අද ධනය ඇති අතලොස්සකගේ සුඛෝප භෝගී ජීවිතයට අදාල එකක් වී තිබේ. ඒ මහජනයාගේ සෙතට හා යහපතට අදාළ වූවක් නොවේ. සාමාන්‍ය මහජනයාට යහපත තකා ගුවන් සේවා යෙදවීමට මෙතෙක් කිසි පියවරක් ගෙන නැත. පසුගිය අවුරුදු කීපය තුළදී ලංකා ගුවන් සේවය අළුත් උපකරණ හා අළුත් ගුවන් යානා මිලදී ගන්නවා වෙනුවට කර තිබෙන්නේ ණය පියවීමටය කියා තිබෙන ඩකෝටා යානාවන් හා තවත් නොයෙක් දේ විකුණා දැමීමය. යටිකුට්ටු කුමන්ත්‍රණ, බෙලි කැපීම, අවංක සේවකයන්ට හිරිහැර කිරීම, හිතවතුන්ට හොඳ සැලකිලි දැක්වීම, මේ ආයතනයේ සාමාන්‍ය පිළිවෙත වී තිබේ. වඩ වඩා සේවය කිරීමට අවශ්‍ය තෘප්තියට පත් සේවක පිරිසක් වෙනුවට අද මේ ආයතනයේ සිටිනුයේ සිත් වේදනාවෙන් කළකිරීමට පත් සේවක පිරිසකි.

5. ජාතික ගුවන් සේවාවේ දියුණුව හා සෞභාග්‍යය දැකීමට නම් මේ දුගඳ හමන අතීතය වලලා දැමිය යුතුය. ඒ නිසා සාමාන්‍යාධිකාරී මහතාගේ ලිපිය සමිතිය ඉතා ඉහලින් පිළිගන්නීය. වියදම් කපා හැරීමට යෝජනා ඉදිරිපත් කරණ ලෙස ඒ ලිපියෙන් කරනලද ඉල්ලීමට සිය සතුට පල කරන්නීය. ඒ අනුව වියදම් කපා හැරීමටත්, ආදායම් වැඩිකිරීමටත් දියුණුවක් ඇති කිරීමටත්, යෝජනා ඉදිරිපත් කරන්නීය. මේ යෝජනාවලින් කිසිවෙකුට පුද්ගලික ලෙස පහර ගැසීමක් හෝ කිසිවෙකුගේ හිත රිදවීමක් හෝ අදහස් නොකෙරේ. සමිතිය මේ යෝජනා ඉදිරිපත් කරන්නේ දේශානුරාගය පෙරදැරි කර ගෙන හුදෙක් අවංක චේතනාවකිනි.

6. ලංකා ගුවන් සේවයට ආධාර කිරීම දිගටම කරගෙන යාමටත්, අළුත් යානාවක් මිළයට ගැනීමට උදව් කිරීමටත්, ආණ්ඩුව ගෙන ඇති තීරණය ඉතා ප්‍රශංසනීයය. ලංකා ගුවන් සේවයට වඩ වඩා ආධාර දීමත් ඒ දෙන ආධාර නිසිලෙස වියදම් කෙරෙනු සොයා බැලීමත්, ආණ්ඩුවේ ජාතික යුතුකමකි. ඒ, මේ හේතුව නිසාය. යම්කිසි රටක කාර්මික, ගොවිකම්, හා ප්‍රායෝගික දියුණුවක් රඳා පවතින්නේ ඒ රටේ ගුවන් ගමන් පිළිබඳ ඇති දියුණුව මත බව අද ලෝක සම්මත මතයකි.

තවද ගුවන් යානා පිළිබඳව ඇති දියුණුව නිසා රටේ සෛවරී බලය තවත් තහවුරු වේ. ජාතික අනුරාගය වැඩිවේ. ජාතික හැඟීමක් නොමැතිව රටක් හැදිය නොහැක. ලංකා ගුවන් සේවයට අවශ්‍ය ඔබින අළුත් ගුවන් යානාවන් මිළදී ගැනීමට උපකාර වීමට හැකි තරම් ඉක්මනින් ක්‍රියා කරන ලෙස සමිතිය ආණ්ඩුවෙන් ඉල්ලයි.

### යෝජනා

7. සමිතියේ යෝජනා කොටස් තුනකට බෙදා තිබේ. (අ) වියදම් කපා හැරීම (ආ) ආදායම් මාර්ග වැඩි කිරීම හා (ඇ) සැලැස්මක් උඩ දියුණුවක් ඇති කිරීම ඒ කොටස් තුන වේ.

### වියදම් කපා හැරීම

8. ලෙඩෙකුට බෙහෙත් දිය යුත්තේ ඔහු සුව කිරීමට මිස මැරීමට නොවේ. ඒ වගේ වියදම් කපා හැරීමෙන් මුදල් ඉතිරි වෙනවා මිසක් මුදල් වැඩියෙන් වියදම් නොවිය යුතුය. වියදම් කපා හැරීමේ ප්‍රතිඵලය විය යුත්තේ ලංකා ගුවන් සේවය තවත් ශක්තිමත් කොට ප්‍රබල කොට දියුණු කිරීමට විනා ලංකා ගුවන් සේවයේ ඉතිරිව තිබෙන ටිකත් නැති කර දැමීම නොවේ. **ලංකා ගුවන් සේවය නැතිකොට පුද්ගලික කොම්පැනියක් බිහි කිරීමට මාන බලන පුද්ගලයන්ට ඉනිමං නොතැබීමට වග බලා ගත යුතුය.**

**සමිතියේ යෝජනා මෙසේ යි:—**

1. විධායක නිලධාරීන්ගේ වැටුප් වැඩි හරියක් කපා හැරීම.

2. උප සාමාන්‍යාධිකාරී තැනගේ හා පාලක සහකාරියගේ තනතුරු අහෝසි කිරීම.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

3. මුදල් පාලක තනතුර අහෝසි කිරීම. (ලංකා ගුවන් සේවය අදට වඩා හොඳ තත්වයක පවතිද්දී ගණකාධිකාරී තනතුරක් පමණය තිබුණේ. දැන් සහතික ලත් ගණකාධිකාරි කෙනෙකු සිටින නිසා මෙවැනි තනතුරක් ඇති කිරීම අනවශ්‍යය).

4. (අ) ඔපරේෂන්ස් මැනේජර් නමැති නිලය අහෝසි කිරීම.

(ආ) පෙරමෙන් ප්‍රධාන ගුවන් නියමුවාගේ නිලය පමණක් තබා ගැනීම.

5. (අ) මගීන් හා වෙළඳ කටයුතු පිළිබඳ කළමනාකාර ධුරය, මගීන් පිළිබඳ උප කළමනාකාර ධුරය හා වෙළඳ කටයුතු පිළිබඳ උප කළමනාකාර ධුරය අහෝසි කිරීම.

(ආ) මගීන් හා වෙළඳ කටයුතු පිළිබඳ අංශයට එක පාලක නිලධාරියෙක් පමණක් පත් කිරීම.

6. (අ) ඉන්ජිනේරු කළමනාකාර ධුරය හා උප ප්‍රධාන ඉන්ජිනේරු ධුරය අහෝසි කිරීම හා

(ආ) ඒ වෙනුවට ප්‍රධාන ඉන්ජිනේරු තුමාගේ හා ජ්‍යෙෂ්ඨ "මේන්ටනන්ස්" ඉන්ජිනේරු තුමාගේ තනතුරු පත් කිරීම.

7. (අ) ශාඛා කළමනාකරුවන්ගේ හා සුපිරින්ටෙන්ඩන්ට් වරුන්ගේ තනතුරු අහෝසි කිරීම.

(ආ) ඒ වෙනුවට ස්ථානාධිපතීන්ගේ හෝ ඒජන්තවරුන්ගේ තනතුරු ඇති කිරීම.

8. (අ) බඩු බාහිරාදිය මිලයට ගැනීමේ කටයුතු පිළිබඳ නිලධාරි ධුරය හා ගබඩා නිලධාරි ධුරය අහෝසි කිරීම.

(ආ) අතීතයේ තිබුණාක්මෙන් ගබඩාව භාරව සිටීමට සැපයීමේ නිළධාරි තනතුර හා ජ්‍යෙෂ්ඨ ගබඩාකරු තනතුර පමණක් තබා ගැනීම.

9. ළඟදී සේවයට බඳවා ගත් ගුවන් සෙදියන් අස් කිරීම (ඔවුනට දීමට තරම් වැඩ නොමැති නිසාය.)

10. සාමාන්‍යාධිකාරි තැනට සංස්ථාවෙන් දී තිබෙන මොටෝ රථය විකුණා දැමීම.

11. ශාඛා කළමනාකරුවන් ඇතුළු විධායක නිල ධාරීන්ගේ ගමනාගමන දීමනා නතර කිරීම.

12. පදිංචියට නිවාස ලබා දී තිබෙන ශාඛා නිලධාරීන්ගෙන් ගෙවල් කුලියක් අය කිරීම.

13. විධායක නිලධාරීන්ගේ කාමරවල තිබෙන ශීතකරන හා වෙනත් සුඛොපභොගී උප කරණ විකිණීම.

14. 1961 දී සේවයෙන් අස් කළාට පසු සේවයට බඳවා ගන්නා ලද සේවකයන් අස්කොට අළුතින් සේවකයන් ගතයුතු නම්, 1961 දී අස්කළ සේවකයින්ට මුල් තැන දී නැවත වැඩට ගැනීම.

15. ප්‍රධාන කාර්‍යාලය රත්මලාන ගුවන් තොටු පලට ගෙන ඒම.

16. සෑම අංශයකම කෙරෙන අනවශ්‍ය ලිපි වැඩ නැති කිරීම.

17. අද සිටිනා තරමේ වෙළඳ නිලධාරීන් පිරිසක් සිටිය යුතුදැයි හොඳින් සොයා බැලීම.

**ආදායම් වැඩි කිරීම**

1. හැම වෙළඳ නිලධාරියා විසින්ම විකිණීයයුතු ටිකට් ගණන නියම කිරීම.

2. කොමිස් ගෙවීමේ ක්‍රමයට හැම ගමකම ටිකට් ඒජන්තවරුන් පත් කිරීම.

3. වන්දනා ගමන් සංවිධානය කරන ආයතන හා සමිති සංවිධාන සමග සම්බන්ධයක් ඇති කර ගැනීම හා අනුරාධපුරය වන්දනා ගමන් (උදේ ගොස් සවස ඒමට) පිළියෙල කිරීම.

4. කණ්ඩායමක ප්‍රධානියාට හෝ සංවිධායකයාට නොමිලේ ටිකට් පතක් හෝ එයට සරිලන මුදලක් ගෙවීම.

5. ගමේ වෙළඳුන්, ගුරුවරුන්, ගොවීන්, ගම්බද පොහොසතුන් හා වෙළඳ සේවකයින් අතරින් ලංකා ගුවන් සේවයේ ගමන් කරන පිරිස් සොයා ගැනීම, මොවුන් සමග කටයුතු කිරීමට පුහුණුවක් වෙළඳ කටයුතු වල නිරත සේවකයින්ට ලබාදීම.

6. මහජනයා සමග ඇසුරු කරන හැම සේවක යෙකු තුලම මහජනයාට කරුණාවෙන් කටයුතු කිරීමේ පුරුද්දක් ඇතිකරවීම සඳහා වැඩ පිළිවෙලක් ගෙනයාම මෙයට හේතුව මහජනයාට අකරුණාවන්ත ලෙස කටයුතු කරන්නේය යන චෝදනා නිසාය.

7. ළඟදී ටිකට් මිළ වැඩි කිරීම නිසා මගීන්ගේ ගණන අඩුවූ නිසා ඒ ගැන නැවත සොයා බැලීම.

8. රටේ ඇතුළත සේවාවන් පිළිබඳව ප්‍රසිද්ධියක් ඇති කිරීම සඳහා සිංහලෙන් හා දෙමළෙන් ලංකා ගුවන් විදුලි සේවය වැඩි වශයෙන් පාවිච්චි කිරීම.

9. ලංකාවට පැමිණෙන විදේශීය ගුවන් සේවාවල කටයුතු ලංකා ගුවන් සේවයට පවරා ගැනීම.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිශිෂ්ටය අංක 2

10. තිරුච්චිනා පල්ලි ගුවන් සේවය "මදුර" ට වෙනස් කිරීම.

11. ලංකා ගුවන් සේවය තිරුච්චිනා පල්ලි හා මදුරාසියට කන්කසන්තුරෙයි හරහා ගමන් ගන්නා නිසා ඒ මඟින්ට ආගමන හා විගමන හා විනිමය නීති පිළිබඳව විශේෂ පහසුකම් ලබාදීම හා සෑම ලාංකිකයෙක්ම ඉහත කී ස්ථාන දෙකට හෝ ලංකා ගුවන් සේවය මඟින් යා හැකි අන් රටකට හෝ ලංකා ගුවන් සේවය මඟින් යා යුතු බවට නීතියෙන් බල කිරීම.

12. පට්ටල් වැඩ, යන්ත්‍ර අළුත් වැඩියා කිරීම්, වඩු වැඩ හා බැටරි චාජින් වැඩ, මෝටර් රථ පිළිබඳ පිට වැඩ, විදුලි බල වැඩ හා ගුවන් විදුලි යන්ත්‍ර වැඩ යනාදිය හා ආණ්ඩුවේ ආධාර ඇතුව සුළු කර්මාන්ත පටන් ගැනීම ගැන සොයා බැලීම.

13. සේවකයන්ගේ නිල ඇඳුම් යනාදී මැහුම් වැඩ කිරීම සඳහා මැහුම් අංශයක් පිහිටුවීම ගැන සොයා බැලීම.

පරිශිෂ්ටය අංක 2

**සංවර්ධනය**

1. සමිතියේ නියෝජිතයින් හා ගුවන් ගමනා ගමනය පිළිබඳව දියුණුවක් ලබා ඇති රට වල විශෙෂඥයින්ගේ ද ආධාර ඇතිව, දීර්ඝකාලීන හා කෙටි කාලීන සැලැස්මක් ඇති කිරීම.

2. මඟින් ගෙන යාහැකි හෙලිකොප්ටර් යානා මිළයට ගැනීම.

3. කතරගම, දියතලාව හා මහනුවර ගුවන් තොටු පලවල් ඇති කිරීම.

4. රත්මලානේ ගුවන් තොටුපල ජාත්‍යන්තර ගුවන් තොටුපලක් කිරීමෙන් වැඩි ප්‍රයෝජනයක් ලැබෙන බව ආණ්ඩුවට පෙන්වා දීම.

ලංකා ගුවන් සේවක සමිතිය.

1963 ජුලි 15,
ගුවන් තොටුපල,
රත්මලාන.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපැලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

1963

சந்தா: பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம்; தனிப்பிரதி சதம் 30. தபால்மூலம் 45 சதம். முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

1963

**Subscriptions** : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months. Each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

1963

---


ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

இலங்கை, வாழைச்சேனை ஈஸ்ரேண் பேப்பர் மில்ஸ் கோப்பரேஷனால் உற்பத்தி செய்யப்பட்ட காகிதத்தில், இலங்கை அரசாங்க அச்சகத்திற் பதிப்பிக்கப்பெற்றது

Printed at the Government Press, Ceylon, on paper manufactured at the Eastern Paper Mills Corporation, Valaichchenai, Ceylon



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org